# සීතාවක සංවර්ධන සැලැස්ම (2019 – 2030)



පළමු

වෙළුම

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

නාගරික සංවර්ධන අධිකාරිය

# සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය

# සංවර්ධන සැලැස්ම (2019 – 2030)

## පළමු වෙළුම

**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,**
“සුහුරුපාය”, සුභූතිපුර පාර,
බත්තරමුල්ල.

**නාගරික සංවර්ධන අධිකාරිය,**
“සෙත්සිරිපාය”,
බත්තරමුල්ල.

**සීතාවක සංවර්ධන සැලැස්ම (2019 – 2030) - පළමු වෙළුම**

© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව (2019)

සියලුම හිමිකම් ඇවිරිණි. මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ප්‍රකාශනය මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදාහැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා තැටිගත කිරීම හෝ බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

**ප්‍රකාශනය**

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
06 වන, 07 වන හා 09 වන මහල්, "සෙත්සිරිපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
**වෙබ් අඩවිය** - www.uda.gov.lk

**ඊ මේල්** - info@uda.gov.lk
**දුරකථන අංකය** - +94112873637
**ප්‍රකාශනය** - 2019 පෙබරවාරි

සීතාවක සංවර්ධන සැලැස්ම (2019 - 2030), ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, එය පළමු වෙළුම හා දෙවන වෙළුම වශයෙන් ප්‍රකාශනයට පත් කෙරේ. මෙහි පළමු වෙළුම අනු කොටස් දෙකකින් සමන්විත වන අතර, එය පළමුවන වන කොටස හා දෙවන කොටස වශයෙන් සඳහන් කර ඇත. මෙහි එන පළමු වෙළුමේ පළමුවන කොටස මගින් සංවර්ධන සැලසුම හැඳින්වීම, පසුබිම් අධ්‍යනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පිළිබඳ සඳහන් කරන අතර, එහි දෙවන කොටස මගින් සංවර්ධන සැලැස්මේ දැක්ම, අරමුණු හා පරමාර්ථ, සංකල්පිත සැලැස්ම, සංවර්ධන උපාය මාර්ග සැලසුම් යනාදිය අන්තර්ගත කර ඇත. සංවර්ධන සැලැස්මෙහි දෙවන වෙළුම වෙනත් ප්‍රකාශනයක් ලෙස සකස් කර ඇති අතර, එහි 2019 -2030 කාලපරිච්ඡේදය සඳහා බලපවත්වන ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ රෙගුලාසි හා කලාපීකරණ රෙගුලාසි අන්තර්ගත කර ඇත.

සීතාවක සංවර්ධන සැලැස්ම (2019 - 2030) නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශය මගින් සකස් කර ඇති අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශයන්ගේ හා සම්පත් දායකයන්ගේ උපදෙස් හා මඟපෙන්වීම පෙරදැරි කරගෙන සිදු කර ඇත.

***අධීක්ෂණ කටයුතු***

ආචාර්ය ජගත් මුණසිංහ ***සභාපති - නා.සං.අ.***, ඉංජිනේරු එස්.එස්.පී.රත්නායක ***අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අ.***, නගර නිර්මාණ ශිල්පී කේ.ඒ.ඩී. චන්ද්‍රදාස ***හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අ.***, නගර නිර්මාණ ශිල්පී ඩී.එම්.බී. රණතුංග ***නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අ.***, නගර නිර්මාණ ශිල්පී ජනක් රණවීර ***අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් හා පර්යේෂණ සංවර්ධන අංශය) - නා.සං.අ.***, නගර නිර්මාණ ශිල්පී වයි.ඒ.ජී.කේ. ගුණතිලක ***අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අ.***, නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න ***අධ්‍යක්ෂ (නැගෙනහිර පළාත) - නා.සං.අ.***

***සැලසුම් කණ්ඩායම***

තමරා ජයගොඩ ***නියෝජ්‍ය අධ්‍යක්ෂ - සැලසුම් (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අ.***, පී. මාධවී කොතලාවල **සැලසුම් සහකාර, (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අ.**, එච් .ඩබ්ලිව් .ඉඳුනිල් සඳරුවන් සිල්වා ***සහකාර සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අ.***, ඒ .ජී..දිශ්නි තාරිකා ***සහකාර සැලසුම් නිලධාරී (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අ.***

***සහාය කණ්ඩායම්***

අතුල සමරසිංහ ***සැලසුම් නිලධාරි (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අ., නදීපා ජයමාලි පල්ලියගුරුගේ සැලසුම් නිලධාරි (බස්නාහිර පළාත් අංශය)*** සහ පරිසර හා භූදර්ශන අංශය - නා.සං.අ. , භූගෝලීය තොරතුරු පද්ධති අංශය - නා.සං.අ., පර්යේෂණ හා සංවර්ධන අංශය - නා.සං.අ.

## ප්‍රණාමය

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සංවර්ධන අංශය ඒකාබද්ධව සිදු කරන ලද ව්‍යාපෘතියකි. මෙම සැලැස්ම සම්පාදනය කිරීමේදී අවශ්‍ය රාජ්‍ය දායකත්වය, මඟපෙන්වීම, අවශ්‍ය පහසුකම් හා සහයෝගය ලබාදුන් ගරු මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක මැතිතුමාට නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් විශේෂ ස්තූතිය පිරිනමන අතර, මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් මෙම සැලැස්ම සාර්ථක කරගැනීමට විවිධාකාරයෙන් දක්වන ලද සහයෝගය වෙනුවෙන් අපගේ කෘතඥතාවය පිරිනමනු ලැබේ.

සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති, ජයන්ත රෝහණ මැතිතුමා ප්‍රමුඛ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් හා නිලධාරීන්ද, හංවැල්ල හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම්තුමන්ලා ඇතුළු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කාර්ය මණ්ඩලය විසින්ද මෙම සැලැස්ම පිළියෙල කිරීමේදී දක්වන ලද සහයෝගය ස්තූති පූර්වකව සිහිපත් කරන අතරම, මෙම සැලැස්ම සාර්ථක කරගැනීම සඳහා සියලුම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන් විසින් අප වෙත ලබාදුන් සහයෝගයද මහඟු පිටුවහලක් වූ බවට අප සිහිකරන්නෙමු.

මෙම සැලැස්ම සම්පාදනය කිරීමේදී තම කාලය හා විශේෂඥ දැනුම ලබාදුන් නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති, ජගත් මුණසිංහ මහතාට හෘදයාංගම ස්තූතිය පිරිනමන අතරම, නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්, එස්.එස්.පී.රත්නායක මහතාට, හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, කේ.ඒ.ඩී.චන්ද්‍රදාස මහතාට, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), ඩී.එම්.රණතුංග මහතාට, සංවර්ධන සැලසුම් අංශයේ අධ්‍යක්ෂ ජනක් රණවීර මහතාට, නැගෙනහිර පළාත් අධ්‍යක්ෂ, ලලිත් විජයරත්න මහතා මෙන්ම බස්නාහිර පළාත් අංශයේ අධ්‍යක්ෂ, වයි.ඒ.ජී.කේ. ගුණතිලක මහතාට අපගේ විශේෂ ස්තූතිය පිරිනමමු. තවද, මෙම සැලැස්ම සාර්ථකව නිමකරගැනීම සඳහා නිරන්තර සහයෝගය ලබාදුන් නියෝජ්‍ය අධ්‍යක්ෂිකා, තමරා ජයගොඩ මහත්මියටද, සංවර්ධන සැලසුම් අංශයේ සහකාර සැලසුම් නිලධාරිනි, සම්ද්දි නිසංසලා මෙනවියටද සැලසුම් කණ්ඩායමේ විශේෂ කෘතඥතාවය පිරිනැමේ.

එමෙන්ම ක්ෂේත්‍ර සමීක්ෂණ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් බස්නාහිර පළාත් අංශයේ සැලසුම් නිලධාරි, අතුල සමරසිංහ මහතා වෙතද, මෙම සැලැස්ම පිළියෙල කිරීම සඳහා නන් අයුරින් සහයෝගය දැක්වූ නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන සැලසුම් අංශය, භූගෝලීය තොරතුරු පද්ධති අංශය සහ පරිසර හා භූදර්ශන අංශය මෙන්ම ඇතුළු අප වෙත සහය දැක්වූ අනෙකුත් සියලුම නිලධාරි මහත්ම මහත්මීන්ටද අපගේ විශේෂ ස්තූතිය පිරිනමන්නෙමු.

අවසාන වශයෙන් මෙම සැලැස්ම මුද්‍රිත පිටපතක් ලෙස ප්‍රකාශ කිරීම සඳහා පරිගණක සහයෝගය ලබාදුන් බස්නාහිර පළාත් අංශයේ අනුෂ්කා හර්ෂණී අබේකෝන් මෙනවිය ඇතුළු අනෙකුත් සියලුම සේවක මහත්ම/ මහත්මීන්හටද අපගේ විශේෂ ස්තූතිය හිමි වේ.

## ගරු අමාත්‍යතුමාගේ පෙරවදන



1978 හි අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනත යටතේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවනු ලැබූ අතර, පසුගිය වසර 40 පුරාවටම නාගරික සංවර්ධන අධිකාරිය නාගරික ප්‍රදේශවල සැලසුම් සහගත නාගරික සංවර්ධනයක් සඳහා දායකත්වය සපයනු ලබයි. මෙම මොහොත වන විට නාගරික සංවර්ධන අධිකාරිය තම ගමන් මඟෙහි තවත් එක් සන්ධිස්ථානයක් පසුකරමින්, පුළුල් සංවර්ධන සැලසුම් සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම සකස් කිරීමට කටයුතු කොට ඇත.

මෙම සංවර්ධන සැලසුම තුලින් අපේක්ෂා කරනු ලබන්නේ, සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා ඒකාබද්ධ සංවර්ධනයක් ඇති කිරීමටයි. සීතාවක නගරය වාණිජ හා පරිපාලනමය වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධානම නගරයක් වන අතර , එය විශාල ජන සංඛ්‍යාවකට සේවා සපයනු ලබයි. තවදුරටත් සීතාවක හා ඒ අවට ප්‍රදේශය සතු ස්වභාවික පරිසර පද්ධතිය හා පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන පිහිටා තිබීම යන විභවතාවයන් සංවර්ධනය සඳහා යොදාගත හැකිය.

අපගේ උත්සාහය සීතාවක ප්‍රදේශයට දිවයිනේ අනෙකුත් ප්‍රදේශ හා සමගාමීව සුදුසු ලෙස භෞතික සංවර්ධනයකට අවශ්‍ය පහසුකම් සැලසීමය.

මාගේ අවබෝධය අනුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා වෘත්තීයවේදීන්, විශේෂඥයන්, පාර්ශවකරුවන් හා ප්‍රජාවගේ පුළුල් උපදේශනය සමඟින් නවීන ක්‍රමෝපායන් යොදා ගනිමින් විශිෂ්ඨ තාක්ෂණික ක්‍රමවේදයන් හා නවෝත්පාදිත ප්‍රවේශයන්ද ලැබී ඇත. ඒ අනුව, සභාපතිතුමා, අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් කණ්ඩායම හා නොයෙක් ආකාරයේ මෙම කාර්ය සාර්ථක කර ගැනීමට උපකාර කළ නාගරික සංවර්ධන අධිකාරියේ සියලුම නිලධාරීන්ගේ සේවය මම අගය කරමි. තවදුරටත් අදාල පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන හා සාමාන්‍ය ජනතාවගේ සහයෝගය හා දායකත්වය එක සමාන අයුරින් මෙම කාර්ය උදෙසා යෙදවීම තුලින් සීතාවක සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කර ගැනීමට මඟ සැලසෙනු ඇත.

**පාඨලී චම්පික රණවක**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

## ගරු සභාපතිතුමාගේ පෙරවදන



වර්තමානය වන විට නාගරික සංවර්ධන අධිකාරිය ශ්‍රී ලංකාවේ නාගරික සැලසුම් සකස් කිරීමට හා එම සැලසුම් ක්‍රියාත්මක කිරීමට ඇති ප්‍රධානතම ආයතනය වන අතර, නාගරික පරිසරය ගුණාත්මක ලෙස කළමනාකරණය කිරීමේ වගකීමද එසේම පැවරී ඇත. 1978 වර්ෂයේදී මෙම ආයතනය ස්ථාපිත කිරීමේ පරමාර්ථය වී ඇත්තේ, ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම තුලින් නාගරික ප්‍රදේශවල හා එහි ජනතාවගේ පොදු යහපැවැත්ම ප්‍රවර්ධනය හා නියාමනය කිරීමයි.

1982 අංක 4 දරණ සංශෝධිත පනතෙහි (II කොටස 8 වන වගන්තිය 8 අ [I]) අනුව අමාත්‍යවරයා විසින් නාගරික සංවර්ධන ප්‍රදේශයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයන්හි සංවර්ධන සැලසුම් සකස් කිරීම අත්‍යාවශ්‍ය කරුණක්ව ඇත. සීතාවක බල ප්‍රදේශය සඳහා සකස් කරනු ලැබූ සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා බලාත්මක කිරීම, එම විධිවිධාන යටතේ සිදු කර ඇත. සීතාවක ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය සීතාවක හා ඒ අවට ප්‍රදේශයන්හි භෞතික, ආර්ථික, සාමාජීය හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන සීතාවක සංවර්ධන සැලැස්ම අවසන් කර ඇත.

මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේදී, අපගේ ගමන් මාර්ගය සුමට නොවන අතර, අභියෝග පිරුණු, අවිනිශ්චිතයන්ගෙන් සැදී, විෂම බලාපොරොත්තුවලින් අපවිත්‍ර වූ, කටුක ගමන් මාර්ගයක් බව අප අමතක කර නොමැත. නාගරික සංවර්ධන අධිකාරිය වර්තමානයේ අවශ්‍ය පද්ධති, මෙවලම්, හා ක්‍රමෝපායන් තුලින් සන්නද්ධව අභියෝගයන් සඳහා මුහුණදීමටත්, අවිනිශ්චිතභාවයට ඔරොත්තු දීම තුලින් ස්වභාව සෞන්දර්යයෙන් අනූන සීතාවක බල ප්‍රදේශය පරිසර පරිසර හිතකාමී සමෘද්ධිමත් නගරයක් බවට පත් කිරීමට අධිෂ්ඨාන කොට ගෙන සිටියි.

මෙම පුළුල් කාර්ය සාර්ථකව ඉටු කර ගැනීම සඳහා කැපවීමෙන් හා වෙහෙස මහන්සි වී වැඩකටයුතු කරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් කණ්ඩායම හා නන් අයුරින් සහයෝගය දැක්වූ සැමට මාගේ හෘදයාංගම කෘතවේදීත්වය පිරිනැමීම සඳහා මෙය අවස්ථාවක් කර ගන්නා අතර, මෙම සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා මේ හා සමාන සහයෝගය ඉදිරියටත් බලාපොරොත්තු වෙමි.

**ආචාර්ය ජගත් මුණසිංහ**

සභාපති

නාගරික සංවර්ධන අධිකාරිය

## සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ පණිවුඩය



නාගරික සංවර්ධන අධිකාරිය විසින් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම පිළිබඳව මාගේ කෘතඥතාවය ප්‍රථමයෙන් ප්‍රකාශ කර සිටින අතර, එම සැලැස්ම තුලින් සීතාවක බල ප්‍රදේශයට අනන්‍ය වූ ලක්ෂණ ආරක්ෂා වන පරිදි, විශේෂයෙන් පාරිසරික සම්පත් රැකගැනීමට ගෙන ඇති උත්සහයට සහ ඒ තුලින් ප්‍රදේශයේ ජනතාවට උපරිම ප්‍රතිලාභ ලබාගත හැකිවන පරිදි කටයුතු කර තිබීම ප්‍රශංසනීය වේ.

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී පොදු මහජනතාව නියෝජනය කරමින් අප විසින් ඉදිරිපත් කරන ලද යෝජනා හා අදහස් පිළිබඳවද අවධානය යොමුකර තිබීම මා අගය කරන අතරම, සැලැස්ම ක්‍රියාත්මක කිරීම තුලින් 2030 වර්ෂය වනවිට සීතාවක පුරවරය බස්නාහිර පළාත තුල ඉහළ සංවර්ධනයක් අත්කර ගත් ස්වයංපෝෂිත නගරයක් බවට පත් වේවායි මා ප්‍රාර්ථනා කරමි.

**ජයන්ත රෝහණ**

සභාපති

සීතාවක ප්‍රාදේශීය සභාව

## පූර්විකාව

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 (i) හා 3 (ii) යන වගන්ති යටතේ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස 1998.01.19 වන දින අංක 1011/4 දරණ ගැසට් නිවේදනය මගින් විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත්කර ඇත.

ඒ අනුව ප්‍රදේශයේ ජනතාවට පාරිසරික, සමාජීයිය, ආර්ථික හා භෞතික වශයෙන් තිරසාර සංවර්ධනයක් ළඟාකර දීමේ අරමුණින් මෙම සංවර්ධන සැලැස්ම 2019 – 2030 වර්ෂය දක්වා පිළියෙල කර ඇති අතරම, 2018 වර්ෂය දක්වා කාලය තෙක් ප්‍රදේශය ආශ්‍රිතව වූ තොරතුරු මේ සඳහා උපයෝගී කරගන්නා ලදී.

මෙම සංවර්ධන සැලැස්ම පළමු හා දෙවන වෙළුම ලෙස වෙළුම් දෙකකින් සමන්විත වන අතරම, පළමු වෙළුම පළමු කොටස හා දෙවන කොටස ලෙස කොටස් දෙකකින් සමන්විතය. එහි පළමුවන කොටස පරිච්ඡේද තුනකින් පැහැදිලි කර ඇති අතර, එහිදී පළමුවන පරිච්ඡේදය මගින් සංවර්ධන සැලැස්ම හා එය සැකසීම පිළිබඳ මෙම අධිකාරිය සතු බලතල, සැලසුම් ක්‍රියාවලියේ පියවර, සැලැස්ම පිළියෙල කිරීම සඳහා දායක කරගත් පාර්ශවකරුවන් හා උපදේශන ආයතන පිළිබඳ විස්තර කිරීම සිදු කර ඇත.

සංවර්ධන සැලැස්මේ දෙවන පරිච්ඡේදය වන මූලික අධ්‍යයනය ඔස්සේ හඳුනාගත් සැලසුම් ප්‍රදේශයේ භෞතික පිහිටීම, ප්‍රදේශය සතු ජාතික හා කලාපීකරණ සම්බන්ධතා හා වැදගත්කම් පිළිබඳවද සාකච්ඡා කර ඇත. අධ්‍යයන ප්‍රදේශයේ භෞතික, සමාජයීය, පාරිසරික හා ආර්ථික තත්ත්වයක් පිළිබඳව විග්‍රහ කර ඇති අතර, හඳුනාගත් ගැටළු විශ්ලේෂණය කිරීම මගින් සීතාවක සැලසුම් ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව මෙම සැලැස්මේ තුන්වන පරිච්ඡේදය ඔස්සේ පැහැදිලි කර ඇත.

පළමුවන වෙළුමෙහි දෙවන කොටස සිව්වන පරිච්ඡේදය ඔස්සේ සංවර්ධන සැලැස්ම මගින් අපේක්ෂිත අනාගත දැක්ම ප්‍රකාශ කර ඇත. එම දැක්ම සාක්ෂාත් කරලීමට යෝජනා කරන අරමුණු හා පරමාර්ථ පිළිබඳව මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරමින් සීතාවක සැලසුම් බල ප්‍රදේශය තුල හඳුනාගන්නා ලද ශක්තීන්, දුර්වලතාද, සංවර්ධන අවස්ථා හා තර්ජනයන් සම්බන්ධයෙන් විශ්ලේෂණයක් සිදුකර ඇත.

අනාගත සංවර්ධන දිශානතියේ අවකාශීය වෙනස්වීම හා ඒ තුලින් දීර්ඝකාලීන අරමුණ ඔස්සේ දැක්ම ළඟාකරලීමට ඉඩ ප්‍රස්ථා විවර කරගන්නා ආකාරය පිළිබඳව හයවන පරිච්ඡේදය යටතේ පැහැදිලි කර ඇත. එහිදී වර්ෂ 2018 – 2030 කාලය තුලදී හඳුනාගන්නා ලද සංවර්ධන උපක්‍රමයන් හරහා යෝජිත භූමි පරිහරණ රටාව සම්බන්ධයෙන් සාකච්ඡා කරන අතර අපේක්ෂිත අරමුණු කරා යාම පිණිස සමාජයීය හා භෞතික අපර ව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම හා ආර්ථික සංවර්ධන උපක්‍රම හා තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම යන අංශ ඒ ඔස්සේ පැහැදිලි කර ඇත.

ඉහත සාකච්ඡා කරන ලද උපාය මාර්ගික සැලසුම් යථාර්ථයක් බවට පත්කරලීමට මෙම සැලැස්ම ඔස්සේ රෙගුලාසි හඳුන්වා දෙන අතරම, දෙවන වෙළුම ඔස්සේ භූමි හා ගොඩනැගිලි සංවර්ධනය පිළිබඳ පොදු නියමතා හා රෙගුලාසි පිළිබඳ විග්‍රහ කර ඇත.

දෙවන වෙළුමේ පළමු පරිච්ඡේදය ඔස්සේ සංවර්ධන සැලැස්ම තුලින් ප්‍රදේශයේ හඳුනාගන්නා ලද කලාප හා ඒවායේ මායිම්, එක් එක් කලාපයට අනන්‍ය වන යෝජිත භාවිතයන් පිළිබඳ සාකච්ඡා කර ඇත. ‘‘සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි’’ ලෙස හැඳින්වෙන එහි දෙවන පරිච්ඡේදය ඔස්සේ ඉහත කලාපයන්හි ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනයන්ට බලපැවැත්වෙන රෙගුලාසි හඳුන්වාදීමක් සිදුකර ඇත.

# පටුන

ප්‍රණාමය ……………………………………………………………………………..… i
ගරු අමාත්‍යතුමාගේ පෙරවදන …………………………………………………………. ii
ගරු සභාපතිතුමාගේ පෙරවදන ............................................................................................ iii
සීතාවක ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමාගේ පණිවුඩය ……………………………………. iv
පූර්විකාව ……………………………………………………………………...….… v
පටුන …………………………………………………………………………….. vii

**පළමුවන කොටස**

**පරිච්ඡේදය 01 .......................................................................................................... 1**
**සංවර්ධන සැලැස්මේ පසුබිම ................................................................................. 1**
1.1 හැඳින්වීම ....................................................................................................................1
1.2 සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන් ..........................................................................1
1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය ................................................................................3
1.4 සැලසුම් ක්‍රියාවලිය.........................................................................................................4
**පරිච්ඡේදය 02 .......................................................................................................... 6**
**මූලික අධ්‍යයනය ....................................................................................................... 6**
2.1 අධ්‍යයන ප්‍රදේශය .............................................................................................................6
2.2 සැලසුම් සහ තත්ත්ව සන්ධර්භය.....................................................................................7
2.3 සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම ....................................................................................28
**පරිච්ඡේදය 03 ........................................................................................................ 30**
**සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය ........................................................................ 30**
3.1 හැඳින්වීම ..................................................................................................................30
3.1.1 හඳුනාගන්නා ලද ගැටළු ...........................................................................................30
3.2 පාර්ශවියකරුවන්ගේ අදහස් .........................................................................................54

**දෙවන කොටස**

**පරිච්ඡේදය 04 ........................................................................................................ 55**
**සංවර්ධන සැලසුම් රාමුව ....................................................................................... 55**
4.1 සංවර්ධන සැලැස්මේ දැක්ම.........................................................................................55
4.2 දැක්මෙහි ප්‍රකාශනය ....................................................................................................55
4.3 සංවර්ධන සැලැස්මේ අරමුණු .......................................................................................56
4.4 සංවර්ධන සැලැස්මේ පරමාර්ථ ......................................................................................56
4.4.1 අරමුණු 01 .................................................................................................................56
4.4.2 අරමුණු 02.................................................................................................................57
4.4.3 අරමුණු 03 .................................................................................................................57

**පරිච්ඡේදය 05 .............................................................................................. 58**
**SWOT විශ්ලේෂණය ........................................................................................ 58**
5.1 විස්තරාත්මක SWOT විශ්ලේෂණය ..............................................................58
5.1.1 අරමුණු 01 .............................................................................................58
5.1.2 අරමුණු 02. ............................................................................................72
5.1.3 අරමුණු 03. ............................................................................................80
**පරිච්ඡේදය 06 .............................................................................................. 98**
**සංවර්ධන සැලැස්ම ........................................................................................ 98**
6.1 සංකල්පිත සැලැස්ම ...................................................................................98
6.2 යෝජිත භූමි පරිහරණ සැලැස්ම ...................................................................100
6.3 අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ග .....................................102
6.3.1 සේවා කළමනාකරණ උපාය මාර්ග ...........................................................103
6.3.1.1 සෞඛ්‍ය සේවා උපාය මාර්ග ...................................................................103
6.3.1.2 අධ්‍යාපන සේවා උපාය මාර්ග .................................................................105
6.3.1.3 නේවාසික සේවා උපාය මාර්ග ................................................................106
6.3.1.4 සේවා මධ්‍යස්ථාන ප්‍රමුඛතා උපාය මාර්ග .....................................................109
6.3.2 මාර්ග හා ප්‍රවාහන උපාය මාර්ග ...............................................................112
6.3.3 ජල සැපයුම් උපාය මාර්ග ........................................................................122
6.3.4 මල සහ අපජල කළමනාකරණ උපාය මාර්ග ................................................127
6.3.5 ඝන අපද්‍රව්‍ය කළමණාකරණ උපාය මාර්ග ....................................................128
6.4 ආර්ථික සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම ...................................................131
6.5 තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග ..........................................................139
6.5.1 පරිසර සංරක්ෂණ උපාය මාර්ග ..................................................................139
6.5.2 භූදර්ශණ කළමනාකරණ උපාය මාර්ග .........................................................142
6.5.3 ආපදා කළමනාකරණ උපාය මාර්ග .............................................................145
6.5.4 පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය උපාය මාර්ග ..........................146
6.6 සංස්කෘතික හා ආගමික වටිනාකමකින් යුත් ස්ථාන කළමනාකරණ උපාය මාර්ග ..........150
6.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික සැලැස්ම ..............................................150
කෙටි යෙදුම් ...................................................................................................i
සිතියම් ලැයිස්තුව ............................................................................................ii
රූප සටහන් ලැයිස්තුව ......................................................................................iii
වගු ලැයිස්තුව ..................................................................................................iv
ප්‍රස්ථාර ලැයිස්තුව ............................................................................................v
ඇමුණුම් ලැයිස්තුව ............................................................................................vi
පරිශීලිත ග්‍රන්ථ ..............................................................................................xxvi

# පළමුවන කොටස

# පරිච්ඡේදය 01

# සංවර්ධන සැලැස්මේ පසුබිම

## 1.1 හැඳින්වීම

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3 (I) සහ 3 (II) යන වගන්ති යටතේ යම් ප්‍රදේශයක් "නාගරික සංවර්ධන බල ප්‍රදේශයක්" ලෙස ප්‍රකාශයට පත්කිරීමේ බලය නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යවරයා වෙත පවරා දී ඇත. එසේ යම් ප්‍රදේශයක් විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කිරීමත් සමග එම ප්‍රදේශය සඳහා ඒකාබද්ධ සැලසුම් සකස් කිරීමේ කාර්යය නාගරික සංවර්ධන අධිකාරියෙහි වගකීමයි.

විෂයභාර අමාත්‍යවරයා විසින් සිය බලතල ප්‍රකාරව ප්‍රකාශයට පත්කරනු ලබන ප්‍රදේශ සඳහා නාගරික සැලසුම් පිළියෙල කිරීමේ බලය 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8 (අ) වගන්තිය සංශෝධනය කරමින් නිකුත් කළ 1982 අංක 04 දරණ ගැසට් නිවේදනයේ පරිදි නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇත. සැලසුම් බල ප්‍රදේශයේ පවතින සමාජ ආර්ථික, භෞතික හා පාරිසරික කරුණු සැලකිල්ලට ගෙන ඒකාබද්ධ නාගරික සංවර්ධන සැලැස්මක් සැකසීම නාගරික සංවර්ධන අධිකාරියේ මූලික වගකීම වේ.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය, නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස 1998/01/19 වන දින අංක 1011/04, අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වන සංවර්ධන සැලැස්ම 2019 - 2030 කාලසීමාව සඳහා බල පවත්නා පරිදි පිළියෙල කරන ලදී.

## 1.2 සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්

සීතාවක සංවර්ධන සැලැස්ම (2019 – 2030) පිළියෙල කිරීම සඳහා විවිධ පාර්ශවකරුවන්ගෙන් අදහස් හා යෝජනා ලබාගන්නා ලදී. එහිදී සැලසුම් ප්‍රදේශයේ පාරිසරික, භෞතික, ආර්ථික හා සමාජීය අංශ නියෝජනය වන පරිදි ලබාගත් අදහස් මෙම සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගන්නා ලදී. එකී උපදේශන රැස්වීම් සඳහා සම්බන්ධ වූ පාර්ශවකරුවන් පහත සඳහන් පරිදි වේ.

**අ) ප්‍රධාන පාර්ශවකරු**

- සීතාවක ප්‍රාදේශීය සභාව

**ආ) උපදේශන ආයතන**

- සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව
- මධ්‍යම පරිසර අධිකාරිය
- වාරි මාර්ග දෙපාර්තමේන්තුව
- මාර්ග සංවර්ධන අධිකාරිය
- ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
- මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
- ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව
- පශු වෛද්‍ය කාර්යාලය - හංවැල්ල
- පශු වෛද්‍ය කාර්යාලය - පාදුක්ක
- ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
- ලංකා විදුලිබල මණ්ඩලය
- සංචාරක සංවර්ධන අධිකාරිය
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- රබර් සංවර්ධන අධිකාරිය
- පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
- ප්‍රජා සෞඛ්‍ය නිලධාරී කාර්යාලය
- පශු සම්පත් කාර්යාලය - හංවැල්ල
- පශු සම්පත් කාර්යාලය - පාදුක්ක
- මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
- වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**ඇ) අනෙකුත් පාර්ශවකරුවන්**

- වෙළඳ සංගමය - පාදුක්ක
- වෙළඳ සංගමය - හංවැල්ල

**ඇ) නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කණ්ඩායම**

- වයි.ඒ.ජී.කේ. ගුණතිලක මහතා - අධ්‍යක්ෂ (බස්නාහිර පළාත)
- තමරා ජයගොඩ මිය - නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)
- අතුල සමරසිංහ මහතා - සැලසුම් නිලධාරි
- මාධවී කොතලාවල - සැලසුම් සහකාර
- ඉඳුනිල් සඳරුවන් - සහකාර සැලසුම් නිලධාරි
- දිශ්නි තාරිකා - සහකාර සැලසුම් නිලධාරි

**ඉ) අනෙකුත් සහයෝගිතා සැලසුම් කණ්ඩායම්**

- සංවර්ධන සැලසුම් අංශය
- පර්යේෂණ සහ සංවර්ධන අංශය
- පරිසර භූදර්ශන හා පහසුකම් කළමනාකරණ අංශය
- භූගෝලීය තොරතුරු පද්ධති අංශය

## 1.3 සංවර්ධන සැලැස්මේ විෂය පථය

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය කොළඹ නගරයට කිලෝ මීටර 44 ක් පමණ දුරින් පිහිටා ඇති අතර, එය කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටා ඇති විශාලතම පළාත් පාලන බල ප්‍රදේශය වේ. එහි ආර්ථික, සමාජීය, පාරිසරික සහ භෞතික යන අංශයන් පදනම් කරගනිමින් තිරසාර සංවර්ධනයක් ළඟාකරගැනීමේ අරමුණින් මෙම සංවර්ධන සැලැස්ම සකස් කරනු ලැබේ. පුළුල්ව ගත්විට, ප්‍රදේශයේ පවතින භාවිතා නොකළ සම්පත් උපයෝජනය කර ගැනීම, භාවිතා වන සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීම, ප්‍රදේශයේ ප්‍රධාන කර්මාන්තයන් පරිසර හිතකාමී ලෙස ප්‍රයෝජනයට ගැනීම, පරිසර පද්ධතිය සංරක්ෂණය කරගැනීම හා පවත්නා ගැටළුකාරී තත්ත්වයන් අවම කිරීමට විසඳුම් යෝජනා කිරීම යනාදී සංවර්ධන අරමුණු සාක්ෂාත් කරගැනීම තුලින් තිරසාර සංවර්ධනයක් ළඟාකරගැනීමට අපේක්ෂා කරන අතර, එහිදී පරිසර සංරක්ෂණය සඳහා තිරසාර පාරිසරික සැලැස්මක් සහ සංස්කෘතික හා ආගමික සැලැස්මක්ද, යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අපරව්‍යුහ සැලැස්මක්ද, ආර්ථික සංවර්ධනය සඳහා පාරිසරික සංචාරක ප්‍රවර්ධන සැලැස්මක් හා ප්‍රදේශයේ පවතින කර්මාන්ත සඳහා පරිසර හිතකාමී ප්‍රවර්ධන සැලැස්මක්ද, නේවාසික භාවිතය ප්‍රවර්ධනය සඳහා සේවා කළමනාකරණ සැලැස්මක්ද මෙමගින් යෝජනා කර ඇත.

මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී, එක් එක් රාජ්‍ය ආයතන මගින් පවත්වාගෙන යනු ලබන ගඟ රක්ෂිත, දුම්රිය රක්ෂිත, රජයේ රක්ෂිත වනාන්තර සහ ජලාශ්‍රිත ප්‍රදේශ, හඳුනා ගන්නා ලද සංවර්ධන ප්‍රදේශ, පුරාවිද්‍යාත්මක ස්ථාන සංරක්ෂණය වැනි පවත්නා නීතිමය සීමාවන් පිළිබඳවද අවධානය යොමුකර ඇත.

## 1.4 සැලසුම් ක්‍රියාවලිය

සීතාවක ප්‍රදේශීය බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී ආරම්භයේ සිටම විධිමත් සැලසුම් ක්‍රියාවලියකට අනුව සැලසුම සකස් කිරීම සිදු වූ අතර ප්‍රධාන වශයෙන් එය පියවරවල් 10 කින් සමන්විත වේ.

**පසුබිම් අධ්‍යයනය**

මේ සඳහා දක්නට ලැබෙන පාරිසරික, ආර්ථික, සමාජීය සහ භෞතික ක්ෂේත්‍ර ඔස්සේ විවිධවූ නිරීක්ෂණයන් හා විශ්ලේෂණයන් සිදු කරන ලදී. ඒ අනුව, ගූගල් සිතියම් ආධාරයෙන් භූගෝලීය සම්බන්ධතා සිතියම, සැලසුම් ප්‍රදේශය තුල සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ හා එක් එක් අදාළ ආයතන හා පාර්ශව මගින් ලබාගන්නා ලද තොරතුරු උපයෝගී කරගෙන ප්‍රදේශයේ සංවර්ධනය සිදුවී ඇති ආකාරය මාර්ග ජාලය පැතිරී ඇති ආකාරය, ස්වභාවික පරිසර පද්ධතිය සම්බන්ධ තොරතුරු ආදියද, භූගෝලීය තොරතුරු පද්ධති මෘදුකාංගය උපයෝගී කරගනිමින් ජන හා නිවාස සනත්වය සහ ඒවායේ පැතිරීම, අධ්‍යාපනික මට්ටමෙහි පැතිරීම ශ්‍රම බලකායෙහි පැතිරීම, භූමි පරිභෝජන රටාවේ පැතිරීම, යටිතල පහසුකම්වල පැතිරීම, කර්මාන්ත සහ වැවිලි කර්මාන්තයන්ගේ පැතිරීම පිළිබඳ තොරතුරු ලබාගන්නා ලදී. එසේම භූවිෂමතා සිතියම, නාය යෑම් සිදුවන ස්ථානවල පැතිරීම, ප්‍රවාහන සිතියම සහ පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් ස්ථාන සිතියම, භූමියේ වටිනාකමෙහි පැතිරීම, ආපදා අවදානම පිළිබඳ සිතියම සහ උද්‍යාන සහ විවෘත භූමි සිතියම සකස් කර ගන්නා ලදී. ඒ අනුව ප්‍රදේශය පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබාගන්නා ලදී.

**විෂය පථය**

ප්‍රදේශයේ පවතින වර්තමාන සමාජීය, ආර්ථික හා භූවිෂමතා ආදී අංශවල තත්ත්වය විශ්ලේෂණය කර හඳුනා ගැනීම

**ගැටළු සහ විභවතා**

විභවතා සහ දුබලතා හඳුනාගැනීම සඳහා ක්‍රමෝපායන් 03 ක් ඔස්සේ අධ්‍යයනයන් සිදුකරන ලදී. ඒ සඳහා ප්‍රදේශයේ රාජ්‍ය, පෞද්ගලික හා විවිධ සමිති සමාගම් නියෝජනය කරමින් 2017.10.16 වන දින පැවති සාකච්ඡාවේදී පාර්ශවකරුවන් ඉදිරිපත් කළ අදහස්ද, නගර නිර්මාණ ශිල්පීන්ගේ විශ්ලේෂණයන්ද පසුබිම් අධ්‍යයනය තුල සඳහන් කරන ලද මෙම ප්‍රදේශයට අදාළ පසුගිය සැලසුම් මැදිහත්වීම්වල විශ්ලේෂණයන්ද උපයෝගී කරගන්නා ලදී.

එම හඳුනාගත් විභවතා සහ දුබලතා ප්‍රදේශයේ සංදර්භය, ප්‍රදේශයේ වැදගත්කම සහ ප්‍රදේශයේ සුවිශේෂීත්වය අනුව ප්‍රමුඛතාගත කරගන්නා ලදී.

**දැක්ම, ඉලක්ක සහ අරමුණු**

සැලසුම් ප්‍රදේශය තුළ තුල පවතින සංවර්ධන විභවතාවයන්ගෙන් මනා ලෙස ප්‍රයෝජන ගැනීමටත්, එහි සංවර්ධනයේ ගැටළුකාරී තත්ත්වයන් මඟහරවා ගනිමින් පාරිසරික, ආර්ථික, සමාජීය හා භෞතික යන අංශයන්ගෙන් සමබර සංවර්ධනය තුලින් සැලසුම් ප්‍රදේශය දියුණුව කරා රැගෙන යාම සඳහා අවශ්‍ය දැක්ම හා අරමුණු සකස් කරනු ලැබීය.

ඉහත සිදුකරන ලද විද්‍යාත්මක විශ්ලේෂණයෙන් අනතුරුව එහි අවසන් ප්‍රතිඵල ප්‍රමුඛතාගත කර ගැනීම සිදුකළ අතර, ඊට අනුකූලව පරමාර්ථ සකස්කර ගන්නා ලදී.

**විස්තරාත්මක විශ්ලේෂණය**

සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී දැක්ම කරා ළඟාවීම සඳහා ප්‍රදේශය තුල ඇති ශක්තීන්, දුර්වලතාවයන්ද, ප්‍රදේශයට බාහිරින් බලපාන අවස්ථාවන් හා තර්ජනයන් පිළිබඳ මනා විශ්ලේෂණයක් කර (SWOT), ඒ තුලින් සංවර්ධන ප්‍රවණතාවයට ඉලක්කගත කරුණු හඳුනාගැනීම සිදු කරන ලදී.

**සැලසුම් සහ උපාය මාර්ග**

ප්‍රධාන සැලසුම් 04 ක් ඔස්සේ අරමුණුවලට ළඟා වීමට සැලසුම් සකස් කර ගන්නා ලදී. ඒ අනුව, යෝජිත සමෘද්ධිමත් නේවාසික සැලැස්ම, පාරිසරික සංචාරක ප්‍රවර්ධන සැලැස්ම, නීල හරිත සැලැස්ම, වැවිලි සහ කර්මාන්ත ප්‍රවර්ධන සැලැස්ම සකස් කරගන්නා ලදී. මෙම සැලසුම් සඳහා වෙන් වෙන් වශයෙන් උපාය මාර්ගික සැලසුම් සකස් කර ඇති අතර, ඒවාට අනුකූලවන අයුරින් නොයෙකුත් ව්‍යාපෘතිද හඳුනාගෙන ඇත.

**සැලසුම් සහ රෙගුලාසි**

ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය නීති රාමුව මේ තුලින් ඉදිරිපත් කෙරේ.

**අදහස් ලබාගැනීම**

රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල නිලධාරීන්, ව්‍යාපාරික ප්‍රජාව ඇතුළු අනෙකුත් මහජන නියෝජිතයන්ගෙන් ලබාගත් අදහස් හා යෝජනා සැලැස්ම සකස් කිරීමේදී සැලකිල්ලට ගන්නා ලදී.

**දළ සැලසුම් වාර්තාව ලබාදීම**

සියලු පාර්ශවකරුවන් ඉදිරිපත් කළ අදහස් හා යෝජනාද සැලකිල්ලට ගනිමින්, ප්‍රදේශය සඳහා දළ සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම.

**අනුමැතිය සහ ප්‍රකාශයට පත් කිරීම**

දළ සංවර්ධන සැලැස්ම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම පිණිස අදාළ පළාත් පාලන ආයතන, නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම හා සැලැස්ම ප්‍රකාශයට පත්කිරීම සඳහා අවශ්‍ය මූලික අනුමැතිය ලබාගැනීම.

# පරිච්ඡේදය 02

# මූලික අධ්‍යයනය

## 2.1 අධ්‍යයන ප්‍රදේශය

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මෙහි අධ්‍යයන ප්‍රදේශය වන අතර, එය බස්නාහිර පළාත තුල කොළඹ දිස්ත්‍රික්කයේ වර්ග කි.මී. 208 ක පමණ භූමි ප්‍රමාණයක පැතිරී ඇත. අධ්‍යයන ප්‍රදේශය, උතුරින් කැලණි ගඟ හා ගම්පහ දිස්ත්‍රික්කයෙන්ද, නැගෙනහිරින් සීතාවකපුර නගර සභා සීමාව සහ ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා සීමාවෙන්ද, දකුණින් හොරණ ප්‍රාදේශීය සභා සීමාවෙන්ද, බටහිරින් පුස්වැලි ඔය හා හෝමාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයටද මායිම්ව පිහිටා තිබේ.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන ලෙස හංවැල්ල හා පාදුක්ක යන නගර හඳුනාගත් අතරම, උප නාගරික මධ්‍යස්ථානයක් ලෙස කොස්ගම නගරය වැදගත් ස්ථානයක් ගනු ලැබේ. ඒ අනුව අධ්‍යයන ප්‍රදේශය වන සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 කින් සමන්විත වන අතර, හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් ග්‍රාම නිලධාරී වසම් 36 ක් සහ පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 54 ක් සමඟ ඒකාබද්ධ වී ග්‍රාම නිලධාරී වසම් 90 කින් සමන්විතව සෑදී ඇත (රූප සටහන් අංක 2.1).

***රූප සටහන් අංක 2. 1 - ස්ථානීය පිහිටීම, සීතාවක ප්‍රදේශීය සභා බල ප්‍රදේශය***



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## 2.2 සැලසුම් සහ තත්ත්ව සන්ධර්භය

සීතාවක සැලසුම් ප්‍රදේශය අතීතයේ සීතාවක රාජධානියට අයත් වූ ඓතිහාසික පසුබිමකින් හෙබි ප්‍රදේශයක් බවට නොයෙකුත් මූලාශ්‍රවලින් ගම්‍ය වී ඇත. මෙම ප්‍රදේශයේ 16 වන සියවසේදී පමණ පෘතුගීසින්ගේද, පසුකාලීනව ලන්දේසි හා ඉංග්‍රීසින්ගේද බලපෑමට ලක් වූ බවට ලක්ෂණ හංවැල්ල, පාදුක්ක, කොස්ගම ප්‍රදේශ ආශ්‍රිතව වර්තමානයේදීද දක්නට ලැබෙන නටබුන්වලින් හඳුනාගත හැක. කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතන අතරින් ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම් රාශියකින් යුත් ප්‍රදේශයක් ලෙස සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හඳුනාගත හැක.

හංවැල්ල නගරය අසල ඇති කැලණි ගඟට මායිමේ වූ තානායම් ගොඩනැගිල්ල අසල අතීතයේ විශාල බලකොටුවක් ඉදිකර තිබූ බවට ඒ අසල වර්තමානයේදී දක්නට ඇති දිය අගලක නටඹුන්වලින් අනාවරණය වේ. කුරුගල ප්‍රදේශයේ පිහිටි කුරුගල ගල්ලෙන, මලගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි නිදන් ගල, කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි එකම සංගිලි පාලම තුම්මෝදර ප්‍රදේශයේ වක් ඔය හරහා පිහිටා තිබීම, අයර්වත්ත ප්‍රදේශයේ පිහිටි ඉංග්‍රීසි යුගයේ ගල් බංගලාව, හංවැල්ල නගරයේ පිහිටි බලකොටුව, ලෙනවර රජමහා විහාරය, මුණ්ඩිගල අරණ්‍ය සේනාසනය ආදිය ප්‍රදේශයේ පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික නටඹුන් අතර වේ. මෙලෙස ඓතිහාසික වටිනාකමකින් සමන්විත සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පරිපාලනමය පසුබිම තුල සිතාවක ප්‍රදේශය 1980 දක්වා කාලය තුල ගම්කාර්යය සභාව ලෙස පැවති අතර, 1980 – 1987 දක්වා සංවර්ධන සභාව ලෙස පරිපාලන ව්‍යුහය සැකසී තිබිණි. පසුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ සීතාවක ප්‍රාදේශීය සභාව 1987 වර්ෂයේදී ස්ථාපනය කර ඇත. මෙම ප්‍රදේශය සඳහා විවිධ කාල පරාසවලදී ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් සැලසුම් පිළියෙල කර ඇත.

ජාතික මට්ටමින් සලකා බැලීමේදී, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් (2017 - 2050) පිළියෙල කර ඇති ජාතික භෞතික සැලැස්මට අනුව මෙම ප්‍රදේශය ආර්ථික කොරිඩෝවට මායිම් වූ මධ්‍යම පරිසර සංවේදී කලාපය *(Central Fragile Area)* ට අයත් ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන ඇත (රූප සටහන් අංක 2.2).

1998 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් පිළියෙල කළ කොළඹ තදාසන්න කලාපය සඳහා වන ව්‍යුහගත සැලැස්ම *(Colombo Metropolitan Regional Structure Plan - CMRSP)* යටතේ මෙම සැලසුම් බල ප්‍රදේශය ජාතික වශයෙන් වැදගත්වන වර්ධක ප්‍රදේශයක් *(Growth Center)* හා පාරිසරික සංවේදී ප්‍රදේශයක් *(Environmental Sensitive Area)* ලෙස හඳුනාගෙන ඇත. එහිදී හංවැල්ල සේවා මධ්‍යස්ථානයක් ලෙසද, පාදුක්ක නාගරික මධ්‍යස්ථානයක් ලෙසද යෝජනා කර ඇත (රූප සටහන් අංක 2.3).

බස්නාහිර පළාත් දළ සංවර්ධන සැලැස්මට අනුව (2010 වර්ෂයේ පිළියෙල කරන ලද) පාදුක්ක හා හංවැල්ල නගර අවට ප්‍රදේශ සඳහා සේවා සපයන වර්ධක මධ්‍යස්ථානයක් බවටද එවකට යෝජනා කර ඇත. ඒ අනුව, මෙම ප්‍රදේශය අඩු සංවර්ධන ඝනත්වයකින් යුක්ත වන ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර තිබේ. මේ අතර, 2016 වර්ෂයේදී පිළියෙල කරන ලද බස්නාහිර පළාත් මහානගර සැලැස්මට *(Western Region Megapolis Plan)* අනුව සීතාවක බල ප්‍රදේශය හරිත සංචාරක කලාපයක් සහ වැවිලි සංවර්ධන කලාපයක් ලෙස පවත්වා ගැනීමට යෝජනා කර ඇත (රූප සටහන් අංක 2.4).

සැලසුම් බල ප්‍රදේශය මුහුදු මට්ටමේ සිට අඩි 350 - 1,500 අතර උසකින් පිහිටි කඳු, තැනිතලා බිම් හා තෙත්බිම්වලින් සමන්විත ප්‍රදේශයකි. නිරිතදිග මෝසම් වර්ෂාව මගින් වර්ෂය පුරා වැසි ලැබෙන අතරම, වාර්ෂික වර්ෂාපතනය මිලිමීටර් 3,000 ක පමණ අගයක් ගනී. වාර්ෂික උෂ්ණත්වය $75^0$F ක් පමණ වේ.

ප්‍රාදේශීය වශයෙන් මෙම ප්‍රදේශයේ පිහිටීම සලකා බැලීමේදී, කඩුවෙල, හෝමාගම, මොරගහහේන, ඉංගිරිය, කිරිඳිවැල හා අවිස්සාවේල්ල නගරයන්ට මැදිව පිහිටා ඇති අතරම, ප්‍රදේශයේ ප්‍රධාන නගරය වන හංවැල්ල නගරය කේන්ද්‍ර කොටගෙන කටුනායක ගුවන්තොටුපලට, කොළඹ, හොරණ, අවිස්සාවේල්ල, රත්නපුර යන නගරවලට මහා මාර්ග ජාලය හරහා ප්‍රවේශ පහසුකම් ව්‍යාප්ත වී තිබේ.

හංවැල්ල නගරයේ සිට කිලෝමීටර් 45 ක් පමණ දුරින් පිහිටි බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල සමඟ සම්බන්ධවීමේ හැකියාව කිරිඳිවැල හරහා ඉදිකර ඇති නව මාර්ගය තුළින් උදාවී ඇත. කොළඹ, පාදුක්ක, කොස්ගම හරහා අවිස්සාවේල්ල දක්වා දිවෙන කැලණිවැලි දුම්රිය මාර්ගය මෙම සැලසුම් ප්‍රදේශය හරහා ස්ථානගතව පැවතීමද ප්‍රදේශයට ඉහළ විභවතාවයක් ලබාදී ඇත. කලාපීය වශයෙන් හංවැල්ල හා පාදුක්ක කේන්ද්‍ර කරගනිමින් කොළඹ නගරය, නිට්ටඹුව, කඩුවෙල, අවිස්සාවේල්ල, හොරණ, හෝමාගම නගර සමඟ මෙන්ම මතුගම, මහනුවර, අනුරාධපුර, බදුල්ල නගර සමඟද සම්බන්ධතා පවත්වා ගනී (සිතියම් අංක 2.1).

අධි තාක්ෂණයෙන් යුත් සන්නිවේදන පණිවුඩ හුවමාරු මධ්‍යස්ථානයක් වන ආතර් සී. ක්ලාක් චන්ද්‍රිකා මධ්‍යස්ථානය පාදුක්ක, ගලගෙදර ප්‍රදේශයේ පිහිටා තිබීම ප්‍රදේශයට ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වැදගත්කමක් ලබාදීමට හේතු සාධක වී ඇත.

***රූප සටහන් අංක 2. 2 - ජාතික භෞතික සංවර්ධන සැලැස්ම (2017-2050)***




මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව (2017)

***රූප සටහන් අංක 2. 3 - කොළඹ තදාසන්න කලාපය සඳහා වන ව්‍යුහගත සැලැස්ම (1998)***




මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව (2018)

*රූප සටහන් අංක 2. 4 - බස්නාහිර පළාත් මහානගර සැලැස්ම (2030)*



Fig.5.1 Proposed Planning Area Division

මූලාශ්‍රය : මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය (2016)

කොළඹ දිස්ත්‍රික්කය සඳහා පානීය ජලය සපයනු ලබන ලබුගම, කලටුවාව ජල පිරිපහදු මධ්‍යස්ථානය පිහිටා තිබීමද විශේෂ වැදගත්කමක් ගන්නා අතර, ප්‍රදේශයේ පිහිටා ඇති ලෙෂර් වර්ල්ඩ් (Leisure World) විනෝද මධ්‍යස්ථානද, සීතාවක උද්භිත උද්‍යානයද ජාතික මට්ටමේ සම්බන්ධතා ඇති කිරීමට ඉවහල් වී ඇත. ඒ අනුව ජාතික හා ජාත්‍යන්තර වශයෙන් ප්‍රදේශයේ ඇති මෙවැනි සම්පත් කෙරෙහිද මෙම සැලැස්මෙන් විශේෂ අවධානය යොමුකිරීමක් සිදු කෙරේ (රූප සටහන් අංක 2.5).

***රූප සටහන් අංක 2. 5 - සීතාවක ප්‍රාදේශීය සහා බල ප්‍රදේශයේ ආකර්ශණීය ස්ථාන***




මූලාශ්‍රය : ක්ෂේත්‍ර සමීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***සිතියම් අංක 2. 1 -සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කලාපීය වැදගත්කම හා ප්‍රාදේශීය පිහිටීම***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

සැලසුම් ප්‍රදේශයේ වැඩි භූමි ප්‍රමාණයක් තුල පැතිරී ඇති පාරිසරික සංවේදී ස්ථාන, කුඹුරු, පහත් බිම්, ජලාශ, දිය ඇළි, ඇළ දොළ, ගංගා, මහා පරිමාණ රබර් වගාවන්, රක්ෂිත වනාන්තර යනාදිය ස්වභාවික පරිසර පද්ධතිය සුරැකීමට විශාල දායකත්වයක් ලබාදෙන අතර, ජල පෝෂක තත්ත්වය සුරැකීම සඳහා උපකාරී වේ. (සිතියම් අංක 2.2) ලබුගම ජලාශය ඇතුළු ජලාශ්‍රිත ප්‍රදේශ ව.කි.මී. 4.16 ක ප්‍රමාණයක් ප්‍රදේශය ආවරණය කරන අතරම, එය භූමි පරිහරණ රටාව තුල සැලකිය යුතු ස්ථානයක් ගෙන ඇත.

ප්‍රදේශයේ මුළු භූමි පරිහරණයෙන් 1.1% ක් ආවරණය වන පරිදි ජලාශ්‍රිත පද්ධති විහිදී ඇති අතරම, කැලණි ගඟ, පුස්සැලි ඔය, වක් ඔය, ඇස්වතු ඔය, අරුක්වත්ත ඔය, අංගමුව ඔය හා ඇලිගේ ඔය ප්‍රධාන කරගත් ජල මාර්ගද, ලබුගම, කලටුවාව ජලාශද මින් ප්‍රධාන වේ. එමෙන්ම  කුමාරි ඇල්ල, රන්මුදු ඇල්ල, ඇල්ල උඩ ඇල්ල, දඹෝර ඇල්ල වැනි දිය ඇළිද ප්‍රදේශය තුල පිහිටා ඇත.

වර්තමානයේ ප්‍රදේශයේ මුළු භූමි පරිහරණයෙන් 73% ක් තුල හරිත වැස්ම පැතිරී ඇති අතරම, ඉන් 42% ක් තුල රබර් වගාව ව්‍යාප්තව ඇත. වී වගාව සඳහා මුළු භූමියෙන් 7.6% ක් වෙන් වී ඇති අතර, පොල් වගාව 3.45% ක පමණ ප්‍රමාණයක ව්‍යාප්තව පවතී. ප්‍රදේශයේ සේවා නියුක්තිකයන්ගෙන් 40% කගේ පමණ ප්‍රධාන ජීවනෝපාය මාර්ගය රබර් වගාව වන අතරම, තේ වගාව, අන්නාසි වගාව සහ මිශ්‍ර බෝග වගාවද ප්‍රදේශය පුරා සුළු පරිමාණයෙන් දක්නට ලැබේ. කොළඹ දිස්ත්‍රික්කයේ මුළු රබර් නිෂ්පාදනයෙන් 62% ක දායකත්වයක් මෙමගින් සැපයනු ලැබේ. විශේෂයෙන්ම කොස්ගම, බෝපේ, පඬ්ඩාගුල වැනි ප්‍රදේශවල මහා පරිමාණයෙන් රබර් වගාව ව්‍යාප්තව ඇත. එමෙන්ම  සාලාව වත්ත, එලිසන් වත්ත, සිරිනිවාස වත්ත, පඬ්ඩාගුල වත්ත ප්‍රධාන කරගත් රජයට අයත් රබර් වතු හෙක්ටයාර 4,698 ක වපසරියක පැතිරී ඇත.

පශු සම්පත් කර්මාන්තය මෙම ප්‍රදේශයේ  තවත් ප්‍රධාන ජීවනෝපාය මාර්ගයක් වන අතරම,  ප්‍රදේශය පුරා පැතිරී ගිය සුළු හා මහා පරිමාණ කුකුල් කොටු, ඌරු ගොවිපලවල් හා ගව පට්ටි විශාල ප්‍රමාණයක් දක්නට ලැබේ. මහා පරිමාණයෙන් පුස්සැල්ලාව ෆාම්, නියෝ ෆාම්, ප්‍රීමා ෆාම් වැනි ගොවිපළවල් ක්‍රියාත්මක වන අතරම, ගෘහාශ්‍රිතව ක්‍රියාත්මක වන සුළු පරිමාණ ගොවිපලවල්ද බහුලව ප්‍රදේශය පුරාම ව්‍යාප්තව ඇත. කොළඹ දිස්ත්‍රික්කය තුල පශු සම්පත් නිෂ්පාදන සඳහා මෙමගින් 66% ක් වැනි ඉහළ දායකත්වයක් සැපයේ.

කළුගල් කැඩීම සහ පස් කැපීමේ කර්මාන්තයද මෙම ප්‍රදේශයේ දැකිය හැකි තවත් සක්‍රීය ආර්ථික ක්‍රියාකාරකමක් වන අතරම, ප්‍රදේශය පුරා විහිදී ගිය මහා පරිමාණ කළුගල් වලවල් 47 ක් පමණ හඳුනාගත හැක. මෙම කර්මාන්ත මගින් වරාය නගරය ඉදිකිරීම, අධිවේගී මාර්ග ඉදිකිරීම වැනි ජාතික මට්ටමේ සංවර්ධන ව්‍යාපෘතින් සඳහා සෘජු දායකත්වයක් ලබාදෙනු ලැබේ. නමුත් නිසි කළමනාකාරීත්වයකින් හා පාලනයකින් තොරව සීඝ්‍රයෙන් පැතිරී යන කුකුල්, ඌරු ආදී පශු සම්පත් ගොවිපලවල් හා අවිධිමත් කළුගල් කැඩීමේ කර්මාන්ත හේතුවෙන් ප්‍රදේශයේ ජන ජීවිතයට සහ පාරිසරික සම්පත්වලට තරමක අයහපත් බලපෑමක් නිර්මාණය වී ඇත.

සංචාරක කර්මාන්තයද සුළු වශයෙන් ප්‍රදේශය තුල ප්‍රචලිත ආර්ථික ක්‍රියාකාරකමක් ලෙස හඳුනාගත හැකිවන අතර, ඒ සඳහා ඉහළ විභවතාවයක්ද ප්‍රදේශය තුල පවතී.

එමෙන්ම සැලසුම් බල ප්‍රදේශයේ සමාජීය තොරතුරු සැලකීමේදී ජන හා සංඛ්‍යාලේඛන දත්ත අනුව, සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 2001 වර්ෂයේ ජනගහනය 113,084 ක් වී ඇති අතර, එය 2018 වර්ෂය වනවිට 162,729 ක් දක්වා වර්ධනය වී ඇත. මෙය කොළඹ දිස්ත්‍රික්කය තුළ සිටින මුළු ජනගහනයත් සමඟ සැසඳීමේදී 6% ක අගයක් ගෙන ඇත. එහෙත් කොළඹ, දෙහිවල, මොරටුව, කඩුවෙල, මහරගම වැනි අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ජනගහනය සමඟ සැසඳීමේදී මෙම අගය සාපේක්ෂ අඩු ප්‍රතිශතයක් ගෙන ඇති බවට ප්‍රස්ථාර අංක 2.1 මගින් පැහැදිලි වේ.

**ප්‍රස්ථාර අංක 2. 1 - බස්නාහිර පළාතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව ජනඝනත්වය (2012)**




මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)

***සිතියම් අංක 2. 2 - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නීල හරිත ප්‍රදේශ (2018)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

*වගු අංක 2. 1 - ජනගහන වර්ධනය හා වර්ධන වේගය (1971 – 2018), සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය*

| වර්ෂය | ජනගහනය | වාර්ෂික ජනගහන වර්ධන අනුපාතය |
|---|---|---|
| 1971 | 76,501 | - |
| 1981 | 92,255 | 2.06 |
| 2001 | 113,084 | 1.13 |
| 2011 | 133,919 | 1.84 |
| 2018 | 162,729 | 1.73 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)

ප්‍රදේශයේ මුළු ජනගහනයේ වාර්ෂික වර්ධන වේගය සැලකිල්ලට ගත්කළ එය වර්ෂ 1971 - 1981 කාලපරිච්ඡේදයේදී 2.06% ක අගයක්ද, 2001 වර්ෂය වනවිට 1.13% ක අගයක්ද ගෙන, 2011 වර්ෂය වනවිට 1.84% ක් දක්වා වැඩි වී නැවතත්, 2018 වර්ෂය වනවිට 1.73% ක් දක්වා සුළු අඩුවීමක් වාර්තා වී ඇත (වගු අංක 2.1). මේ අනුව බල ප්‍රදේශයේ ජනගහන වර්ධනයේ සාමාන්‍ය 1.5% ක පමණ අගයක් ගනී.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනගහන ව්‍යාප්තිය සැලකීමේදී ජාතික මාර්ග ජාලය තුල ප්‍රධාන මාර්ග ඔස්සේ කොස්ගම, හංවැල්ල, පාදුක්ක නගර කේන්ද්‍ර කරගනිමින් ප්‍රදේශයේ නැගෙනහිර සිට බටහිර දිශාවට හා දකුණු දිශාවට ජනගහනයේ ඉහළ ව්‍යාප්ත වීමක් දැකිය හැකි අතර, සාමාන්‍ය ජනඝනත්වය වර්ග කිලෝමීටරයකට පුද්ගලයින් 948 ක් වී ඇත. ග්‍රාම නිලධාරී වසම් අනුව සැලකීමේදී 2011 වසරේ වැඩිම ජනඝනත්වයක් කුඩළුවිල, වලව්වත්ත, පහත්ගම, පිටුම්පේ දකුණ, වග දකුණ, ගලගෙදර, කොස්ගම, කහටපිටිය, හංවැල්ල නගරය, පාදුක්ක හා අරුක්වත්ත යන ග්‍රාම නිලධාරී වසම්වල දැකිය හැක. මෙම ග්‍රාම නිලධාරී වසම්වල ජනඝනත්වය වර්ග කිලෝමීටරයට පුද්ගලයින් 1,500- 3,000 අතර ප්‍රමාණයක් වේ. මෙයට ප්‍රධානතම හේතුව වී ඇත්තේ, සීතාවක ප්‍රදේශයේ ප්‍රධාන වාණිජ නගර මධ්‍යස්ථාන වූ කොස්ගම, හංවැල්ල, පාදුක්ක මෙම ග්‍රාම නිලධාරී වසම් තුළ පිහිටා තිබීමය.

තවද, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ (2012) දත්ත වාර්තා අනුව, වයස් ව්‍යුහය අනුව ප්‍රදේශයේ වයස අවුරුදු 15 - 60 ත් අතර වන ශ්‍රම බලකාය 62% ක් පමණ (වගු අංක 2.2) වන අතර, සම්පත් පැතිකඩ වාර්තා (2016) අනුවද වයස අවුරුදු 19 - 60 ත් අතර ශ්‍රමික පිරිස් සංඛ්‍යාව වැඩි අගයක් ගන්නා බව පැහැදිලි වේ (ප්‍රස්ථාර අංක 2.2).

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ (2012) වාර්තා අනුව ජාතීන් අනුව ජනගහනය සැලකීමේදී සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජනගහනයෙන් බහුතරයක් එනම් 94.41% ක් සිංහල ජාතිකයන් වන අතර, ඉතිරි 5.59% දෙමළ, මුස්ලිම්, බර්ගර් හා වෙනත් ජාතීන් වේ (ප්‍රස්ථාර අංක 2.3 ).

*වගු අංක **2. 2** - වයස් ව්‍යුහය අනුව ජනගහනය **(2011)***

| වයස් පරතරය | ජනගහනය | ප්‍රතිශතය (%) |
|---|---|---|
| 0 – 14 | 31,628 | 23.8 |
| 15 – 59 | 83,250 | 62 |
| 60 < | 19,041 | 14.2 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)

*ප්‍රස්ථාර අංක 2. 2 - වයස් පිරමීඩය අනුව ජනගහනය (2016) - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය*




මූලාශ්‍රය : සම්පති පැතිකඩ වාර්තා (2016)

*ප්‍රස්ථාර අංක 2. 3 - ජාතින් අනුව ජනගහනය (2016) - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය*




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය (2018)

ප්‍රදේශයේ නිවාස ව්‍යාප්තිය පිළිබඳව සැලකිලිමත්වීමේදී, ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ (2016) දත්ත වාර්තා අනුව 2001 වර්ෂයේ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පැවති නිවාස සංඛ්‍යාව 27,542 ක් වන අතර, වර්ෂ 2011 දී නිවාස ප්‍රමාණය 35,137 කි. 2001 - 2011 කාල සීමාව සඳහා වාර්ෂික නිවාස වර්ධන වේගය 2.16% ක් පමණ වී ඇති අතරම, තදාසන්න ප්‍රදේශ වන අවිස්සාවේල්ල, හෝමාගම, මහරගම ආදී පළාත් පාලන ප්‍රදේශ සමඟ සැසඳීමේදී එය මධ්‍යස්ථ මට්ටමක පවතින අතර, මෙම කාලපරිච්ඡේදය තුල ඇතිවූ ජනගහන වර්ධනයට සාපේක්ෂව ප්‍රදේශයේ නිවාස සංයුතිය තීරණය වී ඇත.

*වගු අංක 2. 3 - ප්‍රදේශයේ නිවාස ව්‍යාප්තිය (2001 - 2011)*

| වර්ෂය | නිවාස සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| 2001 | 27,542 | 01 |
| 2011 | 35,137 | 2.16 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සංඛ්‍යාලේඛනයන්ට අනුව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල එක් නිවසක පදිංචි පුද්ගලයින් සංඛ්‍යාව 3.8 ක් වේ. මුළු දිවයිනටම මෙම අගය 3.9 ක් වන අතර, කොළඹ දිස්ත්‍රික්කයේ 4.1 ක් වේ. සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නිවාස සංයුතිය පහත පරිදි වේ.

*වගු අංක 2. 4 - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නිවාස වර්ග අනුව නිවාසවල සංයුතිය (2011)*

| තත්ත්වය | නිවාස සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|
| තනි නිවාස | 33,839 | 96.31 |
| අනුයුක්ත නිවාස උප ගෘහ | 160 | 0.45 |
| තට්ටු නිවාස සුපිරි තට්ටු නිවාස | 04 | 0.01 |
| යුගල නිවාස ලයින් කාමර/ පේළි නිවාස | 953 | 2.71 |
| පැල්පත් මුඩුක්කු හා වෙනත් | 181 | 0.52 |
| **එකතුව** | **35,137** | **100** |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)

ප්‍රදේශයේ වැඩිම නිවාස ඝනත්වයක් පෙන්නුම් කරනුයේ කොස්ගම, හංවැල්ල, පහත්ගම, කුඩළුවිල, කුඩාකන්ද, ගලගෙදර, පාදුක්ක, අරුක්වත්ත යන ග්‍රාම නිලධාරී වසම්වල වන අතර, අඩුම ඝනත්වය දඹෝර, උඩගම, කනම්පැල්ල, දිගන, ඉලුක්ඕවිට යන ග්‍රාම නිලධාරී වසම්වල පවතී. ප්‍රධාන මාර්ග පදනම් කරගෙන ඉහළ රේඛීය සංවර්ධනයක් සිදුවී ඇති අතර, මීට ප්‍රධාන හේතුව වී ඇත්තේ ඒ ඔස්සේ දිවෙන අපරව්‍යුහ පහසුකම් හා සංවර්ධනය කළ හැකි ඉඩම් පැවතීමයි. ප්‍රදේශයේ ව්‍යාප්තවී ඇති නිවාස වර්ගීකරණය සැලකීමේදී තනි මහලේ සහ දෙමහල් නිවාස වැඩි වශයෙන් පැතිරීමක් ප්‍රදේශය පුරා දැකිය හැකිය. නිවාස ඉදිකිරීමේදී බිත්ති, ගෙබිම, වහලය සඳහා යොදාගන්නා ද්‍රව්‍යයන් සැලකිල්ලට ගෙන ස්ථිර, අර්ධ ස්ථිර හා අඩු පහසුකම් ලෙස වර්ගීකරණය වගු අංක 2.5 මගින් දක්වා ඇත.

*වගු අංක 2.5 - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නිවාසවල තත්ත්වය අනුව වර්ගීකරණය (2011)*

| කාණ්ඩය | නිවාස ඒකක ගණන | ප්‍රතිශතය (%) |
|---|---|---|
| ස්ථිර | 32,326 | 92 |
| අර්ධ ස්ථිර | 2,108 | 06 |
| අඩු පහසුකම් හා වෙනත් | 703 | 02 |
| **එකතුව** | **35,137** | **100** |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)

ඉහත දත්ත පදනම් කරගනිමින් සැලසුම් ප්‍රදේශයේ නිවාස ඝනත්වය පිළිබඳව විග්‍රහ කිරීමේදී, ඉන් 92% ක් පමණ මිනිස් වාසය සඳහා සුදුසු තත්ත්වයක පවතින අතර, 6% කට පමණ ප්‍රමාණවත් අපරව්‍යුහ පහසුකම් සැපයිය යුතු මට්ටමක පවතී. මෙම නිවාස ඒකක තුන්තාන, වලව්වත්ත, කුඩලුවිල, වේරගොල්ල, දිගන, සුදුවැල්ල, කොඩිකන්ද ආශ්‍රිත ප්‍රදේශවල ව්‍යාප්තව ඇති අතර, 2% ක් පමණ වන අඩු පහසුකම් සහිත නිවාසද සංවර්ධනය කළ යුතු නේවාසික ඒකක ලෙස හඳුනාගෙන ඇත.

භූමියේ බෑවුම් සහිත බව සහ වතු කෘෂිකාර්මික කටයුතු, සංරක්ෂිත වනාන්තර, අවම අපරව්‍යුහ පහසුකම් පැවතීම යනාදිය නිවාස ඝනත්වය අඩුවීමට බලපා ඇත. ප්‍රදේශය තුළ වරින්වර ක්‍රියාත්මක වී ඇති රජයේ ඉඩම් බෙදාදීමේ ව්‍යාපෘතිය තුලින් ජනගහනය හා නේවාසික ඒකක ප්‍රදේශ කිහිපයකට සංකේන්ද්‍රණය කර ඇති අතර, එම කරුණුද නිවාස ඝනත්වය වැඩිවීමට බලපා ඇත. ප්‍රදේශයේ ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන වන හංවැල්ල, පාදුක්ක සහ කොස්ගම ආශ්‍රිතව අනවසර නේවාසික ඒකක 50 ක් පමණ ඉදිවී ඇති අතර, අලුත් අම්බලම, සුදුවැල්ල යන ප්‍රදේශයන් හැරුණු කොට අනෙකුත් ප්‍රදේශයන්හි නිවාස විසුරුණු ස්වභාවයකින් යුක්ත වේ. කෙසේ වෙතත් දැනට ඉදිරිපත් වී ඇති සංඛ්‍යාලේඛන අනුව නිවාස අහිමි ජනගහනයක් සීතාවක ප්‍රදේශයේ නොමැතිවීම විශේෂ ලක්ෂණයකි. එමෙන්ම අනවසර ඉදිකිරීම් වැඩිවීමේ ප්‍රවණතාවයන්ද නොමැති බව නිරීක්ෂණය විය. නමුත් පවත්නා නිවාසවල පහසුකම් තවදුරටත් වැඩිදියුණු කළ යුතු මට්ටමක පවතී.

සැලසුම් බල ප්‍රදේශය තුල මාර්ග ජාලය ගැන සලකා බැලීමේදී පවතින “A” ශ්‍රේණියේ මහා මාර්ග ලෙස ප්‍රදේශයේ උතුරු සහ බටහිර මායිම් ඔස්සේ වැටී ඇති කොළඹ - රත්නපුර, අලුත්පාර (හයිලෙවල් මාර්ගය) සහ කොළඹ - හංවැල්ල පරණ පාර (ලෝලෙවල් මාර්ගය) හඳුනාගත හැකිය. “B” ශ්‍රේණියේ මාර්ග ලෙස ගලගෙදර - හොරණ මාර්ගය, කෝට්ටෙ - බෝපෙ මාර්ගය, තුම්මෝදර - පුවක්පිටිය මාර්ගය, කළුඅග්ගල - ලබුගම මාර්ගය, බෝපෙ - දඹෝර - ලබුගම මාර්ගය ආදී මාර්ගයන් ව්‍යාප්ත වී ඇත. ඊට අමතරව ප්‍රදේශය පුරා විහිදී ඇති අනෙකුත් මාර්ග ජාලයන් සැලකීමේදී, බහුලව පටු මාර්ග ජාලයන්ගෙන් යුක්ත බව හඳුනාගත හැකිය. සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල මාර්ග පද්ධතියේ විහිදී ඇති ආකාරය පහත වගු අංක 2.6 මගින් සහ සිතියම් අංක 2.3 මගින් පෙන්නුම් කර ඇත.

*වගු අංක 2. 6 - ප්‍රදේශයේ මාර්ග පද්ධතියේ විහිදීම*

| අයිතිය | සංඛ්‍යාව |
|---|---|
| මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග | 08 |
| පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ග | 19 |
| ප්‍රාදේශීය සභාව සතු මාර්ග | 881 |
| දුම්රිය මාර්ග | 01 |

මූලාශ්‍රය : මාර්ග සංවර්ධන අධිකාරිය (2016),
පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය (2016),
සීතාවක ප්‍රාදේශීය සභාව (2016)

කොළඹ - අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගයේ දිනකට රථවාහන දිවා කාලයේ 30,000 ක් පමණ ප්‍රමාණයක් කොළඹ දෙසට ධාවනය වන අතර, අවිස්සාවේල්ල දෙසට 20,000 ක් පමණ ගමන් කරනු ලබන බව සංගණන අනුව වාර්තා වේ.

කොළඹ, කොටුව සිට අවිස්සාවේල්ල දක්වා වැටී ඇති කැලණිවැලි දුම්රිය මාර්ගය සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හරහා කි.මී. 25 ක් පමණ දුරක විහිදී ඇති අතර, පාදුක්ක, අරුක්වත්ත, අංගම්පිටිය, උග්ගල, පින්නවල, වග, කඩුගොඩ, කොස්ගම හරහා මෙම මාර්ගය ගමන් ගනී. දෛනිකව 20,000 ක පමණ ජනගහනයක් ප්‍රවාහන කටයුතු සඳහා දුම්රිය සේවය භාවිතා කරනු ලබන බවට දුම්රිය දෙපාර්තමේන්තු වාර්තා අනුව තහවුරු වේ.

***සිතියම් අංක 2. 3 - ප්‍රදේශයේ පවත්නා මාර්ග පද්ධතිය (2017)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

ප්‍රදේශයේ ඇති අනෙකුත් අපරව්‍යුහ පහසුකම් ගැන සාකච්ඡා කිරීමේදී සීතාවක ප්‍රාදේශීය සභා ප්‍රදේශයම ආවරණය වන ආකාරයට විදුලිබල සැපයුම ව්‍යාප්තව පවතින අතර, එහි ඉහළ සැපයුමක් ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය මගින් සිදුකරනු ලබයි (සිතියම් අංක 2.4). ප්‍රදේශයේ විදුලිය ලබාගන්නා ප්‍රභවයන් සම්බන්ධයෙන් වගු අංක 2.7 මගින් පැහැදිලි කෙරේ.

*වගු අංක **2. 7** - ප්‍රදේශයට විදුලිබලය ලබාගන්නා ප්‍රභවයන්*

| බලශක්ති ප්‍රභවය | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
|---|---|---|
| විදුලිබල මණ්ඩලය | 20,004 | 12,805 |
| ග්‍රාමීය ජල විදුලිය මගින් | 20 | 28 |
| භූමිතෙල් | 1,383 | 567 |
| සූර්ය බලශක්තිය | 09 | 14 |
| වෙනත් | 21 | 09 |

මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)

ප්‍රදේශයේ විදුලි පරිභෝජනයෙන් 90% ක් පමණ නේවාසික භාවිතය සඳහා වන අතර, වාණිජ හා කර්මාන්ත ආදී අනෙකුත් භාවිතයන් සඳහා වන ප්‍රමාණය අවම මට්ටමක පවතින බව වගු අංක 2.8 මගින් පැහැදිලි වේ.

*වගු අංක 2. 8 - විදුලිබල පරිභෝජන අවශ්‍යතා*

| භාවිතය | පාරිභෝගික සම්බන්ධතා සංඛ්‍යාව | |
|---|---|---|
| | එකලා | තෙකලා |
| නේවාසික | 30,354 | 368 |
| වාණිජ | 2,353 | 511 |
| කර්මාන්ත | 27 | 207 |
| හෝටල් | 19 | 54 |
| ආගමික | 82 | 17 |

මූලාශ්‍රය: ලංකා විදුලිබල මණ්ඩලය, හංවැල්ල, අවිස්සාවේල්ල (2016)

***සිතියම් අංක 2. 4 - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විදුලි සැපයුම පවතින ප්‍රදේශ***




මූලාශ්‍රය : ලංකා විදුලිබල මණ්ඩලය (2017)

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජල පරිභෝජනය සලකා බැලීමේදී, මුළු ජනගහනයෙන් 80% ක්ම පානීය ජල අවශ්‍යතා සපුරාගැනීම සඳහා ළිං ජලය භාවිතා කරයි. නල ජල පහසුකම් ඉල්ලුමට වඩා වැඩි සැපයුමක් ලබාදීමේ හැකියාව ප්‍රදේශය තුල පැවතුණද, ගතානුගතික සම්ප්‍රදායික ක්‍රමවලට මෙම ප්‍රදේශයේ

තවමත් වැඩි නැඹුරුවීමක් දක්නට ඇත. සිතියම් අංක 2.5 මගින් ප්‍රදේශය පුරා නල ජල පහසුකම් පැතිරී ඇති ආකාරය පෙන්නුම් කරනු ලබයි. සමස්ථයක් ලෙස ප්‍රදේශයේ පවතින නිවාස සංඛ්‍යාව සමඟ සැසඳීමේදී 15% ක් සඳහා මේවනවිට නල ජල පහසුකම් ලබාගෙන ඇති අතර, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් 2012 වර්ෂයේ ජල සම්බන්ධතා 1,715 ක ප්‍රමාණයක් ලබාදී ඇති අතර, ඉන් 95% ක ප්‍රමාණයක් නේවාසික භාවිතයන් සඳහා වේ.

***සිතියම් අංක 2. 5 - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නල ජලය පවතින ප්‍රදේශ***




මූලාශ්‍රය : ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (2017)

ප්‍රදේශයේ අධ්‍යාපන පහසුකම් පිළිබද සලකා බැලීමේදී, ප්‍රධාන වශයෙන් අධ්‍යාපන පරිපාලන කටයුතු හංවැල්ල අධ්‍යාපන කොට්ඨාශ කාර්යාලය හා පාදුක්ක අධ්‍යාපන කොට්ඨාශ කාර්යාල මගින් සිදු කෙරේ.

සැලසුම් සීමාව තුල 2001 වර්ෂය වනවිට රජයේ පාසැල් 53 ක් පිහිටා ඇති බවට අධ්‍යාපන කාර්යාල වාර්තාවන්හි සඳහන් වන අතර, ඒ තුල ජාතික පාසැල් 02 ක් අන්තර්ගත වේ. ප්‍රදේශයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 30,102 ක් පමණ වන අතර, ඉන් ප්‍රදේශයේ පවත්නා පාසැල්වල අධ්‍යාපනය ලබන්නේ 20,848 ක පමණ ශිෂ්‍ය සංඛ්‍යාවක් වේ (වගු අංක 2.9). ඉතිරි ප්‍රමාණය සැලසුම් බල ප්‍රදේශයෙන් පිටත ජනප්‍රිය පාසැල් කරා ඇදීයාමක් දක්නට ලැබේ.

*වගු අංක **2. 9** - පාසැල් වර්ගීකරණය - සීතාවක ප්‍රාදේශීය සභාව **(2001)***

| පාසැල් වර්ගීකරණය | පාසැල් සංඛ්‍යාව | ප්‍රතිශතය (%) | ශිෂ්‍ය සංඛ්‍යාව | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|
| 1AB | 02 | 04 | 4,457 | 21 |
| 1C | 07 | 13 | 5,707 | 27 |
| 2 | 28 | 53 | 8,269 | 40 |
| 3 | 16 | 30 | 2,415 | 12 |
| **එකතුව** | **53** | **100** | **20,848** | **100** |

මූලාශ්‍රය : අධ්‍යාපන කාර්යාලය, හංවැල්ල (2017)

පාසැල්වල ගුරු - සිසු අනුපාතය සලකා බැලීමේදී, මායාදුන්න මහා විද්‍යාලය, කනම්පැල්ල කණිෂ්ඨ විද්‍යාලය ආදී පාසැල්වල ගුරු - සිසු අනුපාතය යහපත් මට්ටමක පවතී. සමස්ථයක් ලෙස ප්‍රදේශයේ පාසැල් පද්ධතියෙන් 70% ක් තුල ප්‍රමාණවත් ගුරුවරු සංඛ්‍යාවක් සිටින බවටත්, ඒ අනුව ප්‍රදේශයේ පාසැල්වල 30% ක ප්‍රමාණයක ගුරු හිඟයක් පවතින බවටත් අධ්‍යාපන කාර්යාල වාර්තාවන්හි සඳහන් වේ.

පාසැල් පද්ධතිය තුල අපරව්‍යුහ පහසුකම් පිළිබඳව අවධානය යොමුකිරීමේදී, 50% ක පමණ පාසැල් සඳහා අපරව්‍යුහ පහසුකම් ප්‍රමාණවත් පරිදි නොමැති බවටද එම වාර්තාවල සඳහන් වේ. ප්‍රදේශයේ ශිෂ්‍ය සංඛ්‍යාව 100 ට අඩු පාසැල් 14 ක් පිහිටා ඇති අතර, පහසුකම් අඩුවීම හේතුවෙන් එම පාසැල් වැසීයාමේ තර්ජනයක් දක්නට ඇත. පසුගිය වර්ෂ කිහිපය තුල එවැනි පාසැල් 04 ක් වැසී ඇති බව අනාවරණය වී ඇත.

සැලසුම් ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය ගැන සාකච්ඡා කිරීමේදී, ප්‍රදේශයේ නේවාසික බිම් කට්ටිවලින් වැඩි ප්‍රතිශතයක් පර්චස් 10 ට වැඩි බිම් කොටස් වන බැවින්, එදිනෙදා නිවාසවලින් ජනනය වන ඝන අපද්‍රව්‍ය තම ගෙවත්ත තුලම කළමනාකරණය කර ගැනීම සාමාන්‍ය තත්ත්වයක් වුවද, සැලසුම් බල ප්‍රදේශයේ ප්‍රධාන නගර මධ්‍යස්ථාන වන හංවැල්ල, පාදුක්ක, කොස්ගම යන නාගරික ප්‍රදේශ ආශ්‍රිතව අපද්‍රව්‍ය රැස්වීම සිදුවන අතර, දිනකට ටොන් 08 - 09 ත් අතර ප්‍රමාණයක් කුණු කසල එක්වන බවට වාර්තා වේ. (වගු අංක 2.10) දිනකට එකතුවන කසල ප්‍රමාණයෙන් 80% ක පමණ දිරාපත් ද්‍රව්‍ය වන අතර, 20% ක්

නොදිරන කැලි කසල වේ. කොස්ගම නගරයට ආසන්නව කැලිකසල කළමනාකාරීත්ව වැඩසටහනක් ක්‍රියාත්මක වන අතර, එහිදී සතියට දෙවරක් කසල ටොන් 04 ක් පමණ ප්‍රතිචක්‍රීකරණය සඳහා යොදා ගැණුනද, එය මෙම ගැටළු විසඳීමට ප්‍රමාණවත් නොවන අතර, විධිමත් කසල කළමනාකරණ පද්ධතියක අවශ්‍යතාවය ප්‍රදේශයට අත්‍යවශ්‍ය සාධකයක්ව පවතී.

*වගු අංක **2. 10** - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෛනික ඝන අපද්‍රව්‍ය සංයුතිය*

| භාවිතය | ප්‍රමාණය (ටොන්) |
|---|---|
| කාබනික හා දිරාපත්වන | 8 |
| දිරාපත් නොවන | 1 |
| වීදුරු හා වෙනත් | 0.78 |
| **එකතුව** | **9.78** |

මූලාශ්‍රය : සීතාවක ප්‍රාදේශීය සභාව (2018)

*වගු අංක 2. 11 - දෛනිකව එකතුවන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය*

| භාවිතය | ප්‍රමාණය (ටොන්) |
|---|---|
| නේවාසික | 1.7 |
| වෙළඳ | 2.6 |
| අනෙකුත් ස්ථාන (හෝටල්, බැංකු, ගොඩනැගිලි) | 0.35 |

මූලාශ්‍රය : සීතාවක ප්‍රාදේශීය සභාව (2018)

ප්‍රදේශයේ ව්‍යාප්තව පවතින විවෘත ප්‍රදේශ හා විවේක, විනෝද පහසුකම් පිළිබඳ සැලකිලිමත්වීමේදී, පවත්නා පාසැල් ක්‍රීඩාංගන සඳහා පොදු මහජනතාවට ප්‍රවේශවීමට අවකාශය විවෘත වුවද, එය සමස්ථ ජනගහනයට ප්‍රමාණවත් මට්ටමක නොමැත. ප්‍රදේශයේ පවත්නා පොදු විවේක ස්ථාන ලෙස, ලෙෂර් වර්ල්ඩ් උද්‍යානය, ඉලුක්විට තෙත් කලාපීය උද්‍යානය (සීතාවක උද්භිද උද්‍යානය), තුම්මෝදර දිවියමල ඇල්ල, වක් ඔය ආදී ප්‍රදේශ හඳුනාගත හැකි අතර, බහුල වශයෙන් ස්වභාවික වනාන්තර හා මහා පරිමාණ රබර් වතු, කුඹුරු හා පහත් බිම් පැවතීම ජනතාවගේ විවෘත භූමි අවශ්‍යතාවය සපුරාලීමට බොහෝ පිටුවහලක් වී ඇත. ප්‍රදේශයේ පවත්නා හඳුනාගත් විවෘත භූමි ස්ථාන ඇමුණුම් අංක 01 මගින් දක්වා ඇත.

ප්‍රදේශයේ පවතින සෞඛ්‍ය පහසුකම් ගැන සැලකිලිමත් වීමේදී, පාදුක්ක ප්‍රදේශයේ පිහිටි දිසා රෝහලත්, කොස්ගම ප්‍රදේශයේ පිහිටි පර්යන්ත රෝහලත් ප්‍රධාන ස්ථානයක් ගනී. මීට අමතරව, ආයුර්වේද බෙහෙත්

ශාලා 04 ක්ද, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල 02 ක්ද, රජයේ වෛද්‍ය සායන 24 ක් හා මධ්‍යම බෙහෙත් ශාලා 08 ක් පවතින බවට වාර්තා වේ. තවද, පෞද්ගලික රෝහල් 02 ක්ද මගින් ප්‍රදේශයේ සෞඛ්‍ය අවශ්‍යතා සපුරනු ලැබේ. එයට පරිබාහිරව සැලකිය යුතු ජනගහනයක් ප්‍රදේශයෙන් පිටත රෝහල් කරා සෞඛ්‍ය පහසුකම් ලබාගැනීම සඳහා ඇදීයන බවට සිදුකරන ලද ක්ෂේත්‍ර සමීක්ෂණ මගින් අනාවරණය විය.

## 2.3 සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම

සීතාවක සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පසුබිම් අධ්‍යයනයක් සිදුකළ අතර, ඒ සඳහා අවට පවතින බල ප්‍රදේශ හරහා ඇති විය හැකි බලපෑම් සැලසුම් ප්‍රදේශය තීරණය කිරීමේදී සැලකිල්ලට ගන්නා ලදී. ඒ අනුව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වටා ඇති අනෙකුත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන් තුලින් එල්ල වන හිතකර හා අහිතකර තත්ත්වයන් ප්‍රධාන වශයෙන් අධ්‍යයනය කරන ලදී.

සීතාවක බල ප්‍රදේශය සීතාවකපුර නගර සභා බල සීමාව සහ සීතාවක ප්‍රාදේශීය සභා බල සීමාව ලෙස පරිපාලන ඒකක 02 කින් සමන්විත වේ. සීතාවකපුර නගර සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්මේ රෙගුලාසි 1999 වර්ෂයේ නීතිගත කර ඇත. මෙම බල ප්‍රදේශ දෙක වටා කඩුවෙල මහ නගර සභා බල ප්‍රදේශය, මහරගම මහ නගර සභා බල ප්‍රදේශය හා ගම්පහ, කළුතර, රත්නපුර, කෑගල්ල යන දිස්ත්‍රික්ක ස්ථානගත වී පවතී. කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි කඩුවෙල හා හෝමාගම බල ප්‍රදේශ සඳහා වෙනම සංවර්ධන සැලසුම් සකස් කර ඇති අතර, කළුතර, රත්නපුර, ගම්පහ හා කෑගල්ල දිස්ත්‍රික්කයන් තුල පිහිටි ඒ ඒ බල ප්‍රදේශයන් සඳහා වෙන වෙනම සංවර්ධන සැලසුම් සකස් කරමින් පවතී.

ඒ අනුව සිතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී. සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 02 කින් සමන්විත වේ. හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ග්‍රාම නිලධාරි වසම් 36 ක් පිහිටා ඇති අතර, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම නිලධාරී වසම් 54 ක් පිහිටා ඇත.

ඒ අනුව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් සම්පූර්ණ ග්‍රාම නිලධාරී වසම් 90 ම (ඇමුණුම් අංක 02) ආවරණය වන පරිදි උතුරින් කැලණි ගඟ, බටහිරින් පුස්සැලි ඔය, නැගෙනහිරින් ඇස්වතු ඔය හා දකුණින් හොරණ ප්‍රාදේශීය සභා බල සීමාවෙන්ද මායිම්ව ඇති සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සැලසුම් ප්‍රදේශය ලෙස නිර්ණය කර ඇත (සිතියම් අංක 2.6).

***සිතියම් අංක 2. 6 - සීතාවක ප්‍රාදේශීය සභාවේ පිහිටීම***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

# පරිච්ඡේදය 03

# සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

## 3.1 හැඳින්වීම

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඇති විභවතාවයන් සහ ගැටළුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කරන ලද අතර, වර්තමානයේ පරිශීලනය වන කෙටුම්පත් සංවර්ධන සැලැස්ම මගින් එම ගැටළුවවලට ප්‍රමාණවත් විසඳුම් ලැබී නොමැත. ඒ අනුව ප්‍රදේශයේ පවතින සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය ලබාගෙන තිරසාර සංවර්ධනයක් කරා ළඟාවීම පිණිස අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස නව සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය පැන නැඟී ඇත.

මෙහිදී, ප්‍රදේශයට බලපාන ප්‍රධානම ගැටළුකාරි තත්ත්වයන් කිහිපයක් හඳුනාගන්නා ලද අතර, එය පහත පරිදි වේ.

1. ප්‍රදේශය තුල පවතින හරිත වැස්ම සීඝ්‍රයෙන් පහළ වැටීමේ ප්‍රවණතාවය
2. පවත්නා ගල්කැඩීමේ හා පශු සම්පත් කර්මාන්ත ආශ්‍රිතව නේවාසික පදිංචිකරුවන් සමඟ සිදුවන ඝට්ටනයන්
3. ප්‍රදේශයේ ඇතිවන ගංවතුර ආපදා තත්ත්වයන්
4. ප්‍රදේශයේ පවතින ස්වභාවික සම්පත් තිරසාර සංවර්ධනය සඳහා උපයෝගී කර නොගැනීම

### 3.1.1 හඳුනාගන්නා ලද ගැටළු

**ගැටළු අංක 01 : ප්‍රදේශයේ පවතින හරිත වැස්ම සීඝ්‍රයෙන් අඩු වීමේ ප්‍රවණතාවයක් පැවතීම**

කොළඹ දිස්ත්‍රික්කය තුල පවතින පළාත් පාලන ආයතන අතරින් ඉහළම හරිත වැස්මකින් සමන්විත වන ප්‍රදේශයක් ලෙස සීතාවක සැලසුම් ප්‍රදේශය හඳුනාගත හැකි අතර, එම හරිත වැස්ම සීඝ්‍රයෙන් අඩුවීමේ ප්‍රවණතාවයක් පවතී.

ඒ සඳහා සිදුකරන ලද එන්ඩීවීඅයි (NDVI) විශ්ලේෂණය හරහා 1995 හා 2016 තෙක් සැලසුම් ප්‍රදේශය තුල පිහිටි හරිත ආවරණය සම්බන්ධයෙන් අධ්‍යයනය කරන ලද අතර, එම හරිත ආවරණය අඩුවීමක් ඒ තුලින් පිළිබිඹු කෙරේ. ඒ අනුව 1995 වර්ෂයේදී ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයෙන් 95% ක් ලෙස එනම්, හෙක්ටයාර 20,000 ක වැඩි ප්‍රදේශයක් ආවරණය වන ලෙස පැවති හරිත වැස්ම, වර්ෂ 2016 වනවිට 73% ක් දක්වා එනම්, හෙක්ටයාර 15,600 ක් දක්වා අඩු වී ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව සිතියම් අංක 3.1 1995

වර්ෂයේදී බල ප්‍රදේශය තුල පැවති හරිත වැස්ම පෙන්නුම් කරන අතර, සිතියම් අංක 3.2 මගින් 2016 වර්ෂයේ පැවති හරිත වැස්ම පෙන්නුම් කෙරේ.

***සිතියම් අංක 3. 1 - සැලසුම් ප්‍රදේශය තුල හරිත වැස්ම අඩුවීමේ ප්‍රවණතාවය - NDVI විශ්ලේෂණය (1995)***




මූලාශ්‍රය : **NDVI** විශ්ලේෂණය, නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***සිතියම් අංක 3. 2 - සැලසුම් ප්‍රදේශය තුල හරිත වැස්ම අඩුවීමේ ප්‍රවණතාවය - NDVI විශ්ලේෂණය (2016)***




මූලාශ්‍රය : **NDVI** විශ්ලේෂණය, නාගරික සංවර්ධන අධිකාරිය (2018)

එන්ඩීවීඅයි (NDVI) විශ්ලේෂණය මගින් 1995 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කොළඹ දිස්ත්‍රික්කයේ හරිත වැස්ම වෙනස් වී ඇති ආකාරය හා 1985 වර්ෂයේ සිට වර්ෂ 2014 තෙක් කොළඹ දිස්ත්‍රික්කය සඳහා පිළියෙල කර ගන්නා ලද භූමි පරිහරණ රටා සිතියම් (සිතියම් අංක 3.3) විශ්ලේෂණය කිරීමේදී, කොළඹ දිස්ත්‍රික්කයේ භූමි පරිහරණ රටාවෙන් වැඩි ප්‍රමාණයක් නාගරීකරණය සඳහා යොමු වී ඇති ආකාරය පෙන්නුම් කෙරේ. එය ක්‍රමයෙන් සීතාවක සැලසුම් ප්‍රදේශය කරා පැතිරී යන බව ඒ තුලින් නිරීක්ෂණය විය. (රූප සටහන් අංක 3.2)

එම සැලසුම් බල ප්‍රදේශයේ හරිත වැස්මේ අඩුවීමේ දිශානතිය පහත රූප සටහන් අංක 3.1 මගින් නිරීක්ෂණය කළ හැකිය.

*රූප සටහන් අංක **3. 1** - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හරිත වැස්ම අඩුවීමේ දිශානතිය*




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය (2018)
බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය

***රූප සටහන් අංක 3. 2 - කොළඹ දිස්ත්‍රික්කයේ භූමි පරිහරණ රටාව වෙනස් වී ඇති ආකාරය (1985, 2005, 2014)***









මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය (2018)

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සිදුකරන ලද සංවේදීතා විශ්ලේෂණය (Sensitivity Analysis) මගින් පාරිසරික සංවේදී ප්‍රදේශ නාගරික සංවර්ධන ප්‍රදේශ බවට පරිවර්තනය වෙමින් පවතින බවට තහවුරු වන අතර, එය සිතියම් අංක 3.4 මගින් පැහැදිලිව හඳුනාගත හැකිය.

ඒ අනුව සැලසුම් ප්‍රදේශය තුල අධි සංවේදී පරිසර හා මධ්‍යම සංවේදී පරිසර ප්‍රදේශ පවතින බව පෙන්වා දිය හැකි අතර, එය මුළු භූමි ප්‍රමාණයෙන් 70% ක ප්‍රතිශතක් ගෙන ඇත. මෙම අධි සංවේදී පරිසර පද්ධති බහුලව කැලණි ගඟ හයිලෙවල් මාර්ගය හා අවිස්සාවේල්ල මාර්ගය අතර මෙන්ම ඇස්වතු ඔය, පුස්සැලි ඔය හා වක් ඔය ආශ්‍රිත ප්‍රදේශ තුල පිහිටා ඇත.

නමුත් මෙම අධි සංවේදී පාරිසරික ප්‍රදේශවලට හානිගෙන දෙන අයුරින් ප්‍රධාන ප්‍රවේශ මාර්ග ඔස්සේ එනම් හයිලෙවල් හා ලෝලෙවල් මාර්ගයන් ඔස්සේ වාණිජ හා අනෙකුත් සංවර්ධන ක්‍රියාකාරකම් බහුල වශයෙන් පැතිර පවතින ආකාරය ප්‍රධාන වශයෙන් නිරීක්ෂණය කළ හැකි වේ. එය සංවර්ධන පීඩන විශ්ලේෂණය (Development Pressure Analysis) සිතියම් අංක 3.5 මගින් පෙන්නුම් කරන අතර, අනාගත සංවර්ධන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය විය හැකි ප්‍රදේශ හඳුනාගැනීම සඳහා සිදුකරන ලද විභවතා විශ්ලේෂණය (Potential Analysis) සිතියම් අංක 3.6 මගින් පෙන්නුම් කෙරේ.

**සිතියම් අංක 3. 3 - *සැලසුම් ප්‍රදේශයේ භූමි පරිහරණ සැලැස්ම (2016)***




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***සිතියම් අංක 3. 4 - පාරිසරික සංවේදීතා දර්ශකය (2017)***




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***සිතියම් අංක 3. 5 - සංවර්ධන පීඩන විශ්ලේෂණය (2017)***




මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***සිතියම් අංක 3. 6 - විභවතා විශ්ලේෂණය (2017)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය

එමෙන්ම පවතින ආකාරයටම සංවර්ධන කටයුතු පැතිරීයාම තවදුරටත් සිදුවුවහොත්, අවිධිමත් අයුරින් අධි පරිසර සංවේදී හා මධ්‍යම පරිසර සංවේදී ප්‍රදේශයන් දැඩි ලෙස තර්ජනයකට ලක්වන බව පෙනී යයි. එම නිසා වර්තමානයේදී මෙන්ම අනාගතයේදී සැලසුම් ප්‍රදේශයට ආවේණික වූ ස්වභාවික පරිසර පද්ධතියට තර්ජනයක් පවතින බව නිගමනය කළ හැකි අතරම, ස්වභාවික හරිත වැස්ම අඩුවන ආකාරයේම ගැටළුකාරී සංවර්ධන දිශානතියක් තවදුරටත් මෙම සැලසුම් ප්‍රදේශය තුල ඇතිවිය හැකි බව නිගමනය කළ හැකිය.

ඉහත අධ්‍යයනයන්ට අමතරව ප්‍රදේශයේ පරිසර උෂ්ණත්වය සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලද අතර, එහිදී ගූගල් අන්තර්ජාල සැපයුම් ඔස්සේ සුළං දිශා විශ්ලේෂණ මෘදුකාංගය මගින් වර්ෂ 1996 සිට වර්ෂ 2017 දක්වා කොළඹ දිස්ත්‍රික්කයේ සුළගේ ගමන් දිශාව විශ්ලේෂණය කරන ලදී. ශ්‍රී ලංකාවේ සුළං හැමීමේ ප්‍රවණතාවයෙන් 59% ක් පමණ ප්‍රතිශතයක්ම බටහිර සහ නිරිත දිශාවේ සිට නැගෙනහිර දිශාව දක්වා ගමන් කරන බවට සිදුකරන ලද අධ්‍යයනය තුලින් අනාවරණය විය. ඒ අනුව බස්නාහිර දෙසින් කොළඹ හා තදාසන්න ප්‍රදේශ හරහා සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය දෙසට සුළං හැමීම සිදුවේ. වර්තමානය වන විට කොළඹ සහ තදාසන්න ප්‍රදේශ අධි ඝනත්වයකින් යුතුව සංවර්ධනය වී ඇති අතර, එබැවින් ඒ අවට ප්‍රදේශයේ පාරිසරික උෂ්ණත්වයේ පැතිරීම ඉහළ අගයක් ගෙන ඇත. මෙහි බලපෑම සුළගේ ගමන් දිශාවත් සමග සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වෙත යොමු වීමේ ඉහළ ප්‍රවණතාවයක් ඇති අතරම, දැනට එම ප්‍රදේශයේ පවතින හරිත වැස්ම මගින් මෙම උෂ්ණත්වය සැලකිය යුතු මට්ටමකින් යාමනය කිරීම සඳහා උපකාරී වී ඇති නමුත්, තවදුරටත් මෙම ප්‍රදේශයේ පරිසර සංවේදී කලාප හා හරිත වැස්ම බාධාවන අයුරින් සංවර්ධන ක්‍රියාකාරකම් සිදුවුවහොත්, කොළඹ දිස්ත්‍රික්කයෙන්ම ජීවත්වීමට සුදුසු $26C^0$ ක පමණ උෂ්ණත්වයකින් යුත් පරිසර පද්ධතියක් පවතින මෙම සැලසුම් ප්‍රදේශයට තවදුරටත් අයහපත් ප්‍රතිඵලයන් ඇතිවීමට වැඩි ප්‍රවණතාවයක් පවතී.

***රූප සටහන් අංක 3. 3 - කොළඹ දිස්ත්‍රික්කයේ උෂ්ණත්වය වෙනස්වීම***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

ඒ අනුව ඉහත සඳහන් කරන ලද හරිත වැස්ම අඩුවීමේ ප්‍රවණතාවය සැලසුම් ප්‍රදේශයේ පවතින හා අධි පරිසර සංවේදී පද්ධතියක් සහ මධ්‍යම පරිසර සංවේදී ප්‍රදේශ විනාශවීම සඳහා පවතින තර්ජනය හේතුකොට ගෙන, කලාපීය මෙන්ම ජාතික වශයෙන් මෙම ප්‍රදේශය ආරක්ෂා කරගැනීමට අත්‍යවශ්‍ය බව හඳුනාගන්නා ලදී.

## ගැටළු අංක 02 : පවත්නා ගල්කැඩීමේ හා පශු සම්පත් කර්මාන්ත ආශ්‍රිතව නේවාසික පදිංචිකරුවන් සමඟ සිදුවන ඝට්ටනයන්

ප්‍රදේශයේ කර්මාන්ත සමඟ නේවාසික පදිංචිකරුවන් අතර සිදුවන ඝට්ඨනය සැලසුම් ප්‍රදේශයේ හඳුනාගන්නා ලද අනෙක් ප්‍රධාන ගැටළුව වේ. එහිදී සීතාවක ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳව සැලකීමේදී, පශු සම්පත් කර්මාන්තය සහ කළුගල් කැඩීමේ කර්මාන්තය ප්‍රධාන ස්ථානයක් ගන්නා අතරම, පාරිසරික වශයෙන් ඉහළ අයහපත් ප්‍රතිඵල ගෙනදෙන්නා වූ කර්මාන්ත ගණයට අයත් බව නිරීක්ෂණය වේ. එහිදී, සැලසුම් ප්‍රදේශය පුරා පැතිර පවතින කුඩා පරිමාණ හා මහා පරිමාණ සත්ත්ව ගොවිපලවල් ප්‍රදේශය පුරා පැතිර පවතී. එය සිතියම් අංක 3.7 මගින් නිරූපණය කෙරේ.

සැලසුම් ප්‍රදේශය තුල ඇති පාදුක්ක පරිපාලන ප්‍රදේශය තුල පමණක් වර්ෂ 2016 දී ගවයින්, එළුවන්, කුකුළන්, ඌරන් සම්බන්ධ ගොවිපලවල සේවයේ නියැලෙන පවුල් සංඛ්‍යාව 1,700 ගන්නා අතර, එය පාදුක්ක ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ ජීවත්වන මුළු පවුල් සංඛ්‍යාවෙන් 10% ක ප්‍රතිශතයක් ගනී.

එමෙන්ම සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජීවත්වන මුළු පවුල් සංඛ්‍යාවෙන් 17% ක ප්‍රතිශතයක් පශු සම්පත් කර්මාන්තය ආශ්‍රිතව නියැලී සිටී. ඒ අනුව සැලසුම් ප්‍රදේශය තුල සත්ත්ව ගොවිපලවල් 15,000 ක් පමණ ව්‍යාප්තව පවතී. මෙහිදී ප්‍රධාන වශයෙන්ම කොළඹ දිස්ත්‍රික්කය තුල සත්ත්ව නිෂ්පාදනවල ඉහළ ප්‍රතිශතයක් මෙම ප්‍රදේශයේ පවත්නා ගොවිපලවල් හරහා ලබාදේ. එම නිසා සැලසුම් ප්‍රදේශය තුල ප්‍රධාන කර්මාන්තයක් ලෙස සත්ත්ව පාලනය ප්‍රචලිතව පවතින බවට හඳුනාගත හැක වේ.

නමුත් ප්‍රදේශය තුල වසම් මට්ටමින් ගැටළු නිරීක්ෂණය කිරීමේදී පෙනී යන්නේ, වැඩි වසම් ප්‍රමාණයකට ඌරු, කුකුල් ආදී ගොවිපලවල්වල අපද්‍රව්‍ය පරිසරයට අනිසි ලෙස මුදාහැරීම හරහා බොහෝ සමාජ පාරිසරික ගැටළු පැන නැඟී ඇති බවයි.

***සිතියම් අංක 3. 7 - පශු සම්පත් කර්මාන්තය ව්‍යාප්තිය (2017)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

මෙහිදී, මහා පරිමාණ ඌරු හා කුකුල් ගොවිපලවල් ආශ්‍රිත අපද්‍රව්‍ය පුස්සැලි ඔය, වක් ඔය හා කැලණි ගඟ වැනි ප්‍රධාන ජල මාර්ගවලට මුදාහැරීමේ ප්‍රවණතාවය දිනෙන් දින වැඩිවන ගැටළුකාරී තත්ත්වයක් බවට පත්වී ඇත.

තවද, සත්ත්ව ගොවිපලවල් හරහා නිකුත් වන දුර්ගන්ධය, සත්ත්ව අපද්‍රව්‍ය ජලාශ්‍රිත පරිසරය සමඟ මුසුවීම වැනි ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් පළාත් පාලන ආයතනයට හා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලැබෙන පැමිණිලි සංඛ්‍යාවේ ඉහළයාමක් පෙන්නුම් කරයි. ඒ සම්බන්ධයෙන් වර්ෂ 2016 දී පැමිණිලි 45 ක්ද, 2017 වර්ෂය වනවිට පැමිණිලි 70 දක්වාද ඉහළ ගොස් ඇත.

මෙහිදී වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වර්තාවන වසම් ලෙස, ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්පත් පැතිකඩ - 2016 වාර්තාවලට අනුව ඉහළ කොස්ගම දකුණ, ඇස්වත්ත උතුර, පහළ කොස්ගම නැගෙනහිර ඒ, කනම්පැල්ල බටහිර ආදී වසම් උදාහරණ ලෙස පෙන්වා දිය හැකිය.

***ප්‍රස්ථාර අංක 3. 1 - පශු සම්පත් කර්මාන්තය සම්බන්ධ පැමිණිලි***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ( 2018)

*රූප සටහන් අංක **3. 4** - ප්‍රදේශයේ පශු සම්පත් කර්මාන්ත ව්‍යාප්තිය*



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

සැලසුම් ප්‍රදේශයේ බහුලව ව්‍යාප්තව පවතින තවත් ප්‍රධාන කර්මාන්තයක් ලෙස කළුගල් කැඩීමේ කර්මාන්තය හඳුනාගත හැකිය. එම කර්මාන්තය නේවාසික ප්‍රදේශයන් ආසන්නව පිහිටා තිබීම හේතුකොටගෙන නේවාසික පදිංචිකරුවන් හා කළුගල් කැඩීමේ කර්මාන්තකරුවන් අතර ගැටළුකාරීකාරී තත්තවයන් ඇතිවීම එම කර්මාන්තය සඳහා ඉහළ තර්ජනයක් වී ඇත.

මෙහිදී වැඩි ජනඝනත්වයකින් යුත් ප්‍රදේශ හා ප්‍රධාන කළුගල් කැඩීමේ කර්මාන්ත පිහිටා ඇති ප්‍රදේශ සංවර්ධනය කිරීමේදී පෙනීයන්නේ, පැහැදිලිවම ජනඝනත්වය අධික ප්‍රදේශ ආසන්නයේම කළුගල් කැඩීමේ කර්මාන්ත පිහිටා ඇති බවය (සිතියම් අංක 3.8 මගින් ප්‍රදේශයේ ජනඝනත්වය හා සිතියම් අංක 3.9 මගින් ප්‍රදේශයේ කළුගල් කැඩීමේ කර්මාන්ත ව්‍යාප්තිය පෙන්නුම් කෙරේ.) .

සැලසුම් ප්‍රදේශය තුළ නේවාසික පදිංචිකරුවන් බහුලව සිටින නුරානිවත්ත, කජුවත්ත, කුඩාකන්ද, දිද්දෙණියවත්ත, දෙල්ගස්හේන වැනි ප්‍රදේශවල මහා පරිමාණ ලෙස කළුගල් කැඩීමේ කර්මාන්තයන් සිදු කෙරේ.

***සිතියම් අංක 3. 8 - ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජනඝනත්වය අධික ප්‍රදේශ (2016)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***සිතියම් අංක 3. 9 - ප්‍රධාන කළුගල් කැඩීමේ කර්මාන්ත පිහිටා ඇති ප්‍රදේශ***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

සැලසුම් බල ප්‍රදේශය තුල කළුගල් කැණීම් සම්බන්ධව ලැබී ඇති පැමිණිලි දත්ත සංඛ්‍යාව වර්ෂ 2015 හා 2017 සැලකුවිට, පැමිණිලි 06 සිට පැමිණිලි 12 දක්වා වැඩි වී ඇති බව නිරීක්ෂණය කළ හැකිය. එය පහත ප්‍රස්ථාර අංක 3.2 මගින් නිරූපණය කළ හැකිය.

***ප්‍රස්ථාර අංක 3. 2 - කළුගල් කර්මාන්තය සම්බන්ධ පැමිණිලි***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

සැලසුම් ප්‍රදේශය තුල කළුගල් කැඩීමේ කර්මාන්ත පිහිටි ස්ථාන 47 ක් පමණ හදුනාගෙන ඇති අතර, මහා පරිමාණයෙන් සිදුකරන කළුගල් කැඩීමේ කර්මාන්ත 06 ක් ප්‍රධාන වශයෙන් හදුනාගත හැකිය. එම කළුගල් කැඩීමේ කර්මාන්ත 11 ක් සඳහා මහජන විරෝධතා එල්ල වී ඇති බව සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ලැබී ඇති දත්ත විශ්ලේෂණයේදී නිරීක්ෂණය විය. එහිදී ලැබී ඇති පැමිණිලි ලෙස ගොඩනැගිලි ඉරිතැලීම්, මාර්ග අබලන්වීම්, අධික දූවිල්ල, අධික ශබ්දය, සැලසුම් ප්‍රදේශයේ භූමි දර්ශනය විනාශවීම, ජෛව විවිධත්වයන්ට බලපෑම් එල්ලවීම, භූගත ජලය සිඳීයාම නිසා ළිං ජලය භාවිතා කරන ජනතාව අපහසුතාවයට පත්වීම ආදී පාරිසරික හා සමාජීය ගැටළුවලට මෙම ප්‍රදේශයේ ජනතාවහට මුහුණදීමට සිදුවී ඇත. එම ගැටළු පහත රූපසටහන් හරහාද නිරීක්ෂණය කළ හැකිය.

***රූප සටහන් අංක 3. 5 - ප්‍රදේශයේ කළුගල් කැඩීමේ කර්මාන්තය***



මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

ප්‍රදේශයේ ප්‍රධාන කර්මාන්තයන් ලෙස පැතිරී පවතින පශු සම්පත් කර්මාන්තය හා කළුගල් කැඩීමේ කර්මාන්තයන් හරහා අර්ධ නාගරීකරණයක් සහිත නේවාසික පරිසරයකින් යුක්ත මෙම සැලසුම් ප්‍රදේශයට පැන නැඟී ඇති පාරිසරික හා සමාජීය ගැටළුකාරී තත්ත්වයන් අවම කරගැනීම සඳහා නව සැලසුමක අවශ්‍යතාවයක් පැන නැඟී ඇති බවට හඳුනාගත හැකිය.

## ගැටළු අංක 03 : ප්‍රදේශයේ ඇතිවන ගංවතුර ආපදා තත්ත්වයන්

සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2016 වසරේ වාර්තා අනුව ගංවතුර නිසා පූර්ණ හා අර්ධ හානි වූ නිවාස හා ගොඩනැගිලි සංඛ්‍යාව පිළිවෙලින් 2,135 හා 108 ලෙස වාර්තා වී ඇත. එහිදී, සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ගංවතුර තත්ත්වය නිසා පීඩාවට පත් වූ ජන සංඛ්‍යාව 9,000 ක් පමණ වේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දත්තයන් අනුව 2016 වසරේදී සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල ගංවතුර ආපදාවට ලක් වූ ග්‍රාම නිලධාරි වසම් ප්‍රමාණය 34 ක් වන අතර, පාදුක්ක ලේකම් කොට්ඨාශය තුල ගංවතුර ආපදාවට ලක් වූ ග්‍රාම නිලධාරි වසම් ප්‍රමාණය 05 කි. මීට අමතරව ගංවතුරට ලක් වී ඇති භූමි ප්‍රමාණය අක්කර 5,871 ක් වන අතර, එය සැලසුම් ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස ගත්කළ 11% කි. තවද, මෙම ගංවතුරට ලක්වන ප්‍රදේශ මූලිකවම පිහිටා ඇත්තේ, දැනටමත් අර්ධ නාගරීකරණය හොඳින්ම සිදු වී පවතින හා ජන ඝනත්වය අධිකම ප්‍රදේශ තුල වේ. එහිදී විශේෂයෙන් හයිලෙවල් මාර්ගය දෙපස අවිස්සාවේල්ල මාර්ගය දෙපස හංවැල්ල මාර්ගය, කොස්ගම නගරය ආශ්‍රිතව හා පාදුක්ක නගරය මූලික කරගනිමින් මෙම ගංවතුර තර්ජනයට ලක්වන බව නිරීක්ෂණය කළ හැකිය.

පසුගිය අවුරුදු කිහිපය තුල කැලණි ගඟ පිටාර ගැලීම මගින් සිදු වී ඇති ගංවතුර තත්ත්වයන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දත්ත විශ්ලේෂණය කර බැලීමේදී පෙනී යන්නේ, ප්‍රධාන වශයෙන්ම අඩි 05 සිට 09 දක්වා විචලනයන් සහිතව ගංවතුර තත්ත්වයන්ට ඉහත සඳහන් කළ ප්‍රදේශ ලක්වන බවයි. (සිතියම් අංක 3.10 මගින් ගංවතුර බලපෑමට ලක්වන ප්‍රදේශ පෙන්නුම් කර ඇත.)

තවදුරටත්, වර්ෂ 2010 සිට 2016 දක්වා දත්ත විශ්ලේෂණය කර බැලුවිට නිරීක්ෂණය වුයේ, කැලණි ගඟ පිටාර ගැලීමෙන් ඇති වන ගංවතුර තර්ජනයන් ඇතිවීමේ සම්භාවිතාවය අවුරුද්දක හා උපරිම අවුරුදු 10 ක කාල පරාසයක් තුල නිරන්තරයෙන් සිදුවන බවයි. ජනතාවගේ දෛනික ජීවිතයට සැලකිය යුතු තර්ජනයක් මෙම ගංවතුර තර්ජනයන් හරහා ඇතිවන බව මින් පැහැදිලි වන අතර, මෙම ගැටළුවද අවම කරමින් තිරසාර සංවර්ධනයකට යාම සඳහා නව සංවර්ධන සැලසුමක අවශ්‍යතාවය හඳුනාගත හැක.

***සිතියම් අංක 3. 10 - ගංවතුර තර්ජනයට ලක්වන ප්‍රදේශ (2016)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## ගැටළු අංක 04 : ප්‍රදේශයේ පවතින ස්වභාවික සම්පත් තිරසාර සංවර්ධනය සඳහා උපයෝගී කර නොගැනීම

ප්‍රදේශයේ පවතින විභවතාවයන් සම්බන්ධයෙන් අධ්‍යයනය කරන ලද අතර, එහිදී ප්‍රදේශයේ පවත්නා ස්වභාවික විභවතාවයන්, සැලසුම් ප්‍රදේශයේ තිරසාර සංවර්ධනය උදෙසා පූර්ණ ලෙස උපයෝගී කරගෙන නොමැති බවට හඳුනාගත් අතර, පවත්න විභවතාවයන් කාණ්ඩ 03 ක් යටතේ හඳුනාගන්නා ලදී.

### අ) ස්වභාවික සංවේදී පරිසර පද්ධතියක් පිහිටා තිබීම

මෙම සැලසුම් ප්‍රදේශය තුල වර්ෂය පුරාම පවතින වර්ෂාව හේතුකොට ගෙන සදාහරිත හා පතනශිලි මිශ්‍ර වනාන්තර සහිත පරිසර පද්ධතියක් දක්නට ලැබේ. ඒ සඳහා නිදර්ශනයන් ලෙස ඉලුක්ඕවිට, ඉදිකඩ මූකලාන ආදී පරිසර පද්ධතීන් පෙන්වා දිය හැකිය. මීට අමතරව, සීතාවක ප්‍රාදේශීය සභාව තුල ඇති තෙත්බිම් ප්‍රධාන ලෙස කුඹුරු හා වගුරු බිම්වලින් සමන්විත වන අතර, ඒ අතරින් බරාව තෙත්බිම් කලාපය ප්‍රධාන තැනක් ගනී.

මීට අමතරව, කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ප්‍රධාන දිය ඇළි වන ඇල්ල උඩ ඇල්ල, රන්මුදු ඇල්ල, කුමාරි ඇල්ල, දඹෝර ආදී දිය ඇළි පද්ධතීන්ද පිහිටා ඇත්තේ, මෙම සැලසුම් බල ප්‍රදේශය තුල වීම විශේෂත්වයක් ලෙස සැලකිය හැකිය. සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට උතුරු මායිම්ව ගලාබසින කැලණි ගඟ ප්‍රධානව වක් ඔය, පුස්සැලි ඔය ප්‍රධාන ජල රටාවට දායකත්වය සපයන අතර, ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති කුඩා ඇළ මාර්ගවලින් සමන්විත ජල බස්නා රටාවන් දක්නට ලැබේ. ඒ හරහා ප්‍රදේශයේ පාරිසරික වටිනාකම් තවදුරටත් වැඩිකිරීමට ඉවහල් වී ඇත. මීට අමතරව ජාතික වටිනාකමක් පවතින ප්‍රධාන ජලාශ්‍ර වන ලබුගම ජලාශ්‍රය හා කලටුවාන ජලාශ්‍රයන් හා බැඳුණු පාරිසරික පද්ධතියක් ප්‍රදේශය තුල පිහිටා තිබීමද ප්‍රදේශයේ පවතින පාරිසරික වටිනාකම වැඩිකිරීමට ඉවහල් වී ඇත. නමුත් මෙම ප්‍රදේශයේ පවත්නා ස්වභාවික සම්පත් සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා සැලකිය යුතු මට්ටමකින් දායක කරගෙන නොමැත.

### ආ) සංරක්ෂණය කර නොමැති පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු ස්ථාන පිහිටා තිබීම

ප්‍රසිද්ධ විජයබා කොල්ලයෙන් පසු කුඩා රාජ්‍යයක් ලෙස ඇරඹි සීතාවක ප්‍රාදේශීය සභාව පසුව යටත් විජිත පාලන සමයටද අයත් විය. බුදු දහම මූලික කරගත් පුරාවිද්‍යාත්මක ස්මාරක, මහා විහාර සම්ප්‍රදායට මෙන්ම ඉංග්‍රීසි, ලන්දේසි හා පෘතුගීසි පාලන සමයන්ට අයත් ගොඩනැගිලි ස්මාරක මේ ප්‍රදේශය පුරාම පැතිර ඇත.

*රූප සටහන් අංක 3. 6 - ප්‍රදේශයේ පවතින පුරාවිද්‍යාත්මක ස්ථාන කිහිපයක්*




මූලාශ්‍රය : හංවැල්ල, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සම්පත් පැතිකඩ (2016)

නමුත් මේවා සංරක්ෂණය කර තිරසාර සංවර්ධනයකට දායක කරගෙන නොමැති බව දක්නට ලැබේ. එහිදී සංරක්ෂණය නොකරන ලද පුරාවිද්‍යාත්මක සම්පත් (සිතියම් අංක 3.11) පිහිටා ඇති ප්‍රදේශ පිළිබඳ විස්තර පහත පරිදි වගු අංක 3.1 මගින් පෙන්වා දිය හැකිය.

*වගු අංක 3. 1 - සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (හංවැල්ල) තුල සංරක්ෂණය නොකරන ලද පුරාවිද්‍යාත්මක ස්ථාන*

| අනු අංකය | ස්ථානය |
|---|---|
| 1. | පැරණි බලකොටුව |
| 2. | දිය අගල |
| 3. | පැණි වරකා ගස |
| 4. | ගල් බංකුව |
| 5. | ලෙව්කේ පිළිරුව |
| 6. | අවමඩල ලෙන |
| 7. | පඤ්ඤාගුල |
| 8. | ගල් පොකුණ |
| 9. | නෝර්ත් අම්බලන්වත්ත ගල් ලෙන් 02 |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තාව (2016)

***වගු අංක 3. 2 - පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල සංරක්ෂණය නොකරන ලද පුරාවිද්‍යාත්මක ස්ථාන***

| අනු අංකය | ස්ථානය |
|---|---|
| 1. | පැරණි ගෘහ නිර්මාණ ශිල්පය විදහා දක්වන මොරකැලේ බංගලාව |
| 2. | ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් කුරගල කන්දේ පිහිටි ගල් ලෙන |
| 3. | පාදුක්ක තානායම |
| 4. | එලුවාගල පුරාණ රජ මහා විහාරය |
| 5. | රාජසිංහ යුගයට අයත් නිකවාකන්ද නිදන්ගල |
| 6. | පැරණි බිතු සිතුවම් සහිත පරම ධම්ම නිකේතනාරාමය |
| 7. | ඉංග්‍රීසි පාලන යුගයට අයත් සංගිලි පාලම |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තාව (2016)

මේ අනුව පුරාවිද්‍යාත්මක වටිනාකමක් පවතින මෙම සම්පත් සංරක්ෂණය කරමින් සංචාරක කර්මාන්තය සඳහා යොදාගනිමින් ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ ආර්ථිකය ඉහළ නැංවීම මෙන්ම සැලසුම් ප්‍රදේශයේ පෞඩත්වය වැඩිකිරීම සඳහාත් නව සංවර්ධන සැලසුමක් ඉවහල් කරගත හැකි බව පෙන්වා දිය හැකිය.

### ඇ) පරිසර හිතකාමී හෝටල් සහ නිකේතන ආදිය පිහිටා තිබීම

ජාතික මට්ටමේ අවධානයට යොමු වී ඇති සීතාවක උද්භිද උද්‍යානය, ලෙෂර් වර්ල්ඩ් වැනි ස්වභාවික පරිසරය හා බැඳුණු ආර්ථික ක්‍රියාකාරකම් මෙම ප්‍රදේශය තුල ස්ථාපිතව ඇත.

***රූප සටහන් අංක 3. 7 - ප්‍රදේශයේ පවතින පරිසර හිතකාමී හෝටල් සහ නිකේතන***




මූලාශ්‍රය : හංවැල්ල, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කාර්යාල, සම්පත් පැතිකඩ (2016)

සැලසුම් බල ප්‍රදේශයේ පවතින මෙම සම්පත් හරහා ප්‍රදේශය වෙත දේශීය හා විදේශීය පිරිස් ආකර්ශණය කරගනිමින් පරිසර හිතකාමී අයුරින් ප්‍රාදේශීය ආර්ථිකය සවිමත් කිරිමෙහිලා නව සංවර්ධන සැලැස්ම ඉවහල් කරගත හැකි බව පෙන්වා දිය හැකිය.

***සිතියම් අංක 3. 11 - සංරක්ෂණය නොකරන ලද පුරාවිද්‍යාත්මක ස්ථාන (2017)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## 3.2 පාර්ශවියකරුවන්ගේ අදහස්

ප්‍රදේශයේ විවිධ ආයතන හා අංශ නියෝජනය කරන පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරන ලද අදහස් හා යෝජනා “එන්විවෝ” (NVIVO) මෘදුකාංගය භාවිතයෙන් විශ්ලේෂණය කරන ලද අතර, ඒ සම්බන්ධයෙන් නගර නිර්මාණ ශිල්පී පාර්ශවකරුවන් විසින් වැඩිදුරටත් විශ්ලේෂණය කර, සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී.

*රූප සටහන් අංක **3. 8** - පාර්ශවියකරුවන්ගේ අදහස්*




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

පාර්ශවකරුවන්ගෙන් ලබාගත් ගැටළු අතර, විධිමත් යටිතල පහසුකම්වල පවත්නා හිඟතාවය ගංවතුර හා නායයෑම් ප්‍රවණතාවය, කළුගල් කැඩීමේ කර්මාන්ත සමඟ නේවාසික පදිංචිකරුවන්ගේ ගැටුම්, වන විනාශය හා කෘෂි කාර්මික ඉඩම් වෙනත් භාවිතයන් සඳහා පරිවර්තනය වීම ආදිය හඳුනාගෙන ඇත. විභවතාවයන් ලෙස ඉහළ ශ්‍රම බලකායක් සිටීම, කෘෂි කාර්මික ඉඩම් බහුලව පැවතීම, පවත්නා කර්මාන්ත, ලබුගම හා කලටුවාන ජල මූලාශ්‍ර පැවතීම ආදිය හඳුනාගෙන ඇත.

පාර්ශවීයකරුවන්ගේ අදහස් හා යෝජනාවන් හා ඉහත සාකච්ඡා කළ හඳුනාගත් ගැටළුකාරී තත්ත්වයන් අතර සමානාත්මතාවයක් ඇති බැවින්, එම ගැටළු අවම කරගැනීම සඳහා විධිමත් නව සංවර්ධන සැලැස්මක් නිර්මාණය කිරීම අත්‍යවශ්‍යව පවතින බව හඳුනාගත හැක.

මෙම පරිච්ඡේදය ඔස්සේ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ඇති ගැටළු හා විභවතාවයන් සම්බන්ධයෙන් මුලික අධ්‍යයනයක් සිදුකර ඇති අතර, ඒ සම්බන්ධව මනා දැක්මක් ඔස්සේ ප්‍රදේශයේ ජීවත් වන හා සංක්‍රමණය වන ජනගහනයට සුවදායී පරිසරයක් නිර්මාණය කරදීම උදෙසා සවිස්තරාත්මකව විග්‍රහයක් මෙම සැලැස්මේ දෙවන කොටස මගින් සිදුකර ඇත.

# දෙවන කොටස

# පරිච්ඡේදය 04
# සංවර්ධන සැලසුම් රාමුව

## 4.1 සංවර්ධන සැලැස්මේ දැක්ම

**"The Charismatic Green Terrace of Colombo"**

**"කොළඹ දිස්ත්‍රික්කයේ ආශිර්වාදාත්මක හරිත නගරය"**




## 4.2 දැක්මෙහි ප්‍රකාශනය

අනාගත සීතාවකපුර සංවර්ධනයේ දිශානතිය උදෙසා ඉදිරි දැක්ම ගොඩනැඟීමේදී ප්‍රදේශයේ ජාතික හා ප්‍රාදේශීය කලාපීය වැදගත්කම, සංවර්ධන ප්‍රවණතා, පවත්නා සම්පත්, පහසුකම් හා විභවතා, භූගෝලීය පිහිටීම ආදී සියලු අංශ පිළිබඳව සැලකිලිමත් වන ලදී.

මෙම ප්‍රදේශයටම ආවේණික වූ මුළු භූමි පරිහරණයෙන් 73% ක් ආවරණය වන පරිදි විහිදී ඇති ස්වභාවික හරිත වැස්ම පදනම් කරගනිමින් හා එය සංරක්ෂණය කරගනිමින් පරිසර හිතකාමී තිරසාර සංවර්ධනයක් කරා ගමන් කරන බව "හරිත පුරවරය" යන්නෙන් පිළිබිඹු කෙරේ. එමෙන්ම ආශිර්වාදාත්මක *(Charismatic)* යන්නෙන් ප්‍රදේශයේ විභවතා උපයෝගී කරගෙන අනන්‍ය ස්වභාවික පාරිසරික ලක්ෂණ ඔස්සේ සංවර්ධනය වන සෞභාග්‍යමත්, ආකර්ශණීය පුරවරයක් වෙත වර්ෂ 2030 දී සීතාවක ළඟාවීමට අපේක්ෂිත බව විදහා දක්වයි.

## 4.3 සංවර්ධන සැලැස්මේ අරමුණු

**ප්‍රධාන අරමුණු 03 ක් ඔස්සේ සීතාවක නගර සංවර්ධන සැලැස්ම (2019 - 2030) පිළියෙල කිරීමට අපේක්ෂා කෙරේ.**

1. කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි නීල හරිත භූදර්ශනයකින් හා විවිධාංගකෘත සංචාරක නවාතැන්පොලක් බවට පත්කිරීම. *(The Green Blue Landscape and the Diversified Eco – Tourism Destination in Colombo District)*
2. පරිසරය හා බැඳුණු කර්මාන්ත සහ සුරක්ෂිත නේවාසික නගරයක් බවට පත් කිරීම.
3. සමෘද්ධිමත් නේවාසික පුරවරයක් බවට පත්කිරීම. *(The Opulent City of Colombo)*

## 4.4 සංවර්ධන සැලැස්මේ පරමාර්ථ

### 4.4.1 අරමුණු 01

**"කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි නීල හරිත භූදර්ශනයකින් හා විවිධාංගකෘත සංචාරක නවාතැන්පොලක්" බවට පත්කිරීම. *(The Green Blue Landscape and the Diversified Eco – Tourism Destination in Colombo District)***

**පරමාර්ථ *(OBJECTIVES);***

i. 2030 වර්ෂය වන විට පවත්නා ජල මූලාශ්‍ර 100% සංරක්ෂණය කිරීම හා දැනට පවත්නා හරිත වැස්මෙන් 99% ක් සංරක්ෂණය කිරීම.
ii. වර්ෂ 2030 වන විට සැලසුම් ප්‍රදේශයේ පවතින සංවේදී පාරිසරික පද්ධතින් ආරක්ෂා වන අයුරින් සංචාරක ආකර්ශණයක් සහිත කුඩා නගර 04 ක් සංවර්ධනය කිරීම.
iii. 2030 වර්ෂයේදී ප්‍රදේශය පුරා පැතිර පවතින සංරක්ෂණය නොකරන ලද පුරාවිද්‍යා වැදගත්කමකින් යුත් ස්ථාන 17 ක් පාරිසරික සංචාරක කර්මාන්තය සමඟ ඒකාබද්ධ කර ප්‍රවර්ධනය කිරීම.
iv. වර්ෂ 2030 වන විට කැලණි ගඟ ඉවුරේ සිට මීටර් 200 ක සීමාව තුල, ස්වභාවික ආකර්ශණීය ස්ථාන පාදක කරගනිමින් හා ඇස්වතු ඔය මූලික කරගනිමින් පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම හා දිරිගැන්වීම.

v. මුළු භූමි ප්‍රමාණයෙන් හඳුනාගන්නා ලද හෙක්ටයාර් 2,135 ක් පමණ වන පාරිසරික සංවාරක ප්‍රවර්ධන කලාපය තුල පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය පවත්වා ගෙනයාම සඳහා දිරිගැන්වීම.

### 4.4.2 අරමුණු 02

**"පරිසරය හා බැඳුණු කර්මාන්ත සහ සුරක්ෂිත නේවාසික නගරයක්" බවට පත් කිරීම.**

**පරමාර්ථ *(OBJECTIVES);***

i. 2030 වර්ෂය වනවිට හෙක්ටයාර 2,216 කින් යුත් පරිසර හිතකාමී කර්මාන්ත ප්‍රදේශයක් ස්ථාපිත කිරීම.

ii. 2030 වර්ෂය වනවිට රබර් වගා බිම් 99% කින් ආරක්ෂා කරගැනීමට පියවර ගැනීම තුලින් කොළඹ දිස්ත්‍රික්කයේ රබර් කර්මාන්තය සඳහා අවශ්‍ය රබර් කිරි සැපයීමේ ප්‍රතිශතය 62% සිට 70% දක්වා ඉහළ දැමීම.

### 4.4.3 අරමුණු 03

**"සමෘද්ධිමත් නේවාසික පුරවරයක්" බවට පත්කිරීම. *(The Opulent City of Colombo)***

**පරමාර්ථ *(OBJECTIVES);***

i. 2030 වර්ෂය වන විට අධි හා මධ්‍යම පාරිසරික සංවේදී ප්‍රදේශ තුල ජීවත්වන පිරිස 50% ක් දක්වා අඩු කිරීම.

ii. 2030 වර්ෂය වනවිට නේවාසික හා සංක්‍රමණික ජනතාවට අවශ්‍ය අපරව්‍යුහ පහසුකම් 90% කින් ඉහළ නැංවීමට අවශ්‍ය පහසුකම් සැපයීම.

iii. 2030 වර්ෂය වනවිට ප්‍රදේශයේ ජීවත්වන ශ්‍රම බලකායෙන් නුපුහුණු ශ්‍රම බලකා ප්‍රතිශතය 70% සිට 40% දක්වා අඩු කිරීම.

# පරිච්ඡේදය 05

# SWOT විශ්ලේෂණය

## 5.1 විස්තරාත්මක SWOT විශ්ලේෂණය

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී හඳුනාගත් ප්‍රදේශය තුල ඇති ශක්තීන්, දුර්වලතාවයන් හා ප්‍රදේශයට බාහිරින් බලපාන අවස්ථාවන් හා තර්ජනයන් පිළිබඳ මේ තුලින් විශ්ලේෂණයක් සිදුකර ඇත.

### 5.1.1 අරමුණු 01 - කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි නීල හරිත භූදර්ශනයකින් විවිධාංගකෘත සංචාරක නවාතැන්පොලක්

ප්‍රදේශයේ මුළු භූමි පරිහරණ රටාවෙන් 42% ක පමණ ප්‍රමාණයකින් යුත් රබර් වගාව, 7.6% ක ප්‍රතිශතයකින් යුත් කුඹුරු වගාව, 1.1% ක ප්‍රතිශතයක් යුත් ජලාශ්‍රිත ප්‍රදේශ හා අනෙකුත් පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා වන අයුරින් පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය ඉහළ නැංවීම සඳහා උපයෝගී කරගැනීමට මෙමගින් අපේක්ෂා කෙරේ.

ශ (S)

1. සැලසුම් ප්‍රදේශයේ පවතින 73% ක් වු හරිත වැස්ම සහ 1.1% ක් වු ජල වැස්ම.
2. රජයේ ගැසට් මගින් ප්‍රකාශිත වු ඉදිකඩ රක්ෂිතය, ලබුගම රක්ෂිතය හා මීරියගල්ල රක්ෂිතය පිහිටා තිබීම හා ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ලබුගම හා කලටුවාව ජලාශ්‍ර පිහිටා තිබීම.
3. සංචාරක ආකර්ශණයට ලක්වන ස්වභාවික දිය ඇළි පිහිටා තිබීම.
4. ප්‍රදේශය පුරා පැතිරි ඇති පටු මාර්ග පද්ධතිය.
5. ස්වභාවික සෞන්දර්යය සමඟ මුහුවෙමින් ඇස්වතු ඔය මුලික කරගනිමින් ක්‍රියාත්මක වන ආකර්ශණීය සංචාරක ලැගුම්හල්.
6. සීතාවක රාජධානියේ උරුමය හා යටත් විජිත බලපෑම් කියාපාන ඓතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන හා නටබුන් පැවතීම.

දු (W)

1. හයිලෙවල් හා ලෝලෙවල් මාර්ග දෙපස පාරිසරික අධිසංවේදී කලාපය හරහා විහිදී ගිය අවිධිමත් සංවර්ධනය.
2. සංචාරක ආකර්ශණයට ලක්විය හැකි පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන මෙතෙක් පොදු ජනයාට විවෘතව නොතිබීම.
3. රබර් වගාව වෙනත් භූමි පරිභෝජනය සඳහා මාරුවීමේ ප්‍රවණතාවය.

අ (O)

1. ශ්‍රී ලංකාවේ සංචාරකයින්ගේ ප්‍රධාන ගමන් මාර්ගය වන බටහිර වෙරළ තීරය හා මහනුවර, අනුරාධපුර මාර්ගයන්ට මැදිව පිහිටා තිබීම.
2. ජාතික භෞතික සැලැස්ම (2017-2050) ට අනුව සංවර්ධනය කිරිමට යෝජිත ප්‍රදේශයක් ලෙසට හඳුනාගෙන තිබීම.

ත (T)

--

බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය

# ශක්තීන්

## 1. සැලසුම් ප්‍රදේශයේ පවතින 73% ක් වු හරිත වැස්ම සහ 1.1% ක් වු ජල වැස්ම.

සැලසුම් ප්‍රදේශය රබර්, කුඹුරු, පොල් ආදී කෘෂි භෝගයන්ගෙන් මෙන්ම වනාන්තරවලින් සමන්විත වු හරිත වැස්මකින් පෝෂණය වන ප්‍රදේශයකි. සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින පාරිසරික වැදගත්කම සම්බන්ධයෙන් ප්‍රස්ථාර අංක 5.1 මගින් පෙන්වා දී ඇති අතර, ඒ අනුව 2016 වර්ෂයේදී සිදුකරනු ලබන අධ්‍යයනයන් පරිදි මුළු භූමි පරිහරණ රටාවෙන් රබර් වගාව, වී වගාව, පොල් වගාව සහ වනාන්තර ඇතුළුව හරිත වැස්ම මුළු භූමි පරිභෝග රටාවෙන් 73% ක අගයක් ගෙන ඇත.

තවද, 1.1% ක ජල පෝෂක ප්‍රදේශයකින්ද මෙම භූමි පරිහරණ රටාව සමන්විත වන අතර, මෙවැනි ඉහළ හරිත වැස්මක් සහිත වු පරිසර පද්ධතින් පිහිටා තිබීම අපිරිසිදු වාතාශ්‍රය පිරිසිදු කර සෞම්‍ය පරිසරයක් නිර්මාණය කිරීම, පාංශු ඛාදනය වැලැක්වීම, සියලු සත්ත්ව ප්‍රජාව සඳහා ආහාර හා ඖෂධ ලබාදීම සහ නව රැකියා උත්පාදනය යනාදී පාරිසරික, ආර්ථික හා සමාජීය වාසි රැසක් බිහිකරලීමට පිටුවහලක් වන බවට පෙන්වා දිය හැකිය. ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව තුන්වන පරිච්ඡේදයේ සිතියම් අංක 3.3 මගින් පෙන්නුම් කර ඇත.

*ප්‍රස්ථාර අංක **5. 1** - ප්‍රදේශයේ පවතින පාරිසරික වැදගත්කම*




මූලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය (2018)

**2. රජයේ ගැසට් මගින් ප්‍රකාශිත වූ ඉදිකඩ රක්ෂිතය, ලබුගම රක්ෂිතය හා මීරියගල්ල රක්ෂිතය මෙම ප්‍රදේශය තුල පිහිටා තිබීම හා ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ලබුගම හා කලටුවාව ජලාශ පිහිටා තිබීම.**

රාජ්‍ය ආයතන මගින් රක්ෂිත ලෙස නම් කර ඇති ප්‍රධාන රක්ෂිත වනාන්තර 03 ක් මෙම සැලසුම් බල ප්‍රදේශය තුල පිහිටා ඇත. ඒ අනුව, ලබුගම රක්ෂිතය සඳහා හෙක්ටයාර 1,020 ක්ද, මීරියගල්ල රක්ෂිතය හෙක්ටයාර 240 ක ප්‍රමාණයකින්ද, ඉදිකඩ රක්ෂිතය හෙක්ටයාර 572 ක ප්‍රමාණයකින්ද යුක්ත වේ. මෙම වනාන්තර රජය මගින් රක්ෂිත ලෙස ප්‍රකාශයට පත් හා නීතිමය ප්‍රතිපාදන තුලින් දීර්ඝකාලීනව ආරක්ෂා කරගැනීමට හැකිවීම සැලසුම් ප්‍රදේශයට ඇති විශේෂ වාසියක් ලෙස හඳුනාගෙන ඇත (සිතියම් අංක 5.1).

තවද, ජාතික වශයෙන් වැදගත්කමක් උසුලන ලබුගම හා කලටුවාව ජල පිරිපහදු මධ්‍යස්ථාන මෙම ප්‍රදේශයේ පිහිටා ඇති අතර, කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 ක් ආවරණය වන පරිදි ලබුගම ජල පිරිපහදු මධ්‍යස්ථානය මගින් දෛනිකව ජල ඝන මීටර් 60,000 ක් සපයන අතර, කලටුවාව ජල පිරිපහදු මධ්‍යස්ථානය මගින් දෛනිකව ජල ඝන මීටර් 90,000 ක් සපයනු ලබයි. (ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය - 2017) මෙවැනි ජාතික වැදගත්කමකින් යුත් ජල මූලාශ්‍ර සහ රක්ෂිත මෙම බල ප්‍රදේශය තුල පිහිටා තිබීම ප්‍රදේශයට අනන්‍ය වැදගත්කමක් ලෙස හඳුනාගත හැකි අතර, නීල හරිත භූදර්ශණයකින් විවිධාංගිකෘත වූ සංචාරක නවාතැන්පලක් යන අරමුණ ළඟාකර ගැනීම සඳහා වූ ශක්තියක් ලෙසද පෙන්වා දිය හැකිය.

*රූප සටහන් අංක **5. 1** - ලබුගම හා කලටුවාව ජල පිරිපහදු මධ්‍යස්ථාන*



මූලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***සිතියම් අංක 5. 1 - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවතින රක්ෂිත ප්‍රදේශ***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

### 3. සංචාරක ආකර්ශණයට ලක්වන ස්වභාවික දිය ඇළි පිහිටා තිබීම.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ස්වභාවික සෞන්දර්යයෙන් අනූන දිය ඇළි කිහිපයක් පිහිටා ඇති අතර, ඇල්ල උඩ ඇල්ල, කුමාරි ඇල්ල, රන්මුදු ඇල්ල, දඹෝර ඇල්ල ඒ අතර ප්‍රධාන වේ. මෙම දිය ඇළි වර්තමානයේ ප්‍රදේශයේ ස්වභාව සෞන්දර්යය ආරක්ෂා කරගැනීමට මෙන්ම සංචාරක ආකර්ශණය දිනාගැනීමටද සමත්ව ඇත (සිතියම් අංක 5.2).

***සිතියම් අංක 5. 2 - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති දිය ඇළි***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

*වගු අංක **5. 1** - සීතාවක බල ප්‍රදේශය තුල පවත්නා සංරක්ෂිත දියඇළි*

| ස්ථානය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය |
|---|---|
| 1. ඇල්ල උඩ ඇල්ල | ඉලුක්ඕවිට |
| 2. කුමාරි ඇල්ල | කොස්වත්ත |
| 3. රන්මුදු ඇල්ල | පඤ්ඤාගුල |
| 4. දඹෝර ඇල්ල | දඹෝර |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තා (2016)

### 4. ප්‍රදේශය පුරා විහිදී ඇති පටු මාර්ග පද්ධතිය

ප්‍රදේශය පුරා වැඩි වශයෙන් විහිදී ඇති පටු මාර්ග පද්ධතිය සංවර්ධන කටයුතු අධෛර්යමත් කර, පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කරගැනීමට මහත් රුකුලක් වී ඇත. සමස්ථයක් ලෙස ගත්කළ ප්‍රදේශයේ A හා B ශ්‍රේණිවල මාර්ගවල සම්පූර්ණ දිග කි.මී.197 ක් පමණද, අනෙකුත් පටු මාර්ග පද්ධතීන්වල සම්පූර්ණ දිග කි.මී.1,068 ක් පමණද වේ. ප්‍රදේශය පුරා පටු මාර්ග ජාලයන් විහිදී ඇති ආකාරය සිතියම් අංක 5.3 මගින් පෙන්නුම් කෙරේ (මූලාශ්‍රය : මිනින්දෝරු දෙපාර්තමේන්තුව - 2016).

*රූප සටහන් අංක **5. 2** - ප්‍රදේශයේ පවතින පටු ප්‍රවේශ මාර්ගයන්හි තත්ත්වය*




මූලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය - 2018

***සිතියම් අංක 5. 3 - ප්‍රදේශයේ පටු මාර්ග පද්ධතිය (2016)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

### 5. ස්වභාවික සෞන්දර්යය සමඟ මුහුවෙමින් ඇස්වතු ඔය හා අනෙකුත් ආකර්ශණීය පරිසර පද්ධතිය මූලික කර ගනිමින් ක්‍රියාත්මක වන සංචාරක ලැගුම්හල්

වර්තමානය වනවිටද ස්වභාවික පරිසරය හා බැඳුණු සංචාරක ව්‍යාපාරය මූලික කරගත් ලැගුම්හල් ගණනාවක්ම ප්‍රදේශයෙහි ක්‍රියාත්මක වන අතර, දළ වශයෙන් සති අන්තයේ දෛනිකව සංචාරකයින් 8,000 ක් පමණද, සතියේ දිනවල සංචාරකයින් 2,500 ක් පමණද පැමිණෙන බව අදාළ ලැගුම්හල් හා හෝටල් හිමියන් සමඟ කරන ලද සාකච්ඡාවන්හිදී අනාවරණය විය. මෙම කර්මාන්තය පරිසර හිතකාමී වන පරිදි ස්වභාවික වටපිටාව සමඟ මුහුවෙමින් ක්‍රියාත්මක වන බව සිදුකරනු ලබන ස්ථාන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. ප්‍රදේශයේ ක්‍රියාත්මක පරිසර හිතකාමී සංචාරක නවාතැන්පොලවල් කිහිපයක් පහත රූප සටහන මගින් පෙන්නුම් කර ඇත.

***රූප සටහන් අංක 5. 3 - පරිසර හිතකාමී සංචාරක නවාතැන්පොලවල්***




මූලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය, 2018

### 6. සීතාවක රාජධානියේ උරුමය හා යටත් විජිත බලපෑම් කියාපාන ඓතිහාසික වටිනාකමින් යුත් ස්ථාන හා නටඹුන් පිහිටා තිබීම.

ඓතිහාසික සීතාවක රාජධානියට අයත් නටඹුන් මෙම සැලසුම් ප්‍රදේශය තුල සංරක්ෂණය නොවීම හේතුවෙන් වර්තමානය වනවිට ශේෂවෙමින් පවතී. සීතාවක රාජධානිය, පෘතුගීසී, ලන්දේසි, ඉංග්‍රීසි

යටත්විජිත පාලනයට නතුවීම හේතුකොටගෙන එම කාලයන්ට අයත් අංගයන්ගෙන් යුත් නටඹුන් මෙම ප්‍රදේශය තුල මේවනවිටත් දක්නට ලැබේ.

පළමුවන රාජසිංහ රජුගේ සොහොන, හංවැල්ලේ පිහිටා ඇති ලෙව්කේ පිළිමය හා ගල් බංකුව, අයර් බංගලාව, තුම්මෝදර සංගිලි පාලම ආදිය ඒ අතර ප්‍රධාන තැනක් ගෙන ඇත. ප්‍රදේශයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ස්ථාන කිහිපයක් පහත වගු අංක 5.2 හා රූප සටහන් අංක 5.4 මගින් පෙන්නුම් කර ඇත.

*වගු අංක **5. 2** - සීතාවක සැලසුම් ප්‍රදේශය තුල පවතින පුරාවිද්‍යාත්මක ස්ථාන (ග්‍රාම නිලධාරි වසම් අනුව)*

| අනු අංකය | ස්ථානය | ග්‍රාම නිලධාරි ප්‍රදේශය |
|---|---|---|
| 1. | සීතාවක මාලිගය පිහිටි කොටුව | හංවැල්ල |
| 2. | දිය අගල | හංවැල්ල නගරය |
| 3. | පැණි වරකා ගස | හංවැල්ල නගරය |
| 4. | ගල් බංකුව | හංවැල්ල නගරය |
| 5. | ලෙව්කේ පිළිරුව | හංවැල්ල |
| 6. | අවමඬල ලෙන | අකරවිට |
| 7. | පඤ්ඤාගුල | අකරවිට |
| 8. | ගල් පොකුණ | අකරවිට |
| 9. | නෝර්ත් අම්බලන්වත්ත ගල් ලෙන් 02 | වේරගොල්ල |
| 10. | පැරණි ගෘහ නිර්මාණ ශිල්පය විදහා දක්වන මොරකැලේ බංගලාව | පින්නවල |
| 11. | ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් කුරගල කන්දේ පිහිටි ගල් ලෙන | කුරගල |
| 12. | පාදුක්ක තානායම | පාදුක්ක |
| 13. | එලුවාගල පුරාණ රජ මහා විහාරය | වග උතුර |
| 14. | රාජසිංහ යුගයට අයත් නිකවාකන්ද නිදන්ගල | මලගල |
| 15. | පැරණි බිතු සිතුවම් සහිත පරම ධම්ම නිකේතනාරාමය | මලගල |
| 16. | ඉංග්‍රීසි පාලන යුගයට අයත් සංගිලි පාලම | මලගල |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තා (2016)

*රූප සටහන් අංක 5. 4 - ප්‍රදේශයේ පවත්නා ඓතිහාසික ස්ථාන කිහිපයක්*




මූලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## දුර්වලතා

**1. හයිලෙවල් හා ලෝලෙවල් මාර්ගයන් පාදක කරගනිමින් පාරිසරික අධි සංවේදී කලාපයන් හරහා විහිදී ගිය අවිධිමත් සංවර්ධනය**

සීතාවක සැලසුම් ප්‍රදේශය තුල ඇති පාරිසරික අධි සංවේදී කලාපයේ ඉහළ භූමි ප්‍රමාණයක් කැලණි ගඟ ඔස්සේ විහිදී ඇති අතරම, හයිලෙවල් හා ලෝලෙවල් මාර්ග කැලණි ගඟට සමාන්තරව පිහිටා ඇත. ප්‍රදේශයේ පවතින බොහෝමයක් සංවර්ධන කටයුතු මෙම මාර්ග දෙක ඔස්සේ අක්‍රමවත් ලෙස බිහිවන ප්‍රවණතාවයක් දක්නට ඇති අතර, එය අධි පාරිසරික සංවේදී කලාපයට තර්ජනයක් ලෙස මෙම සැලැස්මේ හඳුනාගෙන තිබේ. භූගෝලීය තොරතුරු පද්ධති ආධාරයෙන් සිදුකළ පාරිසරික සංවේදීතා විශ්ලේෂණය තුන්වන පරිච්ඡේදයේ සිතියම් අංක 3.4 මගින් පෙන්නුම් කර ඇති අතර, එමගින් අධි සංවේදී පාරිසරික කලාප පිහිටා ඇති ස්ථාන පෙන්නුම් කර ඇති අතර, ඒවා බොහෝමයක් සැලසුම් ප්‍රදේශයේ බටහිර, වයඹ, උතුරු හා ගිනිකොණ දිශාවන්හි පැතිර පවතී.

තුන්වන පරිච්ඡේදයේ සිතියම් අංක 3.8 මගින් පෙන්නුම් කර ඇති පරිදි ප්‍රදේශය පවත්නා හයිලෙවල් හා ලෝලෙවල් මාර්ගයන් එම අධි සංවේදී පාරිසරික කලාපය හරහා ගමන් කිරීම තුලින් අධි ජනගහන ඝනත්වයක් එම ප්‍රදේශය තුල ස්ථානගතව ඇති බවට නිරීක්ෂණය වේ.

## 2. සංචාරක ආකර්ශනයට ලක් විය හැකි පුරාවිද්‍යා වටිනාකමක් සහිත ස්ථාන මෙතෙක් පොදු ජනයාට විවෘත නොතිබීම.

සැලසුම් ප්‍රදේශය තුල පැතිරී ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත සංරක්ෂණය නොකරන ලද ස්ථාන 16 ක් පමණ වගු අංක 5.2 හි සඳහන් පරිදි දැනට හඳුනාගෙන ඇත. නමුත් මෙම ස්ථාන බොහොමයක් ඒවායේ පවතින වටිනාකම ඉස්මතු වන ලෙස මහජන ආකර්ශණය සඳහා සුදුසු අයුරින් එහි වටපිටාව විවෘතව නොපවතින බව ක්ෂේත්‍ර අධ්‍යයනයේදී නිරීක්ෂණය විය. එමෙන්ම ඒවායේ වැදගත්කම පිළිබඳ අවබෝධයක් හා දැනුවත් කිරීමක්ද පොදු ජනයාට නොමැතිකම දුර්වලතාවයක් ලෙස හඳුනාගන්නා ලදී.

*රූප සටහන් අංක **5. 5** - ජනතා ආකර්ශණයට ලක් නොවූ පුරාවිද්‍යාත්මක ස්ථාන කිහිපයක්*



**හංවැල්ල ප්‍රදේශයේ පිහිටා ඇති ඓතිහාසික ලෙව්කේ ස්මාරකය**



**හංවැල්ල ප්‍රදේශයේ පිහිටා ඇති පුරාණ ගල් බංකුව**

මූලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## 3. රබර් වගාව වෙනත් භූමි පරිභෝජනයන් සඳහා පරිවර්තනය වීමේ ප්‍රවණතාවය

2017 වර්ෂයේදී සැලසුම් ප්‍රදේශය තුල රබර් වගාව හෙක්ටයාර 9,000 ක පමණ වපසරියක ව්‍යාප්තව තිබූ බවට වාර්තා වේ. එය මුළු භූමි පරිහරණයෙන් 42% ක අගයක් ගෙන ඇත. එම වගාවන් ප්‍රදේශයේ සෞම්‍ය කාලගුණයට හිතකර ඉහළ විභවතාවයක් වන නමුත්, කෙටි කාලීන ආර්ථික ප්‍රතිලාභ සඳහා වර්තමානයේදී මෙම වගාව අන්නාසි වැනි වෙනත් භූමි පරිභෝජන රටා සඳහා මෙන්ම, නේවාසික කටයුතු සඳහා ඉඩම් කැබලි කිරීමේ ප්‍රවණතාවයක් පවතින බව නිරීක්ෂණය වේ (ප්‍රස්ථාර අංක 5.2).

*ප්‍රස්ථාර අංක **5. 2** - රබර් වගාව වෙනස්වීමේ සීඝ්‍රතාවය*




මූලාශ්‍රය : මිනින්දෝරු දෙපාර්තමේන්තුව (2016)

මීට අමතරව, රබර් වතු තුල කුකුල් පාලනය, ඌරු කොටු පාලනය හා පාරිසරික සංචාරක නවාතැන් ඉදිකිරීම ආදී කර්මාන්තවලට මාරුවීම හරහාද මෙම රබර් කර්මාන්තය පහළ තත්ත්වයකට වැටීමට හේතු වී ඇත. එම නිසා ප්‍රදේශයේ ඇති ප්‍රධානම කර්මාන්තයක් ලෙස ඉදිරියට පැවතීම සඳහා බලපෑම් එල්ල වී ඇත (රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව - 2017).

මෙහිදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හඳුනාගත් පරිදි ප්‍රදේශයේ රබර් වැස්ම අඩුවීම කෙරෙහි බලපෑ හේතු පහත පරිදි වේ.

1. සීතාවක ප්‍රදේශය අර්ධ නාගරීකරණය වෙමින් පවතින අතර, එහිදී අවශ්‍ය වන නේවාසික බිම් ඉල්ලුම සපුරාලීම සඳහා ඉඩම් කැබලි කිරීම.
2. රබර් වගාවේ නිරත වන කම්කරුවන්ගේ දෛනික ආදායම ඉතා පහළ අගයක් එනම්, රු.800/- ක් ගන්නා බැවින්, රබර් වගාවට නැඹුරුවන කම්කරු ජනතාව සීඝ්‍රයෙන් පහළ බසී.
3. පුහුණු දක්ෂ කැපුම්කරුවන් හිඟවීම සහ ඉදිරි වසර 10 ක් ඇතුලත දැනට සිටින කිරි කැපුම්කරුවන්ගේ 50% කට වැඩි පිරිසක් වයස්ගත වුවන් වීම.
4. රබර් වගාවෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් කැලණි ගං මිටියාවත ආසන්නයේ පිහිටීම නිසා ගංවතුර තර්ජනයට ලක්වීම හේතු කොටගෙන වගාවෙන් ඈත්වීම.
5. සුදුමල් නම් රෝග තත්ත්වයට පත්වීම නිසා රබර් වගාව විනාශ වීම.

6. විදුලිබල මණ්ඩලය හරහා ක්‍රියාත්මක ව්‍යාපෘති රබර් ඉඩම්වලට බාධාවන අයුරින් සිදුවීම නිසා ඉඩම් හිමියන් වගාව කෙරෙහි ඇති උනන්දුව අඩුවීම.

*රූප සටහන් අංක **5. 6** - රබර් ඉඩම් වෙනත් භූමි පරිභෝජන රටාවලට පරිවර්තනය වීම*




මූලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය (2018)

**අවස්ථා**

1. **ශ්‍රී ලංකාවේ සංචාරකයින්ගේ ප්‍රධාන ගමන් මාර්ගය වන බටහිර වෙරළ තීරය හා මහනුවර - අනුරාධපුර මාර්ගයන්ට මැදිව මෙම සැලසුම් ප්‍රදේශය පිහිටා තිබීම**

රූප සටහන් අංක 5.7 මගින් දැක්වෙන පරිදි සංචාරක සංවර්ධන අධිකාරිය මගින් හඳුනාගෙන ඇති ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක ගමන් මාර්ගය වන බටහිර වෙරළ තීරය හා රට අභ්‍යන්තරයට වන මාර්ගවලට මැදිව මෙම සැලසුම් ප්‍රදේශය පිහිටා ඇත. එහිදී. කොළඹ - නුවරඑළිය මාර්ගය, කොළඹ - නුවර - අනුරාධපුර - පොළොන්නරුව මාර්ගය, කොළඹ - කළුතර - හික්කඩුව - වැලිගම - මාතර - ආරුගම්බේ මාර්ගය යන සංචාරක මාර්ගවලට මැදිව සීතාවක සැලසුම් ප්‍රදේශය පිහිටා තිබීම සුවිශේෂිතාවයක් ලෙස ලෙස හඳුනාගත හැකිය. එබැවින් සැලසුම් බල ප්‍රදේශයේ පිහිටීමේ වාසිය සැලකිල්ලට ගෙන ස්වභාවික පරිසරය හා ඒකාබද්ධ වූ සංචාරක කර්මාන්තයක් ඇති කිරීම සඳහා ඉහළ වාසිසහගත තත්ත්වයක් පවතී.

*රූප සටහන් අංක 5.7 - ශ්‍රී ලංකාවේ සංචාරක ගමන් මාර්ගය*




මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය (2018)

**2. ජාතික භෞතික සැලැස්ම (2017-2050) ට අනුව සංවර්ධනය කිරීමට යෝජිත ප්‍රදේශයක් ලෙසට හඳුනාගෙන තිබීම.**

ජාතික භෞතික සැලැස්ම (2017–2050) ට අනුව සීතාවක සැලසුම් ප්‍රදේශය ආර්ථික කොරිඩෝවට මායිම් වූ පාරිසරික සංවේදී කලාපය තුල පිහිටි ප්‍රදේශයක් බවට සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය හඳුනාගෙන ඇත. ඒ අනුව, ජාතික වශයෙන් ප්‍රකාශයට පත්කර ඇති මෙවැනි සැලසුම් පරිසර හිතකාමී සංවර්ධනයක්

කරා ළඟාවීමට මහඟු අවස්ථාවක් බවට හඳුනාගෙන ඇත (දෙවන පරිච්ඡේදයෙහි රූප සටහන් අංක 2.2 මගින් පෙන්වා දී ඇත.).

### 5.1.2 අරමුණු 02 – “පරිසරය හා බැඳුණු කර්මාන්ත සහ සුරක්ෂිත නේවාසික නගරයක්” බවට පත් කිරීම.

ප්‍රදේශයේ පවතින කළුගල් කැඩීමේ කර්මාන්ත හා පශු සම්පත් කර්මාන්තය සමඟ නේවාසික කටයුතු සමඟ ඇති වී තිබෙන සට්ඨනය අවම කිරීම සඳහා එම කර්මාන්ත පරිසර හිතකාමී අයුරින් පවත්වාගෙන යාම සඳහා විශේෂ රෙගුලාසි හඳුන්වාදීම තුලින් සුරක්ෂිත නේවාසික නගරයක් බවට පත්කිරීමට අපේක්ෂා කෙරේ.

ශ (S)

1. මුළු භූමි පරිහරණයෙන් 73% ක ප්‍රතිශතයක් තවමත් නාගරීකරණයට යොමු නොවී ඇති අතර, ඉන් 41% ක් වූ භූමි ප්‍රමාණයක රබර් වගාව ව්‍යාප්තව පැවතීම.
2. ජාතික මට්ටමින් ව්‍යාප්ත වූ මහා පරිමාණ පශු සම්පත් කර්මාන්ත හා ගල් කැඩීමේ කර්මාන්ත පිහිටා තිබීම.
3. කාර්මික හා කෘෂිකාර්මික අංශවල 11% ක් වූ ශ්‍රම බලකායක් සිටීම.

දු (W)

1. කළුගල් කර්මාන්තය හා පශු සම්පත් කර්මාන්තය මගින් පාරිසරික වශයෙන් හා නේවාසිකයින්ට සිදුවන අවහිරතා.
2. ඉදිරි වසර 10 ක කාලය තුල දැනට රබර් කිරි කපන්නන්ගෙන් 50% කට වැඩි පිරිසක් වයස්ගතවූවන් වීම.

අ (O)

1. රබර් කර්මාන්තය (62%) හා පශු සම්පත් කර්මාන්තය (66%) සඳහා පවත්නා ජාතික මට්ටමේ දායකත්වයක් ලබාදීම.
2. යෝජිත රාජ්‍ය ව්‍යාපෘති
   i. යෝජිත හොරණ කර්මාන්ත පුරවරය
   ii. කැලණිවැලි දුම්රිය මාර්ගය ද්විත්ව දුම්රිය මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
3. මහානගර හා බස්නාහිර පළාත් මහනගර සැලැස්ම - 2030 තුලින් වග නගරය හරහා රත්නපුර දිස්ත්‍රික්කය දක්වා යෝජනා කර අධි බලැති විදුලි රැහැන් පද්ධතිය.

ත (T)

--

## ශක්තීන්

**1. මුළු භූමි පරිහරණයෙන් 73% ක ප්‍රතිශතයක් තවමත් නාගරීකරණයට යොමු නොවී ඇති අතර, ඉන් 42% ක් වූ භූමි ප්‍රමාණයක රබර් වගාව ව්‍යාප්තව පැවතීම.**

සැලසුම් ප්‍රදේශය තුල ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු වන ප්‍රධාන ආර්ථික කටයුත්තක් ලෙස රබර් වගාව හා ඒ ආශ්‍රිත කර්මාන්ත හඳුන්වාදිය හැකිය. එහිදී වර්තමානයේ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි මුළු හරිත භූමි ප්‍රමාණයෙන් ඉහළම ප්‍රතිශතයක් රබර් වගාව සතුවන අතර, එය ප්‍රතිශතයක් ලෙස 42% ක ප්‍රමාණයක් වේ. එම ප්‍රමාණයෙන් 11.5% ක් හෙවත් හෙක්ටයාර් 4,698 ක පමණ භූමි ප්‍රමාණයක් රජයට අයත් රබර් වතු වීම (වගු අංක 5.3) රබර් වැස්ම අඩුවීමේ ප්‍රවණතාවය අවමවීමට ඉහළ රුකුලක් වී ඇත.

*වගු අංක 5. 3 - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රජයට අයත් රබර් වතු*

| | රබර් වතු | ප්‍රමාණය (හෙක්ටයාර) |
|---|---|---|
| 1. | සාලාව වත්ත | 2,003 |
| 2. | එලිසන් වත්ත | 1,518 |
| 3. | සිරි නිවාස වත්ත | 1,042 |
| 4. | පඤ්ඤාගල වත්ත | 135 |
| | එකතුව | **4,698** |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තා (2016)

*රූප සටහන් අංක 5. 8 - ප්‍රදේශයේ පවතින මහා පරිමාණ රබර් ඉඩම්*



මූලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## 2. ජාතික මට්ටමින් ව්‍යාප්ත වූ මහා පරිමාණ පශු සම්පත් කර්මාන්ත හා ගල් කැඩීමේ කර්මාන්ත පිහිටා තිබීම.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල වාර්තා (සම්පත් පැතිකඩ වාර්තා - 2016) අනුව සැලසුම් ප්‍රදේශය තුල නිවාස මට්ටමින් සිදුකරන පශු සම්පත් කර්මාන්තය සැලකීමේදී, මහා පරිමාණ මෙන්ම කුඩා පරිමාණ සත්ත්ව ගොවිපලවල් 15,000 ක් පමණ ව්‍යාප්තව පවතින අතර, එහි නියැලෙන පවුල් සංඛ්‍යාව 1,700 ක් පමණ වේ.

සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය පුරා ප්‍රධාන කළුගල් වලවල් 47 කට ආසන්න ප්‍රමාණයක් ඇතුළුව කුඩා කළුගල් වලවල් සැලකිය යුතු ප්‍රමාණයක් ව්‍යාප්තව පවතින අතර, එමගින් බොහෝ පිරිසකට රැකියා අවස්ථා උදා වී ඇත (ප්‍රදේශයේ පශු සම්පත් කර්මාන්ත ව්‍යාප්තිය සහ කළුගල් කැඩීමේ කර්මාන්ත ව්‍යාප්තිය තුන්වන පරිච්ඡේදයෙහි සිතියම් අංක 3.7 සහ 3.9 මගින් පෙන්නුම් කර ඇත.).

*රූප සටහන් අංක **5. 9** - ප්‍රදේශයේ පශු සම්පත් හා කළුගල් කර්මාන්තයන් ව්‍යාප්තිය*



මූලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය (2018)

**3. කාර්මික හා කෘෂිකාර්මික අංශවල 11% ක් වූ ශ්‍රම බලකායක් සිටීම.**

වර්තමානයේදී හංවැල්ල, පාදුක්ක නගර මධ්‍ය ප්‍රදේශ හැර අනෙකුත් සියලු ප්‍රදේශයන් පුරා විහිදී ගිය ග්‍රාමීය කෘෂි ආර්ථික රටාවක් නිරීක්ෂණය කළ හැකි අතරම, කෘෂිකාර්මික අංශයේ නිරත වූ පිරිසද සැලකිය යුතු මට්ටමක පවතින අතර, කෘෂි හා කාර්මික අංශවල නියුතු ශ්‍රම බලකාය මුළු ජනගහනයෙන් 10% ක ප්‍රතිශතයක් ඉක්මවා ඇත. එය පහත වගු අංක 5.4 පරිදි පෙන්වා දිය හැකිය.

*වගු අංක **5. 4** - සේවා නියුක්තිය වී ඇති ආකාරය (2016)*

| *කෘෂිකාර්මික* | *කාර්මික* | *රාජ්‍ය* | *පුද්ගලික* | *වෙනත්* | *එකතුව* |
|---|---|---|---|---|---|
| 9,720 | 7,867 | 10,112 | 22,767 | 38,331 | **88,797** |
| 6% | 5% | 6.4% | 14.4% | 24.2% | **56.2** |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තා (2016)

## දුර්වලතා

**1. කළුගල් කර්මාන්තය හා පශු සම්පත් කර්මාන්තය මගින් පාරිසරික හා නේවාසිකයන්ට සිදුවන අවහිරතා**

ප්‍රදේශයේ ප්‍රචලිත කර්මාන්ත වන කළුගල් කැඩීම හා පශු සම්පත් කර්මාන්තය ප්‍රධාන ආදායම් මාර්ග ලෙස හඳුනාගත හැක. නමුත් මෙම කර්මාන්ත මගින් සිදුවන අතුරු ප්‍රතිඵල නිසා නේවාසික ජනගහනය සමඟ නිරන්තර ගැටුම් ඇතිවන බව වාර්තා වේ. ප්‍රදේශයේ ව්‍යාප්තව ඇති කළුගල් කර්මාන්ත ස්ථාන 47 ක් පවතින අතර, ඒ අතරින් මහජන විරෝධතා මතු වී ඇති ස්ථාන 11 කම කැණීම් මේවනවිටද නීතිමය ක්‍රියාමාර්ග ඔස්සේ අත්හිටුවා ඇති බවට හංවැල්ල සහ පාදුක්ක යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල දත්ත අනුව අනාවරණය වේ.

*ප්‍රස්ථාර අංක **5. 3** - කළුගල් කර්මාන්තය සහ පශු සම්පත් කර්මාන්තය සම්බන්ධ පැමිණිලි*




මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තා (2016)

ඉහත ප්‍රස්ථාර සටහන මගින් පැහැදිලි කරනු ලබන්නේ, 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කළුගල් කැඩීමේ කර්මාන්තය සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව වේ. 2015 වර්ෂයේ සිට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව 06 ක් වන අතර, එය ක්‍රමයෙන් 2017 වර්ෂය වනවිට පැමිණිලි 12 ක් දක්වා වැඩි වී ඇත. තවද, පශු සම්පත් කර්මාන්තය සඳහාද ලැබී ඇති පැමිණිලි ප්‍රමාණයේ වැඩිවීමක් 2015 වර්ෂයේදී පැමිණිලි 15 ක් වන අතර, එය 2017 වර්ෂය වනවිට පැමිණිලි 50 ක් දක්වා වූ වැඩි අගයක් ගෙන ඇත.

ප්‍රදේශය පුරා පැතිරී ඇති කළුගල් කැඩීමේ ස්ථාන හා පශු සම්පත් කර්මාන්තය ජන ජීවිතය සමඟ ඇතිවන ගැටීම් මෙම ප්‍රදේශයේ පවතින ප්‍රධාන දුර්වලතාවක් ලෙස හඳුනාගන්නා ලදී. එහිදී කළුගල් කර්මාන්තය මගින් ඇතිවන කම්පනය මගින් නිවාස හානිවීම, ප්‍රවේශ මාර්ග අබලන්වීම ආදී ගැටළු ඉස්මතු කරන අතරම, පශු සම්පත් කර්මාන්තයේ අවිධිමත් කැලිකසල කළමනාකරණය, දුර්ගන්ධය යනාදී සෞඛ්‍ය ගැටළු මතු වී තිබෙන බවට 2018 වර්ෂයේදී සිදුකරනු ලැබූ ක්ෂේත්‍ර පරීක්ෂණයන්හිදී අනාවරණය විය. කළුගල් කැඩීමේ කර්මාන්ත සහ පශු සම්පත් මගින් ආපදාවන්ට ලක්වන ග්‍රාම නිලධාරි වසම් සිතියම් 5.5 මගින් පෙන්නුම් කර ඇත.

**2. ඉදිරි වසර 10 ක කාලය තුල දැනට රබර් කිරි කපන්නන්ගෙන් 50% කට වැඩි පිරිසක් වයස්ගතවුවන් වීම.**

සීතාවක සැලසුම් ප්‍රදේශය තුල රබර් කර්මාන්තයේ නියැලෙන කිරි කපන්නන් බොහෝ පිරිසක් වයස්ගත පුද්ගලයන් බව රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් දත්ත වාර්තා මගින් තහවුරු වී ඇත. එම නිසා 50% ක අධික පිරිසකගේ වයස් සීමාව අවුරුදු 50 ඉක්මවූ පුද්ගලයන් බවට හඳුනාගෙන ඇත. ඊට අමතරව එම කර්මාන්තයේ නියැලෙන එක් පුද්ගලයෙකුගේ දිනක වැටුප රු.800/- ක් පමණ වීම හේතුකොටගෙන තරුණ පිරිස් මෙම රැකියාව හැරදමා යාමේ තත්ත්වයක් උද්ගතව පවතී.

***සිතියම් අංක 5. 4 - ග්‍රාම නිලධාරි වසම් අනුව සැලසුම් ප්‍රදේශයේ ගංවතුර, කළුගල් කැඩීමේ කර්මාන්ත හා පශු සම්පත් කර්මාන්තය නිසා බලපෑමට ලක්වන ප්‍රදේශ***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## අවස්ථා

**1. රබර් කර්මාන්තය (62%) හා පශු සම්පත් කර්මාන්තය (66%) සඳහා පවත්නා ජාතික මට්ටමේ දායකත්වයක් ලබාදීම.**

රබර් නිෂ්පාදනය ශ්‍රී ලංකාවේ තුන්වන විශාලම අපනයන භාණ්ඩය වන අතර, ඒ සඳහා ලෝක වෙළඳපොළ තුල 0.7% ක ප්‍රමාණයක දායකත්වයක් හිමි වී ඇති බවට වාර්තා වේ. (මූලාශ්‍රය : මහා බැංකු වාර්තා - 2016)

ජාතික ආර්ථිකයට කොළඹ දිස්ත්‍රික්කය තුලින් රබර් කර්මාන්තයෙන් ලැබෙන දායකත්වයෙන් 62% ක පමණ ප්‍රමාණයක් සීතාවක ප්‍රදේශයෙන් සපයනු ලබන අතර, එය පශු සම්පත් කර්මාන්තය සඳහා 66% ක දායකත්වයක් වන බවට වාර්තා වේ. (මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තා (2016) සහ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (කෘෂිකාර්මික දත්ත) - 2016)

**2. නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යන ආයතන මගින් හඳුනාගෙන ඇති යෝජිත රාජ්‍ය ව්‍යාපෘති**

- යෝජිත හොරණ කර්මාන්ත පුරවරය
- කැලණිවැලි දුම්රිය මාර්ගය ද්විත්ව දුම්රිය මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
- හෝමාගම තාක්ෂණ නගර ව්‍යාපෘතිය

ඉහත යෝජිත ව්‍යාපෘතින් හරහා සැලසුම් ප්‍රදේශය තුල සිටින කර්මාන්තකරුවන් සඳහා විවිධ අංශ ඔස්සේ පහසුකම් සපයාගත හැකි වේ යැයි අපේක්ෂා කෙරේ. හොරණ යෝජිත කර්මාන්තපුර ව්‍යාපෘතිය තුල රබර් කර්මාන්තශාලා ස්ථානගත කිරීම ප්‍රමුඛස්ථානයේලා හඳුනාගෙන තිබීම විශේෂ කරුණකි. හෝමාගම තාක්ෂණික නගර ව්‍යාපෘතිය තුලින් ප්‍රදේශයේ සිටින ජනතාවට තාක්ෂණික ඥානය දියුණු කරගැනීමට අවස්ථාවන් ළඟාකරගත හැකි වේ යැයි අපේක්ෂා කරන අතර, කැලණිවැලි දුම්රිය මාර්ග ව්‍යාපෘතිය ඉදිවීම තුලින් කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබාගැනීමටත් අවස්ථාව උදා වේ.

**3. මහානගර හා බස්නාහිර පළාත් මහනගර සැලැස්ම - 2030 තුලින් වග නගරය හරහා රත්නපුර දිස්ත්‍රික්කය දක්වා යෝජනා කර අධි බලැති විදුලි රැහැන් පද්ධතිය.**

මහානගර හා බස්නාහිර පළාත් මහනගර සැලැස්ම - 2030 තුලින් යෝජනා කර ඇති විදුලි සැලැස්මට අනුව ලංකා විදුලිබල මණ්ඩලය වග නගරය හරහා රත්නපුර දිස්ත්‍රික්කය දක්වා කිලෝ වොට් 132 ක විදුලි රැහැන් පද්ධතියක් යෝජනා කර ඇත. (රූප සටහන් අංක 5.10) ඒ අනුව සීතාවක ප්‍රදේශය තුල ස්ථාපිත කිරීමට යෝජිත වතු කෘෂිකාර්මික, පශු සම්පත්, කළුගල් කැඩීමේ කර්මාන්ත පිහිටා ඇති කලාපය තුලින් ඉහත

කිලෝ වොට් 132 ක් වූ විදුලි රැහැන් පද්ධතිය ගමන් කිරීම තුලින් එම කර්මාන්ත සඳහා අවශ්‍යඅධි වෝල්ටියතාවයෙන් යුත් විදුලි බලය ලබාගැනීමේ හැකියාවක් පවතී.

***රූප සටහන් අංක 5. 10 - යෝජිත අධි විදුලි රැහැන් පද්ධති ගමන් මාර්ගය (2030)***




මූලාශ්‍රය : මහානගර හා බස්නාහිර පළාත් සැලැස්ම (2030)

### 5.1.3 අරමුණු 03 - “සමෘද්ධිමත් නේවාසික පුරවරයක් ” බවට පත් කිරීම.

ප්‍රදේශය තුල පාරිසරික සංචාරක කර්මාන්තය (Eco Tourism) බිහිකිරීම තුලින් ජනතාව සඳහා නව ආර්ථික ක්‍රියකාරකම් හඳුන්වාදීම, රබර් ආශ්‍රිත වගාබිම් ඇතුළුව අනෙකුත් පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා වන අයුරින් සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා දිරිගැන්වීම හා ඒ සඳහා විශේෂ රෙගුලාසි හඳුන්වාදීම, අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීම යනාදී අරමුණු සාක්ෂාත් කරගැනීම මගින් ප්‍රදේශයේ ජනතාවට ජීවත් විය හැකි සුවදායී පරිසරයක් නිර්මාණය කරදීම අපේක්ෂා කරනු ලබයි.

**ශ (S)**

1. ස්වභාවික සෞන්දර්යය සමඟ බැඳීගිය පරිසරය.
2. මහා මාර්ග හා දුම්රිය ප්‍රවාහන සේවාවක් සහිත මනා කලාපීකරණ සම්බන්ධතාවයක් පවතින ප්‍රදේශයක් වීම.
3. ප්‍රදේශයේ දැනට සිටින පවුල් සංඛ්‍යාවෙන් 94% ක් පමණ ජාතික විදුලිබල පද්ධතිය හරහා විදුලිය ලබාගැනීම.

**දු (W)**

1. කැලණි ගඟ හා පුස්සැලි ඔය පිටාර ගැලීම හේතුවෙන් හදිසි ගංවතුර ආපදාවලට ලක්වන ප්‍රදේශ පැවතීම.
2. ප්‍රදේශයේ පවතින අපරව්‍යුහ පහසුකම් ප්‍රමාණවත් නොවීම.
3. ප්‍රදේශයේ ජීවත් වන ශ්‍රම බලකායෙන් 70% ක ප්‍රතිශතයක් නුපුහුණු ශ්‍රමිකයින් වීම.

**අ (O)**

1. රාජ්‍ය ආයතන මගින් හඳුනාගෙන ඇති යෝජිත සංවර්ධන ව්‍යාපෘති.
2. 2016 වර්ෂයේදී පිළියෙල කරන ලද බස්නාහිර පළාත් මහානගර සැලැස්ම (Western Region Megapolis Plan) මගින් කෘෂිකාර්මික ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන තිබීම.
3. බස්නාහිර පළාත් මහනගර සැලැස්ම යටතේ සැලසුම් ප්‍රදේශයට අදාළ විදුලි දුම්රිය මාර්ග ස්ථාපිත වීම.

**ත (T)**

1. කළුගල් කැඩීමේ කර්මාන්තය සඳහා වෙනත් ප්‍රදේශවලින් ආයෝජකයන් පැමිණීම.

## ශක්තීන්

### 1. ස්වභාවික සෞන්දර්යය සමඟ බැඳී ගිය පරිසරය

සැලසුම් බල ප්‍රදේශය තුල ස්වභාවික දිය ඇළි, ගංගා හා වෘක්ෂලතා වැනි ස්වභාවික පරිසර පද්ධතිය හා බැඳුණු නේවාසික භූමි පරිහරණ රටා සමඟ ඒකාබද්ධ වූ පරිසරයක් දක්නට ලැබීම මෙහි ඇති සුවිශේෂි ලක්ෂණයකි.

*ප්‍රස්ථාර අංක **5. 4** - සීතාවක ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ භූමි පරිහරණය (2016)*




මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තා (2016)

ඉහත ප්‍රස්ථාරය අධ්‍යයනය කිරීමේදී පෙන්නුම් කරනු ලබන්නේ, ප්‍රදේශයේ පවතින මුළු භූමි පරිහරණ රටාවෙන් හෙක්ටයාර 5,000 ක ප්‍රමාණයක් එනම්, 25% කට ආසන්න ප්‍රමාණයක් නේවාසික කටයුතු සඳහා වෙන්වී ඇති බවයි. මේ අතර, ප්‍රදේශයේ මුළු භූමි පරිහරණ රටාවෙන් හෙක්ටයාර 9,000 ක ප්‍රමාණයක (42%) රබර් ආශ්‍රිත වගාවන් පැතිර තිබෙන බවට, හෙක්ටයාර 3,000 ක වපසරියක වනාන්තරද, හෙක්ටයාර 1,500 ක පමණ භූමි ප්‍රමාණයක කුඹුරු වගාවන්ද පැතිර තිබීම තුලින් ප්‍රදේශයේ ජනතාව දිය ඇළි, ගංගා හා වෘක්ෂලතා වැනි ස්වභාවික පරිසර පද්ධතියක් හා බැඳුණු වටපිටාවක ජීවත්වන බවට මනාවට පැහැදිලි වේ.

## 2. මහා මාර්ග හා දුම්රිය ප්‍රවාහන සේවාවක් සහිත මනා කලාපීකරණ සම්බන්ධතාවයක් පවතින ප්‍රදේශයක් වීම.

සැලසුම් බල ප්‍රදේශය තුල මහා මාර්ග සහ දුම්රිය ප්‍රවාහන සේවාවක් පැවතීම සුවිශේෂී කරුණක් ලෙසට හඳුනාගත හැක. කැලණිවැලි දුම්රිය මාර්ගය මගින් මෙන්ම හයිලෙවල් හා ලෝලෙවල් වැනි A ශ්‍රේණියේ මාර්ග මගින්ද, අනෙකුත් B ශ්‍රේණියේ ප්‍රවේශ මාර්ග හරහාද සීතාවක සැලසුම් ප්‍රදේශය, වාණිජ අග නගරය වන කොළඹ නගරය හා මාලබේ, මහරගම, අවිස්සාවේල්ල, ගම්පහ, හොරණ, රත්නපුර, කෑගල්ල, දෙහිඕවිට මෙන්ම හැටන්, මඩකලපුව ආදී ඉතා දුරබැහැර ප්‍රදේශ සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට සමත්වී ඇත. පහත සිතියම් අංක 5.6 මගින් ප්‍රදේශයේ ප්‍රධාන මහා මාර්ග ජාලයන්හි පිහිටීම පෙන්නුම් කෙරේ.

***සිතියම් අංක 5. 5 - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන මාර්ග ජාලයන්***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

ප්‍රදේශයේ පවතින ප්‍රධාන දුම්රිය ස්ථාන 03 ලෙස පාදුක්ක,කොස්ගම හා වග-කහහේන යන දුම්රිය ස්ථාන හරහා සහ පින්නවල, අරුක්වත්ත, අංගම්පිටිය, උක්ගල්ල, මොරකැලේ, වටරැක, මාවල්ගම සහ කඩුගොඩ යනාදී කුඩා දුම්රිය ස්ථාන 08 කට ආසන්න ප්‍රමාණයක් මගින් ජනතාවට දුම්රිය ප්‍රවාහන පහසුකම් ලබාගත හැකිවීම අනෙකුත් ප්‍රදේශ හා සංසන්දනය කිරීමේදී ප්‍රදේශය තුල පිහිටි වැදගත් සාධකයක් ලෙස හඳුන්වාදිය හැකිය.

**3. ප්‍රදේශයේ දැනට සිටින පවුල් සංඛ්‍යාවෙන් 94% ක් පමණ ජාතික විදුලිබල පද්ධතිය හරහා විදුලිය ලබාගැනීම.**

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012) සංගණන වාර්තා අනුව සීතාවක ප්‍රාදේශීය සභා සැලසුම් බල ප්‍රදේශය තුල ජනගහනය 133,919 කි. සීතාවක සැලසුම් ප්‍රදේශය තුල ජීවත්වන පවුල් සංඛ්‍යාව වගු අංක 5.5 මගින් පෙන්නුම් කරන අතර, ඉන් පවුල් 35,003 ක් වසර 2012 වනවිට ජාතික විදුලි පද්ධතිය මගින් විදුලිය ලබාගෙන ඇති බවට පැහැදිලි වේ. (වගු අංක 5.6) එය ප්‍රදේශයේ පවතින මුළු විදුලිය ලබාගැනීමේ මූලාශ්‍රවල ප්‍රතිශතයක් ලෙස ගත්කළ 94% ක් ඉක්මවූ ප්‍රමාණයකි. විදුලිය ලබාගන්නා මූලාශ්‍රයන් අනුව පවුල් සංඛ්‍යාව වගු අංක 5.6 මගින් පැහැදිලි කෙරේ.

***වගු අංක 5. 5 - සීතාවක සැලසුම් බල ප්‍රදේශයේ නිවාස ඒකක සංඛ්‍යාවේ වැඩිවීම (2012 - 2030)***

| වර්ෂය | පවුල් සංඛ්‍යාව |
|---|---|
| 2012 | 35,224 |
| 2016 | 41,725 |
| 2030 | 50,769 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***වගු අංක 5. 6 - විදුලිය ලබාගන්නා මූලාශ්‍රයන් අනුව පවුල් සංඛ්‍යාව***

| මූලාශ්‍රය | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ජාතික විදුලි සැපයුම් මගින් | 35,003 | 94.1 |
| ග්‍රාමීය විදුලි යෝජනා ක්‍රම මගින් | - | 0 |
| භූමිතෙල් දහනය කිරීම මගින් | 2,221 | 5.7 |
| සූර්ය කෝෂ | 18 | 0 |
| ජීව වායු මගින් | - | 0 |
| වෙනත් | 29 | 0 |
| **එකතුව** | **37,271** | **100** |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)

වර්තමානය වනවිට මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි විදුලි සැපයුමෙන් ලංකා විදුලි බල මණ්ඩලය මගින් ලබාදී ඇත (එය දෙවන පරිච්ඡේදයෙහි සිතියම් අංක 2.4 මගින් පෙන්නුම් කර ඇත.) . විදුලිබල මණ්ඩලයේ ගණනය කිරීම්වලට අනුව මසකට කුටුම්භ ඒකකයක් සඳහා විදුලි සැපයුම කිලෝ වොට් 120 ක් වේ. මෙම සාමාන්‍ය අගය පාදක කොට ගණනය කළවිට සීතාවක සැලසුම් බල ප්‍රදේශය සඳහා අවශ්‍ය වර්තමාන විදුලි පරිභෝජනය (කුටුම්භ ඒකක සඳහා පමණක්) මෙගාවොට් 5.007 ක් පමණ වේ. තවද, සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ව්‍යාප්තව පවතින කර්මාන්ත වග පශු සම්පත් කර්මාන්තය, රබර් කර්මාන්තය හා සංචාරක කර්මාන්තය සඳහා අවශ්‍ය කරන විදුලිබල සැපයුම ලබාගැනීමට අවශ්‍ය විදුලි රැහැන් පද්ධතියේ පැතිරීම මුළු ප්‍රදේශයම ආවරණය වන පරිදි සිදු වී ඇති බව පෙනී යයි (ජීව වායුව මගින් විදුලිය ලබාගැනීම ඇමුණුම් අංක 03 හි දක්වා ඇත.).

ලංකා විදුලිබල මණ්ඩලය විසින් පිහිටුවා ඇති විදුලි සම්ප්‍රේෂණ රැහැන් පද්ධතිය හා උප පොළවල් පිහිටා ඇති ආකාරය අනුව කිලෝ වොට් 132 ක උප පොළවල් 02 ක් ප්‍රදේශය තුල පවතී. ඒවා පාදුක්ක හා කොස්ගම නගරාසන්නයේ දක්නට ලැබෙන අතර, එමගින් ඉහළ වෝල්ටියතාවයේ සිට පහළ වෝල්ටියතාවය දක්වා විදුලිය සම්ප්‍රේෂණය කිරීමේ හැකියාවක් ඇත. එම නිසා වර්ෂ 2030 වනවිට සංවර්ධනයවීමට අපේක්ෂිත මධ්‍යම ඝනත්ව නේවාසික ප්‍රදේශ සහ කෘෂිකාර්මික කර්මාන්ත ප්‍රදේශ සඳහා අවශ්‍ය විදුලිය ලබාගැනීමේ හැකියාවක් පවතී. එය පහත රූප සටහන මගින් පෙන්නුම් කෙරේ.

***රූප සටහන් අංක 5. 11 - සම්ප්‍රේෂණ විදුලි පද්ධතිය***




මූලාශ්‍රය : ලංකා විදුලිබල මණ්ඩලය (2015)

මේ අනුව 2030 වර්ෂය සඳහා ප්‍රමාණවත් විදුලිබල සැපයුමක් සැලසුම් බල ප්‍රදේශය තුල පවතින බැවින්, සමෘද්ධිමත් නේවාසික පුරවයක් කරා ළඟාවීමේදී ශක්තියක් ලෙස හඳුනාගත හැක.

## දුර්වලතා

1. **කැලණි ගඟ හා පුස්සැලි ඔය පිටාර ගැලීම හේතුවෙන් හදිසි ගංවතුර ආපදාවන්ට ලක්වන ප්‍රදේශ පැවතීම.**

ප්‍රදේශයේ පිහිටා ඇති කැලණි ගඟ, වක් ඔය හා පුස්සැලි ඔය මගින් අධික වැසි සහිත කාල තුලදී ක්ෂණික ගංවතුර ආපදා තත්ත්වයක් ඇති වේ. මෙලෙස ගංවතුර ආපදාවන්ට ලක්වන ප්‍රදේශ තුල අධි ඝනත්වයකින් යුතුව නේවාසික හා වාණිජ ස්ථාන ස්ථාපිත වී තිබීම මෙම ප්‍රදේශයේ සැලසුම්මය වශයෙන් දුර්වලතාවයක් ලෙස හඳුනාගත හැකිය. ඒ අනුව අක්කර 5,660 කට ආසන්න ප්‍රමාණයක් ගංවතුර ආපදා ප්‍රදේශ වශයෙන්ද වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් හඳුනාගෙන ඇත.

*වගු අංක **5. 7** - ගංවතුර නිසා පීඩාවට පත්වූවන්ගේ තොරතුරු **(2016)***

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ප්‍රදේශයේ සම්පූර්ණ ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව | ගංවතුර ආපදාවට පත් ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව | ගංවතුර ආපදාවට පත් වූ පවුල් සංඛ්‍යාව |
|---|---|---|---|
| හංවැල්ල | 36 | 34 | 2,135 |
| පාදුක්ක | 54 | 05 | 108 |
| **එකතුව** | **90** | **37** | **2,243** |

මූලාශ්‍රය : සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හංවැල්ල (2016)

ඉහත වගු අංක 5.7 මගින් ප්‍රදේශයේ 2016 වර්ෂයේදී ගංවතුර ආපදාවට ලක්වූ ග්‍රාම නිලධාරි වසම් හා පවුල් සංඛ්‍යාව සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සිදුකර ඇත. ඒ අනුව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හංවැල්ල ඒකකය තුල පිහිටා තිබෙන ග්‍රාම නිලධාරි වසම් 36 කින් 34 ක්ම ගංවතුර ආපදාවට ලක් වූ බවට වාර්තා වී ඇති අතර, ඉන් ආපදාවට ලක්වී ඇති පවුල් සංඛ්‍යාව 2,135 ක් වේ. පාදුක්ක ඒකකය තුල සම්පූර්ණ ග්‍රාම නිලධාරි වසම් 54 න් 05 ක් පමණක් ආපදාවට ලක් වී ඇති අතර, ආපදාවට ලක් වූ පවුල් සංඛ්‍යාව 108 ක් ලෙස ගණනය කර ඇත. ඒ අනුව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හංවැල්ල ඒකකය විශාල වශයෙන් ගංවතුර උවදුරට ලක්වන බව එම වාර්තාවලින් පැහැදිලි වේ (සැලසුම් ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි වසම් අනුව ගංවතුර ආපදාවට ලක්වන ප්‍රදේශ සිතියම් අංක 5.5 මගින් පෙන්නුම් කර ඇත.) .

*රූප සටහන් අංක **5. 12** - හංවැල්ල ප්‍රදේශයේ ගංවතුර ආපදා අවස්ථාවක්*





මූලාශ්‍රය : ක්ෂේත්‍ර පරීක්ෂණ, නාගරික සංවර්ධන අධිකාරිය (2018)

2. **ප්‍රදේශයේ දැනට පවතින අපරව්‍යුහ පහසුකම් ප්‍රමාණවත් නොවීම.**

සීතාවක සැලසුම් ප්‍රදේශය තුල වර්ෂ 2012 දී ජනගහනය 133,919 ක් වන අතර, එය වර්ෂ 2018 වනවිට ජනගහන වර්ධන වේගය 1.7 කින් එනම්, ජනගහනය 162,729 ක් දක්වා වර්ධනය වී ඇති බව පුරෝකථනය කරන ලදී. ඊට අනුකූලව වර්ෂ 2030 දී සැලසුම් ප්‍රදේශය තුල අපේක්ෂිත ජනගහනය 198,246 ක් ලෙස ගණනය කළ හැකි අතර, ඒ අනුව වර්තමාන ජනගහනයට 30,000 ක් පමණ ජනගහනයක් අළුතින් එක්වන බව පෙනී යයි. මීට අමතරව ප්‍රදේශයට පැමිණිය හැකි සංක්‍රමණික ජනගහනය ගණනය කළ විට, එය 151,009 ක පමණ අගයක් ගන්නා බව පෙනී යයි (වගු අංක 5.8).

*වගු අංක **5. 8** - අපේක්ෂිත ජනගහනය - **2030,** සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය*

| ජනගහනය | සංඛ්‍යාව |
|---|---|
| සංක්‍රමණික ජනගහනය (2030) | 151,009 |
| නේවාසික ජනගහනය (2030) | 198,246 |
| **එකතුව** | **349,255** |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

එනමුත්, සීතාවක සැලසුම් ප්‍රදේශය තුල වර්තමානය වනවිට පවතින අපරව්‍යුහ පහසුකම් එවැනි ජනගහන වර්ධනයකට ප්‍රමාණවත් නොවීම ගැටළුවක් ලෙස හඳුනාගන්නා ලදී. එම ගැටළුකාරී තත්ත්වයන් සෞඛ්‍ය, අධ්‍යාපන, ප්‍රවාහන හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ යන අංශවලට බලපානු ලබයි.

සැලසුම් ප්‍රදේශය තුල වර්තමානය වනවිට සෞඛ්‍ය පහසුකම් සැපයීම සඳහා ප්‍රධාන වශයෙන් පවත්නා රජයේ රෝහල් ලෙස පාදුක්ක ප්‍රාදේශීය රෝහල හා සාලාව ප්‍රාදේශීය රෝහල පමණක් ස්ථානගත වී තිබේ. එම රෝහල්වල පවතින භෞතික හා මානව සම්පත් දැනට ප්‍රදේශයේ ජීවත්වන ජනතාවට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් සලසාදීම සඳහා ප්‍රමාණවත් මට්ටමක නොපවතී. (සම්පත් පැතිකඩ වාර්තා - 2016) ප්‍රදේශයේ පවතින සෞඛ්‍ය පහසුකම්වල තත්ත්වය වගු අංක 5.9 මගින් පෙන්නුම් කර ඇත.

***වගු අංක 5. 9 - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්න සෞඛ්‍ය පහසුකම්***

| වෛද්‍ය මධ්‍යස්ථානය | පවත්නා ඇඳවල් සංඛ්‍යාව | සිටින වෛද්‍යවරු සංඛ්‍යාව |
|---|---|---|
| පාදුක්ක රෝහල | 80 | 46 |
| කොස්ගම - සාලාව පර්යන්ත රෝහල | 40 | 14 |
| පෞද්ගලික රෝහල | සඳහන් වී නොමැත. | 23 |
| මුළු ජනගහනය | 220 (උපකල්පිත අගය) | 83 |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තා (2016)

මීට අමතරව වර්තමාන රෝහල්හි පිහිටීම කි.මී.03 ක අරයකින් යුත් වපසරියකින් සැලකුවිට ප්‍රදේශය සඳහා අවශ්‍ය වන රෝහල්හි පැතිරීම අවම බව නිරීක්ෂණය කළ හැකිය (සිතියම් අංක 5.7).

මේ අනුව පැහැදිලි වන්නේ, සීතාවක සැලසුම් ප්‍රදේශය හරහා ජනගහන ව්‍යාප්තිය ග්‍රාම නිලධාරි කොට්ඨාශ මට්ටමින් සැලකු විට, ඉහළ ඝනත්වයක් පවතින හංවැල්ල, පාදුක්ක, කොස්ගම නගරාශ්‍රිත ප්‍රදේශයන් තුල පවතින බවයි. නමුත් කොස්ගම සහ පාදුක්ක අධි ඝනත්ව ප්‍රදේශ එම රෝහල්හි පහසුකම් ලබාගැනීමට සමත් වුවත්, අනෙකුත් අධික ජනඝනත්ව ප්‍රදේශ සඳහා රෝහල් පහසුකම් නොමැති බව නිරීක්ෂණය වේ. එම නිසා අනෙකුත් ජනඝනත්ව ප්‍රදේශයන් ආවරණය වන පරිදි නව රෝහල් ඇති කිරීම පිළිබඳව අවධානය යොමුකළ යුතු වේ.

***සිතියම් අංක 5. 6 - රෝහල් ව්‍යාප්තිය (2017), සීතාවක ප්‍රාදේශීය සහා බල ප්‍රදේශය***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

සීතාවක සැලසුම් ප්‍රදේශය තුල දැනට පවතින අධ්‍යාපන පහසුකම් සලකා බැලීමේදී, එහි පවතින ප්‍රාථමික, ද්වීතියික හා තෘතික අධ්‍යාපන ආයතනයන් ප්‍රමුඛ ස්ථානයක් ගනී. මෙහිදී පවතින පාසැල් ව්‍යුහය පහත වගුවේ පරිදි පෙන්වාදිය හැකිය.

*වගු අංක **5. 10 -** සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්නා පාසල්වල ව්‍යුහය*

| පාසැල් ව්‍යුහය | සංඛ්‍යාව |
|---|---|
| 1. ප්‍රාථමික පාසැල් | 04 |
| 2. ද්වීතික පාසැල් | 27 |
| 3. තෘතික පාසැල් | 07 |
| 4. පෞද්ගලික අධ්‍යාපන ආයතන | සඳහන් වී නොමැත. |
| 5. වෙනත් | - |
| **එකතුව** | **31** |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තා (2016)

මෙම පාසැල් හරහා ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 32,010 කි. (වර්ෂ 2016 දී) මීට අමතරව ප්‍රදේශයේ පවතින ප්‍රධාන හඳුනාගත් පාසැල්හි කි.මී.01 ක් හා කි.මී.02 ක් අරයකින් යුත් වපසරිය තුල පාසැල් ව්‍යාප්තිය සැලකූ විට ජනගහනයේ පැතිරීමට සාපේක්ෂව පාසැල්හි ව්‍යාප්තිය ඉහළ මට්ටමක පැවතුණද, (සිතියම් අංක 5.8) ප්‍රදේශයේ පවතින පාසැල් වැසියාමේ ප්‍රවණතාවයක් පවතින බව සම්පත් පැතිකඩ වාර්තා (2016) අනුව පැහැදිලි වේ. ඒ අනුව පසුගිය වසර කිහිපය තුල වැසිගිය පාසැල් ප්‍රමාණය පහත වගු අංක 5.11 මගින් දැක්වේ.

*වගු අංක **5. 11 -** ප්‍රදේශය තුල වැසීගිය පාසැල් පිළිබඳ දත්ත*

| පරිපාලන ප්‍රදේශය | වැසිගිය පාසැල් ප්‍රමාණය |
|---|---|
| පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 04 |
| සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | 04 |

මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තා (2016)

මේ සඳහා ප්‍රදේශයේ පාසැල්වල පවත්නා භෞතික පහසුකම් (විද්‍යාගාර, ගෘහ විද්‍යාගාර, පරිගණක පහසුකම්, භෝජනාගාර හා වැසිකිලි පහසුකම් යානාදිය) ප්‍රමාණවත් නොවීම මීට ප්‍රධාන හේතුවක් ලෙස හඳුනාගෙන ඇත. ඒ අනුව සැලසුම් ප්‍රදේශය තුල පාසැල්හි භෞතික පහසුකම් දියුණු කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවට සඳහන් කළ හැකිය. මීට අමතරව, ප්‍රදේශයේ වෘත්තීය පුහුණු පහසුකම් ප්‍රමාණවත් මට්ටමක නොපවතින අතර, දැනට පාදුක්ක හා කොස්ගම නගරයන්හි වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිතව ඇති අතර, එහි ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 300 කට අඩු අගයක් ගනී.

***සිතියම් අංක 5. 7 - පාසැල් ව්‍යාප්තිය (2017), සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

සීතාවක සැලසුම් ප්‍රදේශය තුල පවතින ප්‍රවාහන පද්ධතියේ පවතින දුර්වලතාවයන් නිරීක්ෂණය කිරීමේදී, සැලසුම් ප්‍රදේශයේ නේවාසික හා සංක්‍රමණික ජනතාවගේ මූලික ප්‍රවාහන අවශ්‍යතා සපුරාලන දුම්රිය සේවය හා පොදු බස්රථ ප්‍රවාහන සේවය යන ප්‍රවාහන මාධ්‍යය දෙක අතර මනා සම්බන්ධතාවයක් නොමැතිවීම ප්‍රධාන ගැටළුවක් ලෙස දැකිය හැකිය.

දෛනිකව පාදුක්ක නගරය තුල 30,000 ක පමණ ජනගහනයක් පාදුක්ක ප්‍රාදේශීය රෝහල, රජයේ පරිපාලන ආයතන, පාසැල් ඇතුළු පුද්ගලික ආයතන මගින් විවිධ සේවාවන් සපයා ගැනීම සඳහා සංසරණය වන අතර, එම ජනතාව සඳහා ප්‍රවාහන පහසුකම් ලබාගැනීම ප්‍රධාන වශයෙන් දුම්රිය හා බස්රථ ඔස්සේ සිදු වේ. එහෙත් එම ප්‍රවාහන සේවාවන් අතර විධිමත් සම්බන්ධතාවයක් දක්නට නොමැතිවීම හේතුවෙන්, මෙම සේවාවන් ලබාගන්නා පුද්ගලයින්ට ආරක්ෂාකාරී හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සපයාගැනීමට බාධා එල්ලවී තිබේ.

මෙම තත්ත්වය කොස්ගම හා වග යන ප්‍රධාන දුම්රිය ස්ථාන ඇතුළු අනෙකුත් දුම්රිය ස්ථානයන් පිහිටා ඇති ප්‍රදේශවලද දක්නට ලැබෙන අතර, එම දුම්රිය ස්ථානයන් ආසන්නයේ බස්නැවතුම්පලවල් පිහිටා නොතිබීම හා පුද්ගලික රථවාහන නැවතුම් ඉඩපහසුකම් නොමැතිවීම හේතුවෙන් මගීන් දුම්රිය සේවාව වෙත වැඩි නැඹුරුතාවයක් දක්නට නොමැතිවීම ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇත.

එසේම ප්‍රධාන දුම්රිය ස්ථාන තුල සෞඛ්‍ය පහසුකම් ඇතුළු අනෙකුත් අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව හඳුනාගෙන ඇත.

පහත සිතියම මගින් ප්‍රදේශයේ පවතින දුම්රිය ස්ථාන හා බස්නැවතුම්පල අතර පවතින දුර්වල සම්බන්ධතාවය නිරීක්ෂණය කළ හැකිය.

***සිතියම් අංක 5. 8 - දුම්රිය සහ බස්නැවතුම්පල අතර පවත්නා දුර්වල සම්බන්ධතාවය - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## 3. ප්‍රදේශය තුල ජීවත් වන ශ්‍රමිකයින්ගෙන් 70% ක ප්‍රතිශතයක් නුපුහුණු ශ්‍රමිකයින් වීම.

ජන හා සංඛ්‍යාලේඛන වාර්තා - 2012 අනුව සැලසුම් ප්‍රදේශයෙන් මුළු ජනගහනයෙන් වයස අවුරුදු 15 - 60 ත් අතර වූ ශ්‍රම බලකාය 62.1 % ක් ලෙස වාර්තා වේ. ප්‍රාදේශීය ලේකම් වාර්තා - 2018 අනුව ආර්ථික ක්‍රියාකාරි ජනගහනය අවුරුදු 15 - 59 ලෙස හඳුනාගෙන ඇති අතර, ඉන් 70% ක ප්‍රමාණයක් ප්‍රාථමික ගණයේ සේවකයන් ලෙස සැලකේ. මීට අයත් වන්නේ, පාසැල් අධ්‍යාපනය නොලැබූ සහ 06 වසර දක්වා පමණක් අධ්‍යාපනය ලැබූවන් වේ. එය ප්‍රදේශයේ පවතින ආර්ථික ක්‍රියාකාරකම් ගුණාත්මක අයුරින් සිදුකර ගෙනයාමට බාධාවක් බවට හඳුනාගෙන ඇත.

ශ්‍රම බලකායෙන් 20% ක ප්‍රමාණයක් ද්වීතික අංශය එනම්, සාමාන්‍ය පෙළ දක්වා පාසැල් අධ්‍යාපනය ලැබූවන් වේ. මෙම බලකායෙන් 10% ක පමණ ප්‍රමාණයක් තෘතික අංශය එනම්, උසස් පෙළ හා ඉන් ඉහළට අධ්‍යාපනය ලැබූවන් ලෙසට හඳුනාගෙන ඇත. (ප්‍රස්ථාර අංක 5.5) ශ්‍රම බලකාය සැලසුම් ප්‍රදේශය පුරා විහිදී ඇති ආකාරය සිතියම් අංක 5.10 මගින් දැක්වේ.

***ප්‍රස්ථාර අංක 5. 5 - සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වර්තමාන ශ්‍රම බලකාය***




මූලාශ්‍රය : සම්පත් පැතිකඩ වාර්තා (2016)

ඒ අනුව එම දුර්වලතා මඟහරවා ගැනීම සඳහා ප්‍රදේශයේ ජනතාවගේ ආර්ථික හා සමාජීය දියුණුව ඇති කිරීම පිණිස නව ව්‍යාපෘති උත්පාදන අවස්ථා මෙම සැලැස්ම මගින් හඳුනාගෙන ඇත.

***සිතියම් අංක 5. 9 - ශ්‍රම බලකාය විහිදීම (2016)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## අවස්ථා

### 1. නාගරික සංවර්ධන අධිකාරිය සහ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව යන රාජ්‍ය ආයතන මගින් යෝජිත අනාගත ව්‍යාපෘති

හොරණ නගරය තුල කර්මාන්ත පුරවරයක් ස්ථාපිත කිරීමට හා කැලණිවැලි දුම්රිය මාර්ගය ද්වීත්ව දුම්රිය මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමට රජය මගින් මේවනවිට සැලසුම් සකස් කරමින් පවතී.

එම ව්‍යාපෘති ක්‍රියාත්මකවීම තුලින් සීතාවක ප්‍රදේශයේ ජීවත්වන ශ්‍රමිකයන්ට රැකියා අවස්ථා උදා වේ යැයි අපේක්ෂා කරන අතර, කැලණිවැලි දුම්රිය මාර්ගය ද්වීත්ව දුම්රිය මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය තුලින් ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබාගැනීමේ අවස්ථාව උදා කෙරේ.

*රූප සටහන් අංක 5. 13 - යෝජිත හොරණ කර්මාන්තපුර ව්‍යාපෘතිය*




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

### 2. 2016 වර්ෂයේදී පිළියෙල කරන ලද බස්නාහිර පළාත් මහානගර සැලැස්මට (Western Region Megapolis Plan) මගින් කෘෂිකාර්මික ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන තිබීම.

වර්ග කිලෝමීටර් 330 ක තරම් වපසරියක පැතිරී පවතින මෙම කෘෂිකාර්මික නාගරික කලාපය බස්නාහිර පළාත තුල මධ්‍යම හා නැගෙනහිර දිශාවන් දිගේ පැතිර පවතී. බස්නාහිර පළාත් මහානගර සැලැස්මට අනුව,

සීතාවක බල ප්‍රදේශයේ කෘෂිකාර්මික ප්‍රදේශයක් ලෙසට සංවර්ධනය කළ යුතු බවට හඳුනාගෙන ඇති අතර, කෘෂිකාර්මික ආර්ථික කටයුතු වැඩිදියුණු කිරීම සහ ඒතුලින් එම කලාපය තුල අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමද එම සැලැස්මේ තවත් අරමුණක් ලෙස හඳුනාගෙන ඇත. එහිදී මෙම සැලැස්ම හරහා නව රැකියා අවස්ථා 90,000 ක් පමණ උත්පාදනය කිරීමට බලාපොරොත්තු වී ඇත. ඒ අනුව මෙම ප්‍රදේශය නාගරික සැලැස්ම හරහා නව රබර් කර්මාන්තය හා සම්බන්ධ රැකියා සහ කර්මාන්ත අවස්ථා රැගෙන ඒමට යෝජිතය.

**3. බස්නාහිර පළාත් මහනගර සැලැස්ම යටතේ සැලසුම් ප්‍රදේශයට අදාළ විදුලි දුම්රිය මාර්ග ස්ථාපිත වීම.**

බස්නාහිර පළාත් මහනගර සැලැස්ම යටතේ කැලණිවැලි දුම්රිය විදුලි බලයෙන් ක්‍රියාකරවීමට සහ නව විදුලි දුම්රිය මාර්ගයක් කැලණිය සිට කොස්ගම දක්වා ඉදිකිරීමට හඳුනාගෙන ඇත (රූප සටහන් අංක 5.14).

## තර්ජන

**1. කළුගල් කැඩීමේ කර්මාන්තය සඳහා වෙනත් ප්‍රදේශවලින් ආයෝජකයන් පැමිණීම.**

සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හංවැල්ල ඒකකය තුල කළුගල් ව්‍යාපෘති ස්ථාන 34 ක් හඳුනාගෙන ඇති අතර, ඉන් කළුගල් කැඩීමේ කර්මාන්ත 28 කට ආසන්න ආයෝජකයින් කොළඹ, බියගම, කඩුවෙල, කැලණිය, පිටකෝට්ටේ, හෝමාගම යනාදී ප්‍රදේශවල පදිංචිකරුවන් බවට හඳුනාගත හැක. මෙම හේතුව නිසා ප්‍රදේශයේ ආර්ථික ප්‍රතිලාභයන් වෙනත් ප්‍රදේශයන් වෙත ඇදී යන අතර, මෙම කළුගල් කැඩීමේ කර්මාන්ත දීර්ඝ කාලීනව නියැලීමෙන් ප්‍රදේශයේ පාරිසරික සම්පත් විනාශ වී යාමේ තර්ජනයට ලක්වෙමින් පවතී.

*රූප සටහන් අංක 5. 14 - යෝජිත නව විදුලි දුම්රිය මාර්ගය, සීතාවක සැලසුම් බල ප්‍රදේශය*




මූලාශ්‍රය : බස්නාහිර පළාත් මහානගර සැලැස්ම, ව්‍යාපෘති (2030)

# පරිච්ඡේදය 06

# සංවර්ධන සැලැස්ම

## 6.1 සංකල්පිත සැලැස්ම

***සිතියම් අංක 6. 1 - සංකල්පිත සැලැස්ම (2030)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

අනාගත දැක්ම ඔස්සේ කොළඹ දිස්ත්‍රික්කයේ ආශිර්වාදාත්මක හරිත පුරවරය ලෙස සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සංවර්ධනය කිරීමේදී ප්‍රදේශයේ අනාගත දිශානතියේ අවකාශීය වෙනස්වීම ඉහත රූපමය සටහනින් නිරූපණය කෙරේ. මූලිකවම ස්වභාවික පරිසරය හා බැඳුණු පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් කලාපය ප්‍රදේශයේ නැගෙනහිර මායිම ඔස්සේද ප්‍රදේශය මධ්‍යයට ගමන් කරන විට අධි පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කරගැනීම උදෙසා අඩු ඝනත්ව නේවාසික පරිසරයක් බිහිකිරීමටද සැලසුම් කෙරේ. ප්‍රදේශයේ උතුරු හා බටහිර මායිම ඔස්සේ නීල හරිත පරිසරයකින් සමන්විත අධි පාරිසරික සංවේදී ප්‍රදේශ ආරක්ෂා කරගැනීම උදෙසා හඳුනාගත් පරිසර හිතකාමී ක්‍රියාකාරකම් ප්‍රදේශයක්ද සංකල්පිත සැලැස්මෙන් නිරූපණය කෙරේ.

යෝජිත පාරිසරික සංචාරක ප්‍රවර්ධන කලාපය පුවක්පිටිය - තුම්මෝදර මාර්ගය හා ඇස්වතු ඔය පදනම් කරගනිමින් ප්‍රවර්ධනය වන අතරම, එහි අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග බොහෝමයක් තවදුරටත් පුළුල් නොකිරීම හා අඩු ඝනත්ව සංවර්ධනයන් යෝජනා කිරීම තුලින් පාරිසරික හිතකාමීත්වය ආරක්ෂා කරගත් සංවර්ධනයකට ඉඩප්‍රස්ථාව විවර කර දී ඇත.

යෝජිත පාදුක්ක - කොස්ගම විකල්ප ප්‍රවේශ මාර්ගය හරහා සම්බන්ධ වන පශු සම්පත් ප්‍රවර්ධන කලාපය හා වතු කෘෂිකාර්මික කලාප - I ඔස්සේ ප්‍රදේශයට අනන්‍ය වූ පශු සම්පත් හා කළුගල් කැඩීමේ කර්මාන්ත පරිසර හිතකාමී අයුරින් පවත්වා ගැනීම අපේක්ෂා කෙරේ. ඒ තුලින් එම කර්මාන්ත හා නේවාසික ජන ජීවිත සමඟ සිදුවන ගැටුම් අවම කිරීමට බලාපොරොත්තු වේ. හඳුනාගත් නාගරික මංසන්ධි වන පාදුක්ක, හංවැල්ල, කොස්ගම හා වග යන නගර එකිනෙකට අනන්‍ය වූ ලක්ෂණ අනුව වාණිජ හා සේවා සැපයුම් මධ්‍යස්ථාන ලෙස සංවර්ධනයවීමට ඉඩප්‍රස්ථා විවර කෙරේ. අධි ඝනත්ව සංවර්ධන පීඩනය හමුවේ ආරක්ෂා කරගත යුතු අනෙකුත් පාරිසරික සංවේදී ප්‍රදේශ එනම්, වන භූමි, ජලාශ්‍ර, තෙත්බිම්, කුඹුරු ඉඩම්, රබර් වතු හා ඇළ මාර්ග යනාදිය සංරක්ෂණය කිරීමට විශේෂ ක්‍රමෝපායන් හඳුනාගෙන ඇත. ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන සම්බන්ධ කරමින් අන්තර් මධ්‍යස්ථාන ප්‍රවේශකත්වය වැඩිදියුණු කිරීමට යෝජිත අතරම, ඊට පරිබාහිරව සිදුවන අධි සංවර්ධනය පාලනය කිරීමට මෙම සැලැස්ම මගින් උපක්‍රම යෙදේ.

ඒ අනුව මෙම සංකල්පිත සැලැස්ම ඔස්සේ ස්වභාවික පාරිසරික ලක්ෂණ ඉස්මතු වන ප්‍රදේශය තුල හඳුනාගන්නා ලද ගැටළු අවම කරලමින්, ප්‍රදේශයට අනන්‍ය වූ හරිත වැස්ම, ජල වැස්ම හා ඓතිහාසික ප්‍රෞඪත්වය ආරක්ෂා කරගනිමින් එම විභවතා මගින් ආර්ථිකය සවිබල ගැන්වීමට බලාපොරොත්තු වේ. තවද, ප්‍රදේශය සුදුසු රෙගුලාසි ක්‍රියාත්මක කිරීම මගින් ආරක්ෂා කරගැනීමටත්, ජල ගැලීම්වලට හා නායයෑම්වලට ගොදුරුවන හා ගොදුරුවීමට ඉඩ ඇති ප්‍රදේශ නිසි භූමි පරිහරණ කළමනාකාරීත්වය තුලින් හානි අවම කරගැනීමටත් මෙම සැලැස්ම තුලින් අපේක්ෂා කෙරේ. ඒ තුලින් කොළඹ දිස්ත්‍රික්කයේ "ආශිර්වාදාත්මක හරිත පුරවරය" යන අනාගත දැක්ම සාක්ෂාත් කරගැනීමට සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට හැකිවනු ඇත.

## 6.2 යෝජිත භූමි පරිහරණ සැලැස්ම

***සිතියම් අංක 6. 2 - භූමි පරිහරණ සැලැස්ම (2030)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

සැලසුම් බල ප්‍රදේශය කොළඹ දිස්ත්‍රික්කයේ ආශිර්වාදාත්මක හරිත වැස්ම යන දැක්ම ළඟා කරලීමේ අභිප්‍රාය පෙරදැරි කරගනිමින් ආර්ථික, පාරිසරික, සමාජයීය හා භෞතික සංවර්ධනයන් එනම්, දැරිය හැකි සංවර්ධනයක් ක්‍රියාවට නැංවීම පිණිස ඒ සඳහා අවශ්‍ය උපාය මාර්ගික ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ආකෘතියේ පිළිබිඹුව යෝජිත ඉඩම් පරිහරණ සැලැස්ම හරහා නිරූපනය කෙරේ.

සමස්ථ ඉඩම් පරිහරණ සැලැස්ම මූලික වශයෙන් අඩු ඝනත්ව නේවාසික සංවර්ධනයක් අපේක්ෂා කරන අතර, ප්‍රධාන වශයෙන් ඇස්වතු ඔය හා කැලණි ගඟ මූලික කර ගනිමින් පාරිසරික සංචාරක ප්‍රවර්ධන කටයුතු බිහිකිරීමට අපේක්ෂා කෙරේ. හඳුනාගන්නා ලද වතු කෘෂිකාර්මික කලාප - I තුල හා පශු සම්පත් ප්‍රවර්ධන කලාපය තුල අපේක්ෂිත කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ඉඩප්‍රස්ථා විවර කරනු ලබන අතර, අනෙකුත් ප්‍රදේශ ආකර්ශණීය ප්‍රදේශ ලෙස අඩු ඝනත්ව සංවර්ධනයෙන් යුතුව ප්‍රවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ. කොස්ගම, පාදුක්ක, හංවැල්ල යන මංසන්ධි ආශ්‍රිත ප්‍රදේශන්හි වාණිජ ඉඩම් භාවිතය සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඇති අතර, වග මංසන්ධිය නේවාසික මධ්‍යස්ථානයක් ලෙස ප්‍රවර්ධනය කිරීමට යෝජනා කෙරේ. ආරක්ෂා කරගත යුතු වනභූමි හා ජල පෝෂක, පහත්බිම් ඇතුළත් අධි පාරිසරික සංවේදී ස්ථානයන් පාරිසරික සංරක්ෂණ ප්‍රදේශ ලෙස නම් කර ඇත. කැලණි ගඟ පිටාර ගැලීම්වලට ලක්වන ප්‍රදේශ තුල සංවර්ධන කටයුතු පාලනය කර පරිසර හිතකාමී ව්‍යාපෘති සඳහා ඉඩප්‍රස්ථා විවර කර ඇත.

තවදුරටත් යෝජිත භූමි පරිහරණ සැලැස්ම යථාර්ථයක් බවට පත්කරගැනීම සඳහා සංවර්ධන සැලැස්ම දෙවන වෙළුම ඔස්සේ සැලසුම් හා කලාපීකරණ රෙගුලාසි හඳුන්වාදීම සිදුකරනු ලැබේ.

පහත රූප සටහන මගින් යෝජිත නේවාසික කලාපයේ හරස්කඩක් පිළිබිඹු කෙරේ.

***රූප සටහන් අංක 6. 1 - යෝජිත නේවාසික කලාපයේ හරස්කඩ***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය ( 2018)

පහතින් දැක්වෙන රූප සටහන මගින් යෝජිත සංචාරක පරිසර කලාපයේ හරස්කඩක් පිළිබිඹු කෙරේ.

*රූප සටහන් අංක 6. 2 - යෝජිත සංචාරක පරිසර කලාපයේ හරස්කඩ*




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

*රූප සටහන් අංක 6. 3 - යෝජිත ආර්ථික ප්‍රවර්ධන කලාපයන්හි හරස්කඩ*




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## 6.3 අපරව්‍යූහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ග

කොළඹ දිස්ත්‍රික්කයේ “ආශීර්වාදාත්මක හරිත පුරවරය” යන්න පෙරදැරි කර ගනිමින් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය එම දැක්ම කරා ළඟාවීම සඳහා අවශ්‍ය වන උපක්‍රමිකයන් වන භෞතික, සමාජීය අපරව්‍යූහ පහසුකම් පිළිබඳව මෙහිදී විස්තර කරනු ලබයි.

යෝජිත සේවා සැපයුම් උපාය මාර්ග, යෝජිත ප්‍රවාහන උපාය මාර්ග, යෝජිත ජල සැපයුම් උපාය මාර්ග, යෝජිත විදුලි සහ දත්ත රැහැන් උපාය මාර්ග, යෝජිත අපද්‍රව්‍ය හා මලාපවහන උපාය මාර්ග, යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ උපාය මාර්ග යනාදිය මෙම මාතෘකාව යටතේ සාකච්ඡා කිරීමට නියමිතය.

### 6.3.1 සේවා කළමනාකරණ උපාය මාර්ග

වර්ෂ 2030 වනවිට සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල නේවාසික හා සංක්‍රමණික ජනතාවට අපේක්ෂිත සෞඛ්‍යය, අධ්‍යාපනික, නේවාසික යන සේවා සැපයීම පිළිබඳ සැලකිලිමත් වෙමින් මෙම සැලැස්ම පිළියෙල කර ඇත. (සිතියම් අංක 6.3)

වර්ග කිලෝමීටර් 208 ක වපසරියකින් යුත් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2012 වර්ෂයේදී ජනගහනය 133,919 ක් ලෙස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012) වාර්තාවල සඳහන් වේ. එම දත්ත වාර්තා අනුව 2016 වර්ෂයේදී ජනගහනය 162,729 ක් ලෙසට පුරෝකථනය කරන ලද අතර, ඒ අනුව එය 2030 වර්ෂය වනවිට 198,102 ක් දක්වා වර්ධනය විය හැක. ඒ අනුව, සෞඛ්‍ය, අධ්‍යාපනික, නේවාසික අවශ්‍යතාවයන් අපේක්ෂිත ජනගහනය පදනම් කරගනිමින් තවදුරටත් විග්‍රහ කිරීමක් සිදුකරනු ඇත.

ඉහත ජනගහනය ප්‍රධාන වශයෙන්ම පරිසර අධි සංවේදී ප්‍රදේශ වෙත නැඹුරු වෙමින් සිදුවන සංවර්ධනය අඩු කිරීම සඳහා උපකාරී වන පරිදි අපරව්‍යුහ සංවර්ධනය කළ යුතු බවට හඳුනාගන්නා ලදී. ඒ අනුව වග, පාදුක්ක, හංවැල්ල, කොස්ගම යන තෝරාගත් නගර කිහිපයක් මූලික කරගත් සංවර්ධනයක් කරා යොමුවීමට සංවර්ධිත සැලැස්ම ඔස්සේ අපේක්ෂා කරයි. එහිදී මධ්‍යම සනත්ව නේවාසික කලාපයත්, සේවා වාණිජ කලාපයත්, ප්‍රජා වාණිජ කලාපයත් ඉහත සඳහන් කරන ලද නගර මූලික කරගනිමින් පිහිටුවීමට මෙම සංවර්ධන සැලැස්ම හරහා යෝජනා කර ඇත. මීට අමතරව, තෙත්බිම් ප්‍රදේශ, කැලණි ගඟ ආශ්‍රිතව ප්‍රදේශ, වක් ඔය හා පුස්සැලි ඔය ආශ්‍රිත ප්‍රදේශ ආදී පරිසර ප්‍රදේශයන් තුල නේවාසික සනත්වය ඉතාමත්ම අවම වන පරිදි සංවර්ධනයන් පවත්වා ගෙනයාම සැලැස්ම හරහා අපේක්ෂා කෙරේ. එසේම ඉහත සංවේදී පරිසර පද්ධති හැර අනෙකුත් ප්‍රදේශ අඩු නේවාසික සනත්වයන් සහිත ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමට අරමුණු කර ඇත. ඒ අනුව එක් එක් ප්‍රදේශ අනුව සෞඛ්‍ය, අධ්‍යාපනික, නේවාසික අවශ්‍යතාවයන් අපේක්ෂිත ජනගහනය පදනම් කරගනිමින් තවදුරටත් විග්‍රහ කිරීමක් සිදුකරනු ඇත.

#### 6.3.1.1 සෞඛ්‍ය සේවා උපාය මාර්ග

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වර්තමානය වනවිට සෞඛ්‍ය පහසුකම් සපයන ස්ථාන ලෙස රජයේ රෝහල්, ආයුර්වේද රෝහල්, පෞද්ගලික රෝහල් සහ සෞඛ්‍ය නිලධාරී කාර්යාල සමන්විත වී ඇති අතර, රජයේ රෝහල් ලෙස පාදුක්ක ප්‍රාදේශීය රෝහල සහ සාලාව ප්‍රාදේශීය රෝහල හඳුනාගත හැක.

සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය - වාර්ෂික සෞඛ්‍ය දත්ත වාර්තාව 2016 පරිදි කොළඹ දිස්ත්‍රික්කය සඳහා රෝහලක පුද්ගලයින් 1,000 කට තිබිය යුතු ඇඳන් අනුපාතිකය 5.9 ක් විය යුතු බවට

සඳහන් කර තිබේ. ලෝක සෞඛ්‍ය සංවිධානයේ සම්මතයට අනුව පුද්ගලයින් 1,000 ක් සඳහා තිබිය යුතු සම්මත ඇඳන් අනුපාතිකය 3:5 බව එහි සඳහන් වේ.

කෙසේවෙතත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් 2016 වර්ෂ සඳහා සකස් කර ඇති වාර්තා අනුව එම වර්ෂයේදී පාදුක්ක ප්‍රාදේශීය රෝහලේ තිබූ ඇඳන් සංඛ්‍යාව 80 ක් වන අතර, එම වර්ෂය තුල ප්‍රතිකාර ලැබූ රෝගීන් සංඛ්‍යාව 6,400 ක් බවට වාර්තා වී ඇත. මෙම බල ප්‍රදේශය තුල ඇති සියලු රජයේ හා පෞද්ගලික රෝහල්වල පවතින මුළු ඇඳන් ගණන 210 ක් බවට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් 2016 සඳහා සකස් කෙරුණු වාර්තාවල සඳහන් වේ. එහෙත් ප්‍රදේශයේ වර්තමාන ජනගහනය 162,729 ක් බවට වාර්තාවීම තුලින් හා ඉහත දත්තයන්ද සැලකිල්ලට ගත්විට, සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පුද්ගලයින් 1,000 ක් සඳහා 1.4 ක් වන අතර, ලෝක සෞඛ්‍ය සංවිධානය අනුව තිබිය යුතු ඇඳන් සංඛ්‍යාව සම්මත අගයට අනුව සැලසුම් ප්‍රදේශය තුල තිබිය යුතු ඇඳන් සංඛ්‍යාව 560 ක් පමණ විය යුතුය. තවද, සම්පත් පැතිකඩ වාර්තා - 2016 අනුව පැහැදිලි වනුයේ, දැනට රෝහල් සඳහා ප්‍රමාණවත් වෛද්‍ය නිලධාරින් නොමැති බවය. ඒ අනුව වර්ෂ 2030 වනවිට සැලසුම් ප්‍රදේශය ආශ්‍රිතව පවතින ප්‍රාදේශීය රෝහල් ඇතුළු අනෙකුත් සෞඛ්‍ය පහසුකම්වල වැඩිදියුණු කිරීමක් අවශ්‍ය වේ.

සැලසුම් ප්‍රදේශය තුල දැනට පවතින ප්‍රාදේශීය රෝහල්, මාතෘ සායන හා ආයුර්වේද රෝහල්හි පැතිරීම සැලකිල්ලට ගත්කළ, සාලාව ප්‍රාදේශීය රෝහල හා පාදුක්ක ප්‍රාදේශීය රෝහල්වල සිට කි.මී. 03 ක අරයකින් යුතු වපසරියක් තුල වර්ෂ 2030 වනවිට කොස්ගම හා පාදුක්ක යන නගර දෙක කේන්ද්‍ර කරගනිමින් පිහිටුවීමට බලාපොරොත්තු වන මධ්‍යම ඝනත්ව නේවාසික හා අඩු ඝනත්ව නේවාසික කලාපයන් සම්පූර්ණයෙන් ආවරණය වන පරිද්දෙන් රෝහල් පහසුකම් ව්‍යාප්ත කිරීමට අපේක්ෂා කරයි.

නමුත් හංවැල්ල නගරය හා වග නගරය මූලික කරගනිමින් 2030 වර්ෂයේ පිහිටුවීමට යෝජිත මධ්‍යම ඝනත්ව හා අඩු ඝනත්ව නේවාසික ප්‍රදේශයන් ආවරණය වන අයුරින් රෝහලක් පිහිටා නොමැති බව පෙනී යයි. ඒ අනුව නව රෝහලක් කහහේන, වග දුම්රිය ස්ථානය අසල පවතින හෙක්ටයාර 3.8 ක හිස් භූමි ප්‍රදේශය තුල නව රෝහලක් ඉදිකිරීම සඳහා යෝජනා කෙරේ.

මෙම සැලසුම් ප්‍රදේශය තුල 2030 වර්ෂය වනවිට අපේක්ෂිත සංවර්ධනය සලකා බැලීමේදී සෞඛ්‍ය සේවාවන් වැඩිදියුණු කළයුතු ආකාරය පිළිබඳ යෝජනාවන් කිහිපයක් පහත පරිදි හඳුනාගන්නා ලද අතර, සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතු වේ.

* පාදුක්ක නගරය තුල පිහිටා ඇති රජයේ ප්‍රාදේශීය රෝහල භෞතික පහසුකම් හා මානව සම්පත් වැඩිදියුණු කිරීම.
* කොස්ගම නගරය තුල පිහිටා ඇති රජයේ ප්‍රාදේශීය රෝහල භෞතික පහසුකම් හා මානව සම්පත් වැඩිදියුණු කිරීම.

### 6.3.1.2 අධ්‍යාපන සේවා උපාය මාර්ග

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල රජයේ පාසැල් 31 ක් පවතින අතර, එම පාසැල්වල ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව 32,010 පමණද, ගුරුවරු සංඛ්‍යාව 1,483 ක් බවටද වාර්තා වේ. මෙම රජයේ පාසැල් 31, ප්‍රාථමික පාසැල් 04 ක් හා ද්වීතියික 27 කින් යුක්ත වන අතරම, එහි ගුරු ශිෂ්‍ය අනුපාතය 1:21 කි. (මූලාශ්‍රය: සම්පත් පැතිකඩ - 2016) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දත්ත හා සංඛ්‍යාලේඛන අනුව ශ්‍රී ලංකාව තුල පවතින ගුරු:ශිෂ්‍ය අනුපාතය 1:23 වේ. විශේෂයෙන්ම ප්‍රාථමික, ද්වීතික පාසැල් ව්‍යාප්තිය සලකා බැලීමේදී, කිලෝ මීටරයක් තුල හා කීලෝ මීටර් දෙකක වපසරිය තුල සැලසුම් ප්‍රදේශයම ආවරණය වන පරිදි ව්‍යාප්ත වී ඇති බව පැහැදිලිය. (පාසැල් ව්‍යාප්තිය පස්වන පරිච්ඡේදයේ සිතියම් අංක 5.8 මගින් පෙන්නුම් කර ඇත.) දැනට අවශ්‍ය භෞතික පහසුකම් මෙම ප්‍රදේශයේ පාසැල් සඳහා ප්‍රමාණවත් ලෙස ස්ථාපිත වී පවතී. තවද, ප්‍රදේශයේ වැඩි ශිෂ්‍ය සංඛ්‍යාවක් සාමාන්‍ය පෙළ දක්වා පමණක් අධ්‍යාපනය ලබන්නන් බවට ජන හා සංඛ්‍යාලේඛන දත්ත අනුව පෙනී යයි.

සීතාවක සැලසුම් ප්‍රදේශය තුල වර්ෂ 2016 වනවිට සිටින සමස්ථ ජනගහනය 162,000 කි. මුළු ජනගහනයෙන් අධ්‍යාපනයෙහි නියැලෙන ප්‍රමාණය 20% කි. සීතාවක සැලසුම් ප්‍රදේශය සඳහා පිළියෙල කරන නව සංවර්ධන සැලැස්ම අනුව ලක්ෂ 02 කට ආසන්න ජනගහනයක් දක්වා වර්ෂ 2030 වනවිට වැඩිවන බව පෙනී යයි. ඒ අනුව වර්ෂ 2030 වනවිට සමස්ථ ජනගහනයෙන් 25% ක ප්‍රතිශතයක් අධ්‍යාපනය ලබන බව උපකල්පනය කිරීම සිදුකළ විට 50,000 ක ශිෂ්‍ය පිරිසක් කරා අවධානය යොමුකළ යුතුය.

මේ අනුව 2030 වර්ෂය සඳහා ඉහත පුරෝකථනය කරන ලද අධ්‍යයනයන් ලබාදිය යුතු ශිෂ්‍ය සංඛ්‍යාව සඳහා අවශ්‍ය පාසැල් මුළු ප්‍රදේශය පුරාම පැතිර පවතින බව නිරීක්ෂණය කළ හැකිය. ඒ අනුව යෝජිත මධ්‍යම ඝනත්ව නේවාසික ප්‍රදේශ තුල පවතින ප්‍රාථමික හා ද්වීතියික පාසැල් තවදුරටත් සංවර්ධනය කළ යුතුව පවතී. එහිදී සංවර්ධනය කළ යුතු පාසැල් පහත වගුව ආශ්‍රයෙන් පෙන්වා දිය හැකිය.

*වගු අංක 6. 1 - සැලසුම් ප්‍රදේශය තුල සංවර්ධනය කළ යුතු මට්ටමේ පවතින පාසැල්*

| පාසලේ නම | යෝජිත සංවර්ධනය |
|---|---|
| 1. කොස්ගම මහා විද්‍යාලය | භෞතික පහසුකම් ඉහළ නැංවීම සහ මානව සම්පත් ඉහළ නැංවීම. |
| 2. ශ්‍රී සුමනජෝති මහ විද්‍යාලය | |
| 3. බොරළුගොඩ මහ විද්‍යාලය | |
| 4. ශ්‍රී පියරතන මහ විද්‍යාලය | |
| 5. වග, රත්නසාර මහ විද්‍යාලය | |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

2030 වර්ෂය වනවිට අධි සංවේදී පරිසර කලාපය තුල ජන ව්‍යාප්තිය අවම කිරීමට යෝජිත බැවින්, එම කලාපය තුල පිහිටා ඇති පාසැල්වල පවත්නා සංවර්ධනයන් මේවනවිටත් ප්‍රමාණවත් මට්ටමක පවතින බවට හඳුනාගන්නා ලදී. අකරවිට මහ විද්‍යාලය, මායාදුන්න මහ විද්‍යාලය, හංවැල්ල රාජසිංහ මධ්‍යම විද්‍යාලය සහ කනම්පැල්ල කණිෂ්ඨ විද්‍යාලය ඒ අතර හඳුනාගෙන ඇත. එමෙන්ම, කළුගල් කැඩීමේ කර්මාන්තය, පශු සම්පත් කර්මාන්තය ඇතුලත් වතු කෘෂිකාර්මික කලාපය තුල පිහිටා ඇති දිද්දෙණිය කණිෂ්ඨ විද්‍යාලය අවදානම් කලාපයක් තුල පවත්නා පාසලක් ලෙසට හඳුනාගන්නා ලදී.

2016 සම්පත් පැතිකඩ වාර්තා අනුව ප්‍රදේශයේ උසස් පෙළ විභාගය සඳහා ඉදිරිපත් වන සිසු පිරිසෙන් සමත්වන සිසු ප්‍රතිශතය 20% කටත් අඩු බවට වාර්තා වී ඇත. ඒ අනුව විශ්ව විද්‍යාල අධ්‍යාපනය කරා යොමුවන සිසුන් සංඛ්‍යාව ඉතාමත් පහළ අගයක් ගෙන ඇත. එම නිසා ප්‍රදේශයේ පවතින කර්මාන්ත සඳහා අවශ්‍ය කරන වෘත්තීය නිපුණත්වයෙන් යුත් ශ්‍රමික පිරිසක් බිහිකිරීම සඳහා පාදුක්ක නගරය තුල පවතින වෘත්තීය මධ්‍යස්ථානය දැනට තවදුරටත් සංවර්ධනය කළ යුතු බවට හඳුනාගන්නා ලදී. ඒ තුලින් විශ්ව විද්‍යාල අධ්‍යාපනය ලබාගත නොහැකි තරුණ පිරිස් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම හා විවිධ වෘත්තීය ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුම ලබාදීමට අපේක්ෂා කෙරේ.

### 6.3.1.3 නේවාසික සේවා උපාය මාර්ග

2050 වනවිට ජාතික භෞතික සැලැස්මේ සඳහන් වන පරිදි ප්‍රධාන ආර්ථික තීරය (East – West Economic Corridor) සහ මධ්‍යම පාරිසරික සංවේදී කලාපයට (Central Environmental Sensitive Area) ඇතුලත්වීම හේතුකොට ගෙන අපේක්ෂිත ජනඝනත්වය ව.කි.මී. 501 - 750 අතර අගයකට අයත් විය යුතුය.

ඒ අනුව ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි කොට්ඨාශවල පවතින ස්වභාවික ජනඝනත්ව වර්ධන වේගය පාදක කරගනිමින් 2030 වසර වනවිට පැවතිය හැකි ජනගහනය පුරෝකථනය කරන ලදී. ඒ අනුව 2016 වර්ෂයේ ජනගහනයට වඩා 35,373 කින් 2030 වනවිට ජනගහනය වැඩිවීමකි. නමුත් සැලසුම් ප්‍රදේශයේ ජනගහන වර්ධන වේගය 1% ට වඩා වැඩි ග්‍රාම නිලධාරි කොට්ඨාශවල ජනගහන වර්ධන වේගය සාමාන්‍ය අගය ගෙන පුරෝකථනය කළවිට, 2016 වර්ෂයට වඩා ජනගහනය 2030 වර්ෂයේදී 37,784 ක අගයක් ගනී.

ඒ අනුව මූලිකවම ප්‍රදේශයේ පවතින පරිසර සංවේදී කලාප ආරක්ෂා කරගැනීම සැලකිල්ලට ගත්විට, ප්‍රදේශය සඳහා යෝග්‍ය ජනගහන වර්ධන වේගය ලෙස ස්වභාවික වර්ධන වේගය පමණක් යෝග්‍ය වන බවට හඳුනාගන්නා ලදී.

ස්වභාවික වර්ධන වේගය අනුව වර්තමානයේ, සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවුල් ඒකක 37, 646 සඳහා නිවාස ඒකක 38,526 ක් ව්‍යාප්තව තිබූ බවට 2016 වර්ෂයේ සම්පත් පැතිකඩ වාර්තා මගින්

තහවුරු වේ. පවතින පවුල් සංඛ්‍යාවට වඩා වැඩි නිවාස ඒකක පිහිටා තිබීම තුලින් නිවාස 880 ක පමණ අතිරික්තයක් ඇති බව පෙනේ. ඒ අනුව බල ප්‍රදේශය තුල පවුල් සංඛ්‍යාවට සරිලන පරිදි නිවාස ඒකක ප්‍රමාණවත්ව ස්ථාපිත වී ඇති බව පෙනී යයි. එම නිවාස අතුරින් ස්ථිර ව්‍යුහයේ නිවාස 92% ක් වැනි ඉහළ ප්‍රතිශතයකින් යුක්ත වේ. ඉහළ නිවාස ඝනත්වයක් ප්‍රධාන මාර්ග මූලික කරගනිමින් ව්‍යාප්තව ඇත. මෙම නිවාසවලින් විශාල ප්‍රමාණයක් තනි මහලේ නිවාස ඝනයට අයත් වේ. සාමාන්‍ය පවුලක සාමාජික සංඛ්‍යාව 04 ක් ලෙස ගෙන වර්ෂ 2030 වනවිට පුරෝකථනය කරන ලද ජනගහනයට අවශ්‍ය නිවාස ඒකක සංඛ්‍යාව 50,387 ක් පමණ බව ගණනය කළ හැකි අතර, ඒ අනුව, වර්ෂ 2016 ට සාපේක්ෂව නව නිවාස ඒකක 12,741 ක පමණ 2030 වර්ෂය වනවිට අළුතින් ඉදිකළ යුතු බව නිගමනය කළ හැක.

එහිදී, හංවැල්ල, පාදුක්ක, කොස්ගම සහ වග යන නාගරික ප්‍රදේශයන්හි මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය ලෙස හඳුනාගත් ප්‍රදේශයන්වල 2030 වර්ෂය වනවිට ජනගහනය ව.කි.මී. 01 ට 1,501 - 3,000 ත් වන බව අපේක්ෂා කරන අතර, ඊට සාපේක්ෂව අළුතින් ඉදිවන නිවාසයන් ක්‍රමයෙන් ස්ථාපිත වන ආකාරයට විශේෂ රෙගුලාසි මෙම සැලැස්මෙන් හඳුන්වා දී ඇති අතරම, එම ප්‍රදේශ තුල මහල් නිවාස ව්‍යාපෘති ඉදිකිරීම සඳහා වන රෙගුලාසි සම්බන්ධ වැඩිදුර විස්තර කිරීම් වෙළුම II යටතේ සඳහන් කර ඇත.

මෙම සංවර්ධන සැලැස්ම තුලින් සමෘද්ධිමත් නේවාසික සැලැස්මට අනුව අධි සංවේදී පරිසරයට හානි නොවන ලෙස නේවාසික සංවර්ධනයක් ඇති කිරීමට බලාපොරොත්තු වේ. සංචාරක ප්‍රවර්ධන කලාපය හා අඩු ඝනත්ව නේවාසික කලාපය තුල නේවාසික ඉඩප්‍රස්ථා විවර කර ඇති අතර, එම සංවර්ධන ඝනත්වයන් රෙගුලාසි මගින් පාලනය කිරීමට යෝජනා කර ඇත.

කෙසේවෙතත්, ප්‍රදේශය තුල ඉහළ නේවාසික ව්‍යාප්තියක් අපේක්ෂා නොකරන අතරම, වතු කෘෂිකාර්මික කලාප - I හා වතු කෘෂිකාර්මික කලාප - II තුලද, පශු සම්පත් ප්‍රවර්ධන කලාපය තුලද නේවාසික ව්‍යාප්තිය සීමාකර ඇත.

තවදුරටත්, නේවාසික සේවා සඳහා අත්‍යවශ්‍ය අපරව්‍යුහ පහසුකම්ද මෙම සැලැස්ම තුලින් ප්‍රවර්ධනය කිරීමට යෝජනා කරන අතර, ඒ පිළිබඳව ඉදිරි පරිච්ඡේදවලදී සාකච්ඡා කෙරේ.

***සිතියම් අංක 6. 3 - සේවා කළමනාකරණ සැලැස්ම (2030)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

### 6.3.1.4 සේවා මධ්‍යස්ථාන ප්‍රමුඛතා උපාය මාර්ග

වර්තමානයේ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල නාගරික සේවා සපයන මධ්‍යස්ථාන අතරින් ප්‍රමුඛස්ථානයෙහිලා පාදුක්ක සහ හංවැල්ල යන නගර හඳුනාගත හැකි අතර, වග, කොස්ගම, තුම්මෝදර සහ මීපේ යන නගර මංසන්ධි ආශ්‍රිත කොටගෙන කුඩා නගර ලෙස සංවර්ධනය වී ඇත.

කෙසේවුවද, මෙම නගර ආශ්‍රිතව නේවාසික හා සංක්‍රමණික ජනතාවට ලබාගත හැකි සේවාවන් ප්‍රශස්ථ මට්ටමක නොමැති බවට හඳුනාගත් අතර, එම ජනතාවගේ පහසුව උදෙසා සැලසුම් ප්‍රදේශයේ පවතින නගර ප්‍රමුඛතාගත කර සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකළ යුතුව පවතී.

*වගු අංක 6. 2 - ප්‍රමුඛතා පදනම මත නගර වර්ගීකරණය*

| ප්‍රමුඛතාවය | නගරය |
|---|---|
| පළමු | හංවැල්ල<br>පාදුක්ක |
| දෙවන | කොස්ගම |
| තෙවන | වග<br>මීපේ |
| සතරවන | තුම්මෝදර |

**මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)**

ඉහත වගුවේ දැක්වෙන පරිදි නගර ප්‍රමුඛතාගත කිරීමේදී, සැලසුම් ප්‍රදේශයේ සංවර්ධනය පීඩන විශ්ලේෂණය, සංවර්ධන විභවතා විශ්ලේෂණය, සංවේදී පරිසර විශ්ලේෂණය, ජනාවාස ව්‍යාප්තිය සඳහා සුදුසු ප්‍රදේශ විශ්ලේෂණය සහ පවත්නා දුම්රිය ස්ථාන හා යෝජිත නව දුම්රිය මාර්ගයන් යන සාධක පාදක කරගන්නා ලදී (ප්‍රමුඛතා පදනම මත නගර වර්ගීකරණය සඳහා බර තැබීම - ඇමුණුම් අංක 04).

බස්නාහිර පළාත් ව්‍යුහාත්මක සැලැස්ම - 2010 (Proposed Structure Plan - 2010) අනුව හංවැල්ල නගරය හා පාදුක්ක යන නගර සේවා සැපයුම් නාගරික මධ්‍යස්ථාන ලෙස හඳුනාගෙන ඇත. තවද, ඉදිරියේදී සංවර්ධනයවීමට යෝජිත හයිලෙවල් මාර්ගය, ලෝලෙවල් මාර්ගය, හංවැල්ල බස්නැවතුම්පල, කැලණිවැලි දුම්රිය මාර්ගය ද්වීත්ව විදුලි දුම්රිය මාර්ගයක් බවට පත්වීම හරහා 70,000 ක පමණ සංක්‍රමණික ජනගහනයකට සහ යෝජිත මධ්‍යම ඝනත්ව නේවාසික කලාප තුල ජීවත්වන ජනගහනයට පහසුකම් සැපයීමට හැකිවන පරිදි හංවැල්ල සහ පාදුක්ක යන නගර පළමු මට්ටමේ නගරයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

කොස්ගම නගරය සඳහා යෝජිත කොස්ගම - කැලණිය විදුලි දුම්රිය මාර්ගය සහ කැලණිවැලි ද්වීත්ව දුම්රිය මාර්ගය කොස්ගම නගරය හරහා ගමන් කිරීම සහ කොස්ගම සතිපොල, ප්‍රාදේශීය සභා පරිපාලන ආයතන මෙම නගරය තුල පිහිටා තිබීමත්, අවිස්සාවේල්ල මාර්ගය නගරය හරහා ගමන් කිරීමත්, කැලණි ගඟ පිටාර ගැලීමෙන් ඇතිවන ගංවතුර ආපදා තත්ත්වයන් අවම නාගරික ප්‍රදේශයක් කිරීමත් යන සාධක හේතුකොට ගෙන 2030 වර්ෂයේදී කොස්ගම නගරය සඳහා 25,000 ක් පමණ සංක්‍රමණික ජනගහනයක් අපේක්ෂා කරන අතර, යෝජිත මධ්‍යම ඝනත්ව නේවාසික ජනගහනයටද පහසුකම් සැපයීමට හැකිවන පරිදි විශේෂයෙන්ම නේවාසික කටයුතු සඳහා ප්‍රමුඛස්ථානයක් ලබාදෙන දෙවන මට්ටමේ නගරයක් ලෙසට හඳුනාගත හැකිය.

තෙවන මට්ටමේ නගරයක් ලෙස හඳුනාගත් වග නගරය තුල පවතින දුම්රිය ස්ථානය සහ ලබුගම - කළුඅග්ගල මාර්ගය ප්‍රදේශය හරහා ගමන් කිරීම යන සාධක මූලික කරගනිමින් 5,000 ක පමණ සංක්‍රමණික ජනගහනයක් බලාපොරොත්තු වේ. තවද, මධ්‍යම ඝනත්ව නේවාසික ප්‍රදේශ වන කහහේන, වග ප්‍රදේශය සංවර්ධනය කිරීමට ජනාවාස සඳහා සුදුසු ප්‍රදේශ හඳුනාගැනීමේ විශ්ලේෂණය මගින් පෙන්වා දෙන ලදී.

මීට අමතරව, සිව්වන මට්ටමේ නගරයක් ලෙස හඳුනාගත් මීපේ නගරය, සංචාරකයින් සඳහා මාර්ගෝපදේශකත්වය සපයන නගරයක් ලෙස සංවර්ධනය කිරීමටත්, පස්වන මට්ටමේ පවතින තුම්මෝදර නගරය සංචාරක ආකර්ශණය ලබාගත් සහ ප්‍රදේශයේ පවතින පාරම්පරික කර්මාන්තවල නිෂ්පාදනයන් අලෙවි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් ලබාගැනීමට හැකි කුඩා නගරයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ.

***සිතියම් අංක 6. 4 - යෝජිත නාගරික සේවා මධ්‍යස්ථාන ධූරාවලිය (2030)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

### 6.3.2 මාර්ග හා ප්‍රවාහන උපාය මාර්ග

කොළඹ දිස්ත්‍රික්කය තුල ග්‍රාමීය ලක්ෂණ පෙන්නුම් කරන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයක් වන මෙහි කඳු පද්ධතිවලින් ගහණ භූවිෂමතා ලක්ෂණ හා පිහිටීම අනුව, දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රදේශවලට සාපේක්ෂව අඩු ඝනත්වයකින් යුත් මාර්ග පද්ධතියක් සහිත ප්‍රදේශයක් ලෙස හඳුනාගත හැකිය.

මාර්ග පද්ධතිය තුල හයිලෙවල් මාර්ගය හා කොළඹ - හංවැල්ල පරණ පාර (ලෝලෙවල් මාර්ගය), මීපේ - ඉංගිරිය, පාදුක්ක - හොරණ ආදී මාර්ග කිහිපයක් මූලික වන අතරම, කොළඹ සිට අවිස්සාවේල්ල දක්වා ගමන් කරන කැලණිවැලි දුම්රිය මාර්ගයේ පාදුක්ක, කොස්ගම, පින්නවල ආදී දුම්රිය නැවතුම්පලවල් ප්‍රදේශයේ ප්‍රවාහන පද්ධතියට දායකත්වයක් සපයයි.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වැඩි වශයෙන්ම රථවාහන ගමනාගමනය හයිලෙවල් හා ලෝලෙවල් මාර්ගයන් හරහා සිදුවන අතරම, වර්ෂ 2014 දී සිදුකරන ලද කොළඹ රථවාහන අධ්‍යයනයට (COMTRANS) අනුව කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රවාහන තදබදය දක්නට ලැබෙන ප්‍රධාන මාර්ග කිහිපයක් හඳුනාගෙන ඇති අතර, ඊට හයිලෙවල් මාර්ගය හා ලෝලෙවල් මාර්ගය ඇතුළත්වී ඇති බැවින්, එම මාර්ග සඳහා විශේෂ අවධානය යොමුකළ යුතුව ඇත.

හයිලෙවල් මාර්ගයේ ප්‍රවාහන ධාරිතාවය (Road Capacity) පැයකට වාහන 2,300 (PCY) ක ප්‍රමාණයකි. කොළඹ රථවාහන අධ්‍යයනයට (COMTRANS) අනුව වර්ෂ 2014 දී හයිලෙවල් මාර්ගයේ ප්‍රවාහන ධාරිතාවය පැයකට වාහන 2,000 ක් දක්වා වර්ධනය වී ඇත. තවද, ලෝලෙවල් මාර්ගයේ ප්‍රවාහන ධාරිතාවය පැයකට වාහන 2,200 ක පමණ අවකාශය තිබුණද, වර්ෂ 2014 වනවිට එය පැයකට වාහන 2,900 ක් දක්වා වර්ධනය වී ඇත. විශේෂයෙන්ම කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රධාන මාර්ගයන් අතර පවතින හයිලෙවල් හා ලෝලෙවල් යන ප්‍රධාන මාර්ගයන් දෙකම සීතාවක සැලසුම් ප්‍රදේශය හරහා ගමන් කරන නිසාවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ සිදුවන සීඝ්‍ර සංවර්ධනයත් සමඟ සැලසුම් ප්‍රදේශය තුල වාහන තදබදය ඉදිරියටත් වැඩිවීමේ ප්‍රවණතාවයක් දැකගත හැකිය. එයට සාපේක්ෂව ඉහළ භෞතිකමය සංවර්ධනයක් මෙම මාර්ගයන් දෙපස සිදුවන බව නිරීක්ෂණය කළ හැකිය. ප්‍රදේශයේ පවතින අධික රථවාහන තදබදය මෙම මාර්ග ඔස්සේ නිරීක්ෂණය කළ හැකි අතරම, විශේෂයෙන් හංවැල්ල නගරය තුල පවතින අධික රථවාහන තදබදය හේතුවෙන් නගරවලට පැමිණෙන හා ජීවත්වන ජනතාවට දෛනිකව විවිධ අපහසුතාවයන්වලට මුහුණදීමට සිදු වී ඇත.

ඒ අනුව මෙම සැලැස්ම තුලින් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පවත්නා රථවාහන තදබදය අවම කර ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන අතර සුමට ප්‍රවාහන සේවයක් ඇති කිරීම, විශේෂයෙන් දුම්රිය ප්‍රවාහන සේවාව වෙත ජනගහනය ආකර්ශණය කරගැනීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

සීතාවක සැලසුම් ප්‍රදේශය තුල පවතින සංවර්ධනය වැඩිම නගරය ලෙස හංවැල්ල නගරය හඳුනාගත හැකිය. මේ සඳහා ප්‍රධානම හේතුව ලෙස හයිලෙවල් මාර්ගය සහ ලෝලෙවල් මාර්ගය හමුවන සුවිශේෂී ස්ථානයක් ලෙස හංවැල්ල නගරය හඳුන්වා දිය හැකිය. එම නිසා හයිලෙවල් මාර්ගය දෙපස, ලෝලෙවල් මාර්ගය දෙපස කැලණි ගඟ ඉවුර ආශ්‍රිත ප්‍රදේශ අධි සංවර්ධන පීඩනයකට ලක්ව ඇත. එය සංවර්ධන විභවතා විශ්ලේෂණය අනුව හංවැල්ල නගරය ඉතාමත් සුවිශේෂී ස්ථානයක් ලෙස හඳුනාගත හැකිය. ඒ හරහා හංවැල්ල නගරය සඳහා දැනටමත් පවතින දැඩි රථවාහන තදබදය අවම කිරීම සඳහා පහත සංවර්ධනයන් යෝජනා කරනු ලැබේ.

1. හංවැල්ල, ඉන්දියානු තෙල් සංස්ථාව (IOC) ට අයත් ඉන්ධන පිරවුම්හල අසල සිට හයිලෙවල් මාර්ගය දක්වා යෝජිත විකල්ප ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම.
2. පවත්නා විකල්ප මාර්ගය තවදුරටත් දීර්ඝව සංවර්ධනය කිරීම.

නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුකරන ලද මාර්ග සම්බන්ධතා අධ්‍යයනයන්ට අනුව, සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ප්‍රධාන නගර අතර ඇති මාර්ග සම්බන්ධතා විශ්ලේෂණය (Connectivity Analysis) සිතියම් අංක 6.5 සහ 6.6 මගින් පෙන්නුම් කරන අතර, එම අධ්‍යයනයේදී අධි සංවේදී ප්‍රදේශවලට හානිවන අයුරින් හයිලෙවල් මාර්ගය ඔස්සේ සංවර්ධන කටයුතු සිදුවෙමින් පවතින බවට අනාවරණය විය.

ඒ අනුව එම ප්‍රදේශවල සංවර්ධනයන් පාලනය කිරීමට යෝජිත විකල්ප මාර්ගයක් ලෙස කොස්ගම සිට පාදුක්ක දක්වා සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. මෙය පවතින මාර්ග පදනම් කරගනිමින් මංතීරු දෙකක් සහිතව පුළුල් කිරීම සුදුසු බවට හඳුනාගෙන ඇත. එසේ සිදුකිරීම තුලින් අධි සංවේදී ප්‍රදේශවල පවතින සංවර්ධන පීඩනය ප්‍රදේශයේ මධ්‍ය දක්වා එනම්, පාරිසරික අඩු සංවේදී ප්‍රදේශ තුලට ව්‍යාප්ත කළ හැකි වේ.

එහිදී, පාරිසරික හානිය අවම වන පරිදි ප්‍රධාන වශයෙන්ම දැනටමත් පවතින මාර්ග පද්ධතිය දියුණු කිරීම හා නව මාර්ග 02 ක් සංවර්ධනය කිරීම සිදුකළ යුතු බවට හඳුනාගන්නා ලදී. ඒ සඳහා දියුණු කළ යුතු මාර්ග හඳුනාගත් අතර, එම මාර්ගයන්හි තත්ත්වය වැඩිදියුණු කිරීමට යෝජනා කර ඇත.

*වගු අංක **6. 3** - සැලසුම් ප්‍රදේශය තුල සංවර්ධනය කිරීමට හඳුනාගත් මාර්ග*

| සංවර්ධනය කළ යුතු මාර්ගය | යෝජිත දුර (කි.මී.) |
|---|---|
| 1. කොස්ගම - කඩුගොඩ මාර්ගය පවතින තත්ත්වය තවදුරටත් සංවර්ධනය කිරීම. | 0.75 |
| 2. අරපනගම මාර්ගය සහ කඩුගොඩ මාර්ගය හමුවන ලක්ෂයේ $6^0$56’1.27”N, $80^0$ 8’6.51”E සිට බොරලුගොඩ, මාවල්ගම මාර්ගයේ $6^0$55’27.40”N, $80^0$ 7’23.12”E ලක්ෂය දක්වා නව මාර්ග කොටසක් ලෙස සංවර්ධනය කළ යුතුය. | 02 |
| 3. බොරළුගොඩ - මාවල්ගම මාර්ගය | 03 |
| 4. $6^0$54’18.85”N, $80^0$7’10.93”E ලක්ෂයේ සිට $6^0$53’36.05”N, $80^0$ 6’21.03”E ලක්ෂය දක්වා දිද්දෙණිය මාර්ගය හමුවන තෙක් නව මාර්ග කොටසක් ලෙස සංවර්ධනය කළ යුතුය. | 2.3 |
| 5. පහත්ගම - දිද්දෙණිය මාර්ගය | 4.8 |
| 6. අරුක්වත්ත - පිටුම්පේ මාර්ගය | 1.5 |
| 7. අරුක්වත්ත - ජයන්ති මාවත | 1.4 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

ඒ අනුව කොස්ගම - පාදුක්ක නගර අතර පවතින අන්තර් සබඳතාවය ඉහළ නැංවීමට මෙයින් අපේක්ෂා කෙරේ.

***සිතියම් අංක 6. 5 - මාර්ග සම්බන්ධතා විශ්ලේෂණය (2016)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***සිතියම් අංක 6. 6 - මාර්ග සම්බන්ධතා විශ්ලේෂණය (2030)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

මීට අමතරව, සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා හරිත මාර්ග යෝජනා කර ඇති අතර, හරිත මාර්ග ලෙස සංවර්ධනයට හඳුනාගත් මාර්ග කිහිපයක් පහත වගුවේ පරිදි වේ.

*වගු අංක 6. 4 - සීතාවක සැලසුම් බල ප්‍රදේශය තුල සංවර්ධනයට හඳුනාගත් හරිත මාර්ග*

| මාර්ගයේ නම | දිග (කි.මී.) | සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන ආකාරය |
|---|---|---|
| සාලාව - අකරවිට | 3.1 | මංතීරු 02 ක් සහිතව හරිත මාර්ග ලෙස දියුණු කිරීමට යෝජිතය. |
| පූගොඩ - කොස්ගම | 4 | |
| පුවක්පිටිය - තුම්මෝදර | 8.6 | |
| හංවැල්ල නගරය හැරයාමේ මාර්ගය | 2 | |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

වර්ෂ 2030 දී සේවා සපයන නගරයක් ලෙස සංවර්ධනය කිරීමට පාදුක්ක නගරය හඳුනාගෙන ඇත. ඒ අනුව වට මාවතක් සහිත සුවිශේෂී මාර්ග පද්ධතියකට හිමිකම් කියන පාදුක්ක නගරය තුල වට මාවත කාණු පද්ධතියක් සහිතව හා සේවා සැපයුම් මංතීරුවක් සහිතව සංවර්ධනය කළ යුතු බවට හඳුනාගන්නා ලදී.

*රූප සටහන් අංක 6. 4 - යෝජිත මංතීරු 02 ක් සහිත හරිත මාර්ග*




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

පාදුක්ක දුම්රිය ස්ථානය හා බස්නැවතුම්පල අතර මනා අන්තර් සබඳතාවයක් ඇතිවන පරිදි සංවර්ධනය කිරිම සඳහා, දුම්රිය ස්ථානය සහ බස්නැවතුම්පල අතර පවතින අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම අත්‍යවශ්‍ය බවද හඳුනාගෙන ඇත.

ප්‍රදේශය තුල අධිකව පවතින පෞද්ගලික වාහන සංඛ්‍යාව හේතුවෙන් ඇතිවිය හැකි වාහන තදබදය අවම කිරීම සඳහා පොදු ප්‍රවාහන සේවය ශක්තිමත් කිරීම අවශ්‍ය වන බව පෙනී යයි. එමගින් වර්ෂ 2030 වනවිට වැඩිවන 150,000 ක පමණ වූ සංක්‍රමණික ජනගහනය හා 200,000 ක් පමණ වූ නේවාසික ජනගහනය සඳහා පවතින ප්‍රවාහන අවශ්‍යතාවයක් ගුණාත්මක ලෙස ලබාදෙමින් සමෘද්ධිමත් නාගරික පුරවරයක් බවට පත්කිරීම යන අරමුණු කරා ළඟාවීම පහසු කරයි. එහිදී, මහානගර හා බස්නාහිර සංවර්ධන සැලැස්ම (Megapolis Plan) අනුව වර්ෂ 2030 වනවිට කොස්ගම නගරය හරහා කැලණිවැලි ද්වීත්ව දුම්රිය සහ කැලණිය - කොස්ගම විදුලි දුම්රිය මාර්ගයක් සංවර්ධනය කරමින් බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස පවත්නා දුම්රිය ස්ථානය ඒකාබද්ධ කරමින් නව බස්නැවතුම්පලක් ඉදිකිරීමට හඳුනාගත් අතර, හංවැල්ල නගරයේ පවත්නා බස්නැවතුම්පල නවීකරණය කිරීමට සහ වග, කහහේන දුම්රියපල පවතින භූමියේ බස්නැවතුම්පලක් ඉදිකිරීමටත් යෝජනා කෙරේ.

මෙම බහුවිධ මධ්‍යස්ථාන හරහා වැඩිවන දුම්රිය මඟී ජනතාව සඳහා සීතාවක සැලසුම් ප්‍රදේශය තුල පවතින දුම්රිය ස්ථාන 08 සඳහා එම දුම්රිය ස්ථාන හා බස්රථ පොදු ප්‍රවාහනය අතර අන්තර් සම්බන්ධතාවය වැඩිදියුණු කළ යුතු බවටද හඳුනාගන්නා ලදී. එහිදී කොස්ගම හා පාදුක්ක යන නගර තුල පවතින දුම්රිය ස්ථාන ප්‍රධාන වශයෙන්ම දියුණු කිරීම කළ යුතුය. එමෙන්ම එම මාර්ගයන් හරහා කඳුගොඩ දුම්රිය ස්ථානය, මොරකැලේ උප දුම්රිය ස්ථානය, පින්නවල දුම්රිය ස්ථාන වෙතද පහසුවෙන් ප්‍රවේශවීමට අවස්ථාව සලසාදීමටද අපේක්ෂා කෙරේ. ඒ අනුව කොස්ගම හා පාදුක්ක යන නගර සඳහා බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන සහිතව සංවර්ධනය කළ යුතු බවට හඳුනාගන්නා ලදී.

*වගු අංක **6. 5** - සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇති ප්‍රධාන මාර්ග*

| අංකය | ප්‍රවේශ මාර්ගයේ නම | පවත්නා පළල (මීටර්) | යෝජිත පළල (මීටර්) | යෝජිත මංතීරු |
|---|---|---|---|---|
| **A ශ්‍රේණියේ මාර්ග** | | | | |
| 1. | කොළඹ - රත්නපුර මාර්ගය (හයිලෙවල් පාර) | 09 | 30 | 06 |
| 2. | කොළඹ - හංවැල්ල මාර්ගය (පරණ පාර) | 09 | 30 | 06 |
| **B ශ්‍රේණියේ මාර්ග** | | | | |
| 3. | ගලගෙදර හොරණ මාර්ගය - | 09 | 13 | 02 |
| 4. | කෝට්ටේ මාර්ගය බෝපේ - | 09 | 13 | 02 |
| 5. | මීපේ ඉංගිරිය මාර්ගය - | 09 | 13 | 02 |

| අංකය | ප්‍රවේශ මාර්ගයේ නම | පවත්නා පළල (මීටර්) | යෝජිත පළල (මීටර්) | යෝජිත මංතීරු |
|---|---|---|---|---|
| 6. | කළුඅග්ගල - ලබුගම මාර්ගය | 09 | 13 | 02 |
| 7. | තුම්මෝදර - පුවක්පිටිය මාර්ගය | 05 | 13 | 02 |
| 8. | වේවැල්පනාව - වග මාර්ගය | 07 | 13 | 02 |
| 9. | කරදන - වැවිල - උඩගම - ගුරුලාන මාර්ගය | 06 | 07 | 02 |
| 10. | පාදුක්ක - දඹෝර - ගුරුලාන මාර්ගය | 06 | 07 | 02 |
| 11. | ඇස්වත්ත - රංවල මාර්ගය | 06 | 07 | 02 |
| 12. | කොස්ගම - කනම්පැල්ල - පූගොඩ මාර්ගය | 06 | 13 | 02 |
| 13. | කොස්ගම - කඩුගොඩ මාර්ගය | 07 | 13 | 02 |
| 14. | උඩුමුල්ල - මලගල මාර්ගය | 06 | 13 | 02 |
| 15. | අරුක්වත්ත - මීරියගල්ල මාර්ගය | 06 | 13 | 02 |
| 16. | බොරළුගොඩ - මාවල්ගම මාර්ගය | 06 | 13 | 02 |
| | **සැලැස්ම මගින් හඳුනාගෙන ඇති නව මාර්ග ව්‍යාපෘති** | | | |
| 17. | හංවැල්ල යෝජිත විකල්ප ප්‍රවේශ මාර්ගය (IOC ඉන්ධන පිරවුම්හල අසල සිට හයිලෙවල් මාර්ගය දක්වා) | 03 - 05 අතර | 07 | 02 |
| 18. | කොස්ගම සිට පාදුක්ක දක්වා යෝජිත ප්‍රවේශ විකල්ප මාර්ගය | 05 | 13 | 02 |
| 19. | සාලාව - අකරවිට - කළුඅග්ගල මාර්ගය (සාලාව රෝහල් මාර්ගය) | 05 | 13 | 02 |
| 20. | හංවැල්ල පවත්නා විකල්ප ප්‍රවේශ මාර්ගය දීර්ඝ කිරීම | 22 | 13 | 02 |
| 21. | පාදුක්ක වට මාවත සංවර්ධනය | 06 | 13 | 02 |
| 22. | නිරිපොල ශාන්ත මරියා මාවත සංවර්ධනය | 05 | 07 | 02 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

මෙම සැලැස්ම හරහා ප්‍රදේශයේ පවතින ප්‍රධාන මාර්ග වන “A” හා “B” ශ්‍රේණිවල මාර්ගයන්හි යෝජිත ප්‍රවේශ මාර්ග පළල දක්වා ඇති අතරම, එම සනයට ඇතුලත් නොවන ප්‍රදේශයේ පවතින පළාත් පාලන ආයතන සතු මාර්ග ”C ශ්‍රේණිය” ලෙසද, අනෙකුත් පොදු මාර්ග ලැයිස්තුව ”D ශ්‍රේණිය” ලෙසද යටතේ වර්ගීකරණය කර ඇත. මෙම ”C” හා ”D” ශ්‍රේණිවල මාර්ග පුළුල් කිරීමේ යෝජිත පළල වෙළුම II හි ඇමුණුම් යටතේ ඉදිරිපත් කර ඇත.

“C ශ්‍රේණියේ” මාර්ගවල අවම පළල අඩි 20 ක් වන ලෙස පවත්වා ගැනීමට යෝජනා කරනු ලබන අතරම, සංවර්ධන කටයුතු සඳහා අනුමැතීන් ලබාදීමේදී එහි යෝජිත පළල ලෙස යෝජනා කරනු ලබන පළලෙහි අගය සලකනු ලැබේ. ප්‍රවේශ මාර්ග පළල අඩි 20 කට වඩා අඩුවන ”D ශ්‍රේණියේ” මාර්ගවල ප්‍රවේශ පළල තවදුරටත් පුළුල් කිරීමට අදහස් නොකරන අවස්ථාවකදී, ප්‍රවේශ මාර්ගයේ මැද සිට අඩි 20 ක ගොඩනැගිලි සීමාවක් පවත්වා ගැනීමට නිර්දේශ කරන අතරම, ”D ශ්‍රේණියේ” මාර්ගවල ප්‍රවේශ මාර්ග පුළුල් කිරීමට යෝජනා කරන අවස්ථාවලදී, පුළුල් කිරීම සඳහා හඳුනාගෙන ඇති පළල යෝජිත පළල ලෙස ගනු ලැබේ. නමුත් සංවර්ධනයන් සඳහා අනුමැතීන් ලබාදීමේදී පවත්නා ප්‍රවේශ මාර්ගයේ පළලට පමණක් අනුකූල වන පරිදි සංවර්ධනයන් නිර්දේශ කරන අතර, ඉදිකිරීම් සිදුනොකරන බිම් තීරුවක් මාර්ගයට මායිම්ව පවත්වා ගත යුතුය. මේ පිළිබඳ වැඩිදුර විස්තර කිරීම් වෙළුම - II යටතේ සඳහන් කර ඇත.

***රූප සටහන් අංක 6. 5  - යෝජිත මංතීරු 06 ක් සහිත මාර්ග***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***රූප සටහන් අංක 6. 6 - යෝජිත මංතීරු 02 ක් සහිත මාර්ග***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***සිතියම් අංක 6. 7 – මාර්ග හා ප්‍රවාහන සැලැස්ම (2030)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

### 6.3.3 ජල සැපයුම් උපාය මාර්ග

සීතාවක සැලසුම් ප්‍රදේශය තුල 2030 වර්ෂය වනවිට අපේක්ෂිත ජන සංඛ්‍යාව ඉලක්කගත කරමින් මෙම යෝජිත ජල සැපයුම් සැලැස්ම පිළියෙල කර ඇත. සීතාවක සැලසුම් ප්‍රදේශය තුල ජල සැපයුම සම්බන්ධයෙන් අවධානය යොමුකළ විට පැහැදිලි වනුයේ, ජලය සපයාගැනීම විවිධ මූලාශ්‍ර හරහා සිදුකරන බවයි. 2012 වර්ෂයේදී ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති දත්ත වාර්තා අනුව සීතාවක සැලසුම් ප්‍රදේශය තුල පානීය ජල අවශ්‍යතා පහත සඳහන් මූලාශ්‍ර මගින් විවිධ ප්‍රමාණවලින් සපුරාගන්නා බව පැහැදිලි වේ.

*වගු අංක **6. 6 -** ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතාවය සපුරාගන්නා ආකාරය **(2012)***

| ජල මූලාශ්‍රය | පවුල් සංඛ්‍යාව | ප්‍රතිශතය(%) |
|---|---|---|
| ප්‍රදේශය තුල පවතින ආරක්ෂිත ළිං | 12,361 | 43 |
| ප්‍රදේශයෙන් බැහැරව පවතින ආරක්ෂිත ළිං | 2,755 | 9.5 |
| අනාරක්ෂිත ළිං | 488 | 1.6 |
| නල ජලය ප්‍රදේශය තුල ඇත. ප්‍රධාන ජල සැපයුමෙන් | 5,069 | 17.6 |
| නල ජලය, සේවා ප්‍රදේශය තුල පරිබාහිරව ඇති ප්‍රධාන ජල සැපයුමෙන් | 920 | 3.2 |
| නල ජලය, පරබාහිර ප්‍රධාන සැපයුමෙන් | 419 | 1.4 |
| ග්‍රාමීය ජල සැපයුම | 5,147 | 17.9 |
| නල ළිං | 86 | 0.29 |
| ගංගා, ජලාශ්‍ර | 1,368 | 4.7 |
| වෙනත් | 126 | 0.4 |
| **එකතුව** | **28,739** | **100** |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (2012)

ඉහත දත්ත අනුව මෙම ප්‍රදේශයේ ජීවත්වන ජනගහනයෙන් බහුතරයක් එනම්, 50% ක ප්‍රමාණයක් ප්‍රදේශය තුල පවතින ආරක්ෂිත ළිං ජලය භාවිතා කිරීමට යොමු වී ඇති බවට පෙනී යයි. නල ජලය භාවිතය පිළිබඳව සැලකීමේදී, ප්‍රදේශයේ ජීවත්වන ජනගහනයෙන් 22.2% ක පමණ නල ජලය භාවිතා කරන බව නිරීක්ෂණය කළ හැකිය. මීට අමතරව ග්‍රාමීය ජල යෝජනා ක්‍රම හරහා මුළු ජනගහනයෙන් 18% ක් පමණ ප්‍රතිශතයක් ජල අවශ්‍යතා සපුරා ගනු ලැබේ.

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය පුරෝකථනයන්ට අනුව දිනකට පුද්ගලයෙකුගේ ජල අවශ්‍යතාවය ලීටර 172 ක් වශයෙන් ගණනය කර ඇත.

2016 වසරෙහි සීතාවක සැලසුම් ප්‍රදේශය තුල නේවාසික ජනගහනය 162,729 ක් පමණ වන බව සම්පත් පැතිකඩ වාර්තා අනුව වාර්තා කර ඇත. තවද, ප්‍රදේශයේ දැනට පවතින සීතාවක උද්භිද උද්‍යානය, පාරිසරික සංචාරක හෝටල් හා පෞරාණික පන්සල්, ලෙෂර් වර්ල්ඩ්, වාණිජ, කර්මාන්ත, රෝහල් ආදි සේවා ලබාගැනීම සඳහා සංසරණය වන ජනගහනය 75,000 ක් පමණ වන බව උපකල්පනය කළ විට, 2016 වර්ෂයේදී මුළු ජල පරිභෝජනය පහත වගුවේ පරිදි පෙන්වා දිය හැකිය.

*වගු අංක 6. 7 - ජල පරිභෝජනය (2016)*

| | ජනගහනය | දිනකට භාවිතා කරන ජල ලීටර් ප්‍රමාණය | දිනකට අවශ්‍ය ජල පරිමාව (ඝන මීටර්) |
|---|---|---|---|
| **නේවාසික** | 162,729 | 172 | 27,989 |
| **සංසරණය වන** | 75,000 | 100 | 7,500 |
| **එකතුව** | | | **35,489** |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

නමුත් සැලසුම් ප්‍රදේශයේ ජනතාවගෙන් 50% කට අධික පිරිසක් තම ජල අවශ්‍යතාවය ළිං ජලය ඔස්සේ ලබාගැනීමට හේතුකොටගෙන පවත්නා ග්‍රාමීය ජල යෝජනා ක්‍රම භාවිතා කිරීම මත දෛනික ජල අවශ්‍යතාවය ඝන මීටර් 15,000 ක් දක්වා සීමා වී ඇත.

තවද, ලබුගම ජලාශ්‍රය, කලටුවාන ජලාශ්‍රයෙන් කොටසක් සැලසුම් ප්‍රදේශය තුල පිහිටා ඇත. ලබුගම, කලටුවාන ජලාශ්‍රයේ ජල ධාරිතාවය ඝන මීටර් 59,000 ක් වන අතර, දෛනික පිරිපහදු ජලය ඝන මීටර් 44,000 ක පමණ නිෂ්පාදනය කිරීමේ හැකියාවක් පවතී. (ඇමුණුම් අංක 05) තවද, කලටුවාන ජලාශ්‍රයේ ජල ධාරිතාවය ඝන මිටර් 91,000 ක් වන අතර, එම ජලාශ්‍රයේ පිරිපහදු මධ්‍යස්ථානය මගින් දෛනික ජලය ඝන මීටර් 83,000 ක් පමණ නිෂ්පාදනය කරනු ලැබේ. තවද, කොස්ගම නගරය තුල පිහිටා ඇති ජල පිරිපහදු මධ්‍යස්ථානය තුල ඝන මීටර් 2,750 ක ජල පරිමාවක් පවතින අතර, දෛනික ඝනමීටර් 1,100 ක ජල පරිමාවක් නිෂ්පාදනය කරනු ලැබේ. (මූලශ්‍රය : ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය)

මෙම ජල පිරිපහදු මධ්‍යස්ථාන හරහා සීතාවක බල ප්‍රදේශය ජල අවශ්‍යතාවය මෙන්ම කොළඹ, බත්තරමුල්ල, කඩුවෙල, ජල්තර ප්‍රදේශ සඳහාද ජලය සපයනු ලබයි. මේ අනුව වර්තමානයේදී සැලසුම් ප්‍රදේශය තුල පානීය ජලය සපයා ගැනීමේ ගැටළුවක් නොපවතින බව නිගමනය කළ හැකිය.

බස්නාහිර පළාත් මහානගර සැලැස්මේ (2013) හි වෙළුම VI ට අනුව සැලසුම් ප්‍රදේශයට අයත් හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පවතින ග්‍රාම නිලධාරි කොට්ඨාශ 54 ම කොස්ගම ජලා පිරිපහදු මධ්‍යස්ථානය, ලබුගම ජල පිරිපහදු මධ්‍යස්ථානය මගින් 2040 වර්ෂය වන තෙක්ම ජලය සැපයීමේ හැකියාවක් පවතින බවයි.

තවද, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල පවතින ග්‍රාම නිලධාරි වසම් 36 ම ආවරණය වන පරිදි ලබුගම හා කලටුවාන පිරිපහදු මධ්‍යස්ථාන මගින් වර්ෂ 2040 දක්වාම ජලය සැපයිය හැකි බව බවයි. මේ අනුව 2030 වර්ෂය සඳහා අවශ්‍ය වන අතිරික්ත ජල ඝනමීටර් 15,000 ක් දෛනික ජල පරිමාව සපයාගැනීමේ හැකියාව පවතින බවයි.

ඒ අනුව ගත්විට වර්ෂ 2030 වනවිට වැඩිවන ජනගහනය සඳහා අත්‍යවශ්‍ය වන පානීය ජල අවශ්‍යතාවය ඝන මීටර් 49,000 කට පමණ ආසන්න වන බව පහත වගුව මගින් පෙන්වා දී ඇත. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් එම ජල අවශ්‍යතාවය සපුරාලීමට කටයුතු කළ යුතුව ඇත.

*වගු අංක **6. 8** - සීතාවක සැලසුම් බල ප්‍රදේශයේ පානීය ජල අවශ්‍යතා (2030)*

| ජනගහනය | සංඛ්‍යාව | එක් පුද්ගලයෙකු සඳහා දිනක ජල ඉල්ලුම (දිනකට ලීටර) | අවශ්‍ය ජල සැපයුම (දිනකට ඝන මීටර්) |
|---|---|---|---|
| ජීවත්වන ජනගහනය - 2030 | 198,000 | 172 | 34,056 |
| සංක්‍රමණික ජනගහනය - 2030 | 150,000 | 100 (උපකල්පනය කරන ලදී.) | 15,000 |
| **අවශ්‍ය වන මුළු ජල සැපයුම** | | | **49,056** |

මූලාශ්‍රය : ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය (NWSDB) - (2016)

2030 වසර සඳහා වූ පුරෝකථනය කරන ලද මුළු ජල ඉල්ලුම සපුරා ගැනීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් වර්ෂ 2013 දී දියත් කරන ලද ලබුගම, කලටුවාන පිරිපහදු මධ්‍යස්ථානවල සංවර්ධනයන් සඳහා කරන ලද ව්‍යාපෘති මගින් ප්‍රතිලාභී ප්‍රදේශ සඳහා සීතාවක හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අයත් වේ. තවද, ප්‍රදේශයේ පවතින නල ජල පද්ධතිය පැතිර පවතින ආකාරය සිතියම් අංක 6.8

මගින් පෙන්වා දී ඇති අතර, හංවැල්ල, කොස්ගම පාදුක්ක, වග නාගරික ප්‍රදේශ සියල්ලම ආවරණය වන පරිදි ජල නල පද්ධතිය පැතිර පවතින බව පෙනී යයි.

නමුත් ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික උත්පාදන මාර්ගයක් වන කළුගල් කර්මාන්තය හා පශු සම්පත් කර්මාන්තය මගින් වක්‍රාකාරව ජල මූලාශ්‍රවලට හානි සිදුවන බවට පැමිණිලි ඉදිරිපත්ව ඇත. ඊට අමතරව කසල හා සත්ත්ව අපද්‍රව්‍යයන් ජලාශ්‍රිත මූලාශ්‍ර සමඟ එකතුවීම පශු සම්පත් කර්මාන්තය හරහා ස්වභාවික ජල මූලාශ්‍රවලට සිදුවන අහිතකර ප්‍රතිඵලයන් වේ. මෙම සැලැස්ම හරහා ජල සැපයුම ශක්තිමත් කිරීම සඳහා හා ජල මූලාශ්‍ර සුරක්ෂිත කිරීම සඳහා පහත ක්‍රියාමාර්ග යෝජනා කළ හැකිය.

1. සැලසුම් බල දේශයේ ජල පෝෂිත හා පාරිසරික සංවේදී ප්‍රදේශයන්ගෙන් බැහැරව පශු සම්පත් හා ඛණිජ සම්පත් (කළුගල් කැඩීමේ කර්මාන්තය) ආශ්‍රිත කටයුතු සිදුකිරීම සඳහා විශේෂ කලාපයක් හා ඒ සඳහා වූ නව රෙගුලාසි හඳුන්වාදීමක් සිදුකර ඇති අතර, ඒ තුලින් එම කර්මාන්ත හරහා ස්වභාවික ජල මූලාශ්‍රවලට වන බලපෑම අවම කිරීමට හඳුනාගෙන තිබේ.

2. ප්‍රදේශයේ වටිනා ජල මූලාශ්‍ර ආරක්ෂා කරගැනීමට සැලසුම්මය මැදිහත්වීමක් අවශ්‍ය වන අතරම, ඒ සඳහා අදාළ පළාත් පාලන ආයතනයේ හා මධ්‍යම පරිසර අධිකාරියේ විශේෂ අවධානය යොමුකළ යුතුය.

3. කිසිඳු ජල නල පද්ධතියක් හරහා ජල පරිභෝජනය නොකරන ඉහළ හංවැල්ල උතුර, දකුණු වේරගොල්ල, මාඹුල, ඉලුක්ඕවිට, නිරිපොල, නැගෙනහිර මාවතගම යන ග්‍රාම නිලධාරි ප්‍රදේශ සඳහා ගුණාත්මක නල ජල සැපයුමක් සැපයීමේ හැකියාවක් පවතීද යන්න සැලකිල්ලට භාජනය කළ යුතුය.

4. අර්ධ නාගරීකරණයට ලක්වී පවතින මෙම ප්‍රදේශය සමෘද්ධිමත් නේවාසික ප්‍රදේශයක් ලෙස යෝජනා කිරීමට හඳුනාගෙන ඇති අතර, එම නිසා වැසි ජල කළමනාකරණ හා සම්බන්ධ වැසි ජලය රැස්කර භාවිතා කිරීම සඳහා පහසුකම් සැලසිය යුතුය.

***සිතියම් අංක 6. 8 - නල ජල පද්ධතිය පවතින ප්‍රදේශ***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

### 6.3.4 මල සහ අපජල කළමනාකරණ උපාය මාර්ග

2030 වර්ෂයේදී ප්‍රදේශයේ ජීවත්වන හා සංක්‍රමණික ජනගහනය සඳහා අවශ්‍ය ජලාපවහන හා මලාපවහන පද්ධතියක් පදනම් කරගනිමින් මෙම සැලැස්ම පිළියෙල කර ඇත.

වර්තමානය වනවිට සැලසුම් ප්‍රදේශයේ තුල ජීවත්වන ජනගහනය 160,000 ක් පමණ වන බව සම්පත් පැතිකඩ වාර්තා - 2016 අනුව පෙනී යයි. ලෝක බැංකු වාර්තාවල සඳහන් වන පරිදි, නාගරික ප්‍රදේශයක් තුල ජීවත්වන පුද්ගලයෙකු ජල ලීටර 120 ක් දිනකට භාවිතා කරන අතර, එයින් 80% ක ප්‍රතිශතයක් අපජලය ලෙස බැහැර කරන බවයි. ඒ අනුව දිනකට පුද්ගලයෙකු විසින් බැහැර කරන අපජල ප්‍රමාණය දිනකට ජල ලීටර 96 කි. ඉහත සම්මත අගය අනුව සීතාවක සැලසුම් ප්‍රදේශයේ දිනකට බැහැර කරන අපජල ප්‍රමාණය (2016 – 2030) පහත වගුවේ පරිදි ගණනය කර පෙන්වා දිය හැකිය.

*වගු අංක **6. 9** - සීතාවක සැලසුම් ප්‍රදේශයේ දිනකට බැහැර කරන අපජල ප්‍රමාණය (2016 - 2030)*

| වර්ෂය | ජනගහනය | එක් පුද්ගලයෙකු දිනකට බැහැර කරන අපජල ප්‍රමාණය (ලීටර) | මුළු අපජල පරිමාව (ඝන මීටර්) |
|---|---|---|---|
| 2016 | 161,729 | 96 | 15,525 |
| 2030 | 198,102 | 96 | 19,017.7 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2019)

මල අපද්‍රව්‍ය බැහැර කිරීම ගලිබවුසර් භාවිතා කරමින් සීතාවක ප්‍රාදේශීය සභාව මගින් සිදුකරනු ලබයි. නමුත් දැනට අපජලය හා මළාපවහන ජලය පිරිසිදු කිරීමේ ව්‍යාපෘති සීතාවක ප්‍රදේශය තුල ක්‍රියාත්මක නොවන බව හංවැල්ල හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ හරහා තහවුරු කරගන්නා ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස කැලණි ගඟ හා පුස්සැලි ඔය යන ප්‍රධාන ජල මූලාශ්‍ර වෙත අපජලය හා මලාපවහන ජලය මුදාහරින බවට නිරීක්ෂණය කළ හැකිය. ඉහත වැඩිවන ජනගහනය සහ නාගරීකරණය සමඟ එම තත්ත්වය තව තවත් අහිතකර ප්‍රතිඵල ගෙනදිය හැකි බව නිගමනය කළ හැකිය.

වර්තමානයේදී, හයිලෙවල් මාර්ගය හා ලෝලෙවල් මාර්ගය මුලික කරගත් වාණිජ සංවර්ධනයක් හංවැල්ල, පාදුක්ක සහ කොස්ගම යන නගර මුල් කරගෙන විහිදී යන හෙයින්, අනාගතයේදී එම නගර සමෘද්ධිමත් නේවාසික ප්‍රදේශ ඇතිකිරීම සඳහා මෙම සැලැස්ම මගින් අරමුණු කර ඇත. ඒ අනුව කොස්ගම, පාදුක්ක, හංවැල්ල සහ වග යන නගර 04 ආවරණය වන පරිදි මධ්‍යම ඝනත්ව නේවාසික කලාපයක් පිහිටුවීමට සහ වාණිජ කලාප ලෙස සංවර්ධනය වීමට යෝජිතය. එබැවින්, ඉහත කලාපීය ප්‍රදේශ සඳහා ක්‍රමවත් අපජල කළමනාකරණ පද්ධතියක් පිහිටුවිය යුතු අතර, ඒ අනුව හෙක්ටයාර 1,466.60 කින් යුක්ත ප්‍රදේශයක

සංවර්ධනය කිරීමට යෝජිත මධ්‍යම ඝනත්ව නේවාසික ප්‍රදේශ සඳහා අපජල කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීමට අපේක්ෂා කෙරේ.

මීට අමතරව, පශු සම්පත් කර්මාන්තය මගින් විශාල වශයෙන් අපජලය ජනනය වන අතරම, එය ජලාශ්‍රිත මූලාශ්‍ර සමඟ එක්වීම හේතුවෙන් ප්‍රායෝගිකව ගැටළුකාරී තත්ත්වයක් නිර්මාණය වී ඇත. ඒ හා සම්බන්ධව ලැබෙන මහජන පැමිණිලි සංඛ්‍යාව දිනෙන් දිනම ඉහළ යන අතර, එම නිසා පශු සම්පත් කර්මාන්ත වපසරිය තුලම අපජල පිරිපහදු මධ්‍යස්ථාන පිහිටුවා ගනිමින් එම කර්මාන්ත කරගෙන යාම සඳහා නව රෙගුලාසි පැනවීම සිදුකළ යුතු බව හඳුනාගන්නා ලදී.

### 6.3.5 ඝන අපද්‍රව්‍ය කළමණාකරණ උපාය මාර්ග

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ජනනය වන වර්තාගතව ඇති ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය දළ වශයෙන් ටොන් 05 - 06 න් පමණ වේ. මින් ටොන් ½ - 01 ත් අතර ප්‍රමාණයක් ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල වේ. නගරවල සහ ප්‍රධාන මාර්ගය දෙපස ඝන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව මගින් දෛනිකව එකතු කරන අතර, ජෛව හායනය වන සහ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ලෙස වර්ග 02 කට වෙන්කර කසල එකතු කිරීමේ ට්‍රැක්ටරයක් මගින් එකතු කරනු ලබයි. සීතාවක ප්‍රාදේශීය සභාව තුල දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය සංයුතිය පහත පරිදි දැක්විය හැකිය.

*වගු අංක **6. 10** - සීතාවක ප්‍රාදේශීය සභාව තුල දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය සංයුතිය*

| ඝන අපද්‍රව්‍ය | ප්‍රතිශතය (%) |
|---|---|
| 1. එළවලු | 50 |
| 2. කඩදාසි | 30 |
| 3. වීදුරු | 6.25 |
| 4. ලෝහ | 1.25 |
| 5. අනෙකුත් | 12.5 |
| **එකතුව** | **100** |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

ඉහත ඝන අපද්‍රව්‍ය හා ප්‍රාදේශීය සභා සීමාව තුල අතුරු මාර්ග ආශ්‍රිතව එකතුවන ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රාදේශීය සභාව මගින් එකතු නොකරන අතර, සෑම නිවසකම කොම්පෝස්ට් බඳුන් ලබාදී ඇති බැවින්, එම ප්‍රදේශවලදී ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ඝන අපද්‍රව්‍ය පමණක් සතියකට වරක් එකතු කරනු ලබයි.

මෙසේ එකතු කරනු ලබන ජෛව හායනය වන ඝන අපද්‍රව්‍ය සීතාවක ප්‍රාදේශීය සභාව සතු කොස්ගම පිහිටි පර්චස් 50 ක පමණින් යුත් කොම්පෝස්ට් අංගනය තුල කොම්පෝස්ට් නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගනු ලබන අතර, එමගින් මසකට කිලෝ ග්‍රෑම් 50 ක් එනම්, කොම්පෝස්ට් පැකට් 200 ක් පමණ නිෂ්පාදනය කර අලෙවි කරනු ලබයි. නමුත් පවතින කසල එකතු කිරීමේ අංගනයේ ඇති ඉඩ ප්‍රමාණය සීමා සහිත වේ.

ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය මගින් සඳහාන් කළ ඇති පරිදි එක් පුද්ගලයෙකු විසින් දිනකට ජනනය කරන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 1 – 0.4 ත් දක්වා විචලනය වන බවයි. ඒ අනුව ගත්කළ, පහත වගුවේ පරිදි වර්ෂ 2030 වනවිට ජනනය වන ඝන අපද්‍රව්‍ය ගණනය කළ හැකිය.

*වගු අංක **6. 11 -** සීතාවක සැලසුම් බල ප්‍රදේශයේ දෛනිකව ජනනය වන ඝන අපද්‍රව්‍ය **(2030)***

| වර්ෂය | ජනගහනය/ දිනකට | එක් පුද්ගලයෙකු විසින් ජනනය කරන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය | මුළු ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය (කි.ග්‍රෑ.) |
|---|---|---|---|
| 2016 | 162,729 (නේවාසික) | 01 | 162,729 |
| 2030 | 198,102 (නේවාසික) | 01 | 198,102 |
| 2030 | 150,000 (සංක්‍රමණික) | 0.4 | 60,000 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

ඉහත දත්ත අනුව නිරීක්ෂණය කළ හැක්කේ, වර්ෂ 2030 වන විට නේවාසික වශයෙන් ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය 1.2 ක ගුණයකින් පමණ වැඩිවන බවයි. ඊට අමතරව, සංක්‍රමණික ජනගහනය හේතුකොටගෙන එම ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය ඉහළ යන බවයි. ඒ අනුව 2030 වර්ෂයේදී දිනකට ජනනය වන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 250 ඉක්මවිය හැකි බවට නිගමනය කළ හැකිය.

ඉහත අධ්‍යයනය අනුව, සැලසුම් ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම අත්‍යවශ්‍ය බව හඳුනාගෙන ඇත. ඒ අනුව යෝජිත සැලසුම් ලෙස දැනට කොස්ගම ප්‍රදේශයේ ක්‍රියාත්මක කරනු ලබන කාබනික පොහොර නිෂ්පාදන අංගනයේ ධාරිතාවය අනාගත සැලසුම සඳහා ප්‍රමාණවත් නොවන බැවින්, ඒ සඳහා කළුඅග්ගල, සාලාවවත්ත ප්‍රදේශයේ අක්කර 01 ක පමණ ප්‍රදේශයක නව කාබනික පොහොර නිෂ්පාදන අංගයනයක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ. එය පහත සිතියම් අංක 6.9 මගින් නිරූපණය වේ.

***සිතියම් අංක 6. 9 - යෝජිත ඝනඅපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම (2018 - 2030)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## 6.4 ආර්ථික සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම

සීතාවක සැලසුම් ප්‍රදේශය තුල අපේක්ෂිත දිගුකාලීන දැක්ම ළඟාකර ගැනීමේදී එහි පවතින මූලික ආර්ථික විභවතාවයන් හා ඒ තුලින් ජාතික හා කලාපීය වශයෙන් ළඟාකරගත හැකි සංවර්ධනයන් පිළිබඳ මෙහිදී අවධානය යොමුකර ඇත.

එහිදී, සංවර්ධන සැලැස්ම මගින් ආර්ථික මට්ටම ඉහළ දැමීම සඳහා ප්‍රධාන වශයෙන්ම අරමුණු 06 ක් ඔස්සේ ආර්ථික සංවර්ධනය විය යුතු ආකාරය විග්‍රහ කරනු ලබයි.

අරමුණු 01 : ප්‍රදේශයේ පවතින කෘෂි කර්මාන්තය (රබර්, කුඹුරු, පොල් හා මිශ්‍ර භෝග) ආශ්‍රිත වගා බිම් ආරක්ෂා කරගැනීම සඳහා පියවර ගැනීම.

අරමුණු 02 : නව රැකියා අවස්ථා බිහිවන කෘෂි කර්මාන්තය හා බැඳුණු විශේෂ කර්මාන්ත කලාපයක් හඳුන්වාදීම.

අරමුණු 03 : ප්‍රදේශයේ පවතින ඛණිජ සම්පත්වලින් ආර්ථික වාසි ලබාගැනීම පිණිස ඛණිජ සම්පත් කර්මාන්තය ආශ්‍රිත නව කලාපයක් හඳුන්වාදීම.

අරමුණු 04 : ප්‍රදේශයේ පවතින පශු සම්පත් කර්මාන්තය හා නේවාසිකයන් අතර ඝට්ටනයක් ඇති නොවන පරිදි පවත්වා ගෙන යාම සඳහා පියවර ගැනීම.

අරමුණු 05 : පෞරාණික ස්ථාන, වන රක්ෂිත, දියඇළි, ගංගා, ඇළදොළ යනාදී ප්‍රදේශ පවතින ස්වභාවික සම්පත් ආරක්ෂා කරගනිමින් පාරිසරික සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම.

අරමුණු 06 : පරිසරය හා බැඳුණු කර්මාන්ත සහ සුරක්ෂිත නේවාසික නගරයක් බවට පත් කිරීම.

ඒ අනුව ඉහත සඳහන් කරන ලද අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා මෙම සැලැස්ම මගින් හඳුනාගන්නා ලද උපාය මාර්ගික ක්‍රියාමාර්ග පහත පරිදි විස්තර කළ හැකිය.

**අරමුණු 01 : ප්‍රදේශයේ පවතින කෘෂි කර්මාන්තය (රබර්, කුඹුරු, පොල් හා මිශ්‍ර භෝග) ආශ්‍රිත වගා බිම් ආරක්ෂා කරගැනීම සඳහා පියවර ගැනීම.**

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මුළු භූමි පරිහරණ රටාවෙන් රබර් ආශ්‍රිත වගා බිම් ප්‍රමාණය 41.8% ක්ද, කුඹුරු ආශ්‍රිත වගා බිම් ප්‍රමාණය 7.6 % ක්ද, පොල් ආශ්‍රිත වගා බිම් ප්‍රමාණය 3.4% ක් සහ මිශ්‍ර භෝග සඳහා බිම් ප්‍රමාණය 2.2% බවට 2016 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුකරන ලද භූමි පරිහරණ රටා විශ්ලේෂණය මගින් අනාවරණය වේ. ඒ අනුව ප්‍රදේශයේ පවතින ප්‍රධාන ආර්ථික කටයුත්තක් ලෙස මුළු භූමි පරිහරණ රටාවෙන් 55% ක ඉහළ අගයක් (වගු අංක 6.12) කෘෂි කර්මාන්තය හිමිකර ගෙන

ඇත. හෙක්ටර් කොබ්බැකඩුව පර්යේෂණ ආයතනය මගින් 2017 වර්ෂයේ සිදුකරන ලද සංගණනය අනුව කොළඹ දිස්ත්‍රික්කයේ මුළු රබර් කිරි නිෂ්පාදනයෙන් 62% ක ප්‍රතිශතයක් මෙම සැලසුම් බල ප්‍රදේශය තුලින් සපයනු ලබන බවට අනාවරණය වේ.

එම වගා බිම් ආරක්ෂා කරගැනීම සඳහා හෙක්ටයාර් 5,375 ක ප්‍රදේශයක් අඩු ඝනත්ව නේවාසික හා නාගරික කෘෂිකාර්මික කලාපය ලෙස කලාපීකරණ සැලැස්ම තුලින් නීතිගත කිරීමට හඳුනාගෙන ඇත.

*වගු අංක **6. 12** - සීතාවක සැලසුම් බල ප්‍රදේශයේ භූමි පරිහරණ රටාව (2017)*

| භූමි පරිහරණය | භූමි ප්‍රමාණය (ha) | ප්‍රතිශතය(%) |
|---|---|---|
| රබර් | 9327.91 | 41.8 |
| නේවාසික | 4945 | 22.2 |
| වනාන්තර | 3072.35 | 13.8 |
| කුඹුරු | 1699.17 | 7.6 |
| පොල් | 758 | 3.4 |
| මිශ්‍ර භෝග | 498 | 2.2 |
| මහා මාර්ග | 436.8 | 2 |
| තෙත් බිම් | 275.6 | 1.2 |
| ජල මාර්ග | 243.5 | 1.1 |
| කර්මාන්ත | 211.6 | 0.9 |
| වාණිජ | 195.8 | 0.9 |
| වෙනත් වගාවන් | 183.7 | 0.8 |
| අත්හරින ලද කුඹුරු | 63.8 | 0.3 |
| අත්හරින ලද ඉඩම් | 165.4 | 0.7 |
| වෙනත් | 239.45 | 1.1 |
| මුළු | 22316.5 | 100 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

**අරමුණු 02 : නව රැකියා අවස්ථා බිහිවන කෘෂි කර්මාන්තය හා බැඳුණු විශේෂ කර්මාන්ත කලාපයක් හඳුන්වාදීම.**

ප්‍රදේශයේ පවතින කෘෂි කර්මාන්තය ආශ්‍රිත කර්මාන්ත කටයුතු ප්‍රවර්ධනය කිරීම හා නව රැකියා උත්පාදන අවස්ථා බිහිකිරීම සඳහා කර්මාන්ත නඟාසිටුවීම පිණිස හෙක්ටයාර 360.6 ක ප්‍රදේශයක් විශේෂ සංවර්ධන කලාපයක් ලෙස මෙම සැලැස්මෙන් ප්‍රකාශයට පත් කෙරේ. ඒ අනුව 2030 වර්ෂය වනවිට නව රැකියා උත්පාදන අවස්ථා 10,000 කට අධික ප්‍රමාණයක් මෙම ප්‍රදේශය තුලින් බිහි වේ යැයි අපේක්ෂා කෙරේ.

**අරමුණු 03 : ප්‍රදේශයේ පවතින ඛණිජ සම්පත්වලින් ආර්ථික වාසි ලබාගැනීම පිණිස ඛණිජ සම්පත් කර්මාන්තය ආශ්‍රිත නව කලාපයක් හඳුන්වාදීම.**

මෙම ප්‍රදේශයේ පවතින ප්‍රධානම ඛණිජ සම්පත් ආශ්‍රිත කර්මාන්තය ලෙස කළුගල් කැඩීමේ කර්මාන්තය ලෙස හඳුනාගත හැකි වේ. දැනට ප්‍රදේශයේ කළුගල් කැඩීමේ කර්මාන්ත 49 ක් පමණ සක්‍රීයව පවතී. ඒ හරහා කොළඹ දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතු සඳහා ඉහළ දායකත්වයක් ලබාදෙන අතර, ජාතික මට්ටමේ ප්‍රමුඛ ව්‍යාපෘතියක් වන වරාය නගර සංවර්ධන ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය කළුගල්ද සැලසුම් ප්‍රදේශයේ කළුගල් කැඩීමේ කර්මාන්ත ඔස්සේ සපයනු ලබයි. භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ නියමයන් අනුව ප්‍රදේශයේ පවතින කළුගල් ආශ්‍රිත නිෂ්පාදනයන් මසකට කියුබික් මීටර් 35,800 ක් භාවිතා කිරීමට අවසර ලබාදී ඇති අතර, දැනට පවතින එම සම්පත් සම්බන්ධයෙන් එම ආයතනය මගින් සිදුකර ඇති සමීක්ෂණ දත්තවලට අනුව එම සම්පත් වසර 2030 ඉක්මවා භාවිතා කිරීමේ හැකියාව පවතී. (මූලාශ්‍රය : භූ විද්‍යා හා පතල් කාර්යාංශය - 2019)

කළුගල් කැඩීමේ කර්මාන්තය ප්‍රධාන වශයෙන් කපුවත්ත, දිද්දෙණියවත්ත, කුඩාකන්ද, නුරානිවත්ත, දෙල්ගස්හේන සහ කහහේන යන ප්‍රදේශ ආශ්‍රිතව පවත්වාගෙන යන අතර, මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිර්දේශිත සියලු ඛණිජ සම්පත් ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් මෙම ප්‍රදේශයේ සිදුකරගෙන යාමට ඉඩප්‍රස්ථාව මෙම සැලැස්මෙන් ලබාදී තිබේ.

**අරමුණු 04 : ප්‍රදේශයේ පවතින පශු සම්පත් කර්මාන්තය හා නේවාසිකයන් අතර ඝට්ටනයක් ඇති නොවන පරිදි පවත්වා ගෙන යාම සඳහා පියවර ගැනීම.**

පශු සම්පත් කර්මාන්තයද ප්‍රදේශයේ බහුලව පැතිරී පවතින අතර, හෙක්ටර් කොබ්බෑකඩුව පර්යේෂණ ආයතනය මගින් 2017 වර්ෂයේ සිදුකරන ලද සංගණනය අනුව කොළඹ දිස්ත්‍රික්කයේ මුළු පශු සම්පත්

නිෂ්පාදනවලින් 66% කට ආසන්න අගයක් මෙම සැලසුම් බල ප්‍රදේශය තුලින් සපයනු ලබන බවට අනාවරණය වේ.

නමුත් නේවාසික ප්‍රදේශ හා මෙම කර්මාන්ත පැවතීම හේතු කොටගෙන පාරිසරික හා සමාජීය වශයෙන් ගැටළුකාරී තත්ත්වයන්ට ප්‍රදේශයේ ජනතාවට මුහුණදීමට සිදුවී ඇත. එබැවින් එම කර්මාන්ත පවත්වාගෙන යාම හෙක්ටයාර් 420 ක පමණ නිශ්චිත ප්‍රදේශයකට පමණක් සීමා කිරීමේ අවශ්‍යතාවය හඳුනාගන්නා ලදී. ඒ අනුව කලාපීකරණ සැලැස්ම යටතේ පශු සම්පත් කර්මාන්තය පවත්වාගෙන යාම සඳහා 2030 වර්ෂයේදී නේවාසික ඝනත්වය අඩු ප්‍රදේශ මේ සඳහා හඳුනාගෙන ඇත. ඒ අනුව පශු සම්පත් කර්මාන්ත කලාප ලෙස උතුරු කඳුගොඩ, දකුණු කඳුගොඩ. වැලිකන්න, එලමලවල, උතුරු පින්නවල ආදී ග්‍රාම නිලධාරි ප්‍රදේශ හඳුනාගෙන ඇති අතර, ඒ හරහා දැනට සාර්ථකව සිදුකරන ප්‍රධාන පශු සම්පත් කර්මාන්ත සමඟ ඒකාබද්ධ කරමින් සංවර්ධනය කිරීමට අරමුණු කරයි. එමෙන්ම කලාපීකරණයේදී ඒ සඳහා විශේෂ නීතිරීති හඳුන්වාදී ඇත.

**අරමුණු 05 : පෞරාණික ස්ථාන, වන රක්ෂිත, දියඇළි, ගංගා, ඇළදොළ යනාදී ප්‍රදේශ පවතින ස්වභාවික සම්පත් ආරක්ෂා කරගනිමින් පාරිසරික සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම.**

ස්වභාවික සෞන්දර්යයෙන් අනූන සෞම්‍ය දේශගුණික ලක්ෂණ හා ඓතිහාසික වැදගත්කමකින් යුත් පුරවරයක් වුවද, එම ඉහත විභවතාවයන් තිරසාර අයුරින් පරිශීලනය කිරීම මගින් සංචාරක කර්මාන්තය ආශ්‍රිත ලබාගත හැකි ප්‍රතිලාභයන් තවමත් මෙම ප්‍රදේශය ලබානොගන්නා බව නිරීක්ෂණය කළ හැකිය. එහිදී, ගෘහස්ථ හා ප්‍රාදේශීය වශයෙන් සංචාරක කර්මාන්තය ක්‍රියාත්මක වීම හැර එමගින් ආර්ථිකයට සැලකිය යුතු පිටුවහලක් ලබාගැනීමේ මාර්ග සංචාරක කර්මාන්තය තුලින තවමත් විවෘත වී නොපවතින බව තහවුරු වේ. එම නිසා ප්‍රදේශයේ පවතින ස්වභාවික පරිසර පද්ධතිය ඓතිහාසික වටිනාකමකින් යුත් ස්ථාන ඒකරාශි කරමින් ආර්ථිකමය වාසි ලබාගැනීමට අපේක්ෂා කෙරේ. එහිදී පාරිසරික සංචාරක කර්මාන්තය (Eco Tourism) කෙරෙහි විශේෂ අවධානය යොමුකර ඇත. මේ අනුව පහත උපාය මාර්ග අරමුණු අංක 01 ඔස්සේ හඳුනාගෙන ඇත.

- දිගන, කොස්වත්ත, පඤ්ඤාගුල, තුම්මෝදර, දඹොර, ගුරුලන, ඉහළ බෝපේ යානාදී ග්‍රාම නිලධාරි වසම් ඇතුලත් ප්‍රදේශ විශේෂ පාරිසරික සංචාරක කලාපයක් බවට පත්කිරීමට එනම්, පුවක්පිටිය - තුම්මෝදර පටු මාර්ගය හා ඇස්වතු ඔය මුලික කරගත්, ඉදිකඩ රක්ෂිතය, ලබුගම ජලාශ්‍රය, රක්ෂිතය, මීරියගල්ල රක්ෂිතය සහ විශාල රබර් වතු අයත්වන ලෙසද සහ ස්වභාවික දිය ඇළි වන ඇල්ල උඩ ඇල්ල, කුමාරි ඇල්ල, රන්මුදු ඇල්ල හා දඹෝර ඇල්ල යන ස්වභාවික හා පරිසර පද්ධතීන් ඇතුළත් වන පරිදි අක්කර 3,000 ක් ඉක්මවූ ප්‍රදේශයක් පාරිසරික හරිත සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීමට හඳුනාගන්නා ලදී. ඒ හරහා පරිසර හිතකාමී සංචාරක නවාතැන්පොළක් ඒවාට අනන්‍ය යෝජිත

පාරිසරික ලක්ෂණ අනුව සංවර්ධනය කිරීමට අවස්ථා බිහිකර ඇති අතර, සංචාරක කටයුතු ආකර්ශණීය කරගත හැකි ආකාරයේ කේබල් කාර් ව්‍යාපෘති, ජලාශ්‍රිත විනෝදාස්වාදිත කටයුතු හා ස්වභාවිකත්වය මත පදනම් වූ විවිධාංගිකෘත විනෝද කටයුතු සඳහා කැලණි ගඟ ආශ්‍රිත හා පරිසර හිතකාමී සංචාරක කලාපය තුළ ඉහළ විභවතාවයක්ද පවතින බවට සිදුකරන ලද අධ්‍යයනයන් ඔස්සේ හඳුනාගෙන ඇත.

***රූප සටහන් අංක 6. 7 - ප්‍රදේශය තුල ප්‍රචලිත කළ හැකි පාරිසරික සංචාරක කටයුතු***



මූලාශ්‍රය : ගූගල් වෙබ් අඩවිය සහ නාගරික සංවර්ධන අධිකාරිය (2018)

- සංචාරකයින් සඳහා අවශ්‍ය කරන සංචාරක විභවතාවයකින් යුත් පාරිසරික හා ඓතිහාසික ස්ථාන පිළිබඳව තොරතුරු ලබාගැනීම සඳහා නවීන තොරතුරු මධ්‍යස්ථාන ඇති කිරීම අත්‍යවශ්‍ය වන බව හඳුනාගත් අතර, එම තොරතුරු මධ්‍යස්ථාන හරහා සැලසුම් ප්‍රදේශයේ පවතින සංචාරක වටිනාකමින් යුත් ස්ථාන නිවැරදි මාර්ග උපදේශකත්වයක් සංචාරකයින්හට ලබාදීම තුලින් සංචාරකයින් අතර මෙම ප්‍රදේශය ප්‍රචලිත කිරීම හරහා වැඩි සංචාරක පිරිසක් ආකර්ශණය කරගැනීමට බලාපොරොත්තු වේ. ඒ අනුව ඊට වඩාත් උචිත ස්ථානයක් ලෙස මීපේ හන්දිය හඳුනාගන්නා ලදී.
- හංවැල්ල නගරය තුල පවතින විභවතාවයක් වන කැලණි ගඟ මූලික කරගනිමින් හංවැල්ල පැරණි සතිපොල පවතින භූමියට පිටුපසින් යාබදව පිහිටා ඇති භූමිය තුල පරිසර නැරඹුම් මැදිරි සහ හංවැල්ල විකල්ප මාර්ගයේ කැලණි ගඟ දර්ශණය වන පරිදි වීදි අවහන්හල් ස්ථාපිත කිරීමට යෝජනා කෙරේ. තවද, කැලණි ගඟ දෙසින් සීතාවක සැලසුම් ප්‍රදේශයට පමණක් අයිති වූ අධි සංවේදී පාරිසරික ප්‍රදේශය,

කැලණි ගඟ මායිමේ සිට මීටර් 200 ක පමණ හඳුනාගන්නා ලද ඒකාකාරී නොවන පළලකින් යුත් පටු තීරයක් තුල විවිධ පාරිසරික විනෝදාස්වාදිත ක්‍රියාකාරකම් ප්‍රචලිත කිරීමට ඉඩප්‍රස්ථා විවර කෙරේ.

***රූප සටහන් අංක 6. 8 - කැලණි ගඟ ආශ්‍රිත ප්‍රදේශය තුල ප්‍රචලිත කළ හැකි විවේක හා විනෝදාස්වාදිත කටයුතු***



මූලාශ්‍රය : ගූගල් වෙබ් අඩවිය සහ නාගරික සංවර්ධන අධිකාරිය (2018)

- ප්‍රදේශයේ ගංගාශ්‍රිත මට්ටමින් පවතින පාරම්පරික කර්මාන්ත වන කිතුල් කර්මාන්තය, පන් කර්මාන්තය, මැටි කර්මාන්තය වැනි පාරම්පරික කර්මාන්ත සංචාරක කර්මාන්ත සමඟ ඒකාබද්ධ කළ යුතු බවටද යෝජනා කෙරේ. ලබුගම නගරය සහ තුම්මෝදර නගරය තුල වීථි වෙළඳසැල් ස්ථාපිත කිරීම තුලින් ඉහත සුළු පරිමාණ කර්මාන්තයන් දිරිගැන්වීමට අපේක්ෂා කරයි.

**අරමුණු 06 : පරිසරය හා බැඳුණු කර්මාන්ත සහ සුරක්ෂිත නේවාසික නගරයක් බවට පත් කිරීම.**

පාදුක්ක, හංවැල්ල, හා කොස්ගම නගරයන් සේවා වාණිජ නගර මධ්‍යස්ථානයන් ලෙස සංවර්ධනය කිරීමට හඳුනාගෙන ඇත.

නව බියගම කොස්ගම දුම්රිය මාර්ගය, නවීකරණය වන කැලණිවැලි දුම්රිය මාර්ගය ප්‍රදේශය හරහා තිබීම හේතු කොටගෙන කොස්ගම හා පාදුක්ක යන නගර දෙක තුල ප්‍රධාන දුම්රිය මංසන්ධි කේන්ද්‍ර කරගනිමින් ගමනාගමනය පාදක කොටගත් නගර සෙසු මාධ්‍යයන් ලෙස සංවර්ධනය කිරීම තුලින් එම ප්‍රදේශවල

වෙළඳ කටයුතු ස්ථාපනය වීම කෙරෙහි පවතින ආයෝජන අවස්ථා ඉහළ නැංවීමට යෝජනා කෙරේ. මීට අමතරව, හංවැල්ල නගරයේ සේවා වාණිජ නගරයක් ලෙස යෝජනා කරන අතර, සීතාවක ප්‍රදේශය සඳහා සිදුකරන ලද සංවර්ධන පීඩන දර්ශකය, සංවේදීතා දර්ශකය හා සංවර්ධන විභවතා දර්ශකය යන විශ්ලේෂණයන් පදනම්ව හඳුනාගත් පරිදි හංවැල්ල නගරය හා හයිලෙවල් නගරය අතර පවතින සංවර්ධනය පරිසර හිතකාමී අයුරින් පවත්වා ගැනීම සඳහා හයිලෙවල් මාර්ගය දිගේ පහත්ගම මංසන්ධියේ සිට කළුඅග්ගල දක්වා පමණ ව්‍යාප්තවීමට ඉඩ ලබාදෙන අතර, රෙගුලාසි මගින් නියාමනය කිරීම සඳහාද බලාපොරොත්තු වේ. ඒ හරහා ප්‍රදේශයේ පවතින වෙළඳ ආර්ථිකය සවිබල ගැන්වීමට අපේක්ෂා කෙරේ.

තවද, ගලගෙදර - හොරණ මාර්ගය දෙපස පාදුක්ක නගරයේ සිට මීපේ මංසන්ධිය දක්වා කි.මී.02 දුරටත් දක්වා රේඛිය ලෙස පැතිරුණු කටයුතු සහිත සංවර්ධනයක්ද, කළුඅග්ගල - ලබුගම මාර්ගය දෙපස වග දුම්රිය පොළ ස්ථානයේ සිට වැලිකන්න මංසන්ධිය බස්නැවතුම්පල දක්වා කි.මී.2.7 ක් දුරක් දක්වා රේඛිය ලෙස පැතිරුණු කටයුතු සංවර්ධනයක්ද, අවිස්සාවේල්ල මාර්ගය දෙපස සාලාව - අකරවිට මංසන්ධියේ සිට කොස්ගම මංසන්ධිය දක්වා කි.මී.02 ක් දුරක් දක්වා රේඛිය වාණිජ කටයුතු සම්බන්ධව පවතින් සංවර්ධනයක් සිදුකිරීමට බලාපොරොත්තු වේ. ඒ අනුව ඉහත සඳහන් කරන ලද උපායමාර්ග හරහා ප්‍රදේශයේ ආර්ථිකය සවිබල ගැන්වීමට යෝජනා කෙරේ.

සැලසුම් ප්‍රදේශය තුල ජීවත්වන ජනගහනයේ ශ්‍රම බලකායට අයත් වයස් කණ්ඩායමෙන් වැඩි ප්‍රමාණයක් (70% ක් පමණ) නුපුහුණු ශ්‍රමිකයින් වීම විශේෂයෙන්ම හඳුනාගන්නා ලද අතර, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හරහා නුපුහුණු ශ්‍රමිකයින්ගේ කුසලතා වැඩිදියුණු කිරීම තුලින් ප්‍රදේශයේ ආර්ථිකයට දායක කරගැනීමට ඉලක්ක කර ඇත. ඒ අනුව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටා ඇති පාදුක්ක වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම හරහා පුහුණු ශ්‍රමිකයන් බිහිකිරීමට දායකත්වය ලබාගත හැකිය. සීතාවකපුර නගර සභාව තුල පිහිටා ඇති අපරව්‍යූහ සැකසුම් කලාපය සඳහා විධිමත් ලෙස පුහුණුවක් සහිත ශ්‍රමික පිරිසක් ආයෝජනය කළ හැකිය. එම කලාපය තුල දැනට ක්ෂේත්‍රයන් 27 ක් ඔස්සේ රැකියා අවස්ථා 23,000 ක් පමණ ක්‍රියාත්මක වන අතර, කාන්තා සහ පිරිමි දෙපාර්ශවයේම ශ්‍රමිකයින් සම අනුපාතිකව එම රැකියාවල නිරත වේ. නිමි ඇඳුම් කර්මාන්තය, රබර් අත් ආවරණ නිෂ්පාදනයන්, රබර් ආශ්‍රිත නිෂ්පාදන ආදී සඳහා පුහුණු ශ්‍රමිකයන් සැපයිම තුලින් ප්‍රාදේශීය ආර්ථිකය බලගැන්වීමට අපේක්ෂා කෙරේ.

***සිතියම් අංක 6. 10 - ආර්ථික සංවර්ධන සැලැස්ම (2030)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## 6.5 තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග

සීතාවක සංවර්ධන සැලැස්ම (2019 - 2030) හි දැක්මට අනුව සීතාවක සැලසුම් ප්‍රදේශය අනාගතයේදී ආශිර්වාදාත්මක හරිත පුරවරයක් ලෙස සංවර්ධනය කිරීම දැක්ම වන අතරම, ඒ සඳහා මූලිකවම වැදගත්වන පරිච්ඡේදයක් ලෙස තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ගික සංවර්ධන සැලැස්ම පෙන්වාදිය හැකිය.

එහිදී, නීල හරිත පරිසරය ආරක්ෂා කිරීම මුලිකවම අරමුණු කරගත් සංවර්ධන සැලැස්මක් ලෙස සීතාවක සංවර්ධන සැලැස්ම හඳුනාගත හැකිය. ඒ අනුව ප්‍රදේශය තුල පවතින භෞතික, පාරිසරික පිහිටීම දෙස විශේෂ අවධානයක් යොමුකරමින් අනාගතයේදී ඉහත භෞතික හා පාරිසරික ප්‍රදේශයන් ආරක්ෂා කරමින් තිරසාර සංවර්ධනයක් කරා යොමුකරන ආකාරය මෙම උපාය මාර්ග සැලැස්ම හරහා විස්තර කරනු ලැබේ.

ඒ අනුව මෙම උපාය මාර්ග සැලැස්ම හරහා තිරසාර සංවර්ධනයක් කරායාමට අවශ්‍ය වන පරිසර සංරක්ෂණ උපාය මාර්ග, භූදර්ශණ කළමනාකරණ උපාය මාර්ග, ආපදා කළමනාකරණ උපාය මාර්ග, විවෘත භූමි උපාය මාර්ග හා කෘෂිකාර්මික උපාය මාර්ග යන තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ග මේ යටතේ විස්තර කෙරේ. ඒ අනුව නීල හරිත ප්‍රදේශ, කෘෂිකාර්මික ප්‍රදේශ හා අනෙකුත් පාරිසරික සංවේදී ප්‍රදේශ සීතාවක සැලසුම් ප්‍රදේශයෙන් 73% කට වඩා ප්‍රතිශතයක් පවතින අතර, ඒවා තවදුරටත් ආරක්ෂා කරගැනීම සඳහා ක්‍රමෝපායන් මෙම සැලසුම මගින් යෝජනා කෙරේ.

### 6.5.1 පරිසර සංරක්ෂණ උපාය මාර්ග

යෝජිත පරිසර සංරක්ෂණ සැලැස්ම යටතේ සැලසුම් බල ප්‍රදේශය තුල පවතින තෙත්බිම් ආරක්ෂණය, දැනට ගැසට් කර ඇති වනාන්තර සංරක්ෂණය හා කැලණි ගඟ, ලබුගම, කලටුවාන හා අනෙකුත් පරිසරය සමඟ බද්ධ වූ පරිසර අධි සංවේදී කලාපය ආරක්ෂා කිරීම පාරිසරික වටිනාකමකින් යුත් ප්‍රධාන දිය ඇළි ආරක්ෂා කිරීම ආදිය සඳහා අවධානය යොමුකර ඇත.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇති තෙත්බිම් ප්‍රධාන ලෙස කුඹුරු හා වගුරු බිම්වලින් සමන්විත වන අතර, බටහිරට වන්නට පුස්සැලි ඔයට මායිම්ව ඇති ගිරඉඹුල, ඉහළ හංවැල්ල උතුර, නිරිපොළ, හංවැල්ල, පහළ හංවැල්ල, පහත්ගම, ජයවීරගොඩ, වලච්චත්ත, තුන්තාන බටහිර සහ මාවතගම බටහිර යන ප්‍රදේශවල ඇති වගුරුබිම්ද ප්‍රදේශය පුරාම විහිදී ඇති කුඹුරු වගා බිම් ප්‍රදේශද මෙයට ඇතුලත් වේ. සැලසුම් බල ප්‍රදේශය තුල වන තෙත්බිම් කලාප 100% ක්ම ආරක්ෂා කළ යුතු බව හඳුනාගත හැකිය.

පරිසර සංවර්ධන උපාය මාර්ගික සැලැස්ම යටතේ කැලණි ගඟ ආශ්‍රිතව ගඟ රක්ෂිත හා පුස්සැලි ඔය, වක් ඔය සහ ඇස්වතු ඔය ආශ්‍රිතව අදාළ ගඟ රක්ෂිතයන් එලෙසම ආරක්ෂා කළ යුතු බවට යෝජනා කෙරේ. කැලණි ගඟ ආශ්‍රිත පරිසර හිතකාමී ක්‍රියාකාරකම් කලාපය තුල පරිසර හිතකාමී අයුරින් විවේක හා විනෝද

කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඉඩප්‍රස්ථාව ලබාදී ඇත. එමෙන්ම ඇස්වතු ඔය මූලික කරගෙන නිර්මාණය වී ඇති රමණීය දිය ඇළි පද්ධති වන ඇල්ල උඩ ඇල්ල, කුමාරි ඇල්ල, රන්මුදු ඇල්ල යන ප්‍රධාන ඇළි තුනද, මීට අමතරව අනෙකුත් කුඩා ඇළිද සංරක්ෂණය කළ යුතු බවට යෝජනා කර ඇත.

කැලණි ගඟ, ඇස්වතු ඔය හා අනෙකුත් ජල ප්‍රවාහයන් මූලික කරගනිමින් ක්‍රියාත්මක වන සංචාරක ප්‍රවර්ධන ක්‍රියාකාරකම් පරිසර හිතකාමී ව්‍යුහයන්ගෙන් සමන්විත විය යුතු බවට යෝජනා කර ඇති අතරම, බරාව ඇතුළු තෙත්බිම් උද්‍යාන සංරක්ෂණ උපක්‍රම හරහා ප්‍රවර්ධනය කිරීමට යෝජනා කර ඇති අතර, පරිසරය ආරක්ෂා කරගැනීම පිණිස මෙම සැලැස්ම තුලින් පරිසර හිතකාමී ක්‍රියාකාරකම් කලාපය, වතු කෘෂිකාර්මික කලාප, පාරිසරික ආරක්ෂිත කලාපය ලෙස කලාපයන් හඳුන්වාදී තිබේ.

මෙම සැලැස්ම යටතේ සැලසුම් ප්‍රදේශයේ භෞතික මායිම් ලෙස පවතින සහ අධි සංවේදී පරිසර පද්ධතියක් නිර්මාණය කරලීම සඳහා ඉවහල් වී ඇති කැලණි ගඟ රක්ෂිත සහ පුස්සැලි ඔයද ආශ්‍රිතව ප්‍රදේශය තුල විහිදී පවතින ප්‍රධාන ජල මාර්ග 02 ක් වන ඇස්වතු ඔය හා වක් ඔය ගඟ රක්ෂිතයන් ආරක්ෂා කිරීම අත්‍යවශ්‍ය බවට හඳුනාගන්නා ලදී. වර්තමානයේ ගංගා රක්ෂිතයන් ආශ්‍රිතව සිදුකරන වැලි ගොඩදැමීම් හා නීති විරෝධි ඉදිකිරීම් වළකාලීමට රෙගුලාසි භාවිතා කෙරේ.

බස්නාහිර පළාත් තෙත්බිම් කළමනාකරණ සැලැස්ම යටතේ එක් එක් තෙත්බිම් සංරක්ෂණය සඳහා රෙගුලාසි හඳුන්වා දී ඇති අතර, එම රෙගුලාසි හා පරිසර සංරක්ෂණය කිරීමේදී පවත්වාගත යුතු පොදු කොන්දේසි, නීති රෙගුලාසි ආදිය පිළිබඳව මෙම සංවර්ධන සැලැස්මේ දෙවන වෙළුම ඔස්සේ තවදුරටත් හඳුන්වා දී ඇත.

***සිතියම් අංක 6. 11 - තෙත්බිම් කළමනාකරණ සැලැස්ම***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

### 6.5.2 භූදර්ශණ කළමනාකරණ උපාය මාර්ග

උග්ගල කඳුවැටියත්, නිකහා කන්ද හා වීදියගල කඳුවැටියත්, කුරගල කඳුයායටත් මැදිව අනන්‍ය භූවිෂමතා ලක්ෂණයන්ගෙන් සමන්විත වූ මෙම ප්‍රදේශයේ තිරසාර පාරිසරික සංවර්ධනය පවත්වා ගෙන යාමේ අපේක්ෂාවෙන් භූදර්ශණ කළමනාකරණ සැලැස්ම යෝජනා කර ඇත. මෙම සැලැස්ම තුලින් ප්‍රදේශයට අනන්‍ය වූ ජල හා හරිත වැස්මද ඓතිහාසික හා සංස්කෘතික ස්ථානද තවදුරටත් සංරක්ෂණය කරලීමට යෝජනා කර ඇත. ඒ අනුව හඳුනාගත් ජලාශ්‍රිත මූලාශ්‍ර හා පහත් බිම් පාදක කරගනිමින් ක්‍රියාත්මක කරන ඇවිදීමේ මංතීරු ප්‍රවර්ධනය, මහබොරගොඩ වැව භූදර්ශණ සංවර්ධන ව්‍යාපෘතිය, හරිත ප්‍රවේශ මාර්ග සංවර්ධනය තුලින් භූදර්ශණය ඉහළ දැමීම හඳුන්වාදීමට මෙම සැලැස්ම තුලින් අපේක්ෂිතය (වගු අංක 6.13).

එමෙන්ම සංචාරක ප්‍රවර්ධන කලාපය තුල යෝජිත ඉදිකිරීම් සඳහා හඳුනාගත් පාරිසරික හිතකාමී ව්‍යුහයන් හඳුන්වාදීම, ක්‍රමවත් වැසි ජල කාණු පද්ධති සහිතව ප්‍රවේශ මාර්ග දෙපස හරිත පදික ගමන් මාර්ග ඉදිකිරිම තුලින් පවත්නා ගැටළු අවම කර භූදර්ශණය ඉහළ නැංවීමටද අපේක්ෂා කෙරේ.

*වගු අංක **6. 13** - සීතාවක සැලසුම් බල ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත හරිත පිවිසුම් දොරටු*

| පිවිසුම් මාර්ගය | භූදර්ශනය ඉහළ දැමීමට යෝජිත මාර්ග කොටස | දිග (කි.මී.) |
|---|---|---|
| හයිලෙවල් මාර්ගය | ගලගෙදර පාලමේ සිට ගලගෙදර හන්දිය දක්වා | 1.2 |
| ලෝලෙවල් මාර්ගය | ලෝලෙවල් මාර්ගය, පුස්සැලි ඔය හමුවන ස්ථානයේ සිට වර්තමාන විකල්ප මාර්ගය දක්වා | 1.3 |
| අවිස්සාවේල්ල මාර්ගය | පුවක්පිටිය දුම්රිය ස්ථානයේ සිට අවිස්සාවේල්ල නගරය දෙසට | 0.5 |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

ඒ අනුව කොළඹ නගරයේ සිට පැමිණෙන සංචාරකයන් ආකර්ශණය කරගැනීම සහ පහසුව සඳහා සැලසුම් ප්‍රදේශයට ඇතුල්වන හා පිටවන මාර්ගවල අවිධිමත් ඉදිකිරීම් ඉවත් කර, විධිමත් ලෙස හරිතකරණය වූ භූදර්ශණයකින් යුත් දොරටු ලෙස සංවර්ධනය කළ යුතු බවට හඳුනාගෙන ඇත. කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගයේ කොළඹ සිට සීතාවක ප්‍රදේශයට ඇතුල්වන ස්ථානය හා රත්නපුර දෙසින් පැමිණෙන විට සීතාවක ප්‍රදේශයට ඇතුල්වන ස්ථානය, ගලගෙදර පාලමේ සිට ගලගෙදර හන්දිය දක්වා ලෝලෙවල් මාර්ගය, පුස්සැලි ඔය හමුවන ස්ථානයේ සිට වර්තමාන විකල්ප මාර්ගය දක්වා, පුවක්පිටිය දුම්රිය ස්ථානයේ සිට අවිස්සාවේල්ල නගරය දෙසට වූ මාර්ගයන් හරිත පිවිසුම් දොරටු ස්ථාපිත කිරීම සුදුසු බවට හඳුනාගෙන ඇත. යෝජිත හරිත පිවිසුම් දොරටු ආකෘතියක් පහත රූප සටහන මගින් පෙන්නුම් කර ඇත.

***සිතියම් අංක 6. 12 - පිවිසුම් දොරටු ආකෘතියක් සහ පිහිටුවිය යුතු ස්ථාන***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***සිතියම් අංක 6. 13 - භූදර්ශන සැලැස්ම (2030)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

### 6.5.3 ආපදා කළමනාකරණ උපාය මාර්ග

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය උතුරු මායිම්ව ගලා බසින කැලණි ගඟ ප්‍රධානව වක් ඔය, පුස්සැලි ඔය හා එම ජල මාර්ගයන්ට දායකත්වය සපයන කුඩා ඇළ මාර්ගවලින් සමන්විත ස්වභාවික ජලාපවහන රටාවකින් යුක්ත වන අතරම, උතුරින් අරුක්වන ඔය, අංගමුව ඔය, ඇලිගේ ඔය හා මාවක් ඔයද ප්‍රධාන වේ. එමෙන්ම ප්‍රදේශයේ ස්වභාවික පරිසර පද්ධතිය පහත් බිම්, ජලාශ්‍ර (ලබුගම හා කලටුවාන), දිය ඇළි, ඇළ දොළ, ගංහා, මහා පරිමාණ වගාවන්, රක්ෂිත වනාන්තර හා තෙත් කලාපීය උද්‍යානවලින්ද සමන්විත වේ.

මෝසම් වර්ෂා කාලයන්හිදී බොහෝවිට කැලණි ගඟ, පුස්සැලි ඔය හා වක් ඔය පිටාර ගැලීම මගින් ප්‍රාදේශීය සභා සීමාව තුල හා පිටත සීමාවටද ක්ෂණික ගංවතුර තත්ත්වයන් ඇති වී ජන ජීවිතයට බලපෑම් ඇති කරයි.

මෙම ගංවතුර තර්ජනයට හේතු ලෙස ජලය බැසයාමට ඇති කාණු පද්ධතිය අවහිර කර ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් පහත් බිම්වල අනවසර ගොඩකිරීම්, රක්ෂිතයන්හි අනවසර ඉදිකිරීම් මෙන්ම අවිධිමත් ලෙස වැලි ගොඩදැමීම නිසා ඉවුරු කඩා වැටීම හේතුවෙන් සිදු වී ඇති කැලණි ගඟේ පළල වැඩිවීම ආදී කරුණු ප්‍රධාන වේ. එම ගැටළු අවම කරගැනීම සඳහා පහත සඳහන් යෝජනාවන් හඳුනාගෙන ඇත. මේ සම්බන්ධයෙන් සීතාවක ප්‍රාදේශීය සභාව විශේෂ අවධානය යොමුකළ යුතුව ඇත.

- කැලණි ගඟ, වක් ඔය, පුස්සැලි ඔය සහ අරුක්ඔය ජල මාර්ග පද්ධති හි රක්ෂිත මත ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් සියල්ලම ඉවත් කිරීම සහ නැවත ඉදිකිරීම් සිදුකළ නොහැකි වන සේ රෙගුලාසි හඳුන්වා දීම.

- දැනට ගංවතුර තර්ජනය පවතින ග්‍රාම නිලධාරි ප්‍රදේශ 39 ක් තුල පවත්නා කි.මී. 75 ක් පමණ දිග ජලමාර්ග පවතින අතර, මෙම ජල මාර්ග ප්‍රදේශ අවහිර වී පවත්නා ප්‍රදේශ විශේෂයෙන්ම පිරිසිදු කිරීම, නඩත්තු කිරීම.

- ගංවතුර තර්ජනයට මූලිකවම බලපාන නගරයක් ලෙස හංවැල්ල නගරය හඳුනාගෙන ඇති අතර, ඒ සඳහා නගරය තුල පවත්නා ජලබස්නා කාණු පද්ධතිය සංවර්ධනය කිරීම, අවහිර වී පවතින ස්ථාන පුළුල් කර සංවර්ධනය කිරීම.

- තවද, කැලණි ගඟ මූලික කරගත් ජල යටවුම් ප්‍රදේශය තුල ස්ථිර ගොඩනැගිලි සඳහා ඉඩප්‍රස්ථාව ලබානොදීම සඳහා රෙගුලාසි හඳුන්වාදීම.

- ගංවතුර බලපෑම ඇතිකරන ප්‍රදේශ කලාපීකරණයේදී කැලණි ගඟේ මීටර් 60 ක් ගංවතුර රඳවා තබාගැනීමේ ධාරිතාවය සපුරාලීමට සහ විවේක හා විනෝද කටයුතු පහසුකම් සැපයීමට ගඟ රක්ෂිතයේ සිට මීටර් 200 විවෘත තීරයක් ගඟට සමාන්තරව සංවර්ධනය කිරීම.

### 6.5.4 පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය උපාය මාර්ග

සෑම පුද්ගලයෙකුගේම කායික, මානසික වර්ධනයේ ගුණාත්මකභාවය නඟාසිටුවීම සඳහා පොදු එළිමහන් විනෝද කටයුතු වැදගත්වන අතරම, සංවර්ධන සැලසුම් සැකසීමේදී පොදු එළිමහන් කටයුතු පිළිබඳ අවකාශීය උපාය මාර්ග පිළිබඳව අවධානය යොමුකර ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් ප්‍රමිතිවලට අනුව පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම සැකසීමේදී, අවම වශයෙන් ජනගහනය 1,000 කට අවම හෙක්ටයාර් 1.4 ක් වන පරිදි විවෘත අවකාශ වෙන්කළ යුතු බවට දක්වා ඇත.

සෘජු හා වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන සංඝටක 02 ක් යටතේ විනෝද පහසුකම් බලනු ලැබේ. සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෘජු හා විනෝද පහසුකම් සපුරාගත හැකි ස්ථාන කිහිපයක් පවතින අතර, එම ස්ථාන පිළිබඳ විස්තර පහත වගු අංක 6.14 මගින් නිරූපණය කළ හැකිය.

*වගු අංක **6. 14 -** පවතින ක්‍රීඩා පිටි හා විවෘත භූමි*

| අනු අංකය | විවෘත භූමියේ නම | ප්‍රමාණය (හෙක්.) |
|---|---|---|
| 1. | කොඩිකාරගේ ඕවිට | 1.0 |
| 2. | පාදුක්ක ක්‍රීඩා පිටිය | 1.5 |
| 3. | බ්‍රැන්ඩිගම්පල ක්‍රීඩා පිටිය | 0.3 |
| 4. | නෙළුවත්තුඩුව ක්‍රීඩා පිටිය | 0.7 |
| 5. | කොස්ගම ඩැනී විජේසුන්දර ක්‍රීඩා පිටිය | 0.6 |
| 6. | සාලාව ක්‍රීඩා පිටිය | 0.3 |
| 7. | 10% විවෘත භූමි ඉඩම් එකතුව | 10.0 |
| | **එකතුව** | **14.48** |

මූලාශ්‍රය : සීතාවක ප්‍රාදේශීය සභාව හා ක්ෂේත්‍ර පරීක්ෂණ දත්ත (2017)

ඉහත සඳහන් තොරතුරුවලට අනුව සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දැනට හෙක්ටයාර 14.48 ක් විවෘත භූමි ලෙස පවතී. සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල 2016 වර්ෂයේ පවත්නා ජනගහනය 162,729 කි. ඒ අනුව එම ජනගහනය සඳහා හෙක්ටයාර 221.6 ක් පමණ විවෘත භූමි ලෙස වෙන්ව තිබිය යුතුය. නමුත් වර්තමාන ජනගහනයට ප්‍රමාණවත් පහසුකම් සහිතව සංවර්ධනය වූ පොදු එළිමහන් භූමි සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල නොපවතී. වර්තමානයේ සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්නා වක්‍ර විනෝද පහසුකම් සලසාගත හැකි ස්ථාන ඇමුණුම් අංක 06 හි සඳහන් කර ඇත.

යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (2019 -2030) ට අනුව 2030 වර්ෂය වනවිට සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල නේවාසික ජනගහනය 198,102 ක් දක්වා වර්ධනය විය හැකි බවට නිගමනය කළ හැකි අතර, ඒ අනුව 2030 වනවිට පොදු එළිමහන් විවෘත භූමි ලෙස ඉඩම් හෙක්ටයාර් 277.34 ක පමණ වපසරියක් වෙන්කළ යුතු වේ.

පවතින භූ විෂමතාවය සංවර්ධනය වී ඇති හා සංවර්ධනය වෙමින් පවතින අවකාශයන්ට අනුව යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ යෝජිත උපාය මාර්ග පහත පරිදි දැක්විය හැකිය.

1. දැනට පවතින සියලුම ක්‍රීඩා බිම් සහ ක්‍රීඩාකළ හැකි සහ පොදු විවෘත භූමි ලෙස පවතින හිස් ඉඩම් හැකිතාක් දුරට ප්‍රයෝජනයට ගත හැකි පරිදි ආරක්ෂා කරගැනීම.

   ඒ සම්බන්ධයෙන් සුදුසුකම්ලත් පුද්ගලයන්ගේ මාර්ගෝපදේශකත්වය යටතේ නිසි භූදර්ශන සැලැස්මකට අනුව දැනට පවතින උද්‍යාන සහ ක්‍රීඩාංගන සංවර්ධනය කිරීමට අදාළ පළාත් පාලන ආයතනය අවධානය යොමුකළ යුතු අතරම, ඉඩම් අනුබෙදුම්වලින් ලබා ගත හැකි 10% ක භූමිය ඉතා කුඩා උද්‍යාන *(Mini Parks)* ලෙස සංවර්ධනය කිරීම.

2. පහත් බිම් සහ ඇළ රක්ෂිත පරිසර හිතකාමී ආකාරයට උද්‍යාන හා රේඛිය උද්‍යාන ලෙස ලෙස ප්‍රතිසංවර්ධනය කිරීම.

3. විවෘත භූමි සම්බන්ධව නීති රෙගුලාසි බලාත්මක කිරීම.

යෝජිත එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම අනුව පහත දැක්වෙන ආකාරයට උද්‍යාන වර්ගීකරණයන් සිදුකර ඇති අතර, (වගු අංක 6.15) ඒ ඒ ග්‍රාම නිලධාරි වසම් තුල හඳුනාගෙන ඇති උද්‍යාන වගු අංක 6.16 සහ සිතියම් අංක 6.14 මගින් විස්තර කර ඇති අතර, උද්‍යාන වර්ගීකරණයන් තුල අනුමත ක්‍රියාකාරකම් ඇමුණුම් අංක 07 හි දැක්වේ.

***වගු අංක 6. 15 - සීතාවක සැලසුම් ප්‍රදේශයේ යෝජිත විවෘත අවකාශ***

| අංක | උද්‍යාන වර්ගය | ප්‍රමාණය (හෙක්) |
|---|---|---|
| 1. | අසල උද්‍යාන | 16.45 |
| 2. | ප්‍රජා උද්‍යාන | 7.8 |
| 3. | රේඛීය උද්‍යාන | 195 |
| 4. | තෙත් බිම් උද්‍යාන | 234 |
| 5. | පවතින පොදු එළිමහන් විනෝද අවකාශ | 14.48 |
| | **මුළු එකතුව** | **467.73** |

මුලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

*වගු අංක **6. 16** - උද්‍යාන වර්ගීකරණය*

| වර්ගය | ප්‍රමාණය (හෙක්ටයාර ) | වර්තමාන භාවිතය | යෝජිත භාවිතය | ග්‍රාම නිලධාරී කොට්ඨාශය |
|---|---|---|---|---|
| | | අසල උද්‍යාන | | |
| LP1 | 2.158 | වගා භූමි | අසල උද්‍යාන | පින්නවල උතුර |
| LP2 | 1.779 | පොල් වගාව | අසල උද්‍යාන | මලගල |
| LP3 | 2.186 | පොල් වගාව | අසල උද්‍යාන | නෙලුවත්තුඩාව |
| LP4 | 2.143 | පොල් වගාව | අසල උද්‍යාන | උඩුමුල්ල |
| LP5 | 2.730 | මිශ්‍ර වගා | අසල උද්‍යාන | වැලිකන්ද |
| LP6 | 2.56 | මිශ්‍ර වගා | අසල උද්‍යාන | නිරිපොළ |
| LP7 | 1.65 | වගා භූමි | අසල උද්‍යාන | බොලත්තාව |
| LP8 | 1.226 | පොල් වගා | අසල උද්‍යාන | ඇස්වත්ත උතුර |
| **එකතුව** | **16.45** | | | |
| | | ප්‍රදේශීය උද්‍යාන | | |
| CP1 | 4.17 | කටුපදුරු | ප්‍රාදේශීය උද්‍යාන | ඉහල කොස්ගම උතුර |
| CP2 | 3.64 | පොල් වගාව | ප්‍රාදේශීය උද්‍යාන | පහල ගෙදර නැගෙනහිර |
| **එකතුව** | **7.81** | | | |
| | | තෙත්බිම් උද්‍යාන | | |
| WP1 | 52.44 | තෙත්බිම් | තෙත්බිම් උද්‍යාන | පහල හංවැල්ල, හංවැල්ල නගරය |
| WP2 | 39.2 | තෙත්බිම් | තෙත්බිම් උද්‍යාන | ඉහල හංවැල්ල උතුර |
| WP3 | 140 | තෙත්බිම් | තෙත්බිම් උද්‍යාන | වලව්වත්ත, ජයවීරගොඩ, තුන්න බටහිර |
| WP4 | 3.5 | තෙත් බිම් | තෙත්බිම් උද්‍යානය | පහල හංවැල්ල |
| **එකතුව** | **235.14** | | | |
| | | රේඛීය උද්‍යාන | | |
| LiP1 | 58 | පුස්සැලි ඔය රක්ෂිතය | ඇවිදින මංතීරුව | - |
| LiP2 | 24 | වක් ඔය රක්ෂිතය | ඇවිදින මංතීරුව | - |
| LiP3 | 113 | කැලණි ගඟ රක්ෂිතය | ඇවිදින මංතීරුව | - |
| **එකතුව** | **195** | | | |

මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

***සිතියම් අංක 6. 14 - යෝජිත පොදු එළිමහන් විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (2019 -2030)***




මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය (2018)

## 6.6 සංස්කෘතික හා ආගමික වටිනාකමකින් යුත් ස්ථාන කළමනාකරණ උපාය මාර්ග

ඓතිහාසික හා සංස්කෘතික වැදගත්කමින් යුත් ස්ථාන මෙම බල ප්‍රදේශය තුල පිහිටා ඇති අතර, 16 වන සියවසේදී සීතාවක රාජධානියේ පැවැත්මත් ඉන් අනතුරුව පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යටත් විජිත පාලනයන්ට නතු වූ මෙම ප්‍රදේශය තුල වර්තමානය වනවිටද අතීත බලපෑම්වල නටබුන් දක්නට ලැබේ. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් හඳුනාගන්නා ලද සංරක්ෂිත හා මෙතෙක් සංරක්ෂණය නොකළ ස්ථාන බොහොමයක්ද එම ප්‍රෞඪ ඉතිහාසයට සාක්ෂි දරන අතර, ප්‍රදේශයේ පවත්නා පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන පස්වන පරිච්ඡේදයෙහි වගු අංක 5.2 මගින් පෙන්වා දී ඇත.

ඒ අනුව සංස්කෘතික හා පුරාවිද්‍යාත්මක වැදගත්කමකින් යුතු ස්ථාන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහ සංස්කෘතික දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ සංරක්ෂණ හා නඩත්තු කටයුතු සිදුකිරීමට මෙම සැලැස්ම මගින් යෝජනා කරන අතරම, සංචාරක කර්මාන්තය පාදක කරගනිමින් සිදුවන සංවර්ධන ක්‍රියාවලින් සඳහා ඒ තුලින් දායකත්වයක් ලබාගැනීමට අපේක්ෂා කෙරේ. තුම්මෝදර ඉදිකිරීම සඳහා යෝජනා කරන සංචාරක කෞතුකාගාරය හරහා ප්‍රදේශය තුල පවතින පුරාවිද්‍යා ස්ථාන සම්බන්ධයෙන් දැනුවත් කිරීම සිදුකළ යුතුය.

## 6.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගික සැලැස්ම (Project Implementation Strategic Plan)

සීතාවක සංවර්ධන සැලැස්ම (2019 - 2030) යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම (Project Implementation Strategic Plan) පිළිබඳව අවධානය යොමුකරන අතර, ඉහතින් විස්තර කරන ලද සැලසුම්හි උපාය මාර්ගයන් සාක්ෂාත් කරගැනීම සඳහා ව්‍යාපෘති හඳුනාගන්නා ලදී. තවද, ව්‍යාපෘති ප්‍රායෝගික ලෙස සැලසුම් ප්‍රදේශයම ආවරණය වන පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රධාන නගර 04 මූලික කරගනිමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය හඳුනාගෙන ඇත. විශේෂයෙන්ම එය සංවර්ධන සැලැස්ම තුලින් ප්‍රායෝගිකව හා තාර්කිකව ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමුඛතා පදනම මත එම ව්‍යාපෘති ප්‍රධාන නගර සඳහා වෙන් වෙන්ව පෙළගස්වා ගන්නා ලදී.

1. හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘති
2. කොස්ගම නගර සංවර්ධන ව්‍යාපෘති
3. පාදුක්ක නගර සංවර්ධන ව්‍යාපෘති
4. වග, තුම්මෝදර නගර සංවර්ධන ව්‍යාපෘති

සීතාවක සංවර්ධන සැලැස්ම (2019 - 2030) අනුව ව්‍යාපෘති විස්තරාත්මක විශ්ලේෂණය තුලින් හඳුනාගන්නා ලදී. දිගුකාලීන දැක්මක් මත පදනම් වෙමින් හඳුනාගන්නා ලද අරමුණු සඳහා ප්‍රදේශය සඳහා පවතින ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන පිළිබඳ අධ්‍යයනය කර විස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකර

ඇත. ඒ හරහා හඳුනාගන්නා ලද පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘතින් හඳුනාගන්නා ලද අතර, එම ව්‍යාපෘතින්වල ප්‍රමුඛතාව හඳුනාගැනීම සඳහා ව්‍යාපෘති බර තැබීමක් සිදුකළ අතර, එය කාණ්ඩ 03 ක් යටතේ බර තැබීම සිදුකරන ලදී.

i. සංවර්ධන සැලැස්මේ අරමුණ මත
ii. එක් එක් ව්‍යාපෘති එකිනෙකට සම්බන්ධවීමේ තීව්‍රතාවය
iii. සමාජීය පාරිසරික බලපෑමේ තීව්‍රතාවය

ඒ අනුව ඉහත ප්‍රධාන නගර හා බැඳුණු ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිත එක් එක් ව්‍යාපෘති ප්‍රමුඛතා පදනම්ව හඳුනා ගැණුනු ආකාරය පහත පරිදි පෙන්වා දිය හැකිය.

### හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘති

1. හංවැල්ල පවත්නා විකල්ප ප්‍රවේශ මාර්ගයට යාබදව ඉදිකිරීමට යෝජිත සංචාරක හරිත නිකේතනය හා කැලණිගඟ මායිමේ හඳුනාගත් පරිසර නැරඹුම් මැදිරිය සහ බෝට්ටු සේවය
2. යෝජිත තෙත්බිම් විනෝදාස්වාදිත ව්‍යාපෘතිය හා මාර්ග සංවර්ධනය
3. පවත්නා විකල්ප ප්‍රවේශ මාර්ගය තවදුරටත් සංවර්ධනය කිරීම
4. හංවැල්ල, ඉන්දියානු තෙල් සංස්ථාවට (IOC) අයත් ඉන්ධන පිරවුම්හල අසල සිට හයිලෙවල් මාර්ගය දක්වා යෝජිත විකල්ප ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම.
5. හංවැල්ල, බස්රථ නැවතුම්පල සහ වෙළඳ සංකීර්ණය පිහිටි චතුරස්‍රය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය
6. හංවැල්ල පොළ අදියර II සංවර්ධන ව්‍යාපෘතිය
7. සැලසුම් බල ප්‍රදේශයට පිවිසෙන හරිත පිවිසුම් දොරටු ඉදිකිරීම
8. බරාව තෙත්බිම් උද්‍යානය සංවර්ධන ව්‍යාපෘතිය

### කොස්ගම නගර සංවර්ධන ව්‍යාපෘති

9. කොස්ගම බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය
10. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය
11. සාලාව නගර සංවර්ධන භූමියේ සිට කොස්ගම සතිපොළ දක්වා කොළඹ රත්නපුර මාර්ගය දෙපස - හරිත පදික තීරු ඇති කිරීම හා භූමි අලංකරණය
12. කොස්ගම සිට පාදුක්ක දක්වා යෝජිත ප්‍රවේශ මාර්ගය මීටර් 13 ක් පළල විකල්ප ප්‍රවේශ මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම
13. සාලාව - අකරවිට මාර්ගය මීටර් 13 ක් දක්වා පුළුල් කර සංවර්ධනය කිරීම
14. කොස්ගම නාගරික උද්‍යාන ව්‍යාපෘතිය
15. සාලාව නගර සංවර්ධන ව්‍යාපෘතිය

16. කොස්ගම ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලට යාබදව ඇති කුඹුරු යාය මායිම දිගේ ව්‍යායාම මංතීරුවක් ඉදිකිරීම.

**පාදුක්ක නගර සංවර්ධන ව්‍යාපෘති**

17. පාදුක්ක වටරවුම් මාවත සංවර්ධනය
18. පාදුක්ක බස්රථ නැවතුම්පල හා දුම්රිය මාර්ගය ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය
19. පාදුක්ක ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පිහිටි භූමිය තුල රථවාහන නැවතුම්පලක් ඇතිකිරීම
20. පාදුක්ක ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පිහිටි චතුරශ්‍රය ප්‍රතිසංවර්ධනය
21. ගොඩගම - පාදුක්ක ප්‍රවේශ මාර්ගය දිගේ පාදුක්ක නගරයේ සිට පාදුක්ක මූලික රෝහල දක්වා පදික මංතීරු සංවර්ධනය
22. පාදුක්ක ක්‍රීඩාංගණය සංවර්ධනය
23. පාදුක්ක ව්‍යායාම මංතීරු සංවර්ධන ව්‍යාපෘති, ජල රැඳවුම් ප්‍රදේශ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති

**වග, තුම්මෝදර නගර සංවර්ධන ව්‍යාපෘති**

24. තුම්මෝදර හරිත අධ්‍යාපනික උද්‍යානය
25. වග බස්රථ නැවතුම්පොල ව්‍යාපෘතිය
26. වග, මහමොරගොඩ වැව (මහා බොරළුගොඩ පාසල අසල පිහිටා ඇති) හරිත රේඛීය උද්‍යාන සංවර්ධනය
27. පුවක්පිටිය, තුම්මෝදර ප්‍රවේශ මාර්ගය මීටර් 13 ක් දක්වා පුළුල් කිරීම හා හරිත මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම

## හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘති

**(1)**

| ව්‍යාපෘතිය හඳුනාගැනීම | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | **හංවැල්ල පවත්නා විකල්ප ප්‍රවේශ මාර්ගයට යාබදව ඉදිකිරීමට යෝජිත සංචාරක හරිත නිකේතනය හා කැලණිගඟ මායිමේ හඳුනාගත් පරිසර නැරඹුම් මැදිරිය සහ බෝට්ටු සේවය** | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | 2030 වර්ෂයේදී සීතාවක බල ප්‍රදේශය නීල හරිත සංචාරක නවාතැන්පලක් බවට පත්කිරීමට අරමුණු කර ඇත. ඒ අනුව ප්‍රදේශයට පැමිණෙන දේශීය හා විදේශීය සංචාරක ප්‍රජාව සඳහා අවශ්‍ය කරන විනෝදාස්වාද කටයුතු, සැපයීම සඳහා මෙම යෝජිත ව්‍යාපෘති ප්‍රදේශය තුල ඉහළ විභවතාවයන් පවතී.<br><br>කැලණි ගඟ ආශ්‍රිත ජලජ පරිසරය හා හංවැල්ල නගරයට ඉතාමත්ව ආසන්නව පවතින නිසා සංචාරකයින්ට පහසුවෙන් පැමිණිය හැකිය. ඒ අනුව හංවැල්ල පරණ පොළ පිහිටි භූමිය තුල හරිත නිකේතනයක්, පරිසර නැරඹුම් මැදිරියක් හා හංවැල්ලේ සිට කළුඅග්ගල දක්වා බෝට්ටු සේවයක් ක්‍රියාත්මක කළ යුතු බව හඳුනාගන්නා ලදී. | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | කැලණි ගඟ | වාණිජ ස්ථාන | හංවැල්ල විකල්ප මාර්ගය | පොල් වගාව සහිත ඉඩම් |
| **ප්‍රවේශය** | කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය (හයිලෙවල් මාර්ගය) | | | |

| | |
|---|---|
| පිහිටීම දක්වන සිතියම |  |
| භූමි පරිහරණ සැලැස්ම |   |

**ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම**

| ව්‍යාපෘති ස්වභාවය | නව | ✓ | දියුණු කළ යුතු | - | ප්‍රතිසංස්කරණය කළ යුතු | - | භූමිය සංවර්ධනය කිරීම අවශ්‍යයි | - |
|---|---|---|---|---|---|---|---|---|

| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | වාණිජ | සංදර්ශන | උද්‍යාන | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| | - | ✓ | ✓ | - | - | - | විවේක හා විනෝද කටයුතු |

| ව්‍යාපෘතියේ ඉලක්ක | ආර්ථික | ✓ | සමාජීය | ✓ |
|---|---|---|---|---|

<table>
<tr><td>ව්‍යාපෘති ඉලක්ක</td><td colspan="7">සීතාවක නගර සංවර්ධන සැලැස්ම යටතේ කොළඹ දිස්ත්‍රික්කය තුල පිහිටි නීල හරිත භූදර්ශණයකින් යුත් සංචාරක නවාතැන්පලක් බවට පත්කිරීමේ අරමුණින් නගර තුල විවිධ ව්‍යාපෘති යෝජනා හඳුනාගෙන තිබෙන අතර, හංවැල්ල නගරය තුල කැලණි ගඟට යාබදව ඇති දැනට මහජන පොළ පවතින ඉඩම තුල සංචාරක හරිත නිකේතනයක් ඉදිකිරීමට යෝජනා කෙරේ.<br><br>නගරයේ සිටින ආයෝජකයන්හට ආයෝජන අවස්ථා විවර කරගැනීම හා නගරයට පැමිණෙන සංචාරකයින්හට විවේක හා විනෝද කටයුතු අවස්ථා සඳහා ඉඩප්‍රස්ථා විවර කරදීම මේ තුලින් බලාපොරොත්තු වන අතර, වසරකට සංචාරකයින් 20,000 කට වැඩි පිරිසක් හංවැල්ල නගරය වෙත ආකර්ශණය කරගැනීමට ඉලක්ක කර ඇත.</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ පදනම</td><td colspan="7">නගරයට ඇදී එන සංචාරකයන්හට නවාතැන් පහසුකම් සලසාදීම මෙහි මූලික පදනම වන අතර, සීතාවක බල ප්‍රදේශය වෙත සංචාරකයින් ආකර්ශණය කරගැනීම සඳහා ජලාශ්‍රිත විනෝද කටයුතු සහිත හරිත නිකේතනයක් ඉදිකිරීමට යෝජිත ඉඩම තුල වඩාත් යෝග්‍ය බවට මෙම සැලැස්මෙන් හඳුනාගෙන ඇත. නගර මධ්‍යයේහි වාණිජ වටිනාකම අධික මෙම භූමිය දැනට හංවැල්ල සතිපොළ පවත්වාගෙන යනු ලබන අතර, හංවැල්ල සතිපොළ සඳහා විකල්ප ස්ථාන ලබාදී යෝජිත ඉඩමෙන් ප්‍රශස්ථ ආර්ථික ප්‍රතිලාභ ළඟා කරගත හැකි බව මේ තුළින් අපේක්ෂා කෙරේ.</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන තත්ත්වය</td><td colspan="2">▪ සතිපොළ පවත්වාගෙන යනු ලබයි.</td><td>ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය</td><td colspan="4">▪ සතිපොළ පවත්වාගෙන යාම සඳහා නා.සං.අ. මගින් සුදුසු ස්ථානයක් වෙන්කිරීමට සැලසුම් කර ඇත.</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය</td><td colspan="7">▪ සීතාවක ප්‍රාදේශීය සභාව සතුය.</td></tr>
<tr><td rowspan="2">මිනින්දෝරු සැලසුම</td><td>අංකය</td><td>මිනින්දෝරුවරයාගේ නම</td><td>දිනය</td><td colspan="3">ඉඩමේ ප්‍රමාණය</td></tr>
<tr><td>-</td><td>-</td><td>-</td><td>අක්: -</td><td>රූ:-</td><td>පර්:-</td></tr>
</table>

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | වාරිමාර්ග දෙපාර්තමේන්තුව, සංචාරක මණ්ඩලය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව හා මධ්‍යම පරිසර අධිකාරිය යන ආයතනයන්හි සහභාගීත්වය ඇතිව නා.සං.අ. මගින් ඉඩම පවරාගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කළ යුතුය. | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නා.සං.අ. | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | නා.සං.අ. පුද්ගලික | | |
| **යටිතල පහසුකම්** | **ජලය** | **අවශ්‍ය ධාරිතාව** | - | **විදුලිය** | අවශ්‍ය ධාරිතාව | - | |
| | | **පවත්නා ධාරිතාව** | - | | පවත්නා ධාරිතාව | - | |
| | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | **ඔව්** | - | **නැත** | - | **යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | - |
| **කලාපය** | **පරිසර හිතකාමී ක්‍රියාකාරකම් කලාපය** | **කලාපීකරණ අනුකූලභාවය** | **ඔව්** | ✓ | **නැත** | - | |
| **වින්‍යාස සැලැස්ම** | | | | | | | |
| **-** | | | | | | | |

**(2)**

| **ව්‍යාපෘතිය හඳුනාගැනීම** | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | **යෝජිත තෙත්බිම් විනෝදාස්වාදිත ව්‍යාපෘතිය හා මාර්ග සංවර්ධනය** | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පාරිසරික සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සඳහා මුලික ඉඩප්‍රස්ථා විවර කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන තෙත්බිම් විනෝදාස්වාදිත ව්‍යාපෘතියක් යෝජනා කෙරේ.<br><br>හංවැල්ල නගරය ආසන්නයේ ඇති නාගරික සංවර්ධන අධිකාරිය සතු අක්කර 04 ක පමණ පහත් බිම හා එයට යාබදව ඇති අක්කර 06 ක් පමණ වන පහත් බිම මේ සඳහා යොදාගැනීමට අපේක්ෂා කෙරේ. එහිදී පහත අනු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට හඳුනාගෙන ඇත.<br>1. අක්කර 03 ක පමණ භූමියක් තුල ජල රැඳවුම් තටාකයක්<br>2. නාගරික උද්‍යාන හා ළමා උද්‍යාන<br>3. ව්‍යායාම මංතීරු<br>4. සංචාරක විනෝදාස්වාදිත ක්‍රීඩා ස්ථාන<br>5. සංචාරක නිකේතන<br>6. රථවාහන නැවතුම්පල<br>7. ප්‍රවේශ මාර්ග | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | උතුර | නැගෙනහිර | දකුණ | බටහිර |
| | කර්මාන්ත | ප්‍රාදේශීය සභා ප්‍රවේශ මාර්ගය | නේවාසික ප්‍රදේශ | තෙත්බිම |

| | |
|---|---|
| ප්‍රවේශය | ප්‍රාදේශීය සභා මාර්ගයකි. |
| පිහිටීම දක්වන සිතියම |   |
| භූමි පරිහරණ සැලැස්ම |   |

**ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම**

| ව්‍යාපෘති ස්වභාවය | නව | ✓ | දියුණු කළ යුතු | - | විස්තීරණය කළ යුතු | - | භූමිය සංවර්ධනය කිරීම පමණක් | - |
|---|---|---|---|---|---|---|---|---|

| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | වාණිජ | සංදර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිෂ්ඨාපන | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| | - | ✓ | ✓ | - | - | | විනෝදාස්වාදිත |

| ව්‍යාපෘතියේ ප්‍රතිලාභ | ආර්ථික | ✓ | සමාජීය | ✓ |
|---|---|---|---|---|

| | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | ▪ සංචාරක ජනගහනයට අවශ්‍ය සංචාරක ක්‍රියාකාරකම් හා නවාතැන් පහසුකම් සැපයීම<br>▪ කැලණි ගඟ හා පුස්සැලි ඔය, පිටාර ගැලීම් මගින් සිදුවිය හැකි හදිසි ගංවතුර තත්ත්වයන් අවම කිරීමට ජල රඳවන ප්‍රදේශ නිර්මාණය කිරීම<br>▪ ප්‍රජා විනෝද පහසුකම් ස්ථාන ඇති කිරීම<br>▪ යටිතල පහසුකම් සංවර්ධනය<br>▪ නගර අලංකරණය පවත්වා ගැනීම<br>▪ ප්‍රදේශයේ ආයෝජකයින්ට වඩා ලාභදායී ආයෝජන ඉඩප්‍රස්ථා විවර කරදීම |
| **ව්‍යාපෘතියේ පදනම** | සීතාවක හරිත සංචාරක පුරවරයක් බවට පත් කිරීමෙහිලා හංවැල්ල නාගරික මධ්‍යස්ථානය ප්‍රමුඛ ස්ථානයක් ගනී. එහිදී හංවැල්ල නගරය තුල සංචාරක ආකර්ශණය සහිත ස්ථාන අවම වීම හා කැලණි ගඟ, පුස්සැලි ඔය පිටාර ගැලීම්වලින් හදිසි ගංවතුර ආපදා තත්ත්වයන්ට ලක්වීම, රථවාහන නැවතුම් වැනි මූලික යටිතල පහසුකම්වල හිඟකම වැනි ගැටළු පිළිබඳ අවධානය යොමුකරමින් එම ගැටළු අවම කිරීමට මෙමගින් යෝජනා කෙරේ. |

**ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | **නා.සං.අ.** | ✓ | **පෞද්ගලික** | - | **රජයේ** | - | **වෙනත්** | - |

| | | | |
|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන තත්ත්වය** | ▪ පහත් ඉඩමකි. | **ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය** | - |
| **ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය** | ▪ අක්කර 04 ක් පමණ වන ඉඩම නා.සං.අ. සතුවේ. | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මිනින්දෝරු සැලසුම** | අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
| | - | - | - | අක්:04 ක් පමණ | රූ:00 | පර්:00 |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | නා.සං.අ. සතු ඉඩමක් බැවින්, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, මධ්‍යම පරිසර අධිකාරිය සහ පුද්ගලික අංශයේ සහභාගීත්වය ඇතිව නා.සං.අ. අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජිතය. | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නා.සං.අ. පුද්ගලික අංශය | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | පුද්ගලික අංශය | | |
| **යටිතල පහසුකම්** | **ජලය** | **අවශ්‍ය ධාරිතාව** | - | **විදුලිය** | අවශ්‍ය ධාරිතාව | - | |
| | | **පවත්නා ධාරිතාව** | - | | පවත්නා ධාරිතාව | - | |
| | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | **ඔව්** | ✓ | **නැත** | **-** | **යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | - |
| **කලාපය** | සේවා වාණිජ කලාපය | **කලාපීකරණ අනුකූලභාවය** | **ඔව්** | ✓ | **නැත** | - | |
| **වින්‍යාස සැලැස්ම** | | | | | | | |
| **-** | | | | | | | |

**(3)**

| **ව්‍යාපෘතිය හඳුනාගැනීම** | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | **පවත්නා විකල්ප ප්‍රවේශ මාර්ගය තවදුරටත් සංවර්ධනය කිරීම** | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | සීතාවක සංවර්ධන සැලැස්මට අනුව හංවැල්ල නගරය සේවා වාණිජ මධ්‍යස්ථානක් ලෙස සංවර්ධනය කිරීමේදී හඳුනාගන්නා ලද ප්‍රධානම ගැටළුක්ව ලෙස ප්‍රදේශයේ පවතින රථවාහන තදබදය හඳුනාගන්නා ලදී.<br><br>එම ගැටළුව විසඳාගැනීමට විකල්ප ක්‍රම කිහිපයක්ම මෙම සැලැස්ම හරහා යෝජනා කර ඇති අතරම, හංවැල්ල පවත්නා විකල්ප ප්‍රවේශ මාර්ගය මගින් වර්තමානයේදී මෙම ගැටළුව අවම කරලීමට දායකත්වයක් නොලැබී ඇති බව නිරීක්ෂණය වේ.<br><br>එබැවින් එම මාර්ගය තවදුරටත් පුළුල් කර හංවැල්ල - පූගොඩ මාර්ගයට ඒකාබද්ධ කරමින් සංවර්ධනය කරලීම තුලින් හංවැල්ල නගරය තුල පවතින රථවාහන තදබදය අවම කරලීමට පිටුවහලක් ලබාගැනීමට අපේක්ෂා කෙරේ.<br><br>මේ සඳහා වර්තමානය වනවිට ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා ආයුර්වේද ඖසුසල පිහිටා ඇති ප්‍රාදේශීය සභාව සතු දළ වශයෙන් පර්චස් 40 ක් පමණ වන ඉඩම හරහා මාර්ගය දීර්ඝ කර සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති අතරම, බස්රථ නැවතුම්පල පිහිටි චතුරස්‍රය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය යටතේ එහි නගරය තුල පවතින වෙළඳ සංකීර්ණය ප්‍රතිසංවර්ධනය කිරීමේදී ඒ තුලින් මෙම ආයතන සඳහා ප්‍රතිස්ථාපන පහසුකම් ලබාදීමට යෝජනා කරනු ලැබේ. මෙම මාර්ග ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලීමට මාර්ග සංවර්ධන අධිකාරිය වෙත යෝජනා කරලීමට අපේක්ෂා කෙරේ. | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | කැලණි ගඟ හා වාණිජ ස්ථාන | වාණිජ ස්ථාන | වාණිජ ස්ථාන | වාණිජ ස්ථාන |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රවේශය | හංවැල්ල විකල්ප ප්‍රවේශ මාර්ගය<br>කොළඹ - හංවැල්ල පරණ පාර (ලෝලෙවල් මාර්ගය) | | | | | | | |
| පිහිටීම දක්වන සිතියම |  | | | | | | | |
| භූමි පරිහරණ සැලැස්ම |  | | | | | | | |
| **ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම** | | | | | | | | |
| ව්‍යාපෘති ස්වභාවය | නව | ✓ | දියුණු කළ යුතු | ✓ | විස්තීරණය කළ යුතු | - | නැවත සංවර්ධනය කිරීම | - |
| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | වාණිජ | සෞන්දර්ය | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් | |
| | - | - | - | - | - | - | මාර්ග සංවර්ධනයන් | |
| ව්‍යාපෘතියේ ප්‍රතිලාභ | ආර්ථික | ✓ | සමාජීය | ✓ | | | | |

| | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | ▪ හංවැල්ල නගරය තුල පවතින රථවාහන තදබදය අවම කරලීම<br>▪ පහසු හා කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් සැපයීම |
| **ව්‍යාපෘතියේ පදනම** | සේවා මධ්‍යස්ථානයක් හා සංචාරක ආකර්ශණීය ප්‍රදේශ ලෙස හංවැල්ල නගරය සංවර්ධනය කරලීමේදී ඒ තුල පවත්නා ප්‍රධානම ගැටළුවක් වන රථවාහන තදබදය අවම කරලීමට මෙමගින් අවධානය යොමුකර ඇත. එහිදී ප්‍රදේශයට ඇති සංක්‍රමණික ආකර්ශණය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. |

**ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | **නා.සං.අ.** | - | **පෞද්ගලික** | - | **රජයේ** | ✓ | **වෙනත්** | - |

| | | | |
|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන තත්ත්වය** | ▪ ජාතික ඉතිරිකිරිමේ බැංකුව හා ආයුර්වේද ඖසුසල පිහිටි ඉඩම | **ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය** | ▪ හංවැල්ල බස්රථ නැවතුම්පල පිහිටි චතුරශ්‍රය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතිය යටතේ එම වෙළඳ සංකීර්ණය තුලින් සැපයීමට යෝජනා කෙරේ. |
| **ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය** | ▪ සීතාවක ප්‍රාදේශීය සභාව සතු ඉඩමකි. | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මිනින්දෝරු සැලසුම** | අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩමෙ ප්‍රමාණය | | |
| | - | - | - | අක්: 00 | රූ:00 | පර්:00 |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | සීතාවක ප්‍රාදේශීය සභාව හා පුරවිද්‍යා දෙපාර්තමේන්තුව යන ආයතනවල සහභාගීත්වය ඇතිව මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ඉඩම් අත්පත් කරගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කළ යුතුය. | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | මාර්ග සංවර්ධන අධිකාරිය නා.සං.අ. සීතාවක ප්‍රාදේශීය සභාව | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | මහා භාණ්ඩාගාරය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **යටිතල පහසුකම්** | ජලය | අවශ්‍ය ධාරිතාව | - | විදුලිය | අවශ්‍ය ධාරිතාව | - |
| | | **පවත්නා ධාරිතාව** | - | | පවත්නා ධාරිතාව | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | **ඔව්** | - | **නැත** | - | **යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **කලාපය** | සේවා වාණිජ කලාපය | **කලාපීකරණ අනුකූලභාවය** | **ඔව්** | ✓ | **නැත** | - |

| **වින්‍යාස සැලැස්ම** |
|---|
| - |

**(4)**

| **ව්‍යාපෘතිය හඳුනාගැනීම** | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | **හංවැල්ල, ඉන්දියානු තෙල් සංස්ථාව (IOC) ට අයත් ඉන්ධන පිරවුම්හල අසල සිට හයිලෙවල් මාර්ගය දක්වා යෝජිත විකල්ප ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරීම** | | | |
| **ව්‍යාපෘති අංශය** | අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපාය මාර්ගය | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | සීතාවක සැලසුම් ප්‍රදේශයට පිවිසීමට ඇති ප්‍රධාන මාර්ගයක් ලෙස ලෝලෙවල් මාර්ගය හඳුනාගත හැකිය. COMTRANS අධ්‍යයනයට අනුව ලෝලෙවල් මාර්ගයේ ප්‍රවාහන ධාරිතාවය පැයකට වාහන 2,200 ක් තිබිය යුතු වුවත්, එය පැයකට වාහන 2,900 ක් දක්වා වර්ධනය වී ඇත. මේ අනුව හංවැල්ල නගරය සඳහා ඇදී එන වාහන ප්‍රමාණය දිනෙන් දින ඉහළ අගයක් ගනී.<br><br>ඒ සඳහා හයිලෙවල් මාර්ගයට සම්බන්ධ විය හැකි පරිදි විකල්ප මාර්ගයන් දියුණු කිරීම උචිත බවට හඳුනාගන්නා ලදී. ඒ අනුව කි.මී.2.1 ක දිගකින් යුක්ත වන සේ IOC ඉන්ධන පිරවුම්හලේ සිට පහත්ගම බස්නැවතුම්පල දක්වා සම්බන්ධ කරමින් පවතින මාර්ගය මීටර් 13 ක් දක්වා පළල් කිරීමත් එය හරිත මාර්ගයක් ලෙස මාර්ගය දෙපස වාණජමය කටයුතු ඇති නොවන සේ සංවර්ධනය කිරීමටත් යෝජනා කරන ලදී. | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | මෙම මාර්ගය, ලෝලෙවල් මාර්ගය අසල පිහිටා ඇති ඉන්දියානු තෙල් සංස්ථාව (IOC) ට අයත් ඉන්ධන පිරවුම්හල අසලින් අරඹා පහත්ගම බස්නැවතුම්පොල දක්වා පවතී. | | | |

| ප්‍රවේශය | ලෝලෙවල් මාර්ගය, හයිලෙවල් මාර්ගය |
|---|---|
| පිහිටීම දක්වන සිතියම |  |
| වර්තමාන භූමි පරිහරණ සැලැස්ම |  |

**ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම**

| ව්‍යාපෘති ස්වභාවය | නව | - | දියුණු කිරීම | ✓ | විස්තීරණය කිරීම | - | නූතන සංවර්ධනය කිරීම | - |
|---|---|---|---|---|---|---|---|---|

| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | වාණිජ | සංදර්ශන | උද්‍යාන | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
|---|---|---|---|---|---|---|---|

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | - | - | - | - | - | - | මාර්ග සංවර්ධනය | |
| **ව්‍යාපෘතියේ ප්‍රතිලාභ** | **ආර්ථික** | - | **සමාජීය** | ✓ | | | | |
| **ව්‍යාපෘති ඉලක්ක** | ▪ යෝජිත මාර්ගය මීටර් 7ක් දක්වා පුළුල් කිරීම.<br>▪ හරිත මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම.<br>▪ මාර්ගය දෙපස වාණිජ කටයුතු ඇති නොවීම සඳහා නීති රෙගුලාසි හඳුන්වාදීම.<br>▪ හංවැල්ල නගරය තුල පවත්නා වාහන තදබදය අවම කිරීම. | | | | | | | |
| **ව්‍යාපෘතියේ පදනම** | හංවැල්ල නගරය හා බැඳී පවතින අධික රථවාහන තදබදය අවම කිරීම මෙහි මූලික පරමාර්ථව ලෙස හඳුනාගන්නා ලදී. මේ මාර්ගය සංවර්ධනය වීමත් සමඟ ලෝලෙවල් හා හයිලෙවල් මාර්ගය අතර අන්තර් සම්බන්ධතාවය ඉහළ යනු ඇත. එම නිසා පාදුක්ක නගරය, හොරණ නගරය ආදී නගර සඳහා පහසුවෙන් ළඟාවීමේ හැකියාව උදාවනු ඇත. එහිදී, දැනට පැයකට වාහන 2,900 ක් පමණ ගමන් කරන ලෝලෙවල් මාර්ගය හංවැල්ල නගරය හරහා යන වාහන ප්‍රමාණය ලෝලෙවල් මාර්ගය සඳහාද බෙදීයාම තුලින් හංවැල්ල නගරය ලෙස වාහන තදබදය අවම වන බව නිගමනය කළ හැකිය. | | | | | | | |
| **ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය** | | | | | | | | |
| **ඉඩමේ වර්තමාන අයිතිය** | **නා.සං.අ.** | - | **පෞද්ගලික** | ✓ | **රජයේ** | ✓ | **වෙනත්** | - |
| **ඉඩමේ වර්තමාන තත්ත්වය අවට භාවිතය** | මීටර් 04 ක් පමණ පළල සහ සංවර්ධනය නොවූ මාර්ගයක් ලෙස හඳුනාගත හැක. ඉන්දියානු තෙල් සංස්ථාව (IOC) ට අයත් ඉන්ධන පිරවුම්හල පිහිටා ඇති ස්ථානයේ සිට මීටර් 900 ක් පමණ දුරට මාර්ගය දෙපස නිවාස පවතින අතර, පහත්ගම හන්දිය දක්වා මාර්ගය දෙපස පවතිනුයේ, වගුරු බිම් සහ කුඹුරු යායවල්ය. | | **ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය** | - | | | | |
| **ඉඩමේ අයිතිය** | රජයේ සහ දෙපස ඉඩම් පුද්ගලික අයිතිය සතු වේ. | | | | | | | |

| | | | | |
|---|---|---|---|---|
| **පිළිබඳ විස්තරය** | | | | |
| **මිනින්දෝරු සැලසුම** | අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | භූමි ප්‍රමාණය |
| | - | - | - | දුර මීටර 900 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම** | | | | | |
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | ▪ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මංතීරු 02 ක් සහිතව සංවර්ධනය කළ යුතු බවට හඳුනාගන්නා ලදී. | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | මාර්ග සංවර්ධන අධිකාරිය | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | රාජ්‍ය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **යටිතල පහසුකම්** | **ජලය** | **අවශ්‍ය ධාරිතාව** | - | **විදුලිය** | අවශ්‍ය ධාරිතාව | - |
| | | **පවත්නා ධාරිතාව** | - | | පවත්නා ධාරිතාව | - |
| | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | **ඔව්** | - | **නැත** | - | **යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **කලාපය** | මධ්‍යම ඝනත්ව නේවාසික කලාපය | **කලාපීකරණ අනුකූලභාවය** | **ඔව්** | ✓ | **නැත** | - |

**වින්‍යාස සැලැස්ම**

-

**(5)**

| | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය හඳුනාගැනීම** | | | | |
| **ව්‍යාපෘති මාතෘකාව** | හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | **හංවැල්ල, බස්රථ නැවතුම්පල හා වෙළඳ සංකීර්ණය පිහිටි චතුරස්‍රය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය** | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | 2030 වර්ෂයේදී සීතාවක සැලසුම් ප්‍රදේශය සමෘද්ධිමත් පුරවරයක් බවට පත්කළ යුතු බව අරමුණු කර ඇත. ඒ අනුව ප්‍රධාන නගර 05 ක් යටතේ එය සිදුකළ යුතු බව හඳුනාගන්නා ලදී. හංවැල්ල නගරය ඒ අතර ප්‍රධාන ස්ථානයක් ගනී.<br><br>සේවාවන් සපයන වාණිජ නගරයක් ලෙස දියුණු කළ යුතු නගරයක් ලෙස හංවැල්ල නගරය හඳුනාගත් බැවින්, වර්තමාන හංවැල්ල බස්නැවතුම්පල ආසන්නයේම පිහිටා ඇති පැරණි වෙළඳ සංකීර්ණය මහල් 03 කින් යුක්ත වේ. එය තවත් වාණිජ අවකාශවලට ඉඩ සැලසෙන ලෙස මහල් 04 දක්වා සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය බවට හඳුනාගන්නා ලදී. ඊට අමතරව, නගරයේ භූදර්ශණය ඉහළ යන අයුරින් මෙම ගොඩනැගිල්ල සංවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ. | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | සේවා මාර්ගය | සේවා මාර්ගය | කොළඹ - හංවැල්ල පරණ පාර | වාණිජ ස්ථාන |
| **ප්‍රවේශය** | කොළඹ - හංවැල්ල පරණ පාර (ලෝලෙවල් මාර්ගය) | | | |

<table>
<tr><td>පිහිටීම දක්වන සිතියම</td><td colspan="9">
</td></tr>
<tr><td>භූමි පරිහරණ සැලැස්ම</td><td colspan="9">
</td></tr>
<tr><td colspan="10">ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති ස්වභාවය</td><td>නව</td><td>-</td><td>දියුණු කළ යුතු</td><td>✓</td><td>විස්තීරණය කළ යුතු</td><td>-</td><td>භූමිය සංවර්ධනය කිරීම</td><td>-</td><td></td></tr>
<tr><td rowspan="2">ව්‍යාපෘති ප්‍රභේද</td><td>සංරක්ෂණය</td><td>වාණිජ</td><td>භූ දර්ශන</td><td>උරුමයන්</td><td>නිවාස</td><td>ප්‍රතිස්ථාපන</td><td>වෙනත්</td><td></td><td></td></tr>
<tr><td>-</td><td>✓</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td></td><td></td></tr>
<tr><td>ව්‍යාපෘතියේ ප්‍රතිලාභ</td><td colspan="2">ආර්ථික</td><td>✓</td><td colspan="2">සමාජීය</td><td colspan="3">✓</td><td></td></tr>
</table>

<table>
<tr><td>ව්‍යාපෘති ඉලක්ක</td><td colspan="8">▪ ප්‍රදේශයේ රථවාහන තදබදය අවම කිරීම<br>▪ ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම<br>▪ ආරක්ෂාකාරී හා පහසු ප්‍රවාහන සේවාවක් ලබාදීම<br>▪ නගර අලංකරණය පවත්වා ගැනීම</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ පදනම</td><td colspan="8">හංවැල්ල නගරය සඳහා 2030 වර්ෂය වනවිට දෛනිකව 30,000 ක පමණ ජනගහනයක් සේවා සපයා ගැනීමට සංක්‍රමණය වේ යැයි අපේක්ෂා කෙරේ. වර්තමානය වනවිටද හංවැල්ල නගරය තුල ඉහළ රථවාහන තදබදයක් නිරීක්ෂණය කළ හැකි අතරම, 2030 වර්ෂය වනවිට එය තවදුරටත් ඉහළ යන බව අපේක්ෂා කෙරේ.<br><br>ඒ අනුව පවත්න බස්රථ නැවතුම්පල ප්‍රතිව්‍යුහගත කිරීම හා වෙළඳ සංකීර්ණය ප්‍රතිසංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.</td></tr>
<tr><td colspan="9">ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන අයිතිය</td><td>නා.සං.අ.</td><td>-</td><td>පෞද්ගලික</td><td>✓</td><td>රජයේ</td><td>✓</td><td>වෙනත්</td><td>-</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන තත්ත්වය</td><td colspan="2">▪ වර්තමානයේ බස්රථ නැවතුම්පල හා ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කරන වෙළඳ සංකීර්ණය ක්‍රියාත්මක වේ.</td><td colspan="2">ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය</td><td colspan="4">▪ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී වෙළඳසැල් සඳහා එම ස්ථානය තුලම තාවකාලික විකල්ප වෙළඳසැල් ලබාදීමට යෝජනා කෙරේ.</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය</td><td colspan="8">▪ සීතාවක ප්‍රාදේශීය සභාව සතු ඉඩමකි.</td></tr>
</table>

| මිනින්දෝරු සැලසුම | අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | - | - | - | අක්: 00 | රූ.00 | පර්. 00 |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | නා.සං.අ. හා සීතාවක ප්‍රාදේශීය සභාව ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ. | ක්‍රියාත්මක කළ යුතු ආයතනය | නා.සං.අ. සීතාවක ප්‍රාදේශීය සභාව | අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය | මහා භාණ්ඩාගාරය පුද්ගලික අංශය |

| යටිතල පහසුකම් | | | | | | |
|---|---|---|---|---|---|---|
| යටිතල පහසුකම් | ජලය | අවශ්‍ය ධාරිතාව | - | විදුලිය | අවශ්‍ය ධාරිතාව | - |
| | | පවත්නා ධාරිතාව | - | | පවත්නා ධාරිතාව | - |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | ඔව් | - | නැත | යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | - |

| කලාපය | සේවා වාණිජ කලාපය | කලාපීකරණ අනුකූලභාවය | ඔව් | ✓ | නැත | - |
|---|---|---|---|---|---|---|

| වින්‍යාස සැලැස්ම |
|---|
| - |

**(6)**

| ව්‍යාපෘතිය හඳුනාගැනීම | | | | |
|---|---|---|---|---|
| ව්‍යාපෘති මාතෘකාව | හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | **හංවැල්ල පොළ (අදියර II) සංවර්ධන ව්‍යාපෘතිය** | | | |
| ව්‍යාපෘති යෝජනාව | හංවැල්ල මහජන පොළ සඳහා විශාල පිරිසක් සේවා සපයා ගැනීමේ අරමුණින් පැමිණෙන අතර, ඔවුනට ඉහළ සේවාවක් ලබාදීමේ අරමුණින් නා.සං.අ. මගින් සුදුසු ස්ථානයක පොළ පරිශ්‍රය ස්ථාපනය කරලීමට කටයුතු සිදුකරන ලදී. නමුත් නව පොළ පරිශ්‍රය තුල පැරණි පොළ පරිශ්‍රයේ සියලු ස්ථාන වෙළඳ ස්ථාන සඳහා ඉඩපහසුකම් හිඟවීම හේතුවෙන් පොළ අදියර - II ක්‍රියාත්මක කරලීමේ අවශ්‍යතාව මතු වී ඇත. එබැවින් ඉදිකළ නව පොළ පරිශ්‍රයට යාබද ඉඩම පොළ අදියර - II ලෙස සංවර්ධනය කර, ඒ සඳහා අවශ්‍ය පොදු රථගාල් සනීපාරක්ෂක පහසුකම් හා විධිමත් ප්‍රවේශ මාර්ග ඇතුළු යටිතල පහසුකම් සහිතව සංවර්ධනය කරලීමට යෝජනා කරනු ලැබේ. වර්තමානයේ මහජන පොළ පවත්නා ස්ථානය සංවර්ධන සැලැස්ම තුලින් හඳුනාගත්නා ලද වෙනත් ව්‍යාපෘතියක් සඳහා යොදාගැනීමටද හඳුනාගෙන ඇත. | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | උතුර | නැගෙනහිර | දකුණ | බටහිර |
| | - | - | - | - |
| **ප්‍රවේශය** | කොළඹ - හංවැල්ල පරණ පාර (ලෝලෙවල් මාර්ගය)<br>ප්‍රාදේශීය සභා මාර්ගය | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පිහිටීම දක්වන සිතියම |  | | | | | | | |
| භූමි පරිහරණ සැලැස්ම |  | | | | | | | |
| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | | | | |
| ව්‍යාපෘති ස්වභාවය | නව | | දියුණු කළ යුතු | ✓ | විස්තීරණය කළ යුතු | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |
| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් | |
| | | ✓ | | | | ✓ | | |
| ව්‍යාපෘතියේ ප්‍රතිලාභ | ආර්ථික | ✓ | සමාජීය | ✓ | | | | |

<table>
<tr><td>ව්‍යාපෘති ඉලක්ක</td><td colspan="8">▪ පවතින හංවැල්ල පොළ තුල ව්‍යාපාරික ස්ථාන 442 ක් ව්‍යාපාරික කටයුතු කරනු ලබන අතර, ඉන් 235 ක් සඳහා හංවැල්ල පොළ (අදියර I) සඳහා නිමකර ඇත. ඉතිරි ව්‍යාපෘතින් සඳහා ව්‍යාපාරික ස්ථාන ලබාදීම අදියර II යටතේ ඉලක්ක කරගෙන ඇත.<br>▪ පවතින පොළ භූමිය ආර්ථික වටිනාකමකින් වැඩි ආයෝජන අවස්ථාවක් සඳහා වෙන්කිරීම<br>▪ ඒ තුලින් රැකියා අවස්ථා 15,000 ක් පමණ බිහිකිරීම<br>▪ පොළ සඳහා අවශ්‍ය මූලික යටිතල හා සනීපාරක්ෂක පහසුකම් සැලසීම</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ පදනම</td><td colspan="8">සීතාවක නගර සංවර්ධන සැලැස්ම යටතේ සංවර්ධනය කළ යුතු ප්‍රධාන නාගරික මධ්‍යස්ථානයක් ලෙස හංවැල්ල නගරය හැඳින්විය හැකිය. හංවැල්ල නගරය තුල සිදුවන සංවර්ධනයන් සැලසුම් සහගත ලෙස සිදුනොවීම තුලින් නගර මධ්‍ය තුල අධික රථවාහන තදබදයක් දක්නට ලැබෙන අතර, නගරයට දෛනිකව 40,000 කට අධික පිරිසක් සංක්‍රමණය වන අතරම, බස්රථ බොහොමයක් එනම්, කොළඹ - රත්නපුර, කොළඹ - අවිස්සාවේල්ල, කොළඹ - ඇඹිලිපිටිය සඳහා මෙම නගරය පසුකරගෙන ගමන් කරනු ලබයි. එබැවින් රථවාහන තදබදයට එක් හේතුවක් වී ඇති නගර මධ්‍ය තුල ඇති මහජන පොළ සඳහා සුදුසු ස්ථානයක් ලබාදීම යෝජනා කර ඇති අතර, ඒ සඳහා රථවාහන නැවැත්වීමට පහසුකම් හා අනෙකුත් යටිතල පහසුකම් සපයා දෙනු ලැබේ. මෙහි ප්‍රධාන අරමුණ නගරයේ ඇති රථවාහන තදබදය අවම කිරීමය.</td></tr>
<tr><td colspan="9">ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන අයිතිය</td><td>නා.සං.අ.</td><td>✓</td><td>පෞද්ගලික</td><td></td><td>රජයේ</td><td></td><td>වෙනත්</td><td></td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන තත්වය</td><td colspan="3">▪ පුද්ගලික අංශය සතු හිස් ඉඩමකි.</td><td>ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය</td><td colspan="4">▪ නා.සං.අ. හා සීතාවක ප්‍රාදේශීය සභාව මගින් ප්‍රතිස්ථාපනය කරනු ලබන අතර, සංවර්ධන කටයුතු අවසන් වූ පසුව සීතාවක ප්‍රාදේශීය සභාව වෙත පැවරීමට කටයුතු කෙරේ.</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය</td><td colspan="8">▪ පුද්ගලික අංශය සතු ඉඩමක් මෙම අධිකාරිය වෙත අත්පත් කරගැනීමේ කටයුතු නා.සං.අ. මගින් සිදුකරගෙන යනු ලැබේ.</td></tr>
</table>

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මිනින්දෝරු සැලසුම | අංකය | ඉල්ලුම්කරුවරයාගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
| | 767 | ජී.ඩී.කේ. දමයන්ති | 2017.04.28 | අක්: 04 | රූ.02 | පර්. 24.40 |

**ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම**

| | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ සිදුකිරීමට යෝජිතය. | ක්‍රියාත්මක කළ යුතු ආයතනය | නා.සං.අ. සීතාවක ප්‍රාදේශීය සභාව | අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය | මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| යටිතල පහසුකම් | ජලය | අවශ්‍ය ධාරිතාව | | විදුලිය | අවශ්‍ය ධාරිතාව | |
| | | පවත්නා ධාරිතාව | | | පවත්නා ධාරිතාව | |
| | ඝන අපද්‍රව්‍ය කළමනා කරණය | ඔව් | ✓ | නැත | යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | |
| කලාපය | ප්‍රජා වාණිජ කලාපය | කලාපීකරණ අනුකූලභාවය | ඔව් | ✓ | නැත | |

**වින්‍යාස සැලැස්ම**

-

**(7)**

| **ව්‍යාපෘතිය හඳුනාගැනීම** | |
|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | හංවැල්ල, කොස්ගම සහ පාදුක්ක නගර සංවර්ධන ව්‍යාපෘති |
| **ව්‍යාපෘතිය** | **සැලසුම් බල ප්‍රදේශයට පිවිසෙන හරිත පිවිසුම් දොරටු ඉදිකිරීම** |
| **ව්‍යාපෘති අංශය** | ආර්ථික සංවර්ධන උපාය මාර්ගය |
| **ව්‍යාපෘති යෝජනාව** | කොළඹ දිස්ත්‍රික්කයේ ආශිර්වාදාත්මක හරිත පුරවරය යන දැක්ම ඔස්සේ සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත. ඒ අනුව සීතාවක සැලසුම් ප්‍රදේශය ප්‍රධාන වශයෙන්ම එහි පවත්නා භූදර්ශණය ඉස්මතු වන පරිදි හරිත පිවිසුම් දොරටු සිදුකිරීම ප්‍රධාන අවශ්‍යතාවයක් ලෙසට හඳුනාගන්නා ලදී.<br><br>ඒ අනුව හරිත මාර්ග ලෙස සංවර්ධනය කිරීමට යෝජිත මාර්ග පහත පරිදි දැක්විය හැකිය.<br><br>1. හයිලෙවල් මාර්ගය - ගලගෙදර පාලමේ සිට ගලගෙදර හන්දිය දක්වා (කි.මී.1.2) භූදර්ශණය කිරීම.<br>2. ලෝලෙවල් මාර්ගය - ලෝලෙවල් මාර්ගය, පුස්සැලි ඔය හමුවන ස්ථානයේ සිට වර්තමාන විකල්ප මාර්ගය දක්වා (කි.මී.1.3) භූදර්ශණය කිරීම.<br>3. අවිස්සාවේල්ල මාර්ගය - පුවක්පිටිය දුම්රිය ස්ථානයේ සිට අවිස්සාවේල්ල නගරය දෙසට (කි.මී.0.5) භූදර්ශණය කිරීම.<br>4. කොස්ගම - පූගොඩ මාර්ගය (කි.මී.1) භූදර්ශණය කිරීම. |

| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
|---|---|---|---|---|
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය<br>පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | උතුර | නැගෙනහිර | දකුණ | බටහිර |
| | - | - | - | - |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| **ප්‍රවේශය** | හයිලෙවල් මාර්ගය / ලෝලෙවල් මාර්ගය/ කොළඹ - රත්නපුර මාර්ගය | | | | | | | | |
| **පිහිටීම දක්වන සිතියම** | - | | | | | | | | |
| **භූමි පරිහරණ සැලැස්ම** | - | | | | | | | | |
| **ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම** | | | | | | | | | |
| **ව්‍යාපෘති ස්වභාවය** | නව | ✓ | දැනට පවතින | - | විස්තීරණය කළ යුතු | - | පුනර්ජීවය සංවර්ධනය කිරීම සඳහා | - | |
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | ධාර්මික | සෞන්දර්ය | උරුමයන් | නිවාස | ප්‍රතිෂ්ඨාපන | වෙනත් | | |
| | - | - | ✓ | - | - | - | සංචාරක ආකර්ශණය | | |
| **ව්‍යාපෘතියේ ප්‍රතිලාභ** | ආර්ථික | - | සමාජීය | ✓ | | | | | |
| **ව්‍යාපෘති ඉලක්ක** | ▪ හරිත පුරවරයකට ඇතුල් වන බව හැඟෙන පරිදි හරිත භූදර්ශණය නිර්මාණය කිරීම.<br>▪ ප්‍රධාන දොරටු 02 ක් නිර්මාණය කිරීම.<br>▪ සංචාරකයින් වැඩි පිරිසක් ආකර්ශණය කරගැනීම.<br>▪ මාර්ග දෙපස රුක් රෝපණයෙන් යුත් භූදර්ශණයකින් සමන්විත කිරීම. | | | | | | | | |
| **ව්‍යාපෘතියේ පදනම** | කොළඹ දිස්ත්‍රික්කයේ හරිත පුරවරය දැක්ම කරායාමේදී, “ප්‍රදේශයට ඇතුළුවන යම්කිසි පුද්ගලයෙකු සැලසුම් ප්‍රදේශයට ඇතුල්වීමේදී සුවදායී පරිසරයකට පිවිසීම” යන සංකල්පය මෙම ව්‍යාපෘතිය තුලින් හඳුනාගන්නා ලදී. ඒ අනුව දිස්ත්‍රික්ක 03 ක් ආවරණය වන ලෙස මෙම හරිත පිවිසුම් මාර්ග දොරටු පිහිට විය යුතු හඳුනාගන්නා ලදී. එනම්, කොළඹ, ගම්පහ හා රත්නපුර දිස්ත්‍රික්කයි.<br><br>මීට අමතරව, සැලසුම් ප්‍රදේශය 2030 වර්ෂයේදී නීලහරිත සංචාරක පුරවරයක් ලෙස සංවර්ධනය කිරීමට අරමුණු කර ඇති අතර, ප්‍රදේශය සඳහා සංචාරකයින් ආකර්ශණය කරගැනීමටද මෙම ව්‍යාපෘතිය ප්‍රධානම අරමුණයි. | | | | | | | | |

| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඉඩමේ වර්තමාන අයිතිය | නා.සං.අ. | - | පෞද්ගලික | - | රජයේ | ✓ | වෙනත් | - |

| | | | |
|---|---|---|---|
| ඉඩමේ වර්තමාන තත්ත්වය අවට භාවිතය | නේවාසික හා වාණිජ භාවිතාවන්ගෙන් යුත් පරිසරයකින් සමන්විත වේ. | ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය | - |
| ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය | මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය සතු මාර්ගයන් වේ. | | |

| මිනින්දෝරු සැලසුම | අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | - | - | - | අක්: 00 | රූ.00 | පර්.00 |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | ▪ මාර්ග සංවර්ධන අධිකාරියේ හා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය යන ආයතනවල එකඟතාවය ලබාගැනීමෙන් අනතුරුව එම ආයතනවල අධීක්ෂණය යටතේ | ක්‍රියාත්මක කළ යුතු ආයතනය | නා.සං.අ. සීතාවක ප්‍රාදේශීය සභාව | අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය | රාජ්‍ය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | නා.සං.අ. හා සීතාවක ප්‍රාදේශීය සභාව යන ආයතනවල මැදිහත්වීම යටතේ ක්‍රියාත්මක කළ යුතුව ඇත. | | | | | |
| **යටිතල පහසුකම්** | **ජලය** | **අවශ්‍ය ධාරිතාව** | - | **විදුලිය** | අවශ්‍ය ධාරිතාව | - |
| | | **පවත්නා ධාරිතාව** | - | | පවත්නා ධාරිතාව | |
| | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | **ඔව්** | - | **නැත** | **යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | - |
| **කලාපය** | අඩු ඝනත්ව නේවාසික කලාපය හා පරිසර හිතකාමී ක්‍රියාකාරකම් කලාපය | **කලාපීකරණ අනුකූලභාවය** | **ඔව්** | ✓ | **නැත** | - |
| **වින්‍යාස සැලැස්ම** | | | | | | |
| **-** | | | | | | |

**(8)**

| **ව්‍යාපෘතිය හඳුනාගැනීම** | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | හංවැල්ල නගර සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | **බරාව තෙත්බිම් උද්‍යානය සංවර්ධන ව්‍යාපෘතිය** | | | |
| **ව්‍යාපෘති අංශය** | තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ගය යටතේ තෙත්බිම් කළමනාකරණ උපාය මාර්ගය | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | සීතාවක සංවර්ධන සැලැස්ම (2019 - 2030) සංවර්ධන දැක්ම අනුව ප්‍රදේශයේ පවතින අධි සංවේදී පරිසර පද්ධතිය ආරක්ෂා කිරීම, ආරක්ෂා කරමින් පාරිසරික වශයෙන් සුරක්ෂිත ක්‍රියාකාරකම් සඳහා යොදාගැනීම තුලින් ප්‍රදේශයේ ආර්ථික තත්ත්වය මෙන්ම විනෝදාස්වාදය සපයා ගැනීමේ පරමාර්ථයෙන් යුතුව ක්‍රියාකරනු ඇත.<br><br>ඒ අනුව සීතාවක ප්‍රදේශයටද අයත්ව පවතින බරාව තෙත්බිම් ප්‍රදේශය සංරක්ෂණය කිරීම උද්‍යානයක් වශයෙන් දියුණු කිරීම තුලින් එම ස්වභාවික සම්පත් පරිශීලනය කිරීමටද මෙම ව්‍යාපෘතිය හරහා යෝජනා කෙරේ. | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | ලෝලෙවල් මාර්ගය | තෙත්බිම් | තෙත්බිම් | පුස්සැලි ඔය |
| **ප්‍රවේශය** | ලෝලෙවල් මාර්ගය | | | |

| | |
|---|---|
| පිහිටීම දක්වන සිතියම |  |
| භූමි පරිහරණ සැලැස්ම |   |

**ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම**

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති ස්වභාවය | නව | ✓ | දියුණු කළ යුතු | - | විස්තීරණය කළ යුතු | | - | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | | - |
| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | වාණිජ | | භූ දර්ශන | | උරුමයන් | | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් | |
| | ✓ | - | | ✓ | | - | | - | - | - | |
| ව්‍යාපෘතියේ ප්‍රතිලාභ | ආර්ථික | | | ✓ | | සමාජීය | | | ✓ | | |
| ව්‍යාපෘති ඉලක්ක | ▪ තෙත්බිම් සංරක්ෂණය කිරීම<br>▪ විවේක හා විනෝද කටයුතු පහසුකම් සැපයීම<br>▪ ප්‍රදේශයේ ආර්ථික වර්ධනය ඉහළ දැමීම<br>▪ ප්‍රදේශයේ පාරිසරික හිතකාමී ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම | | | | | | | | | | |

| | |
|---|---|
| **ව්‍යාපෘතියේ පදනම** | වර්තමානයේ සීතාවක සැලසුම් බල ප්‍රදේශය තුල නාගරීකරණය හයිලෙවල් මාර්ගය, ලෝලෙවල් මාර්ගය දෙපස අධිකව ව්‍යාප්ත වන බව සංවර්ධන පීඩන විශ්ලේෂණය ඔස්සේ නිරීක්ෂණය කරන ලදී. ඒ අනුව පුස්සැලි ඔය හා බරාව තෙත්බිම් සහිත ප්‍රදේශයේ අධි සංවේදී පරිසර පද්ධතිය කලාපයද ඉහත තර්ජනයට ලක්වන බව පෙනී යයි. නව සංවර්ධන සැලැස්මේ දැක්මට අනුව පාරිසරික ප්‍රදේශ ආරක්ෂා කිරීම විශේෂයෙන්ම සැලකිල්ලට බඳුන් වන අතර, ඒ හා සමගාමීව ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ හා සංචාරකයින්ගේ විනෝදාස්වාද පහසුකම් සැපයීම මෙන්ම ප්‍රදේශයේ භූදර්ශණය ඉහළ දැමීමද මේ ව්‍යාපෘතිය හරහා සිදුකරනු ලබයි. එම නිසා සංවර්ධන සැලැස්මේ දැක්ම කරායාමේදී මෙම ව්‍යාපෘතිය අත්‍යාවශයෙන්ම ක්‍රියාත්මක කළ යුතුව පවතී. |

**ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය**

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | **නා.සං.අ.** | - | **පෞද්ගලික** | ✓ | **රජයේ** | ✓ | **වෙනත්** | - |

| | | | |
|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන තත්ත්වය අවට භාවිතය** | තෙත්බිම් හා නේවාසික භාවිත වශයෙන් පවතී. | **ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය** | - |

| | |
|---|---|
| **ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය** | රජයේ සහ පුද්ගලික අංශය සතුව පවතී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **මිනින්දෝරු සැලසුම** | අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
| | - | - | - | අක්: 10 | රූ.00 | පර්.00 |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | ▪ භූමිය සැකසීම හා යටිතල පහසුකම් සැපයීම මධ්‍යම පරිසර අධිකාරිය, නා.සං.අ. හා අනෙකුත් රාජ්‍ය ආයතන ඒකාබද්ධව සිදුකරනු ලබයි. පුද්ගලික අංශයේ ආයෝජකයින් සඳහාද ඉඩප්‍රස්ථාව ලබා දේ. | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නා.සං.අ. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | භාණ්ඩාගාර අරමුදල් පෞද්ගලික අංශය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **යටිතල පහසුකම්** | **ජලය** | **අවශ්‍ය ධාරිතාව** | - | **විදුලිය** | අවශ්‍ය ධාරිතාව | - |
| | | **පවත්නා ධාරිතාව** | - | | පවත්නා ධාරිතාව | - |
| | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | **ඔව්** | - | **නැත** | **යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **කලාපය** | ස්වභාවික තෙත්බිම් සංරක්ෂණ කලාපය | **කලාපීකරණ අනුකූලභාවය** | **ඔව්** | ✓ | **නැත** | |

| වින්‍යාස සැලැස්ම |
|---|
| - |

## කොස්ගම නගර සංවර්ධන ව්‍යාපෘති

**(9)**

| ව්‍යාපෘතිය හඳුනාගැනීම | | | | |
|---|---|---|---|---|
| ව්‍යාපෘති මාතෘකාව | කොස්ගම නගර සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | **කොස්ගම බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය** | | | |
| ව්‍යාපෘති යෝජනාව | සීතාවක සංවර්ධන සැලැස්ම යටතේ කොස්ගම නගරය ප්‍රජා වාණිජ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති අතර, ඒ අනුව 2030 වර්ෂය වනවිට දෛනිකව 25,000 ක පමණ ජනගහනයක් ප්‍රදේශයට සංක්‍රමණය වේ යැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව ඔවුනට දෛනිකව අවශ්‍ය මූලික පහසුකම් සැපයීමේ අරමුණින් මෙම ව්‍යාපෘතිය යෝජනා කර ඇත. මෙහිදී කොස්ගම නගරය ආසන්නයේ හඳුනාගත් අක්කර 06 ක පමණ භූමියක් තුල කොස්ගම බස්රථ නැවතුම්පල හා දුම්රිය නැවතුම්පල ඒකාබද්ධව සංවර්ධනය කිරීම හා ඊට අනුබද්ධ අනෙකුත් පහසුකම් සැපයීමට යෝජනා කෙරේ.<br><br>මෙම ව්‍යාපෘතිය තුලින් පහත පහසුකම් සැපයීමට අපේක්ෂා කෙරේ.<br><br>1. බස්රථ නැවතුම්පල හා දුම්රිය නැවතුම්පල අතර මනා සම්බන්ධතාවයක් ඇති කිරීම තුලින් මගී ජනතාවට පහසුකම් සැපයීම<br>2. පදික ජනතාවට අවශ්‍ය සනීපාරක්ෂක පහසුකම් සැපයීම<br>3. වාණිජ හා බැංකු පහසුකම්වලින් සමන්විත වෙළඳ සංකීර්ණ ලබාදීම<br>4. රථවාහන නැවතුම් සඳහා ස්ථාන හා විවේකීය ස්ථාන ලබාදීම<br>5. නගර අලංකරණ හා යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |

<table>
<tr><td rowspan="2">සීමාවන්</td><td colspan="3">උතුර</td><td colspan="2">නැගෙනහිර</td><td>දකුණ</td><td colspan="2">බටහිර</td></tr>
<tr><td colspan="3">අවිස්සාවේල්ල පාර</td><td colspan="2">දුම්රිය මාර්ගය</td><td>කොස්ගම-කඳුගොඩ මාර්ගය</td><td colspan="2">නේවාසික හා ප්‍රාදේශීය සභා මාර්ගය</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="8">කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය (හයිලෙවල් මාර්ගය)<br>කොස්ගම - කඩුගොඩ මාර්ගය</td></tr>
<tr><td>පිහිටීම දක්වන සිතියම</td><td colspan="8">
</td></tr>
<tr><td>භූමි පරිහරණ සැලැස්ම</td><td colspan="8">
</td></tr>
<tr><td colspan="9">ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති ස්වභාවය</td><td>නව</td><td>✓</td><td>දියුණු කළ යුතු</td><td>-</td><td>විස්තීරණය කළ යුතු</td><td>-</td><td>භූමිය සංවර්ධනය කිරීම පමණක්</td><td>-</td></tr>
</table>

| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | ධාරිත | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| | - | ✓ | ✓ | - | - | - | ප්‍රවාහන |

| ව්‍යාපෘතියේ ප්‍රතිලාභ | ආර්ථික | ✓ | සමාජීය | ✓ |
|---|---|---|---|---|

| | |
|---|---|
| ව්‍යාපෘති ඉලක්ක | ▪ ප්‍රදේශයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම<br>▪ පහසු, කාර්යක්ෂම හා ආරක්ෂාකාරී මගී ප්‍රවාහන සේවාවක් ප්‍රදේශයේ ජනතාවට සැපයිය හැකිවීම<br>▪ නාගරික අලංකරණය පවත්වා ගැනීම<br>▪ ප්‍රදේශයේ ආයෝජකයින්ට වඩා ලාභදායී ආයෝජන අවස්ථා සැලසීම |
| ව්‍යාපෘතියේ පදනම | දැනට කොස්ගම නගරයට දුම්රිය ප්‍රවාහන සේවාවක් පැවතුණද, එය ප්‍රදේශයේ ජනතාවගේ ආකර්ශණයට තවමත් භාජනය වී නොමැත. වැඩි පිරිසක් පුද්ගලික බස්රථ සේවාව භාවිතා කරනු ලබයි. මෙය සැලකිල්ලට ගෙන දුම්රිය ප්‍රවාහන සේවය හා බස්රථ ප්‍රවාහන සේවය ඒකාබද්ධ කර, කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් මගී ජනතාවට ලබාදීමේ අරමුණින් කොස්ගම දුම්රියපලට ආසන්නයේ පවතින හිස් භූමිය තුල බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ඉදිකිරීමට යෝජනා කර ඇත. |

**ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය**

| ඉඩමේ වර්තමාන අයිතිය | නා.සං.අ. | - | පෞද්ගලික | ✓ | රජයේ | - | වෙනත් | - |
|---|---|---|---|---|---|---|---|---|

| ඉඩමේ වර්තමාන තත්වය | ▪ පහත් බිම ස්වභාවයෙන් යුත් හිස් ඉඩමකි. | ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය | - |
|---|---|---|---|

| | |
|---|---|
| ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය | ▪ පුද්ගලික අයිතිය |

| මිනින්දෝරු සැලසුම | අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | - | - | - | අක්: 06 ක් පමණ | රු.00 | පර්.00 |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | ඉඩම පුද්ගලික අංශය යටතේ පවතින බැවින්, නා.සං.අ. මගින් ඉඩම අත්පත් කරගැනීමෙන් අනතුරුව පුද්ගලික අංශයේද මැදිහත්වීම යටතේ ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘතියකි. | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නා.සං.අ. පුද්ගලික අංශය | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | පුද්ගලික අංශය මහා භාණ්ඩාගාරය |

| යටිතල පහසුකම් | ජලය | අවශ්‍ය ධාරිතාව | - | විදුලිය | අවශ්‍ය ධාරිතාව | - |
|---|---|---|---|---|---|---|
| | | පවත්නා ධාරිතාව | - | | පවත්නා ධාරිතාව | - |
| | සන අපද්‍රව්‍ය කළමනාකරණය | ඔව් | - | නැත | යෝජිත සන අපද්‍රව්‍ය කළමනාකරණය | - |

| කලාපය | සේවා වාණිජ කලාපය | කලාපීකරණ අනුකූලභාවය | ඔව් | ✓ | නැත | |
|---|---|---|---|---|---|---|

| වින්‍යාස සැලැස්ම |
|---|
| - |

**(10)**

| | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය හඳුනාගැනීම** | | | | |
| **ව්‍යාපෘති මාතෘකාව** | කොස්ගම නගර සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | **ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය** | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ හංවැල්ල, පාදුක්ක, කොස්ගම යන නගර කේන්ද්‍ර කරගනිමින් එම ප්‍රදේශවලින් ජනනය වන ඝන අපද්‍රව්‍ය පරිසර හිතකාමී අයුරින් බැහැර කිරීම සිදුකළ යුතු බවට අවධානය යොමුකර ඇත. මේ සඳහා සාලාවවත්ත ඉඩමෙන් අක්කර 01 ක පමණ භූමි භාගයක් යෝජනා කරන අතර, මෙය සීතාවක ප්‍රාදේශීය සභාව මැදිහත්වීමෙන් ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘතියකි. | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | - | - | - | - |
| **ප්‍රවේශය** | සාලාව - අකරවිට මාර්ගය | | | |
| **පිහිටීම දක්වන සිතියම** |  | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **භූමි පරිහරණ සැලැස්ම** |  | | | | | | | |
| **ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම** | | | | | | | | |
| **ව්‍යාපෘති ස්වභාවය** | නව | ✓ | දියුණු කළ යුතු | - | විස්තීරණය කළ යුතු | - | භූමිය සංවර්ධනය කිරීම | - |
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | ධාරිතා | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් | |
| | | ✓ | - | - | - | - | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ | |
| **ව්‍යාපෘතියේ ප්‍රතිලාභ** | ආර්ථික | ✓ | සමාජීය | ✓ | | | | |
| **ව්‍යාපෘති ඉලක්ක** | ▪ නාගරික යටිතල පහසුකම් සංවර්ධනය<br>▪ පාරිසරික ගැටළු අවම ප්‍රදේශයක් බවට පත්කිරීම | | | | | | | |
| **ව්‍යාපෘතියේ පදනම** | සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල වාර්ෂිකව කසළ ටොන් 182.8 ක පමණ ප්‍රමාණයක් ඒකරාශීවන බවට හඳුනාගෙන ඇති අතරම, වර්තමානයේ මෙට්‍රික් ටොන් 36 – 40 ත් අතර ප්‍රමාණයක් පළාත් පාලන ආයතනයේ අධීක්ෂණය යටතේ කොස්ගම පිහිටි කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනාගාරය තුලදී ප්‍රතිචක්‍රීකරණය කෙරේ. නමුත් ප්‍රදේශය තුල හඳුනාගත් ගැටළු අනුව එය ප්‍රමාණවත් නොවන බව හඳුනාගෙන ඇත.<br><br>එමෙන්ම වර්තමානයේදී කොම්පෝස්ට් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය සභාව සතු භූමිය ඒ සඳහා සුදුසු ස්ථානයක් නොවන බැවින්, වෙනත් විකල්ප ස්ථානයක් හඳුනාගැනීමෙන් අනතුරුව, මෙම ඉඩම වෙනත් සුදුසු සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා යොදාගැනීමට සැලසුම් කර ඇත. | | | | | | | |

| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ඉඩමේ වර්තමාන අයිතිය | නා.සං.අ. | - | පෞද්ගලික | ✓ | රජයේ | - | වෙනත් | - |

| | | | |
|---|---|---|---|
| ඉඩමේ වර්තමාන තත්වය | ▪ රබර් වගාව සහිත ඉඩමකි. | ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය | - |
| ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය | ▪ පුස්සැල්ලාව වැවිලි සමාගම සතු ඉඩමකි. | | |

| මිනින්දෝරු සැලසුම | අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | ඉඩමේ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | - | - | - | අක්: 01 | රූ:00 | පර්:00 |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | සීතාවක ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා ඉඩම් පවරාගැනීමේ කටයුතු සිදුකර, සීතාවක ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කළ යුතුය. | ක්‍රියාත්මක කළ යුතු ආයතනය | සීතාවක ප්‍රාදේශීය සභාව | අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය | රජය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| යටිතල පහසුකම් | ජලය | අවශ්‍ය ධාරිතාව | | විදුලිය | අවශ්‍ය ධාරිතාව | | |
| | | පවත්නා ධාරිතාව | - | | පවත්නා ධාරිතාව | - | |
| | ඝන අපද්‍රව්‍ය කළමනා කරණය | ඔව් | - | නැත | - | යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | - |
| කලාපය | අඩු ඝනත්ව නේවාසික කලාපය | කලාපීකරණ අනුකූලභාවය | ඔව් | ✓ | නැත | | |
| වින්‍යාස සැලැස්ම | | | | | | | |
| - | | | | | | | |

**(11)**

<table>
<tr><th colspan="5">ව්‍යාපෘතිය හඳුනාගැනීම</th></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="4">කොස්ගම නගර සංවර්ධන ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘතිය</td><td colspan="4">සාලාව නගර සංවර්ධන භූමියේ සිට කොස්ගම සතිපොළ දක්වා කොළඹ - රත්නපුර මාර්ගය දෙපස හරිත පදික තීරු ඇති කිරීම හා භූමි අලංකරණය</td></tr>
<tr><td>ව්‍යාපෘති අංශය</td><td colspan="4">තිරසාර පරිසර සංවර්ධන උපාය මාර්ගය යටතේ භූදර්ශන කළමනාකරණ උපාය මාර්ගය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">සීතාවක සංවර්ධන සැලැස්ම (2019-2030) යටතේ ප්‍රධාන ප්‍රජා සේවා වාණිජ නගරයක් ලෙස සංවර්ධනය කිරීමට කොස්ගම නගරය හඳුනාගෙන ඇත. වර්තමානයේ කොස්ගම නගරය මූලිකවම ව්‍යාප්තව පවතිනුයේ, කොළඹ - රත්නපුර මාර්ගය දෙපසයි. එය ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ සිට සාලාව පොළ දක්වා මීටර් 400 ක් පමණ දිගක් පැතිරී පවතින අතර, ප්‍රධාන මාර්ගය ආසන්නයටම සංවර්ධනය ව්‍යාප්තවීම හේතුකොටගෙන පදික මංතීරු ඇති කිරීම අත්‍යවශ්‍ය බවට හඳුනාගන්නා ලදී. ඒ අනුව ඉහත සඳහන් කරන ලද සීමාව තුල මාර්ගය දෙපසම කාණු පද්ධතියක්ද සහිතව රුක් රෝපණය කරන ලද මංතීරු පද්ධතියක් නගරයේ භූදර්ශණය ඉහළ දමන අයුරින් ඉදිකිරීම සුදුසු බවට යෝජනා කෙරේ.</td></tr>
<tr><th colspan="5">ව්‍යාපෘතියේ පිහිටීම</th></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය</td><td>පරිපාලන ඒකකය</td><td>සීතාවක ප්‍රාදේශීය සභාව</td></tr>
<tr><td rowspan="2">සීමාවන්</td><td>උතුර</td><td>නැගෙනහිර</td><td>දකුණ</td><td>බටහිර</td></tr>
<tr><td colspan="4">අවිස්සාවේල්ල මාර්ගය දිගේ සීතාවක ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ සිට කොස්ගම මහජන පොළ දක්වා මාර්ගය දෙපස</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">අවිස්සාවේල්ල මාර්ගය - A4</td></tr>
</table>

<table>
<tr><td>පිහිටීම දක්වන සිතියම</td><td colspan="9">
</td></tr>
<tr><td>වර්තමාන භූමි පරිහරණ සැලැස්ම</td><td colspan="9">
</td></tr>
<tr><td colspan="10">ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති ස්වභාවය</td><td>නව</td><td>✓</td><td>දියුණු කළ යුතු</td><td>-</td><td>විස්තීරණය කළ යුතු</td><td>-</td><td>භූමිය සංවර්ධනය කිරීම සමඟින්</td><td>-</td><td></td></tr>
<tr><td>ව්‍යාපෘති ප්‍රභේද</td><td>සංරක්ෂණය</td><td>ධාරිතා</td><td>භූ දර්ශන</td><td>උරුමයන්</td><td>නිවාස</td><td>ප්‍රතිස්ථාපන</td><td>වෙනත්</td><td></td><td></td></tr>
<tr><td></td><td>-</td><td>-</td><td>✓</td><td>-</td><td>-</td><td>-</td><td>-</td><td></td><td></td></tr>
<tr><td>ව්‍යාපෘතියේ ප්‍රතිලාභ</td><td colspan="2">ආර්ථික</td><td>-</td><td>සමාජීය</td><td colspan="5">✓</td></tr>
<tr><td>ව්‍යාපෘති ඉලක්ක</td><td colspan="9">▪ කොළඹ - රත්නපුර මාර්ගයේ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ සිට පොළ දක්වා මීටර් 400 බැගින් මාර්ගය දෙපසම පදික මංතීරු ඇති කිරීම.<br>▪ පදික මංතීරු සඳහා සුදුසු සෙවණ ලබාදෙන වෘක්ෂ 100 ක් රෝපණය කිරීම.<br>▪ කාණු පද්ධති සහිතව මංතීරු සංවර්ධනය කිරීම.</td></tr>
</table>

<table>
<tr><td>ව්‍යාපෘතියේ පදනම</td><td colspan="8">සීතාවක සංවර්ධන සැලැස්ම සඳහා කර ඇති පුරෝකථනයන් අනුව 2030 වර්ෂය වනවිට නගරයට දිනකට පැමිණෙන සංක්‍රමණික ජනගහනය 25,000 ක් පමණ වේ. ඊට අමතරව, නේවාසික ජනගහනය 3,000 ක් පමණ වේ. ඒ අනුව නගරය භාවිතා කරන පුද්ගලයින් සඳහා අවශ්‍ය පදික මංමාවත් දියුණු විය යුතු බවට හඳුනාගන්නා ලදී. තවද, සාලාව පොළෙහි පදික මංමාවත් අවම තත්ත්වයක පැවතීමෙන්, පොළ තුල ගමන් කිරීමේ අවශ්‍ය පහසුකම් ඉතා අල්ප වේ. කොස්ගම දුම්රිය පොළ සංවර්ධනයවීමත් සමඟ නගරය භාවිතා කරන මගී ජනතාව සඳහා විධිමත් පදික මංතීරු පද්ධතියක් බිහිකිරීම අවශ්‍ය වේ. තවද, පරිපාලන සේවා ලබාගැනීමට ප්‍රාදේශීය සභාව සඳහා පැමිණෙන ජනතාව සඳහාද ඉහත අවශ්‍යතාවය පවතින බව නිගමනය කළ හැකිය.<br><br>මීට අමතරව, මහානගර හා බස්නාහිර සංවර්ධන සැලැස්ම මගින් හඳුනාගෙන ඇති කොස්ගම - කැලණිය විදුලි දුම්රිය මාර්ගය සහ කැලණිවැලි දුම්රිය මාර්ගය ද්වීත්ව දුම්රිය මාර්ගයක් වීමට යෝජිතව පවතින නිසා කොස්ගම නගරය අනාගතයේදී ඉහළ නාගරික සංවර්ධනයක් අත්පත් කරගැනීම සිදු වේ. එම නිසා නගරයේ මංතීරු සංවර්ධනය හරහා නේවාසික හා සංක්‍රමණික පුද්ගලයන් ප්‍රමාණය ඉහළ යන බැවින්, ඔවුන්හට අවශ්‍ය කරන පදික මංතීරු ප්‍රමාණය සපුරාලීම අරමුණු කෙරේ.</td></tr>
<tr><td colspan="9">ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන අයිතිය</td><td>නා.සං.අ.</td><td>-</td><td>පෞද්ගලික</td><td>✓</td><td>රජයේ</td><td>✓</td><td>වෙනත්</td><td>-</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන තත්වය අවට භාවිතය</td><td colspan="4">අවිස්සාවේල්ල මාර්ගය දෙපස බහුලව වාණිජ භාවිතයන් පවතී.</td><td colspan="2">ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය</td><td colspan="2">-</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය</td><td colspan="8">මාර්ග සංවර්ධන අධිකාරිය හා පෞද්ගලික අංශය සතු වේ.</td></tr>
</table>

<table>
<tr><td rowspan="2">මිනින්දෝරු සැලසුම</td><td>අංකය</td><td>මිනින්දෝරුවරයාගේ නම</td><td>දිනය</td><td>ඉඩමේ ප්‍රමාණය</td></tr>
<tr><td>-</td><td>-</td><td>-</td><td>දුර මීටර් 400</td></tr>
<tr><td colspan="5">ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම</td></tr>
</table>

<table>
<tr><td>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</td><td>▪ පදික මංතීරු හා ජලබස්නා කාණු සහිතව මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කළ යුතු බවට යෝජනා කෙරේ.</td><td>ක්‍රියාත්මක කළ යුතු ආයතනය</td><td>මාර්ග සංවර්ධන අධිකාරිය</td><td>අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය</td><td>රජය</td></tr>
</table>

<table>
<tr><td rowspan="2">යටිතල පහසුකම්</td><td rowspan="2">ජලය</td><td>අවශ්‍ය ධාරිතාව</td><td>-</td><td rowspan="2">විදුලිය</td><td>අවශ්‍ය ධාරිතාව</td><td>-</td></tr>
<tr><td>පවත්නා ධාරිතාව</td><td>-</td><td>පවත්නා ධාරිතාව</td><td>-</td></tr>
<tr><td></td><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</td><td>ඔව්</td><td>-</td><td>නැත</td><td></td><td>යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</td><td>-</td></tr>
</table>

<table>
<tr><td>කලාපය</td><td>සේවා වාණිජ කලාපය</td><td>කලාපීකරණ අනුකූලභාවය</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td>-</td></tr>
<tr><td colspan="7">වින්‍යාස සැලැස්ම</td></tr>
<tr><td colspan="7">-</td></tr>
</table>

**(12)**

| ව්‍යාපෘතිය හඳුනාගැනීම | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | කොස්ගම නගර සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | **කොස්ගම සිට පාදුක්ක දක්වා යෝජිත ප්‍රවේශ මාර්ගය මීටර් 13 ක් පළල විකල්ප ප්‍රවේශ මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම** | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | කොස්ගම නගරය සහ පාදුක්ක නගරය අතර කි.මී. 17 ක් දිගකින් හා මීටර් 13 ක් පළලින් යුත් හරිත විකල්ප ප්‍රවේශ මාර්ගයක් හඳුනාගන්නා ලදී. මෙහිදී, දැනට පවත්නා මාර්ග වන කොස්ගම, කඳුගොඩ මාර්ගය, බොරළුගොඩ - මාවල්ගම මාර්ගය, ඇල්ලවත්ත මාර්ගය, පහත්ගම, දිද්දෙණිය මාර්ගය, අරුක්වත්ත - පිටුම්පේ මාර්ගය හා අරුක්වත්ත - ජයන්ති මාර්ගය සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. ඊට අමතරව කි.මී. 02 කින් හා කි.මී. 1.6 කින් යුත් නව මාර්ග කොටස් 02 ක් මෙම විකල්ප ප්‍රවේශ මාර්ගය සඳහා අළුතින්ම සංවර්ධනය කළ යුතු බව හඳුනාගන්නා ලදී. මේ මාර්ගය හරහා හයිලෙවල් මාර්ගය හරහා පවතින අධික වාහන තදබදය අඩු කිරීමක් හයිලෙවල් හාර්ගය හා අධි පරිසර සංවේදී කලාපය තුල පවත්නා අධික අවිධිමත් සංවර්ධනය අඩුකිරීමටත්, මෙම මාර්ගය තුලින් බලාපොරොත්තු වේ. | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය<br>පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | කොස්ගම නගරයේ සිට කඳුගොඩ මාර්ගය ආරම්භ වන ස්ථානයේ සිට අරුක්වත්ත, ජයන්ති මාවත, ගලගෙදර - හොරණ මාර්ගය හමුවන ස්ථානය දක්වා දිද්දෙණිය මාර්ගය මුලික කරගෙන නව මාර්ගය සංවර්ධනය කිරීම. | | | |
| **ප්‍රවේශය** | - | | | |

බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය

| පිහිටීම දක්වන සිතියම |   |
|---|---|
| භූමි පරිහරණ සැලැස්ම |    |

**ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම**

| ව්‍යාපෘති ස්වභාවය | නව | ✓ | දියුණු කළ යුතු | ✓ | විස්තීරණය කළ යුතු | - | භූමිය සංවර්ධනය කිරීම පමණක් | - |
|---|---|---|---|---|---|---|---|---|

| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
|---|---|---|---|---|---|---|---|
| | - | - | - | - | - | - | මාර්ග සංවර්ධනය |

| ව්‍යාපෘතියේ ප්‍රතිලාභ | ආර්ථික | - | සමාජීය | ✓ |
|---|---|---|---|---|

| ව්‍යාපෘති ඉලක්ක | |
|---|---|
| | ▪ හයිලෙවල් මාර්ගයේ වාහන තදබදය අඩුකිරීම<br>▪ අධි සංවේදී කලාපය තුල හා හයිලෙවල් මාර්ගය දෙපස පවතින අධි සංවර්ධනය අඩු කිරීම |

<table>
<tr><td></td><td colspan="9">
<ul>
<li>යටිතල පහසුකම් සංවර්ධනය කිරීම</li>
<li>පාදුක්ක නගරය හා කොස්ගම නගරය තුලට ප්‍රවේශ වීමේ හැකියාව වැඩි කිරීම</li>
<li>දුම්රිය ස්ථානවලට පහසුවෙන් ළඟාවිය හැකි මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම</li>
</ul>
</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ පදනම</td><td colspan="9">යෝජිත සංවර්ධන සැලැස්ම අනුව සමෘද්ධිමත් නේවාසික හරිත පුරවරය යන අරමුණ ඉටුකරගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය ඉවහල් කරගනී. එහිදී වර්ෂ 2030 වනවිට මධ්‍යම ඝනත්වය නේවාසික කලාපයක් ලෙස දියුණු කිරීමට යෝජිත නගර ලෙස කොස්ගම හා පාදුක්ක නගරයන් හඳුනාගෙන ඇත. මේ නිසා එම නගරවලට දැනට ප්‍රවේශවීමට පවතින අවිස්සාවේල්ල මාර්ගය හා හයිලෙවල් මාර්ගයට අමතරව, නව විකල්ප මාර්ගයන් හඳුන්වාදීම තුලින් එම නගරවලට පහසුවෙන් ළඟාවීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත.</td></tr>
<tr><td colspan="10">ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන අයිතිය</td><td>නා.සං.අ.</td><td>-</td><td>පෞද්ගලික</td><td>✓</td><td>රජයේ</td><td>✓</td><td>වෙනත්</td><td colspan="2">-</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන තත්වය</td><td colspan="2">අඩි 06 ක පමණ පළලකින් යුත් පටු මාර්ග පද්ධතියකි.</td><td colspan="2">ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය</td><td colspan="5">-</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය</td><td colspan="9">රජයේ හා පුද්ගලික</td></tr>
<tr><td rowspan="2">මිනින්දෝරු සැලසුම</td><td>අංකය</td><td>මිනින්දෝරුවරයාගේ නම</td><td colspan="2">දිනය</td><td colspan="5">ඉඩමේ ප්‍රමාණය</td></tr>
<tr><td>-</td><td>-</td><td colspan="2">-</td><td colspan="5">දුර කි.මී. 17</td></tr>
</table>

<table>
<tr><th colspan="8">ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම</th></tr>
<tr><td>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</td><td colspan="2">▪ මාර්ග සංවර්ධන අධිකාරිය හා පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ප්‍රවේශ මාර්ග දෙපස ඇති ගොඩනැගිලි සීමා විවෘත කරමින් මාර්ග පුළුල් කිරීමේ කටයුතු හා සංවර්ධන කටයුතු සිදුකළ යුතුය.</td><td>ක්‍රියාත්මක කළ යුතු ආයතනය</td><td colspan="2">මාර්ග සංවර්ධන අධිකාරිය<br>පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය<br>සීතාවක ප්‍රාදේශීය සභාව<br>නා.සං.අ.</td><td>අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය</td><td>මාර්ග සංවර්ධන අධිකාරිය</td></tr>
<tr><td rowspan="3">යටිතල පහසුකම්</td><td rowspan="2">ජලය</td><td>අවශ්‍ය ධාරිතාව</td><td>-</td><td rowspan="2">විදුලිය</td><td colspan="2">අවශ්‍ය ධාරිතාව</td><td>-</td></tr>
<tr><td>පවත්නා ධාරිතාව</td><td>-</td><td colspan="2">පවත්නා ධාරිතාව</td><td>-</td></tr>
<tr><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</td><td>ඔව්</td><td>-</td><td>නැත</td><td colspan="2">යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</td><td>-</td></tr>
<tr><td>කලාපය</td><td colspan="2">අඩු ඝනත්ව නේවාසික කලාපය</td><td colspan="2">කලාපීකරණ අනුකූලභාවය</td><td>ඔව් | ✓</td><td>නැත</td><td>-</td></tr>
<tr><th colspan="8">වින්‍යාස සැලැස්ම</th></tr>
<tr><td colspan="8">-</td></tr>
</table>

**(13)**

<table>
<tr><th colspan="5">ව්‍යාපෘතිය හඳුනාගැනීම</th></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="4">කොස්ගම  නගර සංවර්ධන ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘතිය</td><td colspan="4">සාලාව - අකරවිට මාර්ගය මීටර් 13 ක් දක්වා පුළුල් කර සංවර්ධනය කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති අංශය</td><td colspan="4">අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපාය මාර්ගය යටතේ මාර්ග හා ප්‍රවාහන උපාය මාර්ගය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="4">සීතාවක සංවර්ධන සැලැස්ම (2019 - 2030) තුලින් හඳුනාගෙන ඇති අරමුණක් ලෙස සමෘද්ධිමත්  නේවාසික පුරවරයක් පෙන්වා දිය හැකිය. ඒ යටතේ ප්‍රදේශයේ පවතින අපරව්‍යුහ පහසුකම් ඉහළ දැමීමේ අවශ්‍යතාවයක් හඳුනාගන්නා ලදී. ඒ අනුව ප්‍රදේශයේ පවතින ග්‍රාමීය රෝහලක් ලෙස සාලාව ග්‍රාමීය රෝහල පෙන්වා දිය හැකිය. ඒ සඳහා ඇති පිවිසුම් මාර්ගය ලෙස සාලාව - අකරවිට මාර්ගය පෙන්වා දිය හැකිය. එහිදී, මාර්ගයේ වර්තමාන මාර්ග පළල මීටර් 06 ක් පමණ වන අතර, එම නිසා රෝහල සඳහා පැමිණෙන රෝගීන් නව විවිධ අපහසුතා සඳහා මුහුණපෑමට සිදු වේ. ඒ අනුව මෙම මාර්ගය මීටර් 13  ක් පුළුල් කර ඉදිකිරීම අත්‍යවශ්‍ය බවත්, මාර්ගය දෙපස රුක් රෝපණය ඇති කළ යුතු බවත්, ඊට අමතරව මාර්ගයේ කාණු පද්ධතියක් සහිත ඉදිකිරීම අනිවාර්ය බවත් යෝජනා කළ හැකිය.</td></tr>
<tr><th colspan="5">ව්‍යාපෘතියේ පිහිටීම</th></tr>
<tr><td rowspan="2">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය</td><td>පරිපාලන ඒකකය</td><td>සීතාවක ප්‍රාදේශීය සභාව</td></tr>
<tr><td rowspan="2">සීමාවන්</td><td>උතුර</td><td>නැගෙනහිර</td><td>දකුණ</td><td>බටහිර</td></tr>
<tr><td colspan="4">අකරවිට මාර්ගය හා අවිස්සාවේල්ල මාර්ගය හමුවන ස්ථානයේ සිට අකරවිට තැපැල් කාර්යාලය දක්වා</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="4">අවිස්සාවේල්ල මාර්ගය</td></tr>
</table>

| | |
|---|---|
| පිහිටීම දක්වන සිතියම |  |
| භූමි පරිහරණ සැලැස්ම |   |

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති ස්වභාවය | නව | - | දියුණු කළ යුතු | ✓ | විස්තීරණය කළ යුතු | - | භූමිය සංවර්ධනය කිරීම පමණක් | - |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් |
| | - | - | - | - | - | - | මාර්ග සංවර්ධනයන් |

| | | | | |
|---|---|---|---|---|
| ව්‍යාපෘතියේ ප්‍රතිලාභ | ආර්ථික | - | සමාජීය | ✓ |

<table>
<tr><td>ව්‍යාපෘති ඉලක්ක</td><td colspan="8">▪ සාලාව ග්‍රාමීය රෝහලට පිවිසීම සඳහා පවතින අවහිරතාවය අවම කිරීම.<br>▪ මාර්ගය දෙපස රුක් රෝපණය ඇති කිරීම.<br>▪ මාර්ගය දෙපස කාණු පද්ධතියක් පිහිටුවීම.<br>▪ පරිසර හිතකාමී ක්‍රියාකාරකම්, කඳවුරු, ලෙනවර රජමහා විහාරය වැනි විශේෂ ස්ථාන සඳහා ළඟාවීම පහසු කිරීම.</td></tr>
<tr><td>ව්‍යාපෘතියේ පදනම</td><td colspan="8">සාලාව ග්‍රාමීය රෝහල වෙත පැමිණෙන රෝගීන්, ප්‍රදේශයේ පවත්නා පරිසර හිතකාමී කඳවුර (Che Adventure Park) හා ලෙනවර රජමහා විහාරය ආදී ස්ථානයන් නැරඹීමට පැමිණෙන්නන් ඇතුළු අවට නේවාසික ප්‍රදේශයන්හි ජනතාව ආදී විශාල ජනසංඛ්‍යාවක් සාලාව - අකරවිට මාර්ගය මගින් දෛනිකව ප්‍රවේශ පහසුකම් ලබාගනී. මෙම මාර්ගය කැලණි ගඟේ ජල මට්ටම ඉහළයෑමත් සමඟ ගංවතුර තර්ජනයට ලක්වන කලාපය තුළ පවතින මාර්ගයක් ලෙසද හඳුනාගත හැකිය. වර්තමානයේ මෙම මාර්ගය මීටර් 06 ක් පමණ වන ලෙස කාපට් අතුරා සංවර්ධනය කර ඇති අතර, ඉහත සඳහන් කරන ලද අවශ්‍යතා ඉටුකරලීම සඳහා දැනට පවතින මාර්ගය ප්‍රමාණවත් නොවන බැවින්, තවදුරටත් මෙම මාර්ගය සංවර්ධනය කිරීම තුලින් මාර්ගය භාවිතා කරන පුද්ගලයන් වෙත කාර්යක්ෂම ප්‍රවාහන අවශ්‍යතාවයන් සපුරාගැනීමට හැකිවනු ඇත.</td></tr>
<tr><td colspan="9">ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන අයිතිය</td><td>නා.සං.අ.</td><td>-</td><td>පෞද්ගලික</td><td>-</td><td>රජයේ</td><td>✓</td><td>වෙනත්</td><td>-</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන තත්වය අවට භාවිතය</td><td colspan="2">මාර්ගය දෙපස කුඹුරු, පහත්බිම්, නේවාසික ප්‍රදේශ ආදී විවිධ භූමි පරිහරණයන් ව්‍යාප්තව පවතී.</td><td colspan="2">ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය</td><td colspan="4">-</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය</td><td colspan="8">රජය හා පුද්ගලික</td></tr>
</table>

| මිනින්දෝරු සැලසුම | අංකය | මිනින්දෝරුවරයාගේ නම | දිනය | භූමියේ ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | - | - | - | අක්: 00 | රූ.00 | පර්.00 |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ගොඩනැගිලි සීමාව විවෘත කර, අදාළ ඉඩම් අත්පත් කරගැනීමෙන් අනතුරුව පුළුල් කර සංවර්ධනය කළ යුතුය. | ක්‍රියාත්මක කළ යුතු ආයතනය | පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය | අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය | රජය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| යටිතල පහසුකම් | ජලය | අවශ්‍ය ධාරිතාව | - | විදුලිය | අවශ්‍ය ධාරිතාව | - |
| | | පවත්නා ධාරිතාව | - | | පවත්නා ධාරිතාව | - |
| | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | ඔව් | - | නැත | යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| කලාපය | පරිසර හිතකාමී ක්‍රියාකාරකම් කලාපය | කලාපීකරණ අනුකූලභාවය | ඔව් | ✓ | නැත | - |

| වින්‍යාස සැලැස්ම |
|---|
| - |

**(14)**

| **ව්‍යාපෘතිය හඳුනාගැනීම** | | | | |
|---|---|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | කොස්ගම නගර සංවර්ධන ව්‍යාපෘතිය | | | |
| **ව්‍යාපෘතිය** | **කොස්ගම නාගරික උද්‍යාන ව්‍යාපෘතිය** | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | ප්‍රධාන නගර මධ්‍යස්ථානයක් වන කොස්ගම නගරය ප්‍රජා වාණිජ නගරයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති අතරම, ඒ අනුව 2030 වසර වනවිට දෛනිකව 25,000 කට අධික ජනතාවක් ප්‍රදේශයට සංක්‍රමණය වේ යැයි අපේක්ෂා කෙරේ. එහිදී, ප්‍රදේශයට පැමිණෙන ජනතාවට අවශ්‍ය විනෝද හා විවේකීය ස්ථාන සැපයීම අරමුණු කර ගනිමින් ළමා උද්‍යානයක්, රථවාහන පහසුකම් හා විවේකීය ස්ථාන සහිතව නාගරික උද්‍යානයක් මෙම ව්‍යාපෘතිය මගින් යෝජනා කර ඇත. ඒ සඳහා සීතාවක ප්‍රාදේශීය සභාව සතු කොස්ගම ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලට යාබදව පිහිටා ඇති පර්චස් 50 ක පමණ ප්‍රමාණයකින් යුත් භූමිය මේ සඳහා යෝජනා කෙරේ. | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** |
| | පරණ දුම්රියපල පාර | කොස්ගම - කඳුගොඩ මාර්ගය | කුඹුරු ඉඩම් | කුඹුරු ඉඩම් |
| **ප්‍රවේශය** | කොස්ගම - කඩුගොඩ මාර්ගය | | | |

| | |
|---|---|
| පිහිටීම දක්වන සිතියම |  |
| භූමි පරිහරණ සැලැස්ම |   |

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති ස්වභාවය | නව | ✓ | දියුණු කළ යුතු | - | විස්තීරණය කළ යුතු | - | භූමිය සංවර්ධනය කිරීම අවශ්‍යයි | - | |
| ව්‍යාපෘති ප්‍රභේද | සංරක්ෂණය | වාණිජ | භූ දර්ශන | උරුමයන් | නිවාස | ප්‍රතිස්ථාපන | වෙනත් | | |
| | - | ✓ | - | - | - | - | විනෝදාස්වාදිත | | |
| ව්‍යාපෘතියේ ප්‍රතිලාභ | ආර්ථික | ✓ | සමාජීය | ✓ | | | | | |
| ව්‍යාපෘති ඉලක්ක | ▪ නාගරික යටිතල පහසුකම් සංවර්ධනය<br>▪ භූමි අලංකරණය පවත්වාගැනීම<br>▪ ප්‍රදේශයේ විවේක හා විනෝද කටයුතු ස්ථාන සංවර්ධනය තුලින් ප්‍රජා විනෝද අවස්ථා සැලසීම | | | | | | | | |

බස්නාහිර පළාත් අංශය, නාගරික සංවර්ධන අධිකාරිය

<table>
<tr><td>ව්‍යාපෘතියේ පදනම</td><td colspan="8">ප්‍රජා වාණිජ නගරයක් ලෙස කොස්ගම නගරය සංවර්ධනය කිරීමේදී නේවාසික හා සංක්‍රමණික ජනතාවට විවේක පහසුකම් සපයාදීම අරමුණු කරගනිමින් මෙම නාගරික උද්‍යානය සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත.<br><br>මෙම ඉඩමේ දැනට සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියක් පවත්වාගෙන යනු ලබන අතර, එම ව්‍යාපෘතිය සාලාවවත්ත ඉඩම තුල ස්ථාපිත කිරීම සුදුසු බවට හඳුනාගෙන ඇත. ප්‍රාදේශීය සභාව සතු මෙම ඉඩම තුල මූලික යටිතල පහසුකම් සහිතව නාගරික උද්‍යානයක් ස්ථාපනය කරලීමට යෝජනා කරනු ලැබේ.</td></tr>
<tr><td colspan="9">ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන අයිතිය</td><td>නා.සං.අ.</td><td>-</td><td>පෞද්ගලික</td><td>-</td><td>රජයේ</td><td>✓</td><td>වෙනත්</td><td>-</td></tr>
<tr><td>ඉඩමේ වර්තමාන තත්වය</td><td colspan="2">▪ කොස්ගම සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන භූමිය වේ.</td><td colspan="2">ප්‍රතිස්ථාපනය පිළිබඳ විස්තරය</td><td colspan="4">▪ හඳුනාගත් සාලාවවත්ත අක්කර 01 ක ඉඩමක් තුල සන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට යෝජනා කෙරේ.</td></tr>
<tr><td>ඉඩමේ අයිතිය පිළිබඳ විස්තරය</td><td colspan="8">▪ සීතාවක ප්‍රාදේශීය සභාව සතු ඉඩමකි.</td></tr>
<tr><td rowspan="2">මිනින්දෝරු සැලසුම</td><td>අංකය</td><td>මිනින්දෝරුවරයාගේ නම</td><td colspan="2">දිනය</td><td colspan="4">ඉඩමේ ප්‍රමාණය</td></tr>
<tr><td>-</td><td>-</td><td colspan="2">-</td><td>අක්: 00</td><td colspan="2">රූ.00</td><td>පර්.00</td></tr>
</table>

<table>
<tr><th colspan="6">ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම</th></tr>
<tr><td>ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය</td><td>නා.සං.අ. මගින් ඉඩම පවරාගැනීමෙන් අනතුරුව ක්‍රියාත්මක කළ යුතු ව්‍යාපෘතියකි.</td><td>ක්‍රියාත්මක කළ යුතු ආයතනය</td><td>නා.සං.අ.<br>සීතාවක ප්‍රාදේශීය සභාව</td><td>අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය</td><td>රජය</td></tr>
</table>

<table>
<tr><td rowspan="2">යටිතල පහසුකම්</td><td rowspan="2">ජලය</td><td>අවශ්‍ය ධාරිතාව</td><td>-</td><td rowspan="2">විදුලිය</td><td>අවශ්‍ය ධාරිතාව</td><td>-</td></tr>
<tr><td>පවත්නා ධාරිතාව</td><td>-</td><td>පවත්නා ධාරිතාව</td><td>-</td></tr>
</table>

<table>
<tr><td></td><td>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</td><td>ඔව්</td><td>-</td><td>නැත</td><td></td><td>යෝජිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</td><td>-</td></tr>
</table>

<table>
<tr><td>කලාපය</td><td>සේවා වාණිජ කලාපය</td><td>කලාපීකරණ අනුකූලභාවය</td><td>ඔව්</td><td>✓</td><td>නැත</td><td>-</td></tr>
</table>

<table>
<tr><th>වින්‍යාස සැලැස්ම</th></tr>
<tr><td>-</td></tr>
</table>

**(15)**

| **ව්‍යාපෘතිය හඳුනාගැනීම** | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති මාතෘකාව** | කොස්ගම නගර සංවර්ධන ව්‍යාපෘති | | | | |
| **ව්‍යාපෘතිය** | **සාලාව නගර සංවර්ධන ව්‍යාපෘතිය** | | | | |
| **ව්‍යාපෘති යෝජනාව** | සාලාව නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ හංවැල්ල ප්‍රධාන මාර්ගයට යාබදව සාලාව යුධ හමුදා කඳවුරු ඉඩමෙන් අක්කර 05 ක භූමි භාගයක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත අත්පත් කරගෙන ඇති අතර, එහි භෝජනාගාරයක්, ළමා උද්‍යානයක්, ක්‍රීඩා පිටියක්, තැපැල් කාර්යාලයක් හා බැංකු පහසුකම් සහිත වාණිජ ස්ථානයක් ඉදිකිරීමට සැලසුම් කර ඇත. මේතුලින් සාලාව ප්‍රදේශයේ ජනතාවට අවශ්‍ය පහසුකම් එකම ස්ථානයකින් සපයාදීමට අපේක්ෂා කරන අතර, අවි ගබඩාව පිපිරීමෙන් විනාශ වූ වාණිජ ස්ථාන සඳහා ඉඩප්‍රස්ථාව ලබාදීමට ප්‍රමුඛතාවය ලබාදීමට යෝජිතය. | | | | |
| **ව්‍යාපෘතියේ පිහිටීම** | | | | | |
| **පිහිටීම** | **පළාත** | බස්නාහිර | **දිස්ත්‍රික්කය** | කොළඹ | |
| | **ප්‍රාදේශීය සීමාව** | හංවැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | **පරිපාලන ඒකකය** | සීතාවක ප්‍රාදේශීය සභාව | |
| **සීමාවන්** | **උතුර** | **නැගෙනහිර** | **දකුණ** | **බටහිර** | |
| | නේවාසික හා වාණිජ භාවිතයන් | සාලාව යුධහමුදා කඳවුර | අවිස්සාවේල්ල පාර | සාලාවවත්ත (රබර් ඉඩම) | |
| **ප්‍රවේශය** | කොළඹ - රත්නපුර ප්‍රධාන මාර්ගය (හයිලෙවල් මාර්ගය) | | | | |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| පිහිටීම දක්වන සිතියම |  | | | | | | | |
